තිරසාර අනාගතයක් උදෙසා



වාර්ෂික වාර්තාව 2023
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව



මෙම වාර්තාව සබැඳිව බැලීමට ඔබගේ ස්මාර්ට් උපාංගය සමඟ
QR කේතය පරිලෝකනය කරන්න

තිරසාර අනාගතයක් උදෙසා

අභියෝග මධ්‍යයේ වූවද
වෙළෙඳපොළේ ප්‍රමුඛයා ලෙස අප,
ජාතියේ ඛනිජ තෙල් නිෂ්පාදන සැපයුම
සුරක්ෂිත කිරීමට කැපවුනෙමු.
දේශයේ ඉදිරි ගමනට ශක්තියක් වීම සඳහා
අපගේ නිර්මාණාත්මක මානසිකත්වය,
නොසැලෙන සහයෝගීතාවය,
උපාය මාර්ගික ප්‍රවේශය ලබා දෙන අතර
අපගේ හවුල්කරුවන්, ගනුදෙනුකරුවන් සහ ප්‍රජාව අතර
කල්පවත්නා විශ්වාසය
වර්ධනය කරමින් තිරසාර අනාගතයක් උදෙසා
දේශය පෙරට ගෙන යාමට
මූලික මහපෙන්වීමක් සිදු කරයි.

පටුන

අප ගැන

02 අපි ගැන
05 අපගේ ගමන් මග
07 අපගේ වාර්තාව පිලිබඳව

සුවිශේෂතා

09 මූල්‍ය සුවිශේෂතා
11 මෙහෙයුම් සුවිශේෂතා

පණිවිඩ

13 සභාපතිතුමාගේ පණිවිඩය
16 කළමනාකාර අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය

අපගේ නායකත්වය

19 අධ්‍යක්ෂ මණ්ඩලය
24 සංස්ථායික කළමනාකාරීත්වය
27 ආයතනික ව්‍යුහය

සමාලෝචන වාර්තා

29 මෙහෙයුම් සන්දර්භය
33 කළමණාකරණ විශ්ලේෂණය
43 අපගේ උපාය මාර්ග

අගය නිර්මාණය කිරීම

47 ව්‍යාපාර මාදිලිය
49 මූල්‍ය ප්‍රාග්ධනය
53 නිපැයුම් ප්‍රාග්ධනය
57 බුද්ධිමය ප්‍රාග්ධනය
60 මානව ප්‍රාග්ධනය
65 සමාජීය හා සම්බන්ධතා ප්‍රාග්ධනය
69 ස්වාභාවික ප්‍රාග්ධනය
72 පාර්ශවකරුවන් කළමණාකරණය
75 නිරසාර වාර්තාව

අවදානම් වාර්තාව

77 අවදානම් කළමනාකරණ වාර්තාව

පාලනය

83 ආයතනික යහපාලනය
88 විගණන හා කළමණාකරන කමිටු වාර්තාව
90 අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

මූල්‍ය ප්‍රකාශන

95 විගණකාධිපති වාර්තාව
109 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
110 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය
111 ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය
112 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය
113 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

අතිරේක තොරතුරු

147 දස වසරක සාරාංශය
148 සංස්ථායික තොරතුරු

අපි ගැන

දැක්ම

ඛනිජ තෙල් ක්ෂේත්‍රය හා අදාළ කර්මාන්ත සඳහා තිරසාර භාවයක් ලබාදීම මෙන්ම නව අවස්ථාවන් මඟින් සේවාදායකයින්ට නිරන්තර වටිනාකම් සැපයීම.

මෙහෙවර

තරඟකාරීත්වය - ඛනිජ තෙල් සහ ඒ හා බැඳුණු නිෂ්පාදන තරඟකාරී මිල ගණන් යටතේ ලබාදෙමින් වෙළඳපොළ ප්‍රමුඛයා ලෙස කටයුතු කිරීමට ප්‍රයත්න දැරීම.
තිරසාරබව - ආර්ථිකමය සමාජමය සහ පාරිසරික වශයෙන් තිරසාර ව්‍යාපාරයක් ලෙස දීර්ඝකාලීන අනාගත ප්‍රතිලාභ උදා කරදීම.
නිරන්තර වර්ධනය - මානව සම්පත සහ ක්‍රියාදාමයන්හි සංවර්ධනය මත සංස්ථාවේ වර්ධනය තහවුරු කිරීම මෙන්ම අදාළ සියලු අංශයන්හි වර්ධනයන් ගැන සුපරික්ෂාකාරී වීම.
අවංක බව - සංස්ථාවේ යහපත සහතික කරනු සඳහා සියලු අවස්ථාවන්හිදී විශ්වාසදායී ලෙස කටයුතු කිරීම.
පොදු යහපත - රටේ සංවර්ධනය වෙනුවෙන් සහයෝගය ලබාදීමේ ඉලක්ක සපුරා ගැනීම.

අඟයන්

තරඟකාරීත්වය
තිරසාර බව
අඛණ්ඩ දියුණුව
අඛණ්ඩත්වය
පොදු යහපත



ලංකා ඛනිජ තෙල් සංස්ථාව (සංස්ථාව) යනු 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් සංස්ථා පනත යටතේ සංස්ථාපිත රාජ්‍ය සංස්ථාවකි. අපගේ මූලික අරමුණ වන්නේ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය, පිරිපහදුව සහ ශ්‍රී ලංකාව පුරා බෙදා හැරීමයි. අපගේ විස්තීර්ණ බෙදාහැරීමේ ජාලය දේශයේ ඉන්ධන ඉල්ලුම සපුරාලීම සහතික කරමින් රට පුරා ව්‍යාප්ත වූවකි. ඛනිජ තෙල් ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම ආයතනය ලෙස, දිවයින පුරා උපායමාර්ගික ලෙස ස්ථාන ගත වූ ඉන්ධන පිරවුම්හල් 990 ජාලයක් හරහා ඉන්ධන බෙදා හැරීම මගින් අපි අපගේ වෙළඳපල තත්ත්වය පවත්වා ගන්නෙමු.

අපගේ දශක හයක සාර්ථක ඉතිහාසය තුළ, සංස්ථාව ජාතියේ මූලික බලශක්ති සැපයුම්කරු ලෙස ක්‍රියා කර ඇති අතර, එමගින් දේශයේ ආර්ථික ප්‍රගමනයට සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. පසුගිය පනස් වසර පුරා ප්‍රධාන උපාය මාර්ගික වත්කම වන සංස්ථා පිරිපහදුව දේශයට මහඟු මූල්‍ය උත්පාදන වටිනාකමක් ලබා දී ඇත. වර්තමානයේ සංස්ථා අලවේයෙන් 35% - 50% ප්‍රතිශතයක් පිරිපහදුව මඟින් සපයන අතර ඉතිරිය පිරිපහදු කරන ලද නිෂ්පාදන ආනයන මඟින් සපුරාලයි.

අපගේ මෙහෙයුම් ක්‍රියාවලිය තුල කුසලතාවයෙන් හෙබි 2082 වෘත්තිකයන්ගෙන් සමන්විත වූ ශ්‍රමබලකාය, අපගේ පාර්ශව කරුවන්ට වටිනාකමක් ලබාදීමේදී අත්‍යවශ්‍ය වේ. අපගේ අනුබද්ධිත සමාගම් අතර, අපට තුනෙන් දෙකක කොටස් හිමිකාරිත්වයක් ඇති සීමාසහිත ලංකා පෙට්‍රෝලියම් ස්ටොරේජ් ටර්මිනල්ස් සමාගම (CPSTL) විසින් අපගේ මෙහෙයුම් රාමුව තුළ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

CPSTL ආයතනය පිහිටුවන ලද්දේ ඛනිජ තෙල් නිෂ්පාදන ගබඩා කිරීම සහ බෙදා හැරීම මෙන්ම තොරතුරු තාක්ෂණ සේවා සැපයීමේ මූලික අරමුණු ඇතිවයි. මීට අමතරව, බද්ධ ව්‍යාපාරයක් ලෙස ක්‍රියාත්මක වන අපගේ අනුබද්ධිත සමාගමක් වන සීමාසහිත ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටෙර්මිනල් (පුද්ගලික) සමාගමෙහි 51% ක කොටස් අප විසින් පවත්වාගෙන යනු ලැබේ. අපගේ ව්‍යාපාරික මෙහෙයුම් ප්‍රවාහනය, ගුවන් තෙල්, බලශක්ති උත්පාදනය, කර්මාන්ත, කෘෂි කර්මාන්ත සහ ලිහිසි තෙල් යන ක්ෂේත්‍ර යටතේ විවිධාංගිකරණය කර ඇත. උපායමාර්ගිකව වශයෙන් ස්ථාපිත කර ඇති රාජ්‍ය ව්‍යවසායයක් ලෙස, ආර්ථික අවපාතයෙන් මිදී ආර්ථික ප්‍රකෘතිය අත්පත් කර ගැනීම සඳහා සංස්ථාව විසින් 2023 වර්ෂයේදී විවිධ මූලාරම්භයන් ගන්නා ලදී. වර්ෂය පුරා, සංස්ථාව විසින් සාර්ථකව ඉන්ධන ලීටර් මිලියන 4,184ක් සපයනු ලැබ ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස උපයාගත් ආදායම රු. බිලියන 1,263.6 කි.

අංශ	නිෂ්පාදන
ප්‍රවාහනය	92 පෙට්‍රල් 95 පෙට්‍රල් ඔටෝ ඩීසල් සුපිරි ඩීසල්
බලශක්ති උත්පාදනය	ඔටෝ ඩීසල් දැව් තෙල් නැෆ්තා
ගුවන් සේවා	ජෙට් A-1
කර්මාන්ත	දැව් තෙල් කාර්මික භූමිතෙල් ලිහිසි තෙල් බිටුමන් සොල්වන්ට්
කෘෂි රසායන	කෘෂි රසායන නිෂ්පාදන
නැව් තෙල් ව්‍යාපාරය සහ අපනයන	දැව් තෙල් ඩීසල්



අපගේ ගමන්මඟ

1961

1961 අංක 28 දරන පනත යටතේ රජය සතු ව්‍යාපාරයක් ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ස්ථාපිත කරන ලදි.

1962

එවකට මෙරට ක්‍රියාත්මක වූ අනෙකුත් තෙල් සමාගම් සමඟ තරඟ කරමින් සංස්ථාව තම ව්‍යාපාරය ආරම්භ කරන ලදි.

1964

රට තුළ ඛනිජ තෙල් නිෂ්පාදනය ආනයනය කරනු ලබන, අළෙවි කරන සහ බෙදාහරින එකම ව්‍යාපාරය බවට පත්විය.

1968

දිනකට බැරල් 38,000 ක් පිරිපහදු කළ හැකි පිරිපහදුවක් සංස්ථාව විසින් ඉදිකර ඇත.



1969

පිරිපහදු මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදි. කොලොන්නාව නිමාව තුළම ලිහිසි තෙල් මුසු යන්ත්‍රාගාරයක් එක් කරන ලදි. කෘෂි රසායන අංශය වෙත ප්‍රවේශ විය.

1971

සංස්ථා පනතට සිදු කරන ලද සංශෝධන හරහා නැවතෙල් මෙහෙයුම් කටයුතු සහ ගුවන්තෙල් පිරවීම් මෙහෙයුම් කටයුතු සංස්ථා විෂය පථයට එකතු කරන ලදී.

1978

රෙදිපිළි, ටයර් සහ ධීවර කර්මාන්තය සඳහා නයිලෝන් 6 නූල් නිෂ්පාදනය සඳහා යන්ත්‍රාගාරයක් පිහිටුවන ලදි.

1979

බොරතෙල් පිරිපහදු ධාරිතාවය වැඩි කරමින් දිනකට බැරල් 50,000 ක් පිරිපහදු කළ හැකි වන පරිදි පිරිපහදු ධාරිතාවය ඉහළ නංවන ලදි.



1987

ඔරුගොඩවත්ත ප්‍රදේශයේ බොරතෙල් ගබඩාකරණ ටැංකි සංකීර්ණයක් අතරමැදි පහසුකමක් ලෙස ස්ථාපිත කරමින්, කොළඹ වරායේ සිට 9.2 Km පිටතින් එක ලක්ෂික පාවෙන නැව් නැවැත්වීමේ පහසුකමක් ස්ථාපිත කරන ලදී.

1994

ද්‍රවිකරණ සහ ලිහිසි තෙල් ආනයනය කිරීම සහ බෙදාහැරීම නියාමනය කරන ලදී.

1992

පිරිපහදු ක්‍රියාවලියේ නම්‍යතාවය සහ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා බොරතෙල් පිරිපහදු ඒකකය පුනර්ජීවනය කරන ලදි.

1995

තුස්තවාදී ප්‍රහාර හේතුවෙන් හානි වූ කොලොන්නාව සහ ඔරුගොඩවත්ත ටැංකි සංකීර්ණ ප්‍රතිසංස්කරණය කිරීම.

1999

සපුගස්කන්ද ගින්නෙන් හානි වූ ටැංකි නව බෙදාහැරීම් පර්යන්තයක් සමඟ නැවත ඉදි කරන ලදි. පෙට්‍රල් මුසු නොග නිෂ්පාදනය කිරීමට හැකිවන පරිදි ප්ලැටිෆෝමර් ඒකකයේ ධාරිතාව වැඩි කරන ලදි.

2002

ඔටෝ ඩීසල් තුළ ඇති ගෙන්දගම් අගය අඩු කිරීම සඳහා නවීකරන කටයුතු සිදු කිරීම. පවත්නා ඩීසල් හයිඩ්‍රොට්‍රීටර් (ඒකක 04) පුනර්ජීවනය කිරීම සහ භූමිතෙල් හයිඩ්‍රොට්‍රීටර් (ඒකක 07) ඩීසල් හයිඩ්‍රෝට්‍රීටර් පද්ධතියක් ලෙස පරිවර්තනය කිරීම.

2003

සංස්ථාව, ශ්‍රී ලංකා රජය සහ ලංකා ඉන්දියානු තෙල් සමාගම විසින් සමාන අයිතියක් දරනු ලබන අළුතින් පිහිටුවනු ලැබූ පොදු පරිශීලක පහසුකම් වෙත ගබඩාකරණ සහ බෙදාහැරීම් ව්‍යාපාරය පවරන ලදි. බණ්ඩාරනායක ගුවන්තොටුපල පරිශ්‍රය තුළ ගුවන් තෙල් පහසුකම් සංකීර්ණයක් සහ ඉන්ධන නල පද්ධතියක් ආරම්භ කරන ලදි.

2010

පිරවුම්හල් 107 ක් සහ නොග ගබඩා පර්යන්ත සමාගමේ 1/3ක සංස්ථාව වෙත ලබාදීමට කැබිනට් මණ්ඩලය තීරණය කරන ලදි. සංස්ථාව විසින් සුපර් ඩීසල් (10 ppm) වෙළඳපල වෙත හඳුන්වා දෙන ලදි.

2011

කොළඹ 09 ප්‍රදේශයේ නව ගොඩනැගිල්ලක් වෙත සංස්ථා ප්‍රධාන කාර්යාලය ගෙන යන ලදී. මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපලේ 1 වන අදියර යටතේ ඉන්ධන නල පද්ධතියක් ඉදිකිරීම ආරම්භ කරන ලදී.

2012

කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ කොටසක් ලෙස, කොළඹ වරාය තුළ සබ්මැරීන් බොරතෙල් නල මාර්ගය සහ නල සම්බන්ද වන කෙළවර ගමන් මග වෙනස් කිරීම/ ආදේශ කිරීම සම්පූර්ණ කිරීම. මත්තල පිහිටා ඇති හම්බන්තොට ජාත්‍යන්තර ගුවන් තොටුපලේ දෙවන අදියර යටතේ ගුවන්තෙල් පර්යන්තයේ ඉදි කිරීම් කටයුතු ආරම්භ කරන ලදී.



2013

පෙට්‍රල් ඔක්ටේන් 90 පෙට්‍රල් ඔක්ටේන් 92 දක්වා වන ඉහළ ශ්‍රේණියට ගෙන එන ලදී.

2014

මත්තල, හම්බන්තොට ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ගුවන්තෙල් පිරවුම් පර්යන්තය සහ ඉන්ධන නළ පද්ධතිය ස්ථාපිත කරන ලදී. ඒකාබද්ධ පරීක්ෂණ කණ්ඩායමේ (JIG) වාර්ෂික විගණනයේදී "හොඳයි" යන තත්වය ("සාමාන්‍ය" යන තත්වයෙන් ඉහළ තත්වය) සංස්ථාවේ ගුවන් තෙල් අංශයට ලබා දෙන ලදී. ආනයනය සඳහා 500 ppm ඉන්ධන පිරිවිතර හඳුන්වා දෙන ලදී.

2016

ඉදිකිරීම්, ක්‍රියාකරවීම සහ පවරා දීම යන පදනම යටතේ ශ්‍රී ලංකාව තුළ ලිහිසි තෙල් මුසු යන්ත්‍රාගාරයක් ක්‍රියාත්මක කිරීම සඳහා හයිරැක්ස් සමාගම සමඟ සංස්ථාව ගිවිසුමකට එළඹෙන ලදී.

2018

ගුවන්තෙල් පිරවුම් පද්ධතිය සහ පවත්නා ඉන්ධන නළ පද්ධතිය සංවර්ධනය කිරීම ආරම්භ කිරීම, බණ්ඩාරනායක ජාත්‍යන්තරගුවන්තොටුපලේ සංවර්ධන ව්‍යාපෘතියේ 2 අදියරේ 11 පියවර සමඟ යමින් නව ඒප්‍රන් 4 ඊ කොටසේ ඉන්ධන නළ පද්ධතියක් ස්ථාපිත කිරීම, දැව් තෙල් භාවිතා කරමින් දියර තාර නිෂ්පාදනයට නැවත ප්‍රවේශ විය. ලංකා සුපර් ඩීසල් යුරෝ 4 සහ පෙට්‍රල් 95 යුරෝ 4 හඳුන්වා දෙන ලදී.

2019

පිරිපහදුවේ වසර 50ක සංවත්සරය සමරන ලදී.

2020

ස්වාභාවික ද්‍රවිකෘත වායු (LNG) අංශයේ ආරම්භය.

2021

නැව් තෙල් ව්‍යාපාරය නැවත ආරම්භ කිරීම.

2022

TPTL හි ආයෝජනය කිරීම හා ඇ.ඩො. බි. 2.4ක ණය රජය විසින් ලබා ගැනුණි

2023

සංස්ථාවේ ඉහළම ආදායම සහ ඉහළම ලාභය වාර්තා කරන ලදී.

අපගේ වාර්තාව පිළිබඳව

මෙම 2023 වර්ෂය සඳහා වන අපගේ ඒකාබද්ධ වාර්ෂික වාර්තාව අපගේ ක්‍රියාකාරකම් වාර්තා කිරීමෙහිලා විනිවිදභාවය සඳහා වන අපගේ කැපවීම ප්‍රදර්ශනය කරනු වස් ඒකාබද්ධ ප්‍රවේශයකින් පිළියෙල කර ඇත. මෙම වාර්තාව සංස්ථාවේ උපාය මාර්ග, කාර්ය සාධනය, පාලනය, අවදානම් කළමනාකරණය සහ වටිනාකම් නිර්මාණය කිරීමේ කලාව පිළිබඳ සවිස්තරාත්මක අවබෝධයක් ලබා දීම අරමුණු කරයි.

විෂය පථය සහ සීමාවන්

2023 ජනවාරි 1 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා කාලසීමාව තුළ ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ ව්‍යාපාරික ආකෘතිය, මෙහෙයුම් පරිසරය, උපාය මාර්ග, සැලකිය යුතු අවදානම් සහ අවස්ථා, පාලනය සහ මෙහෙයුම් කාර්ය සාධනය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු මෙම වාර්ෂික වාර්තාව මඟින් ඉදිරිපත් කරයි. මෙම වාර්තාවට මෙම කාලය පුරාවට අපගේ උපාය මාර්ගික ව්‍යාපාර ඒකක වල කාර්ය සාධනය අන්තර්ගතවේ.

ප්‍රමාණාත්මකතාව

කෙටි, මධ්‍ය කාලීන සහ දිගු කාලීන වටිනාකම් උත්පාදනය කිරීමට ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව සතු හැකියාව පිළිබඳව දැනුවත් ඇගයීම් කිරීමට අපේක්ෂා කරන වත්මන් සහ විභව පාර්ශ්වකරුවන් විසින් සැලකිය යුතු උනන්දුවක් දක්වනු ඇති බවට අප සලකන ප්‍රමාණාත්මකතාව පිළිබඳ මූලධර්මයේ භාවිතය සම්බන්ධයෙන් අදාළ තොරතුරු මෙම වාර්තාව ඉදිරිපත් කරයි. අපගේ අරමුණ වී ඇත්තේ මෙම වාර්තාවේ ඇතුළත් සියලුම තොරතුරු සංස්ථාවෙහි වටිනාකම් නිර්මාණයට බලපාන සාධකවලට අදාළ වන බව සහතික කිරීමයි.

මීට අමතරව, මෙහි විගණන වාර්තාව සමඟ වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ද ඇතුළත් කර ඇත. මූල්‍ය තොරතුරු නියාමන අවශ්‍යතාවලට අනුකූලව ඉදිරිපත් කර ඇති අතර, එලෙස නොවන බවට පැහැදිලිව ප්‍රකාශ කර නොමැති විට, වාර්තාවේ ඇතුළත් මූල්‍ය නොවන තොරතුරු, සංස්ථාව සඳහා පමණක් අදාළ වන අතර, සංස්ථාවෙහි සමස්ත මෙහෙයුම් ආදායම, වත්කම්, සහ සම්පූර්ණ වගකීම් වලින් 90%කට වඩා වැඩි ප්‍රමාණයක් සංස්ථාව සතු බැවින් ඉන් එහි අනුබද්ධිත ආයතනයන් බැහැර කෙරෙයි.

කෙටි, මධ්‍ය කාලීන සහ දිගු කාලීන වටිනාකමක් නිර්මාණය කිරීමේ හැකියාව කෙරෙහි බාහිර පරිසරය සහ විවිධ ප්‍රාග්ධන සමඟ අන්තර්ක්‍රියා බලපා ඇති ආකාරය සැලකිල්ලට ගනිමින්, අපගේ සියලු වාර්තා සඳහා වාර්තාකරණ රාමුවට මඟ පෙන්වනු ලබන්නේ මෙහි ගෙනහැර දක්වා ඇති මූලධර්ම සහ අවශ්‍යතා මගිනි.

අපගේ ආයතනය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගැනීම සඳහා අපගේ ව්‍යාපාරයේ අංශ (පිටු 2 සිට 12 දක්වා), ව්‍යාපාර ආකෘතිය (පිටු 47 සිට 48 දක්වා) සහ අපගේ වටිනාකම් දාමය පුරා ඇති ක්‍රියාකාරකම් සහ බලපෑම් (පිටු 49 සිට 71 දක්වා) සමාලෝචනය කිරීම වැදගත් වේ. මෙම විශ්ලේෂණය සංස්ථාව අගය උත්පාදනය කරන ආකාරය හඳුනා ගැනීමට සහ මෙම අගයට බලපාන සාධක හඳුනා ගැනීමට පදනම ලෙස ක්‍රියා කරයි. වටිනාකමක් නිර්මාණය කිරීමේ අපගේ හැකියාව අපගේ මෙහෙයුම් සන්දර්භය (පිටු 29 සිට 32 දක්වා) සහ ඒ ආශ්‍රිත අවදානම් සහ අවස්ථාවන්ට අපගේ ප්‍රතිචාරය (පිටු 77 සිට 82 දක්වා) මත රඳා පවතී.

තවද, මෙම වාර්තාව අපගේ කාර්ය සාධනය (පිටු 33 සිට 42 දක්වා), නායකත්ව කණ්ඩායම (පිටු 19 සිට 26 දක්වා) සහ පාලන භාවිතයන් (පිටු 83 සිට 93 දක්වා) ඉදිරිපත් කරයි. අමතර තොරතුරු අපේක්ෂා කරන පාර්ශ්වකරුවන් සඳහා, අපගේ වාර්ෂික වාර්තා අවශ්‍ය විය හැකි අතිරේක තොරතුරු ඉදිරිපත් කරයි.

අපගේ විගණන කමිටුව විසින් ඒකාබද්ධ සහතික කිරීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නියමිත වේලාව මත පදනම්ව අධ්‍යක්ෂක මණ්ඩලයට අභ්‍යන්තර සහතිකයක් ලබා දේ. විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව 88 සිට 89 දක්වා පිටුවලඉදිරිපත් කර ඇත.

වාර්තා කිරීමේ මාදිලිය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS / LKAS)

යහපාලනය සඳහා පොදු ව්‍යවසාය මාර්ගෝපදේශ

1971 අංක 28 දරන මුදල් පනත

1961 අංක 28 දරන ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථා පනත

ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ කවුන්සිලය විසින් ප්‍රකාශයට පත් කරන ලද ඒකාබද්ධ වාර්තාකරණ (IR) රාමුව

තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs)

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ හොඳම භාවිතයන් සංග්‍රහය

→ ලෝක වාර්තාකරණ මූලාරම්භයන් (GRI)

විගණකාධිපති විසින් අපගේ 2023 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණන වාර්තාව ලබා දී ඇත. (95 සිට 108 දක්වා පිටු බලන්න).

ස්ථාපිත ක්‍රියා පටිපාටි, මූල්‍ය සහ මූල්‍ය නොවන දත්ත ඇතුළත් අපගේ 2023 ඒකාබද්ධ වාර්තාවේ විශ්වසනීයත්වය පිළිබඳ තහවුරුවක් ලබා දෙයි.

ප්‍රතිචාර

අපගේ වාර්තාවේ අදාලත්වය සහ කියවීමේ පහසුව සම්බන්ධව සංස්ථාව කැප වී ඇත. 2023 වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් වන යෝජනා, විමසීම් සහ ප්‍රතිචාර ඉතා අගය කරනු ලැබේ. ඔබගේ ප්‍රතිචාර පහත ලිපිනයට යොමු කරන්න.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)
අංක 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත
කොළඹ 09.

finadminsec@ceypetco.gov.lk
+94117296147

අපගේ වාර්තාව වෙත ප්‍රවේශය

ප්‍රාග්ධනයන්

- මූල්‍ය ප්‍රාග්ධනය
- නිපැයුම් ප්‍රාග්ධනය
- බුද්ධිමය ප්‍රාග්ධනය
- මානව ප්‍රාග්ධනය
- සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය
- ස්වාභාවික ප්‍රාග්ධනය

පාර්ශවකරුවන්

- පාරිභෝගිකයින්
- ආයෝජකයින්
- නියාමකයින්
- සේවකයන්
- සැපයුම්කරුවන්
- ප්‍රජාව

උපායමාර්ග

- ලාභ වර්ධනය
- මෙහෙයුම් විශිෂ්ටත්වය
- තාක්ෂණික දියුණුව
- මානව ප්‍රාග්ධනයේ ආයෝජනය
- තිරසාර බව
- සැපයුම් දාම කළමනාකරණය

මූල්‍ය සුවිශේෂතා

	සංස්ථාව		සමූහය	
	2023	2022 යලි ප්‍රකාශිත*	2023	2022 යලි ප්‍රකාශිත*
	රු. මි.	රු. මි.	රු. මි.	රු. මි.
මෙහෙයුම් ප්‍රතිඵල				
ආදායම - (දළ)	1,314,829.110	1,154,449.058	1,313,009.330	1,151,908.784
දළ ලාභය/(අලාභය)	162,114.617	39,849.197	156,073.831	33,390.986
මෙහෙයුම් ලාභය/(අලාභය)	89,871.491	(6,210.881)	88,992.297	(7,205.657)
මූල්‍ය ආදායම	17,588.922	37,636.243	17,898.964	37,921.524
විනිමය අනුපාත විචලනය	20,340.297	(529,477.329)	20,340.297	(529,477.329)
වර්ෂය සඳහා වන ලාභය/(අලාභය)	120,346.360	(617,589.391)	119,746.687	(618,330.430)
මුළු විස්තීර්ණ ආදායම	120,203.198	(617,746.069)	119,549.038	(618,553.837)
මූල්‍ය තත්වය				
මුළු වත්කම්	311,436.249	493,901.241	333,009.902	516,379.696
කොටස්	166,802.597	149,303.332	167,685.660	150,161.303
මුදල් හා මුදල් සමාන දෑ	65,424.424	17,483.719	66,627.243	19,588.006
ස්කන්ධය	33,471.259	(86,731.938)	54,962.232	(64,496.582)
ජංගම නොවන වගකීම්	14,225.292	15,038.342	17,944.216	18,650.796
ජංගම නොවන ණය හා ණය ලබාගැනීම්	10,678.38	11,833.49	10,678.38	11,833.49
කෙටි කාලීන ණය ලබාගැනීම්	81,106.708	316,874.548	81,106.708	316,874.548
මුළු ණය ගැනීම්	91,785.09	328,708.03	91,785.09	328,708.03

ප්‍රධාන අනුපාත - සංස්ථාව	2023	2022	2021	2020
දළ ලාභ අනුපාතය	12.33%	3.47%	-0.70%	12.95%
මෙහෙයුම් ලාභාන්තිකය	6.84%	-0.54%	-7.07%	6.49%
ශුද්ධ ලාභ අනුපාතය	9.15%	-53.28%	-13.78%	0.44%
මුළු වත්කම් මත ප්‍රතිලාභ	38.63%	-1.25%	-9.77%	10.42%
කොග පිරිවැටුම් අනුපාතය	6.60	7.43	14.05	8.66
වත්කම් පිරිවැටුම් අනුපාතය	4.06	2.33	1.38	1.57
ජංගම අනුපාතය	0.97	0.77	0.48	0.45
ද්‍රවශීලතා අනුපාතය	0.34	0.51	0.42	0.36
පොළී ආවරණය	12.06	(0.05)	(1.61)	1.62

1,315
(රු. බි.)
ආදායම

162,115
(රු. මි.)
දළ ලාභය


233,220
(රු. මි.)
රජයට දායකත්වය

311,436
(රු. මි.)
මුළු වත්කම්


3,017
(රු. මි.)
ප්‍රාග්ධන ආයෝජන

17,588
(රු. මි.)
මූල්‍ය ආදායම

ආදායම



ආදායම වර්ග



මෙහෙයුම් සුවිශේෂතා

	ඒකකය	2023	2022
විකුණුම්	මී. ලීටර	4,184	4,050
වසර අවසානයේ තොගය	මී. ලීටර	504.462	269.549
මුළු පිරවුම්හල් ගණන	ප්‍රමාණය	990	1,140
සේවකයන්	ප්‍රමාණය	2,219	2,360
කාර්ය මණ්ඩල පිරිවැය	රු. මී.	6,483	6,595
පුහුණු කිරීම් පිරිවැය	රු. මී.	6.40	4.75
සමුච්චිත සේවා පළපුරුද්ද	වර්ෂ	36,290	37,600
මෙහෙයුම් කාල කාර්යක්ෂමතාවය - බොරතෙල් පෙරනය	%	94.28	38.17
පිරිපහදු අපේක්ෂිත හානිය	මෙ.ටො.	9,708	3,034
ජල පරිභෝජනය	මෙ.ටො.	716,899	559,874
පිරිපහදුවේ සෞඛ්‍ය සහ ප්‍රවේසම්			
සේවා කාලය තුළ සිදු වූ අනතුරු	ප්‍රමාණය	2	-
ප්‍රථමාධාර අනතුරු	ප්‍රමාණය	-	-
වාර්තා වූ සුළු ගිනි ගැනීම්	ප්‍රමාණය	-	-
අහිමි වූ දින ගණන	ප්‍රමාණය	30	-


පිරිපහදු මෙහෙයුම්	බොරතෙල් ගැනීම් - මෙ. ටො.	වර්ෂයට දින	කැලැන්ඩර් දිනකට ටොන් ගණන
2023	1,677,034	344	4,595
2022	529,779	140	3,790
2021	1,269,938	314	4,452
2020	1,685,441	362	4,605
2019	1,864,817	357	5,109
2018	1,675,245	327	5,141



4,184

(ලී. මී.)

විකුණුම් ප්‍රමාණය



990

පිරවුම්හල් ගණන



1,677

(000 මෙ.ටො)

බොරතෙල් යෙදවුම්



6,483


(රු. මී.)

කාර්ය මණ්ඩල පිරිවැය



2,083

කාර්ය මණ්ඩලය




1736


347

ස්ථිර කාර්ය මණ්ඩලය

විකුණුම් ප්‍රමාණය



පිරිපහදු නිෂ්පාදන



සභාපතිතුමාගේ පණිවුඩය



ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ 2023 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව එළිදැක්වීමට ලැබීම ගැන මම සතුටු වෙමි.

අපගේ ජාතිය වෙනුවෙන් යළි ස්ථාවර ඉන්ධන සැපයුමක් සාර්ථකව පවත්වා ගැනීමට හැකිවූ බව ඔබ සමඟ බෙදා හදා ගැනීමට ලැබීම මට මහත් සතුටක් ගෙන දෙන කාරණයකි. මෙම වසරේදී, සංස්ථාව මූල්‍ය කාර්ය සාධනයේ නව වර්ධනයකට ළඟා වී ඇති හෙයින් අපි එම කැපී පෙනෙන ජයග්‍රහණය සමරන්නෙමු. ඉහළම ගුණාත්මක ප්‍රමිතීන් ආරක්ෂා කර ගනිමින් අපගේ උපායමාර්ගික මූලපිරීම් මගින් ඉන්ධන සැපයුම සහ බෙදා හැරීම යන දෙකම ක්‍රමයෙන් ඉහළ තලයකට නංවනු ලැබ ඇත. අපගේ කණ්ඩායම් ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල සෑමට භුක්ති විඳීමට හැකි වන බව සහතික කරමින්, ගතික මිලකරණ යාන්ත්‍රණයක් යොදා ගැනීම මගින් පිරිවැය සමතුලිත කිරීමටත් මහජනතාව සඳහා ප්‍රතිලාභ අත් කර දීමටත් අපට හැකි වී තිබේ.

ගෝලීය පරිසරය

විවිධ භූ දේශපාලන අභියෝග මැද, විශේෂයෙන් රුසියා යුක්‍රේන යුද්ධයෙන් නිර්මාණය වූ ආර්ථික බලපෑම් පවතින අතරතුර 2023 වසර ගත කිරීමට අපට සිදු විය. 2022දී සියයට 3.5 ක් ලෙස IMF විසින් පුරෝකථනය කරන ගෝලීය වර්ධනය සියයට 3.1ක් දක්වා වූ පහළ අගයක් සඳහා මන්දගාමී විය. 2022 වර්ෂයේදී දියුණු ආර්ථිකයන්ගේ ආර්ථික වර්ධනය සියයට 2.6 සිට සියයට 1.6 දක්වා පහත වැටී ඇත. නැගී එන වෙළඳපල සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් 2022 වර්ෂයේදී වාර්තා වූ 4.1% වර්ධන ප්‍රතිශතය එලෙසම පවත්වා ගන්නා ලදි.

ගෝලීය තෙල් පරිභෝජනය ආර්ථිකය පුර්ව වසංගත තත්වය කරා ලඟාවීමත් සමඟ 2022 වර්ෂයේදී 99.5 mb/d වූ ගෝලීය ඉන්ධන පරිභෝජනයේ සාමාන්‍යය, 2023 වර්ෂයේ 102.1 mb/d වන, මෙය ඉල්ලුම YoY ලෙස ගත්කල 2.4% වර්ධන වේගයක් පෙන්නුම් කරයි. ගෝලීය ආර්ථිකය ප්‍රකෘතිමත් වීමත් සමඟ ඉල්ලුමේ වැඩිවීමක් ඇති විය; කෙසේ වෙතත්, දැනට පවතින රුසියානු යුක්‍රේන ගැටුම හේතුවෙන් සැපයුම් පාර්ශවයෙන් අභියෝග මතු වූ අතර එය තෙල් මිල ඉහළ යාමට හේතු විය.

WTI බොරතෙල් මිල 2022 දී බැරලයකට ඩොලර් 94.79 සිට 2023 දී ඩොලර් 77.64 දක්වා 18.09% කින් පහත වැටුණි. IMF විසින් පුරෝකථනය කරන ලද පරිදි, 2022 දී භාණ්ඩ මිල (තෙල්) 39.2% කින් වැඩි වූ අතර 2023 දී 16.0% කින් අඩු විය. තෙල් මිල ගණන් 2024 දී 2.3% කින් අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර එය 2025 දී 4.8%ක් වනු ඇත.

දේශීය පරිසරය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත්කරන ලද පරිදි, ශ්‍රී ලංකා දල දේශීය නිෂ්පාදිතය සියයට 7.3 ක හැකිලීමෙන් යථා තත්වයට පත්වෙමින් 2023 වසරේදී වසරින් වසර හැකිලීම 2.3% දක්වා පැමිණ ඇත. වේගවත් උද්ධමනය මැඩලීමේ ක්‍රියා මාර්ග, වැඩිදියුණු කල බාහිර ඔරෝත්තු දීමේ හැකියාව, ශක්තිමත් මූල්‍ය ශේෂයන් සහ සංරක්ෂණ කරන ලද මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය මඟින් මෙම ප්‍රකෘතිය ලභා විය.

2022 සැප්තැම්බරයේදී සර්වකාලීන ඉහළම මට්ටමට ලභා වූ උද්ධමනය වසරක් තුලදී තනි ඉලක්කම් මට්ටමට ආපසු පරිපර්තනය විය. 2022 දෙසැම්බර් මස 57.2% වූ CCPI දර්ශකය 2023 දෙසැම්බර් මස 4% දක්වා පහත වැටුණි.

2022 දෙසැම්බර් මාසයේදී වාර්තා වූ විනිමය අනුපාතිකයට සාපේක්ෂව මාසිකව විනිමය අනුපාතිකය 11.53% කින් වර්ධනය වී ඇත. මහ බැංකු විසින් ක්‍රියාත්මක කරන ලද වෙළඳපල පදනම් කර ගත් විනිමය අනුපාත ප්‍රතිපත්තියක් යටතේ 2023 වසරේදී ශ්‍රී ලංකා රුපියලේ අගය තියුණු ලෙස ඉහළ ගියේය. එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය ඉහළ යෑම සංස්ථාව වෙත ධනාත්මක බලපෑමක් ඇතිකළ අතර ඒ හේතුවෙන් ඉන්ධන පිරිවැය අඩුවීම නිසා සියලු ඛනිජතෙල් නිෂ්පාදන වල මිල අඩුකිරීමටද බලපෑමක් ඇති විය. සංස්ථාව විසින් රු.බිලියන 20.34 ක විනිමය අනුපාත ලාභයක් වාර්තා කර ඇත.

වර්ෂ 2023 දී, රජය විසින් දේශීය ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා මිලකරණ යාන්ත්‍රණය පවත්වා ගෙන යන ලද අතර, මිල ගණන් සකස් කිරීම ජාත්‍යන්තර ඉන්ධන මිලෙහි උච්චාවචනයන් සහ අනෙකුත් සැලකිය යුතු පිරිවැය සාධක සමඟ ගැළපෙන පරිදි සිදු කරන ලදී. ජාත්‍යන්තර ඉන්ධන මිලෙහි වෙනස්කම්, විනිමය අනුපාත සහ අමතර පිරිවැය සංරචක මත පදනම්ව මාසික මිල ගැලපීම් ක්‍රියාත්මක කරන ලදී. මෙහෙයුම් වලින් මුදල් ප්‍රවාහ උත්පාදන සිදුවීම සහ වෙළඳපොලේ ඇමරිකානු ඩොලර් පැවතීම හේතුවෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ඉන්ධන සඳහා වන වත්මන් වගකීම් නියමිත වේලාවට පියවීමට හැකි විය. එපමනක් නොව, 2022 දෙසැම්බර් 31 වන විට පැවති හිඟ ණය රජයේ ශේෂ පත්‍රයට මාරු කිරීම, සංස්ථාව සඳහා වන මූල්‍ය පිරිවැය අඩු කිරීමට දායක විය. සංස්ථාව විසින් රාජ්‍ය ආදායමට දායක වීම, රජයේ මෙහෙයුම්වල පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය වන තිරුබඳු සහ බදු රු. බිලියන 233ක් ගෙවීම මගින් අඛණ්ඩව රාජ්‍ය ආදායමට දායක විය.

තිරසාර අනාගතයක් උදෙසා

පසුගිය දශක හය තුළ අපගේ ආදරණීය මව්බිමේ ඛනිජ තෙල් අංශයේ අසභාය නායකත්වය සංස්ථාව සතු විය. 2022 වර්ෂයේ පැවති අභියෝගාත්මක තත්වයන්ට මුහුණ දීමෙන් පසු, ජාතිය සඳහා ස්ථාවර ඉන්ධන සැපයුමක් ලබා දීම සහතික කරමින් අපි වඩාත්ශක්තිමත් ව පෙරමුණ ගෙන සිටින්නෙමු. අපගේ නිර්මාණාත්මක හැඟීම, කණ්ඩායමක් ලෙස නොසැලී ක්‍රියාකිරීම සහ උපායමාර්ගික දැක්ම, අපගේ පාර්ශවකරුවන්, ගනුදෙනුකරුවන් සහ ප්‍රජාව සමඟ කල්පවත්නා විශ්වාසයක් ගොඩනඟන ඔරොත්තු දීමේ හැකියාවක් පෝෂණය කරමින් අපගේ ප්‍රගතියට පාදක වූ ගාමක බලවේග වී ඇත. අපි එක්ව වර්තමානය සඳහා ඉන්ධන සපයනවා පමණක් නොව තිරසාර හෙටක් සඳහා මාවත සකසමින් ද සිටින්නෙමු.

කාර්ය සාධනය

2022 දී මුහුණ දුන් අභියෝග හමුවේ, සංස්ථාව සිය මෙහෙයුම් මණ්ඩලය හරහා වැඩිදියුණු කරමින් වඩාත් ශක්තිමත් වී ඇත. ක්‍රියාත්මක කර ඇති උපායමාර්ගික මූලාරම්භයන් මගින් බොරතෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදනවල ස්ථාවර ප්‍රවාහයක් සහතික කර ඇති අතර, පිරිපහදුව සුමටව ක්‍රියාත්මක වීමට සහ ආකර්ෂණීය නිමි භාණ්ඩ මෙට්‍රික් ටොන් 1,596,507ක් නිෂ්පාදනය කිරීමට එමඟින් ඉඩ සලසනු ලැබ ඇත.

ජාත්‍යන්තර ඉන්ධන මිල සහ විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම ඇතුළු අනෙකුත් ආර්ථික සාධකවල නිරන්තරයෙන් වෙනස් වන තත්වයට අනුවර්තනය වීමට, සංස්ථාව විසින් දේශීය විකුණුම් මිල සඳහා අවශ්‍ය වෙනස්කම් සිදු කර ඇත. මෙම ක්‍රියාශීලී ප්‍රවේශය, පෙර වසරේ සංස්ථාවේ දළලාභය වන රු. බිලියන 39.8 සිට දළ ලාභය රු. බිලියන 162 දක්වා ආදායමේ කැපී පෙනෙන ඉහළ නැංවීමකට හේතු වී ඇත.

වෙළඳපල ගතිකත්වය සමඟ සම්මුහුර්තව සිටීමට උත්සාහ කිරීමක් ලෙස, පිරිවැය ප්‍රතිලාභ පාරිභෝගිකයින් වෙත ලබා දීම සඳහා පිරිවැය අංගවල උච්චාවචනයන් පිළිබිඹු කරමින් පෙට්‍රල්, ඩීසල් සහ භූමිතෙල් මිල මාසිකව සංශෝධනය කර ඇත. තවද, ආනයනය, නිෂ්පාදනය සහ බෙදාහැරීම සම්බන්ධයෙන් සංස්ථාව විසින් දරනු ලබන වියදම් නිවැරදිව නියෝජනය කිරීම සඳහා දැවි තෙල් ඉන්ධන මිල සඳහාද ගැලපීම් සිදු කර ඇත.

QR පද්ධතිය ක්‍රමානුකූලව ඉවත් කිරීමට සහ පරිභෝජන සීමාවන් ඉවත් කිරීමට තීරණය කිරීමට තුඩු දෙන ජාතිය සඳහා ස්ථාවර ඉන්ධන සැපයුමක් සහතික කිරීම සඳහා වන අපගේ උපාය මාර්ගික ප්‍රයත්නයන් වැදගත් වේ. අපගේ සීමාවන් පුළුල් කිරීමේ උත්සාහයක් ලෙස, සංස්ථාව අපගේ කාර්යයන් විවිධාංගීකරණය කරමින් TPTL සමඟ හවුල්කාරිත්වයකට ද පිවිස ඇත්තෙමු. තවද, අපගේ ඉන්ධන ගබඩා කිරීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා අප විසින් කල්බදු පදනම මත ලබාගෙන ඇති ත්‍රිකුණාමලයේ ටැංකි 24 වෙනුවෙන්ද සැලකිය යුතු ආයෝජනයක් සිදු කර ඇත. මෙම තීරණාත්මක යටිතල පහසුකම් ප්‍රමුඛතම ජාත්‍යන්තර ගබඩා පහසුකමක් බවට පත් කිරීම සඳහා බලාපොරොත්තු සහගත සහ පරිවර්තනීය සංවර්ධන ක්‍රියාකාරකම් මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම ප්‍රයත්නයන් තුලින් අපගේ විශිෂ්ඨත්වය සහ නවොත්පාදනයන් මඟින් ඉහත ප්‍රමිතීන් සපුරාලන ගෝලීය වශයෙන් පිළිගත් කේන්ද්‍රස්ථානයක් පිහිටුවීම සඳහා අපගේ කාර්යක්ෂමතාවය සහ තිරසාරත්වය පිළිබඳ කැපවීම පිළිඹිබු වේ.

තිරසාර මෙහෙයුම්

අපගේ උපාය මාර්ග දැඩි ලෙස තිරසාරභාවය මත පදනම්ව ඇති අතර ඒ අපගේ ව්‍යාපාරික මෙහෙයුම්වල දිගුකාලීන බව සහතික කරනු පිණිස වේ. අපගේ කාර්යයේ සෑම අංගයකටම පරිසර හිතකාමී භාවිතයන් ඇතුළත් කොට, දිගු කාලීනව අපගේ මෙහෙයුම් පෝෂණය කිරීමට අපි දැඩි ලෙස කැපවී සිටිමු. අපගේ මෙහෙයුම්වල සෑම අංශයක්ම හැකිතාක් හරිත හිත්කාමී කිරීමට අප උත්සාහ කරන බැවින් අපගේ ප්‍රවේශයට මේ සියල්ල ඇතුළත් වේ. පරිසර හිතකාමී ඉන්ධන භාවිතය, අවබෝධාත්මක පරිභෝජනය ප්‍රවර්ධනය කිරීම සහ අපගේ මෙම සුන්දර ලෝකය ආරක්ෂා කිරීම සඳහා අපි ප්‍රමුඛ වන්නෙමු.

අප හුදෙක් අප අත්පත් කරගත් කීර්තිය මත උද්දාමයට පත්වය් නොසිටින අතර කෘෂිරසායන නිෂ්පාදන සඳහා වන අපගේ ක්‍රියාවලිය නිරන්තරයෙන් වැඩිදියුණු කරමින්, අප පිරිනමන සේවාවන් ජාත්‍යන්තර තත්ත්වයේ ස්වර්ණමය ප්‍රමිතීන්ට අනුකූල වන බවට වග බලා ගන්නෙමු. අපගේ මෙහෙවරට තිරණාත්මක වන තිරසාරභාවය සඳහා වන අපගේ කැපවීම අපගේ සම්පත් ලබා ගැනීමේ භාවිතයන් තුළින් ද ආලෝකමත් වේ. ප්‍රජාවටත් විශේෂයෙන්ම ආර්ථිකයටත් ප්‍රතිලාභ ලබා දෙන ධනාත්මක සමාජීය ආර්ථික වෙනසක බලපෑමක් ඇති කිරීම අපගේ අරමුණයි.

ඉහළ සිට පහළට, තිරසාරත්වය සඳහා වන අපගේ නොසැලෙන කැපවීම මගින් අප විසින් කරනු ලබන සෑම දෙයක්ම මෙහෙයවනු ලබන අතර එමගින් අපගේ පාර්ශවකරුවන්ට අප කිරීමට උත්සාහ කරන ධනාත්මක බලපෑම පිළිබඳව පූර්ණ විශ්වාසයක් තබා ගැනීමට ඉඩ සලසනු ලැබේ.

අනාගත ඉදිරි දැක්ම


කර්මාන්ත ප්‍රමිතීන්ට අනුගත වන ඉහළම මට්ටමේ ඛනිජ තෙල් නිෂ්පාදන අඛණ්ඩව ලබා දෙන බැවින් ජාතිය සඳහා බලශක්ති සුරක්ෂිතභාවය සහතික කිරීම සඳහා අපගේ නොසැලෙන කැපවීම ඇගයීමට ලක්වේ. 2024 දී, ඛණිජ තෙල් අංශයේ යටිතල පහසුකම් නංවාලීමේ අරමුණින් රුපියල් බිලියන 3.0 ක සැලකිය යුතු ආයෝජනයක් සිදු කර ඇති බව නිවේදනය කිරීමට අපි කැමැත්තෙමු. අපගේ මෙහෙයුම් කාර්යක්ෂම වනවා පමණක් නොව තිරසාර ඒවාද වන අතර, අපගේ බෙදාහැරීමේ ජාලයන් වැඩිදියුණු කිරීම සහ අපගේ ඛනිජ තෙල් නිෂ්පාදන ඒවා වැඩියෙන්ම අවශ්‍ය වන අයට පහසුවෙන් ලබා ගත හැකි බවට සහතික වීම ද අපගේ කාර්යයන් හැටියට අපි සළකන්නෙමු.

දැනට පවතින පිරිපහදුව නවීකරණය කිරීම හෝ නව පිරිපහදුවක් තැනීම මඟින් අතුරු නිෂ්පාදන ඵලදායී ලෙස යොදා ගැනීම සහ පුහුණු ශ්‍රම බලකායක් ජාත්‍යන්තර වෙළඳපලට සැපයීම ඉලක්ක කර ශක්‍යතා අධ්‍යනයක් සිදු කරමින් පවතී. ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි සංකීර්ණයේ සංස්ථාව සතුව පවතින ටැංකි 24 සහ බද්ධ ව්‍යාපාරය සතු ටැංකි 61 පිළිබඳ ගිවිසුම් නව්‍ය ව්‍යාපාරික ආකෘතීන් හරහා නැවත සමාලෝචනය කෙරේ. සුරක්ෂිත ඩිජිටල් පසුබිමක් යටතේ තෙල් නිෂ්පාදන සඳහා විනිවිදභාවයෙන් යුතු ටෙන්ඩර් පටිපාටියක් සහ ප්‍රසම්පාදන ක්‍රියාවලියක් සහතික කරනු ඇත. මෙම මූලපිරීම් සැලසුම් කර ඇත්තේ අපගේ ජාතියේ බලශක්ති අනාගතය සුරක්ෂිත කරන අතරම අපගේ පාර්ශවකරුවන් සඳහා වටිනාකමක් නිර්මාණය කිරීම සඳහා වේ.

ස්තූතිය පිළිගැන්වීම

අපගේ ප්‍රගතියට ඉවහල් වූ අගනා උපදෙස්, මගපෙන්වීම් සහ සහයෝගය ලබා දුන් ගරු අමාත්‍යතුමාට සහ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් සහ නිලධාරීන්ට මගේ හෘදයාංගම ස්තූතිය පුද කිරීමට කැමැත්තෙමි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින මගේ කෘතහස්ත, පළපුරුද්දෙන් සපිරි සගයන්ට ඔවුන් විසින් ලබා දෙන ලද සුවිශේෂී නායකත්වය වෙනුවෙන් මගේ අවංක කෘතඥතාව පළ කිරීමටද කැමැත්තෙමි. කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ මගපෙන්වීම යටතේ ආයතනික කළමනාකාරිත්වයේ උත්සාහයන්, ආර්ථික අවපාතය නිසා ඇතිවූ අභියෝග මධ්‍යයේ වුවද අපගේ ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඉවහල් වූ අතර ඔවුන්ගේ එම නොසැලෙන කැපවීමද මගේ සුවිශේෂ පිළිගැනීමට ලක්වන බව පැවසිය යුතුය. අපට දීප්තිමත් ඉදිරි දැක්මක් ඇති අතර අපගේ දක්ෂ කණ්ඩායමට වර්තමාන අභියෝග අභිභවමින් අනාගතයේදී අපගේ සංවිධානය සමෘද්ධිමත් සහ තිරසාර ව්‍යවසායයක් බවට පත් කිරීමට හැකි වනු ඇති බව මගේ විශ්වාසයයි.



ඩී.ජේ.ඒ.එස් ද එස්. රාජකරුණා
සභාපති
20.11.2024

කළමනාකාර අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය



2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ 2023 වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම මගේ සතුටට කරුණකි.

මෙහෙයුම් පරිසරය

ආර්ථිකයේ යළි පිබිදීමත් සමඟ, සංස්ථාව සිය මූල්‍ය ප්‍රතිඵලවල කැපී පෙනෙන ඉහළ නැංවීමකට තුඩු දුන් සෑම අංශයකම පාහේ සිය කාර්ය සාධනය ඉහළ නැංවීමට සමත් විය. 2023 දී, සංස්ථාව විසින් නැවත වරක් ජාතියට ස්ථාවර ඉන්ධන සැපයුමක් සහතික කර ඇති අතර, එමගින් ප්‍රගතියේ ඉදිරි ගමනට ඇති කැපවීම ශක්තිමත් කිරීමට සත් වී ඇත.


ගෝලීය උද්ධමන අනුපාත 2022 දී එහි උච්චතම අවස්ථාවෙන් අපේක්ෂා කළ වේගයට වඩා වේගයකින් පහත වැටෙමින් පවතින අතර, රැකියා සහ ආර්ථිකය කෙරෙහි වඩා අඩු බලපෑමක් ඇති කරමින් තිබේ. මෙම ප්‍රවණතාවයට සැපයුම් අංශයේ හිතකර වර්ධනයන් සහ අපේක්ෂා කළ උද්ධමන තත්වයන් සාර්ථකව ස්ථාවර කර ඇති මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද දැඩි පියවරයන් නිසා වූවකි. කෙසේ වෙතත්, උද්ධමනය පාලනය කිරීමට ක්‍රියාත්මක කරන ලද ඉහළ පොලී අනුපාත පමණක් නොව ඉහළ ණය මට්ටම් මධ්‍යයේ රාජ්‍ය මූල්‍ය සහය අඩු කිරීම, 2024 දී වර්ධනය අඩු කෙරෙන තරමේ පීඩනයක් එල්ල කරනු ඇතැයි අපේක්ෂා කරන බව හඳුනා ගැනීම ඉතා වැදගත් වේ.

ගෝලීය ආර්ථිකය ප්‍රකෘතිමත් වීමක් දක්නට ඇති බැවින්, ඉල්ලුමේ වැඩි වීමක් සිදුව ඇත එපමණක් නොව, දැනට පවතින රුසියානු-යුක්‍රේන ගැටුම හේතුවෙන් සැපයුම් පාර්ශවයෙන් අභියෝග මතු වී ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස තෙල් මිල ඉහළ ගොස් ඇත. සංස්ථාව විසින් භාවිතා කරන ලද බොරතෙල් (Murban) වල සාමාන්‍ය මිල 16.09% කින් අඩු වූ අතර, 2022 දී ඇමරිකානු ඩොලර් 98.77 ක් වූ බැරලයක මිල 2023 දී බැරලයක මිල ඇමරිකානු ඩොලර් 82.88 දක්වා පහත වැටීම කැපී පෙනේ. මෙම පහත වැටීම රට තුළට ආනයනය කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා වූ පිරිවැය අඩු වීමට හේතු වී ඇත.

මාසය අවසන් වන විට විනිමය අනුපාතිකය 2022 දෙසැම්බරයේ වාර්තා වූ අනුපාතය ට සාපේක්ෂව 11.53% ක වර්ධනයවීමක් අත්විඳ ඇත. එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ මෙම ශක්තිමත් වීම සංස්ථාවට හිතකර බලපෑමක් ඇති කර ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ඛනිජ තෙල් නිෂ්පාදන පිරිවැය අඩු වී ඉන්ධන මිල අඩු වීමට හේතු වී ඇත. සංස්ථාව විසින් 2022 වර්ෂයේදී අත් විඳි රුපියල් බිලියන 529.47 ක අලාභයට සාපේක්ෂව රු. බිලියන 20.34 ක විනිමය අනුපාත ලාභයක් වාර්තා කර ඇත.

ගෝලීය ඉන්ධන මිලෙහි උච්චාවචනයන් සහ අනෙකුත් අත්‍යවශ්‍ය පිරිවැය සාධකවලට අනුගත වෙමින් දේශීය ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා මිල නියම කිරීමේ උපායමාර්ගය ක්‍රියාත්මක වේ. සෑම මසකම, ජාත්‍යන්තර ඉන්ධන පිරිවැය, මුදල් විනිමය අනුපාත සහ වෙනත් විවිධ වියදම්වල අඩු වැඩි වීම් පිළිබිඹු වන පරිදි මිල ගණන් සකස් කරනු ලැබේ.

දේශීය මිල සංශෝධන



අපගේ මෙහෙයුම්

පිරිපහදුව වාසිදායක ආන්තිකයක් සහිතව මෙහෙයුම් පවත්වා ගත් අතර, ලාභදායීත්වයට ධනාත්මක ලෙස දායක වන සේ මෙහෙයුම් ප්‍රතිඵලවල සමස්ත දියුණුවට මග පාදමින් සියලු අංශ වැඩිදියුණු කළ මූල්‍ය කාර්ය සාධනයන් පෙන්නුම් කර ඇත. විකුණුම්වල සාමාන්‍ය වර්ධනයක් සමඟින් අගෝස්තු මාසය දක්වා QR පද්ධතිය හරහා පරිභෝජනය සීමා කිරීම, පූර්ව වර්ෂය වූ 2022 පෙර වසරට සාපේක්ෂව 3.31% ක සමස්ත විකුණුම් වර්ධනයකට ළඟා විය. ආදායම රු. බිලියන 1,154.4 සිට රු. බිලියන 1,315 දක්වා වැඩිවිය. මීට අමතරව, වසර පුරාවට ජාත්‍යන්තර ඉන්ධන මිලෙහි කැපී පෙනෙන අඩුවීමක් ඇති වීම රජය විසින් මාසිකව දේශීය විකුණුම් මිල ගණන් යළි සකස් කිරීමට හේතු වී තිබේ.

අවශ්‍ය උත්ප්‍රේරක පුනර්ජනනය සඳහා කෙටිකාලීන වසා දැමීමක් සිදු කිරීම හැර බාධාවකින් තොරව මෙහෙයුම් සඳහා පහසුකම් සලසමින් CPC විසින් 2023 වර්ෂය පුරාවට පිරිපහදුව වෙත ස්ථාවර බොරතෙල් සැපයුමක් ඵලදායී ලෙස පවත්වාගෙන යන ලදී. වසර තුළ, පවතින බොරතෙල් සැපයුම හේතුවෙන් පිරිපහදුව විසින් බොරතෙල් මෙට්‍රික් ටොන් 1,677,033ක් පිරිසැකසුම් කර ඇති අතර, එය පෙර වසරට සාපේක්ෂව 217% ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

2023 දී ප්‍රවාහන අංශයේ ආදායම රු. බිලියන 902.77 සිට රු. බිලියන 959.30 දක්වා ඉහළ ගිය අතර මෙය පෙර වසරට සාපේක්ෂව 6% ක වර්ධනයක් පිළිබිඹු කරයි. බලශක්තිය සඳහා වූ ඉල්ලුම ඉහළ ගිය අතර, පෙර වසරට සාපේක්ෂව සැපයුමේ 35% ක වැඩිවීමක් වර්තා ගනිමින් සංස්ථාව විසින් බලශක්ති උත්පාදනය සඳහා ස්ථාවර ඉන්ධන සැපයුමක් ඵලදායී ලෙස පවත්වාගෙන ගිය බව අවධාරණය කිරීම වැදගත්ය. මෙම තිරසාර සැපයුම 2022 ට සාපේක්ෂව 41% ක කැපී පෙනෙන ආදායම් වර්ධනයකට දායක විය.

සංචාරක ව්‍යාපාරයේ සහ ආර්ථික ක්‍රියාකාරකම්වල ප්‍රගතිය, තිරසාර සැපයුමක් සමඟින්, 2022 වසරට සාපේක්ෂව ඉන්ධන සැපයුමේ 53.6% ක වැඩිවීමක් ඇති වී තිබේ. මෙය ආර්ථික පුනර්ජීවනය සහ සංචාරක ප්‍රවර්ධනය සඳහා අපගේ කැපවීම අවධාරනය කරයි. ගුවන් සේවා අංශයේ ආදායම විකුණුම් පරිමාවන් සහ විකුණුම් මිලෙහි උච්චාවචනයන් මගින් මෙහෙයවනු ලැබ වසරින් වසර 47.8% කින් ඉහළ ගොස් එය රු. බිලියන 121.5 දක්වා ළඟා වී ඇත. මෙම වාර්තාව මඟින් කාර්මික භූමිතෙල්, කර්මාන්ත අංශය වෙත දැවිතෙල්, ලිහිසි තෙල් සහ ද්‍රාව්‍ය (SBP) පුද්ගලික අංශයට විකිණීමෙන් ලැබෙන ආදායම විස්තර කරයි. කෙසේ වෙතත්, කර්මාන්තයෙන් ලැබෙන සමස්ත ආදායම පහත වැටීමක් අත්විඳ ඇති අතර, එය පෙර වසරේ රු. බිලියන 21.1 සිට 2023 දී රු. බිලියන 18.8 ක් දක්වා වූ අඩුවීමකි.

සැපයුම් දාමය තුළ ඇති අභියෝග කැපී පෙනෙන දියුණුවක් පෙන්නුම් කර ඇති අතර, ඒ නිසා පිරිපහදුවට බාධාවකින් තොරව මෙහෙයුම් පවත්වාගෙන යාමට හැකි වී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, එය භූමිතෙල් සඳහා වූ සම්පූර්ණ ඉල්ලුම සාර්ථකව සපුරා ඇති අතර ද්‍රව පෙට්‍රෝලියම් වායුව (LPG) සැපයුමේද සැලකිය යුතු වැඩි වීමක් විදහා දක්වයි.

භූමිතෙල් ඉල්ලුමේ අඩුවීමක් දක්නට ලැබුණද, මෙම අංශයේ ආදායම 71.2% කින් ඉහළ ගොස් මූල්‍ය වර්ෂය තුළ රු. බිලියන 32.2 කට ළඟා විය. මීට අමතරව, කෘෂි රසායන අංශයේ ආදායම පවත්නා වර්ෂයේදී රු. බිලියන 1.6 ක් වූ අතර, එය 2022 දී වාර්තා වූ රු. බිලියන 0.29 ක්ට වඩා රු. බිලියන 1.32 ක කැපී පෙනෙන වැඩිවීමකි.

උපායමාර්ගික අවධානය

නව තරඟකරුවන් වෙළඳපලට අවතීර්ණ වීමත් සමඟ, ශක්තිමත් වෙළඳපල පැවැත්මක් සහතික කිරීම සඳහා වෙළඳපල, මෙහෙයවන ප්‍රතිපත්ති රජය විසින් සකස් කර ඇත. වටිනාකම් උත්පාදනය ඉහළ නැංවීම සහ අනාගතය සඳහා මෙහෙයුම්වල තිරසාර බව සහතික කිරීම අරමුණු කරගත් දිගුකාලීන මූලාරම්භයන් කෙරෙහි දැඩි අවධානයක් යොමු කෙරේ. මේ අතරතුර, කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සහ ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් ලබා ගැනීමේ හැකියාව මනා කළමනාකාරිත්වයකින් පවත්වා ගැනීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් කළමනාකරණය හොඳින් සුසර කර ජාතියට අවශ්‍ය ස්ථාවර ඉන්ධන සැපයීමක් සහතික කරයි.

ආයෝජන

TPTL වෙත අවධානය යොමු කරන අතරම සංස්ථාව ලංකා IOC සමඟ එක්ව බද්ධ ව්‍යාපාරයක් සඳහා වන ආයෝජනය කටයුතු සිදු කරයි. මේ වන විට TPTL විසින් ත්‍රිකුණාමලය ටැංකි සමූහයේ කල්බදු මත ලබාගත් ටැංකි 61 ක් කළමනාකරණය කරන අතර ඒවා ඔවුන්ගේ මෙහෙයුම් සඳහා ඉතා වැදගත් වේ. බනිජ තෙල් අංශයේ ඉදිරියෙන්ම සිටින සමාගමක් ලෙස, සංස්ථාව තමන්ගේ මෙහෙයුම්වල කාර්යක්ෂමතාව සහ ඵලදායී බව ඉහළ නැංවීම සඳහා රුපියල් බිලියන 3.05ක සැලකිය යුතු මුදලක් ආයෝජනය කර ඇත. ත්‍රිකුණාමලයේ ටැංකි සමූහයෙන් කල්බදු පදනම මත ලබා ගත් ටැංකි 24 වැඩිදියුණු කිරීමට අප ක්‍රියාශීලීව කටයුතු කරමින් සිටින අතර, එමගින් අපගේ ගබඩා කිරීමේ හැකියාව ඉහළ නැංවීමට සම්පත් ආයෝජනය කරමින් පවතී.

සංස්ථාව ගෝලීය මිණුම් සලකුණු සපුරාලන පිරිපහදු ව්‍යාපෘති ආරම්භ කිරීමේ මෙහෙයුමක යෙදී සිටින අතර, මේ සියල්ල, හොඳින් ක්‍රියාත්මක වන යන්ත්‍රයක් මෙන් සහතික කෙරෙයි. අපේ කාර්ය සැලැස්ම තිරසාර බව අවධාරනය කරන අතර එය අපගේ ක්‍රියාකාරකම්වල හරයට එක් කර ඇත්තෙමු. අපි අපගේ අඛණ්ඩතාව, කීර්තිය සහ රෙගුලාසිවලට අනුකූල වීමට ඉහළම සැලකිල්ලක් දක්වන්නෙමු. ධනාත්මක කාර්මික සබඳතා වර්ධනය කිරීම සහ සෞඛ්‍ය සහ ආරක්ෂිත ප්‍රමිතීන් ඉහළ නැංවීම සඳහා ස්ථීර කැපවීමකින් යුතුව ජාතියේ සංවර්ධන අභිලාෂයන් ඉදිරියට ගෙන යාම සඳහා අපගේ කාර්යභාරය ඉටු කිරීමට අපි කැපවී සිටිමු.

ඉදිරි දැක්ම

අනාගත තරඟකාරී වෙළඳපොළට සාර්ථකව මුහුණ දීම සඳහා මූලිකරණ උපායමාර්ගය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම ප්‍රධාන වන අතර එය සංස්ථාව මූල්‍යමය වශයෙන් ශක්තිමත්ව පවතින බවත් ඉදිරි සංවර්ධන කටයුතු සඳහා සූදානම් බව සහතික කරයි.

අගය කිරීම

බනිජ තෙල් නීතිගත සංස්ථාවේ මෙහෙයුම් සඳහා ස්වකීය නොසැලෙන කැපවීම සම්බන්ධයෙන් සභාපතිතුමාට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට මාගේ හෘදයාංගම ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමි. අන්තර්-සංවිධාන සබඳතාවයන් සැලකිය යුතු ලෙස වැඩිදියුණු කර අපගේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පහසුකම් සලසා ඇති අපගේ සුවිශේෂී ශ්‍රම බලකාය විසින් ආරවුල් විසඳීමේදී සහ හැකියාවන් ප්‍රශස්ත කිරීමේදී මාගේ ආයතනික සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව කණ්ඩායම දරන උත්සාහය ද මම අගය කිරීමට කැමැත්තෙමි.

තවද, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය, මහ බැංකුව, අපගේ බැංකුකරුවන්, විගණකවරුන්, ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන් සහ අනෙකුත් සියලුම පාර්ශ්වකරුවන්ට ඔවුන්ගේ නොසැලෙන සහයෝගය වෙනුවෙන් මාගේ බලවත් ප්‍රශංසාව ප්‍රකාශ කරමි.



ආචාර්ය එන්.කේ.එම්.සී. නෙත්තිකුමාරගේ
කළමනාකාර අධ්‍යක්ෂ
20.11.2024

අධ්‍යක්ෂ මණ්ඩලය







ඩී.ජේ.ඒ.එස් ද එස්. රාජකරුණා මහතා - සභාපති

රාජකරුණා මහතා 2024.09.24 දින ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපති ලෙස පත් කරන ලද අතර ඔහු අපගේ අනුබද්ධිත ආයතනය වන ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමහි ද සභාපතිවරයා වේ.
රාජකරුණා මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් කාර්මික රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය ද කැලණිය විශ්වවිද්‍යාලයෙන් රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ශුද්ධ ගණිතය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය ද ලබා ශක්තිමත් අධ්‍යයන පසුබිමකට හිමිකම් කියයි. මෙම ශක්තිමත් අධ්‍යාපනික පදනම, පුළුල් අත්දැකීම් සමඟින්, ආරක්ෂාව, කාර්යක්ෂමතාව සහ නවෝත්පාදනය කෙරෙහි අවධානය යොමු කරමින් සංකීර්ණ මෙහෙයුම් අධීක්ෂණය කිරීමට ඔහුට ඇති හැකියාවට පිටිවහලක් ලබා දෙයි.
රාජකරුණා මහතා තෙල් හා ගෑස් කර්මාන්තයේ, විශේෂයෙන් පර්යන්ත මෙහෙයුම් සහ කළමනාකරණය පිළිබඳ පුළුල් විශේෂඥ දැනුමක් ඇති කීර්තිමත් ප්‍රමුඛයෙකි. ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි(CPSTL) දශක දෙකකට අධික කාලයක් කැපවූ සේවාව තුළින් මෙහෙයුම් විශිෂ්ටත්වය කරා මෙහෙයවීමට සහ සංවිධානයේ සාර්ථකත්වය හැඩගැස්වීමට ඔහු මූලික වී ඇත.
ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි ඔහුගේ සේවා කාලය පුරාවටම, රාජකරුණා මහතා මුතුරාජවෙල පර්යන්තයේ පර්යන්ත කළමනාකරු සහ නියෝජ්‍ය මෙහෙයුම් කළමනාකරු ඇතුළු ප්‍රධාන නායකත්ව තනතුරු හොබවා ඇත. මෙම කර්තව්‍යයන්හි නියැලෙමින්, ඔහු ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් ගබඩා කිරීමේ සහ බෙදාහැරීමේ යටිතල පහසුකම්වල ආරක්ෂිත සහ කාර්යක්ෂම කළමනාකරණය සහතික කළ අතර, එමගින් රටේ බලශක්ති සුරක්ෂිතතාව සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දුන්නේය.ක්‍රියාශීලි සහ ක්ෂණික උකහාගන්නෙකු ලෙස, රාජකරුණා මහතා ස්වකීය තාක්ෂණික සහ කළමනාකරණ විශේෂඥතාව අඛණ්ඩව වැඩිදියුණු වන ප්‍රකට කර්මාන්ත ප්‍රවණතා සමඟ සමීපව කටයුතු කරයි. ඔහුගේ සුවිශේෂී තීරණ ගැනීමේ කුසලතාවයන් සහ බාධක වලට සන්සුන්ව මුහුණ දීමේ හැකියාව මගින් ඔහුට සංකීර්ණ අභියෝග ජය ගැනීමටත්, බලපෑමකාරී ප්‍රතිඵල ලබා දීමටත් හැකියාව ලැබී ඇත.
සහයෝගී නායකත්ව විලාසය සඳහා ප්‍රකට ඔහු, ස්වකීය කණ්ඩායම් සාමාජිකයින්ගේ සංවර්ධනය සහ වෘත්තීය සාර්ථකත්වය යන දෙකටම ප්‍රමුඛත්වය දෙන කණ්ඩායම් වැඩ සහ අන්‍යෝන්‍ය ගෞරවය පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කරයි. අඛණ්ඩ වැඩිදියුණු කිරීම්, පාරිසරික භාරකාරත්වය සහ දැනුම හුවමාරු කර ගැනීම සඳහා ගැඹුරු කැපවීමක් සහිත රාජකරුණා මහතා ශ්‍රී ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රයේ කැපී පෙනෙන චරිතයකි. කලාපයේ බලශක්ති ක්ෂේත්‍රයේ ප්‍රධාන නායකයෙකු හැටියට . CPSTL සහ CPC ස්ථානගත කරමින්, ඔහුගේ නායකත්වය සහ කැපවීම තුළින් සංස්ථාවේ ප්‍රගතියට සහ නවෝත්පාදනයට අනුබල දීම අඛණ්ඩව සිදුවේ.



ආචාර්ය එන්.කේ.එම්.සී. නෙත්තිකුමාරගේ මහතා - කළමනාකාර අධ්‍යක්ෂ

ආචාර්ය නෙත්තිකුමාරගේ මහතා 2024.09.24 දින ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස පත් කරන ලදී. ඔහු ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙසද කටයුතු කරයි.
ආචාර්ය නෙත්තිකුමාරගේ යනු විවිධ ක්ෂේත්‍ර වල ශාස්ත්‍රීය සුදුසුකම් සහ පුළුල් කර්මාන්ත අත්දැකීම් සම්මිශ්‍රණයක් සහිත කීර්තිමත් වෘත්තිකයෙකි. ඔහු මැලේසියාවෙන් කළමනාකරණය/ව්‍යාපාර පිළිබඳ ආචාර්ය උපාධියක් ද, එක්සත් රාජධානියෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක්ද, මොරටුව විශ්වවිද්‍යාලයෙන් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධියක් ද ලබා ඇත. ඊට අමතරව, ඔහු ස්වකීය බහුවිධ විශේෂඥතාව පිළිබිඹු කරමින් දේශපාලන විද්‍යාව, මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව සහ පරිගණක පාදක ගණකාධිකරණය පිළිබඳ වැනි බහුවිධ ඩිප්ලෝමා ලබා ඇත.
සීමාසහිත CodeGen International (PVT) හි උපදේශක, SLO-GAL Energy DMCC ඩුබායි හි දේශීය නියෝජිත / ගෝලීය වෙළඳ මෙහෙයුම් ප්‍රධානි, LGBL (Laugfs/Petredec/ Klean-heat) හි සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, Edna සමූහයේ නියෝජ්‍ය ප්‍රධාන විධායක නිලධාරී සහ Coca-Cola Sabco හි ව්‍යාපාර ඒකක උපදේශක සහ ව්‍යාපෘති කළමනාකරු,වැනි ගතික වෘත්තීය ජීවිතයක් පුරා විහිදුණු භූමිකාවන් සහිතව, ආචාර්ය මයුර මහතා, ව්‍යාපාර සංවර්ධනය, ක්‍රියාවලි වැඩිදියුණු කිරීම සහ තාක්ෂණික ව්‍යාපෘති නායකත්වය පිළිබඳ දැනුම සම්භාරයක් සහිතව අප සමඟ සම්බන්ධව සිටී.
ඔහුගේ විශේෂඥතාවට පර්යේෂණ සහ සංවර්ධන, සැපයුම් දාම කළමනාකරණය, ඉංජිනේරු සැලසුම්, නිෂ්පාදන සංවර්ධනය, සහ ESG අනුකූලතා ඇතුළු පුළුල් පරාසයක් අන්තර්ගත වේ. ඔහු ඉංජිනේරු, ප්‍රසම්පාදන, අති නවීන නිෂ්පාදන පහසුකම් ඉදි කිරීම, LPG / පෙට්‍රෝ රසායනික පර්යන්ත සහ නැව් ජැටි ඉදිකිරීමට නායකත්වය දී ඇත. ආචාර්ය මයුර මහතා විසින් CodeGen හි ගණුදෙණුකරුවන් සඳහා AI අනුගත කිරීම ඇතුළු එලදායිතා සංවර්ධන සහ ඩිජිටල් පරිවර්තන ව්‍යාපෘති සඳහා ද මූලිකත්වය ගෙන ඇත.
ඔහුගේ ශක්තිමත් ජාලකරණ සහ බහු පාර්ශ්වකරුවන් කළමනාකරණය කර ගැනීමේ කුසලතා නිසා යුනිලීවර්, බ්‍රිතාන්‍ය ගුවන් සේවය සහ ඔරකල් ඇතුළු කීර්තිමත් ගෝලීය පාරිභෝගික පදනමක් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට සහ ටෝටල්, විටෝල් සහ එක්සොන් මොබිල් වැනි බලශක්ති අංශයේ දැවැන්තයන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමටද ඔහුට හැකි වී තිබේ. ජාත්‍යන්තර ව්‍යාපාර සඳහා ඔහුගේ දායකත්වය නවෝත්පාදනය සහ මෙහෙයුම් විශිෂ්ටත්වය මෙහෙයවීමට ඔහුට ඇති හැකියාව ඉස්මතු කර පෙන්වයි.



ආර්.එම්. එස්.පී.එස්. බණ්ඩාර මහතා - අධ්‍යක්ෂක

බණ්ඩාර මහතා 2024.10.03 දින බනිජ තෙල් නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂවරයා ලෙස පත් විය.
බණ්ඩාර මහතා ශ්‍රී ලංකාවේ බාහිර සම්පත් කළමනාකරණය කිරීම සහ ජාතික සංවර්ධන මුලපිරීම් ඉදිරියට ගෙන යාම සම්බන්ධයෙන් පුළුල් පළපුරුද්දක් ඇති ඉහළ දක්ෂ රාජ්‍ය පරිපාලකයෙක් සහ සංවර්ධන ආර්ථික විද්‍යාඥයෙකි. දැනට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ බහුපාර්ශ්වික සහ තාක්ෂණික සහාය අංශයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස හෙතෙම කටයුතු කරයි.

ඔස්ට්‍රේලියාවේ Flinders විශ්වවිද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක්, කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත්උපාධියක් සහ සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත්උපාධි ඩිප්ලෝමාවක් ලබා ඇති බණ්ඩාර මහතාගේ අධ්‍යයන පදනම ශක්තිමත් එකකි. කැලණිය විශ්වවිද්‍යාලයෙන් ගණිතය විෂයෙහි විද්‍යාවේදී (ගෞරව) උපාධියක් ලබා ඇති ඔහු, එමගින් ආර්ථික සැලසුම්කරණයේ සහ ප්‍රතිපත්ති සම්පාදනයේ ඔහුගේ භූමිකාවන් සඳහා අත්‍යවශ්‍ය විශ්ලේෂණ කුසලතාවලින් සන්නද්ධව සිටී.

ඔහුගේ වෘත්තීය ගමනේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ මැදපෙරදිග සහ දකුණු ආසියාව සඳහා අධ්‍යක්ෂ, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ බැංකු රක්ෂණ සහ ධීවර අධ්‍යක්ෂ සහ සාර්ක් සහ මැදපෙරදිග කළාපයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වැනි ප්‍රධාන නායකත්ව භූමිකාවන් ඇතුළත්ය. මීට අමතරව, ඔහු ලෝක බැංකු අංශයේ සහ ජාතික අයවැය අංශයේ සහකාර අධ්‍යක්ෂවරයා ලෙස ද කටයුතු කර ඇත.

බණ්ඩාර මහතා තම පරිපාලන භූමිකාවෙන් පරිබාහිර වූ තේ පර්යේෂණ ආයතනය, සමාජ ආරක්ෂණ මණ්ඩලය, ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය, ශ්‍රී ලංකා වැවිලි සංස්ථාව සහ සුනිත්‍ය බලශක්ති අධිකාරිය ඇතුළු විවිධ ප්‍රධාන මණ්ඩලවලද සේවය කර ඇත. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ කොමිෂන් සභා සාමාජිකයෙකු, පාලි සහ බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෙකු සහ පරමාණුක බලශක්ති මණ්ඩලයේ නිරීක්ෂකයෙකු ලෙස ඔහුගේ දායකත්වය ප්‍රතිපත්තිමය නවෝත්පාදන සහ තිරසාර සංවර්ධනය සඳහා වූ ඔහුගේ කැපවීම පිළිබිඹු කරයි.



ඒ.ජේ.එල්. විමලරත්න මහතා - අධ්‍යක්ෂ

විමලරත්න මහතා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂවරයා ලෙස 2024.09.24 දින පත්වීම් ලැබීය.

ඔහු මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය විගණනය සහ නායකත්වය පිළිබඳ පුළුල් පළපුරුද්දක් ඇති දක්ෂ මූල්‍ය වෘත්තිකයෙකි. දැනට ඔහු The One Transworks Square (Pvt) Ltd හි මූල්‍ය ප්‍රධානියා ලෙස සේවය කරයි.

ඔහු SLIDA වෙතින් රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා ඇති අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අවසන් පරීක්ෂණය සමත් වූවෙකි. මෙන්ම, ඔහු සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරිවරයෙකු, ශ්‍රී ලංකා ගිණුම්කරණ වෘත්තීය ශිල්පීන්ගේ සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු සහ ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ සාමාජිකයෙකු ද වේ.

ජාතික විගණන කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපතිවරයකු ලෙසත් විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරිවරයකු ලෙසත් සේවය කිරීම ඇතුළුව රාජ්‍ය විගණනයේ කැපී පෙනෙන භූමිකාවන් විමලරත්න මහතාගේ වෘත්තීය ජීවිතය පුරා විහිදී ඇත. එම ආයතනයේම විගණන පරීක්ෂකවරයෙකු ලෙස කටයුතු කළ කාලය තුළ ඔහුගේ මූලික විශේෂඥතාව වැඩිදියුණු විය. මෙම භූමිකාවන් රාජ්‍ය මූල්‍ය, පාලනය සහ වගවීම පිළිබඳ ඔහුගේ ගැඹුරු අවබෝධය අවධාරනය කරයි.



එම්.කේ. ගරුසිංහ මහතා - අධ්‍යක්ෂ

ගරුසිංහ මහතා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂවරයා ලෙස පත් කරන ලද්දේ 2024.09.24 දින දීය.

ගරුසිංහ මහතා, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ (CPC) වසර 14ක ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව කර්තව්‍යයන්ද ඇතුළුව වසර 27කට අධික විශේෂඥ දැනුමක් සහිත නාවික හා ඛනිජ තෙල් කර්මාන්ත පිළිබඳ ඉහළ පළපුරුද්දක් දරන වෘත්තිකයෙකි. ඔහු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ සහ සැපයුම් දාම) ලෙස 2023 සැප්තැම්බර් මාසයේදී විශ්‍රාම ගියේය.

ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් ද, ස්වීඩනයේ ලෝක සමුද්‍ර විශ්වවිද්‍යාලයෙන් සමුද්‍රීය කටයුතු (වරාය කළමනාකරණය) පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ද, කොළඹ විශ්වවිද්‍යාලයෙන් ශුද්ධ හා ව්‍යවහාරික ගණිතය හා රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ද ලබා ඇත. ඔහු වරලත් නැව් තැරැව්කරුවෙකුද වන අතර වරලත් නැව් තැරැව්කරුවන්ගේ කළමනාකරණ ආයතනයේ (MICS, UK) සාමාජිකයෙකු මෙන්ම ශ්‍රී ලංකා සැපයුම් සහ ද්‍රව්‍ය කළමනාකරණ ආයතනයේ (MISMM) ආයතනයේ සාමාජිකයෙක් ද වේ.

බොරතෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, සංවිධානය කිරීම සහ පාලනය කිරීම ඔහුගේ පුළුල් අත්දැකීම්වලට ඇතුළත් ය. ගරුසිංහ මහතා සංස්ථාවේ තොග සමාලෝචන කමිටු තුළ සිදු කළ ක්‍රියාකාරී සහභාගීත්වය තුළින් කොටස් කළමනාකරණයේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කර ඇත. ඔහු නෞවි ටැංකි හා ටග් කුලියට ගැනීමේ කාර්යයෙහි හසල දැනුමක් ඇත්තෙකුද වන අතර මත්තල ගුවන් තොටුපළේ ඉන්ධන හයිඩ්‍රන්ට් පද්ධතිය වැනි යටි තැඹුරු ව්‍යාපෘති සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත.

ගරුසිංහ මහතාගේ වෘත්තීය ජීවිතය ඩෙන්මාර්කය, ප්‍රංශය, නෙදර්ලන්තය, මෝල්ටා සහ එක්සත් රාජධානිය යන රටවල විශේෂිත පාඨමාලා මගින් ලබාගත් ජාත්‍යන්තර නිරාවරණයෙන් පොහොසත්, සැපයුම්, සැපයුම් දාම කළමනාකරණය, වරාය මෙහෙයුම් සහ නාවික කර්මාන්ත කටයුතු කෙරෙහිද අවධානය යොමු කරයි. ඔහු ජාත්‍යන්තර සමුද්‍ර සංවිධානයේ (IMO) ජාත්‍යන්තර තෙල් දූෂණ වන්දි (IOPC) අරමුදල් රැස්වීම් වැනි ගෝලීය සංසදවලදී ශ්‍රී ලංකාව නියෝජනය කර ඇති අතර සංස්ථාව වෙනුවෙන් ජාත්‍යන්තර බෙරුම්කරණ නඩු හැසිරවීමද සිදු කර ඇත.



එම්. එම්. ක්‍රිස්ටි ඩොස් මහතා - අධ්‍යක්ෂ

ක්‍රිස්ටි ඩොස් මහතා 2024.09.24 දින සංස්ථාවේ අධ්‍යක්ෂවරයා ලෙස පත් කරන ලදී.

ක්‍රිස්ටි ඩොස් මහතා පුළුල් පරාසයක සිවිල් නීති කටයුතු පිළිබඳ විශේෂඥතාවක් ඇති දශකයකට වැඩි පළපුරුද්දක් ඇති දක්ෂ නීතිඥවරයෙකි. ක්‍රිස්ටි ඩොස් මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිධාරියෙක් වන අතර ඔහු බණ්ඩාරනායක ජාත්‍යන්තර අධ්‍යයන මධ්‍යස්ථානයෙන් ජාත්‍යන්තර සබඳතා පිළිබඳ සහතිකයක් ද ලබා ඇත. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ LLM අපේක්ෂකයෙක් වන අතර ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලයේ අධ්‍යාපනය ලබා ඇත.

ඉඩම් නීතිය, බෙදුම් නීතිය, මුදල් අයකර ගැනීම්, වාණිජ නීතිය, පවුල් නීතිය, කම්කරු නීතිය, පරිපාලන නීතිය සහ මූලික අයිතිවාසිකම් ඇතුළු ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ඔහුට පුළුල් විශේෂඥ දැනුමක් තිබේ. ඔහු දිසා අධිකරණ, සිවිල් අභියාචනාධිකරණය, මහාධිකරණය, වාණිජ මහාධිකරණය, අභියාචනාධිකරණය සහ ශ්‍රේෂ්ඨාධිකරණය යන අධිකරණවල කෘත්‍යයන්ට නිතිපතා සහභාගි වේ. ස්වකීය ප්‍රබල සන්නිවේදන, සංවිධානාත්මක සහ අන්තර් පුද්ගල කුසලතා සඳහා ප්‍රසිද්ධියක් දරන ක්‍රිස්ටි ඩොස් මහතා, කණ්ඩායම් ක්‍රියාකාරකම් සහ සුවිශේෂී නීති සේවා සැපයීමෙහි ලා විශිෂ්ටයෙකි.

සංස්ථායික කළමනාකාරිත්වය

2023 .12.31 දිනට සංස්ථායික කළමනාකාරීත්වය පිළිබඳ විස්තර පහත දක්වා ඇත.



එල්. ජී. එම්. ආර්. පෙරේරා මහතා
වැඩබලන පිරිපහදු කළමනාකරු

පෙරේරා මහතා, මොරටුව විශ්ව විද්‍යාලයෙන් ඉලෙක්ට්‍රොනික් සහ විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා ඇත.

1992 වසරේදී සංස්ථාවේ උපකරණ ඉංජිනේරුවරයෙකු වශයෙන් ඔහු සිය වෘත්තීය ජීවිතය ආරම්භ කරන ලදී. මෙහෙයුම් පාලන උපකරණ ක්ෂේත්‍රයේ වසර 29කට වඩා අධික අත්දැකීම් සම්භාරයක් ඔහු සතු අතර උපකරණ දෙපාර්තමේන්තුවේ විවිධ තනතුරු ගණනාවක් හොබවා ඇත. ඔහු නියෝජ්‍ය පිරිපහදු කළමනාකරු යන ධුරය හොබවමින් පිරිපහදු අංශයේ ඉලෙක්ට්‍රොනික්, උපකරණ සහ ද්‍රව්‍ය අංශයේ ප්‍රධානියා වශයෙන් කටයුතු කරනු ලැබීය. වර්තමානයේ, වැඩබලන පිරිපහදු කළමනාකරු යන ධුරය දරමින් සමස්ත පිරිපහදු කළමනාකරණය සම්බන්ධයෙන් වගකීම් දරනු ලැබේ.



ඩබ්ලිව්.එම්.කේ.ආර්.බී. වික්‍රමසිංහ මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි)

වික්‍රමසිංහ මහතා පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධියක් ද, කොළඹ විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක්ද හිමි කරගෙන ඇත. ඔහු ශ්‍රී ලංකා රසායනික විද්‍යා ආයතනයේ සාමාජිකයෙකු මෙන්ම ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ සහතිකලත් සාමාජිකයෙකු ද වේ. මීට අමතරව, ප්‍රසිද්ධ දේශීය සහ ජාත්‍යන්තර ආයතන වෙතින් වෘත්තීය පුහුණුවද ලබා ඇත.

ඔහු කෙමිකල් ඉන්ඩස්ට්‍රීස් ආයතනයේ ජ්‍යෙෂ්ඨ නිෂ්පාදන කළමනාකරු වශයෙන් 1999 සිට 2008 දක්වා කටයුතු කර ඇත. Imulsion plant හි සංවර්ධන ක්‍රමවේද, ක්‍රියාත්මක කිරීම සහ පර්යේෂණ යන ක්ෂේත්‍රවලට අදළව ගැඹුරු, ප්‍රායෝගික දැනුම් සම්භාරයක් ඔහු සතුය.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවි යන තනතුර දරමින් ඔහු, දේශීය ඉන්ධන වෙළඳපොළ, කෘෂි රසායනික ද්‍රව්‍ය, තාර, ලිහිසි තෙල් සහ විශේෂ නිෂ්පාදන මෙන්ම පාරිභෝගික සත්කාර හා සන්නිවේදන තාක්ෂණ සහ සේවා ස්ථාන උපකරණ යන අංශ සහ අනු ඒකක පාලනය සහ සම්බන්ධීකරණය සිදු කරනු ලැබේ.



එම්.ඒ.ඩී. මල්ලිකාරච්චි
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(තාක්ෂණික සේවා සහ ආයතනික කටයුතු)

පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් ඉංජිනේරු (නිෂ්පාදන) උපාධියක් ලබා ඇති මල්ලිකාරච්චි මහතා, ඇමරිකා එක්සත් ජනපදයේ ව්‍යාපෘති කළමනාකරණ ආයතනයේ සාමාජිකයෙකු මෙන්ම ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකුද වේ. ඔහු ප්‍රධාන පෙළේ දේශීය සහ ජාත්‍යන්තර මට්ටමේ අධ්‍යයන, වෘත්තිය සහ කාර්මික පහසුකම් පිළිබඳ ආයතනයන්හි කළමනාකරණ සහ නායකත්වය පිළිබඳ පශ්චාත් උපාධි පුහුණු වැඩසටහන් කිහිපයකටම සහභාගි වී ඇත. විවිධ ක්ෂේත්‍රවලට අදාළව තෙල් සහ ගෑස් කර්මන්තයට සම්බන්ධයෙන් වසර 23කට වඩා අධික අත්දැකීම් සම්භාරයක් ඔහු සතුය. මල්ලිකාරච්චි මහතා, 1996 දී ජිනසේන සමාගමේ ඉංජිනේරුවකු වශයෙන් සේවයට බැඳී සිය වෘත්තිය ජීවිතය ආරම්භ කළ අතර අනතුරුව, ඉන්ටර්බැව් පෝසිලේන් පුද්ගලික සමාගමේ සහකාර යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු ලෙස සේවට එක් විය.

ඔහු, 1999 වසරේදී යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු ලෙස සංස්ථාවට එක්වූ අතර සංස්ථාවට අයත් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල ගුවන් සේවා කටයුතු වෙනුවෙන් ව්‍යාපෘති ඉංජිනේරුවරයෙකු, ගුවන් මෙහෙයුම් නියෝජ්‍ය කළමනාකරු වශයෙන් ද කටයුතු කර ඇත. වර්තමානයේ, තාක්ෂණික සේවා සහ ආයතනික කටයුතු පිළිබඳ නියෝජ්‍ය සාමාන්‍යාධිකාර ධුරයේ කටයුතු කරනු ලැබේ.



ඩී.එම්.පී. දිසානායක මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(නඩත්තු සහ ව්‍යාපෘති)

යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධිධාරියෙකු වන දිසානායක මහතා, වරලත් ඉංජිනේරුවරයෙකු මෙන්ම ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සාමාජිකයෙකු ද වේ. ඔහු නීතිවේදි උපාධිය ලබා ඇති අතර නීතිඥයෙකු ද වේ.

දිසානායක මහතා සංස්ථාවේ පිරිපහදු අංශය වෙත යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු වශයෙන් 1988දී සේවයට බැඳුණි. ඔහු, සංස්ථාවේ දශක තුනක් වූ සිය දීර්ඝ සේවා කාලය තුළදී, නියෝජ්‍ය ඉංජිනේරු කළමනාකරු, ඉංජිනේරු කළමනාකරු (යාන්ත්‍රික), ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු කළමනාකරු (නඩත්තු සහ ව්‍යාපෘති), සහ නියෝජ්‍ය පිරිපහදු කළමනාකරු (නඩත්තු සහ ව්‍යාපෘති) වශයෙන් 2016 සිට ද කටයුතු කරනු ලබයි.



කේ.ඩබ්.එස්. පුෂ්පලාල් මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(මානව සම්පත් සහ පරිපාලන)

පුෂ්පලාල් මහතා, කොළඹ විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රවේදි (දේශපාලන විද්‍යා පිළිබඳ විශේෂ) උපාධිධාරියෙකි. ඔහු ඕස්ට්‍රේලියාවේ AHRIහි සහතිකලත් වෘත්තීය සාමාජිකයෙක් මෙන්ම ශ්‍රී ලංකා සහතිකලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනයේ ද සාමාජිකයෙක් වේ. ඔහු දේශීයව මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද පිළිගත් පුහුණු වැඩසටහන් කිහිපයක් සඳහාම සහභාගි වී ඇත.

කළමනාකරණ අභ්‍යාසලාභියෙකු වශයෙන් 1997දී සංස්ථාවේ සේවයට බැඳුනු පුෂ්පලාල් මහතා මේ වනවිට වසර 21ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත. ඔහුගේ සේවා කාලය තුළදී, නියෝජ්‍ය පිරිස් කළමනාකරු, පරිපාලන කළමනාකරු, මානව සම්පත් කළමනාකරු ආදි විවිධ තනතුරු ගණනාවක කටයුතු කර ඇති අතර දැනට සංස්ථාවේ මානව සම්පත් සහ කළමනාකරණයට අදාළ රාජකාරි සිදු කරමින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන) ධුරයේ හොබවයි.



කේ.ජී.එච්. කෝදාගොඩ මහතා
නියෝජ්‍ය පිරිපහදු කළමනාකරු
(නිෂ්පාදන සහ මෙහෙයුම්)

කෝදාගොඩ මහතා මොරටුව විශ්ව විද්‍යාලයේ රසායනික ද්‍රව්‍ය සහ සැකසුම් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ප්‍රථම පන්තියේ ගෞරව උපාධියක් සහ තායිලන්තයේ Chulalonghorns විශ්ව විද්‍යාලය සහ මොරටුව විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන ඛනිජ තෙල් තාක්ෂණය සහ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි ලබා ඇත. ඔහු වරලත් ඉංජිනේරුවෙකු මෙන්ම ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආයතනික සාමාජිකයෙකු මෙන්ම ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරුවන්ගේ සංගමයේ ද ආයතනික සාමාජිකයෙකු වේ. ඔහු සිය පර්යේෂණ පිළිබඳ ජාත්‍යන්තර ප්‍රකාශන සහ ඉදිරිපත් කිරීම් සිදු කර ඇති අතර ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ රසායනික ද්‍රව්‍ය සහ සැකසුම් ඉංජිනේරු විද්‍යා අංශයේ සභාපති වශයෙන් ද කටයුතු කර ඇති අතර එහි වසර දෙකක් කවුන්සිලය නියෝජනය කර ඇත.

කෝදාගොඩ මහතා, සිය ඉංජිනේරු වෘත්තිය 2002 වසරේදී Piramal Glass පුද්ගලික සමාගමේ සේවයට එක් වෙමින් ආරම්භ කරනු ලැබීය. අනතුරුව රසායනික ද්‍රව්‍ය පිළිබඳ පළපුරුදු ඉංජිනේරුවරයෙකු වශයෙන් 2006 වසරේදී සංස්ථාවේ සේවයට එක් විය.

ඔහු, පිරිපහදු අංශයේ සැකසුම් තාක්ෂණික සේවා සහ නිෂ්පාදන හා මෙහෙයුම් යන ක්ෂේත්‍ර ද ඇතුළත්ව කාර්මික ක්ෂේත්‍රයේ වසර 20කට වඩා අධික පළපුරුද්දක් ලබා ඇත. ඔහු 2021 පෙබරවාරි මාසයේදී නියෝජ්‍ය පිරිපහදු කළමනාකරු (නිෂ්පාදන සහ මෙහෙයුම්) ලෙස සේවයට එක් වීමට පෙර රසායනික ඉංජිනේරු, උපයෝගිතා මෙහෙයුම් ප්‍රධානි, කළමනාකරු (පිරිපහදු මෙහෙයුම්) යන තනතුරුවල රාජකාරි ඉටු කර ඇත.

ඔහු දැනට, මෙහෙයුම් දෙපාර්තමේන්තුව, ගිනි සහ ආරක්ෂ දෙපාර්තමේන්තුව, ආර්ථික සහ උපලේඛනගත කිරීම් දෙපාර්තමේන්තුව, සහ සපුගස්කන්ද බෙදා හැරීම් පර්යන්තය ද ඇතුළත් පිරිපහදු අංශයේ නිෂ්පාදන සහ මෙහෙයුම් කටයුතු ප්‍රධානි වශයෙන් ක්‍රියා කරනු ලැබේ.



එම්.සී.ඩී.පෙරේරා මෙනවිය
වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

පෙරේරා මෙනවිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් (USJP) වාණිජ විශේෂවේදී දෙවන පන්තියේ ගෞරව උපාධියක් ලබා ඇත. ඇය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (FCA) සාමාජිකාවක් මෙන්ම සහතික කළ කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (ACMA) ආශ්‍රිත සාමාජිකාවකි.

ඇය සහකාර ගණකාධිකාරීවරියක් ලෙස 2001 දී සංස්ථාව හා සම්බන්ධ වූවාය. සංස්ථාවේ දශක දෙකක දීර්ඝ වෘත්තීය ජීවිතය තුළ ඇය ගණකාධිකාරී, නියෝජ්‍ය මූල්‍ය කළමනාකරු, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය මූල්‍ය කළමනාකරු සහ ජ්‍යෙෂ්ඨ මූල්‍ය කළමනාකාර තනතුරු ද 2023 සිට වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මූල්‍ය ලෙස ද කටයුතු කරයි.

පෙරේරා මෙනවිය SAP-ERP පද්ධතිය ක්‍රියාත්මක කිරීමේදී ප්‍රධාන සාමාජිකාවක් වශයෙන්ද කටයුතු කර ඇත.ඇය සංස්ථාවේ සියලුම ගිණුම්කරණයන් සහ මූල්‍ය කළමනාකරණ කටයුතු අධීක්ෂණය කරන අතර සංස්ථාවේහි පරිපාලන, සැලසුම්, ගිණුම්කරණය සහ අයවැය සම්බන්ධ ක්‍රියාකාරකම්වල නායකත්වය සහ සම්බන්ධීකරණය ලබා දීමද සිදු කරයි.



ඒ.ජී.ඩී බණ්ඩාර මහතා
වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ සහ සැපයුම් දාම)

බණ්ඩාර මහතා පේරාදෙනිය විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී (ආර්ථික විද්‍යාව) පිළිබඳව උපාධිධාරියකු සහ ඩලියන් නාවික විශ්වවිද්‍යාලයෙන් (චීනය) ලොජිස්ටික් සහ සැපයුම්දාම පිළිබඳව පශ්චාත් උපාධිය ලබා ඇත.ඔහු එක්සත් රාජධානියේ වරලත් නාවික


තැරැව්කරුවන්ගේ ආයතනයෙන් නැවිගත කිරීම පිළිබඳ ඩිප්ලෝමාවක් (වරාය නියෝජිතායතන) ද, N.I.B.M වෙතින් ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ද, පරිගණක තාක්ෂණ ඩිප්ලෝමාව (SLIT)ක්ද ලබා ඇත. බණ්ඩාර මහතා දේශීය හා ජාත්‍යන්තර වශයෙන් පුහුණු වැඩසටහන් ගණනාවක් සම්පූර්ණ කර ඇති අතර සංස්ථාව නියෝජනය කිරීමද ඔහු විසින් සිදු කරන ලදී.


ඔහු 1995 දි සංස්ථාවේ සේවයට බැඳී ඇති අතර, සංස්ථාවේ විවිධ තනතුරු වන නාවික සහකාර, සහකාර වාණිජ කළමනාකරු, නියෝජ්‍ය වාණිජ කළමනාකරු, වැඩ බලන වාණිජ කළමනාකාරු, නාවික කළමනාකාරු සහ වර්තමානයේ වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වාණිජ හා සැපයීම් දාම ලෙස කටයුතු කරයි. ඔහු සංස්ථාවේ නාවික, වාණිජ සහ ප්‍රසම්පාදන හා ගබඩා යන අංශ තුනහි කටයුතු කළමනාකාරණය සහ සම්බන්ධීකරණය සිදුකරයි

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

ආර්.ඒ.කේ.සී. ආරියරත්න මහත්මිය - ප්‍රධාන නීති නිලධාරී, වයි.ඒ.ඩී.එස්. ප්‍රියංකර මහතා - ප්‍රධාන අභ්‍යන්තර විගණක, එම්.සී.ඩී. පෙරේරා මහත්මිය - ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මුදල්), ජී.පී. උපනන්ද මහතා - කළමනාකරු (මානව සම්පත්), මේජර් එම්.ආර්.එස්.පී. සමරසිංහ - කළමනාකරු (ආරක්ෂක සහ විමර්ශන), එස්.එම්.සී.පී. සමරකෝන් මහතා - කළමනාකරු (අලෙවිකරණ), ජී.පී.කේ විජේකෝන් මහතා - කළමනාකරු (ඉංජිනේරු සහ පරිශ්‍ර), ආර්.ඒ.ටී.අයි. රණසිංහ මහතා - කළමනාකරු (විගණන), කේ.කේ.ඒ ජයවික්‍රම මහතා - කළමනාකරු (වාණිජ), ඒ.ජී.ඩී. බණ්ඩාර මහතා - කළමනාකරු (නාවික), බී.එස්.එස්. පෙරේරා මහතා - කළමනාකරු (කෘෂි රසායන), ඒ.අයි. වන්සේකර මහතා - කළමනාකරු (ගුවන් මෙහෙයුම්), එන්.බී.එම්.පී. ජීවසිරි මහතා - කළමනාකරු (මෙහෙයුම් - තොග සහ පර්යන්ත මෙහෙයුම්), ඩබ්.ඒ.ඒ.සී. වීරසිංහ මහත්මිය - කළමනාකරු (මානව සම්පත් සංවර්ධන), ඩබ්.කේ.එස්. ගුණවර්ධන - කළමනාකරු (පර්යේෂණ සහ සංවර්ධන), එම්.එස්.ආර්. ප්‍රනාන්දු මිය - කළමනාකාර (තොරතුරු තාක්ෂණ), වයි.එස්. දිසානායක මහත්මිය - කළමනාකාර (නීති), එච්.ජී. කුමුදිනී මහත්මිය - කළමනාකාරිනී (ප්‍රසම්පාදන සහ ගබඩා) (වැඩ බලන), ඒ.බී. කෝරලේගෙදර මහතා - සහකාර කළමනාකාර (ලේකම් කාර්යාලය) (වැඩ බලන), කේ.එම්.වී.ජේ.බී. කුලසේකර මහතා - කළමනාකරු (LNG) (වැඩ බලන), ඒ.එච්. කාංචන මහතා - HSE හි ප්‍රධානී (වැඩ බලන), පී.එෆ්.ඩබ්. දයානාත් මහතා - කළමනාකරු (ඉංජිනේරු - සිවිල්), ආර්.ඒ.එස්. රාජපක්ෂ මහතා - කළමනාකරු (ද්‍රව්‍ය), ආර්.ඒ.බී. තිලංග මහතා - කළමනාකරු (ඉංජිනේරු - යාන්ත්‍රික), කේ.වී.ජේ. වන්දුවංක මහතා - කළමනාකරු (ඉංජිනේරු - විදුලි), ඩබ්ලිව්.එස්. රබෙල් මහතා - කළමනාකරු (ඉංජිනේරු - උපකරණ), ඒ.එස්. ප්‍රේමකාන්ති මෙනෙවිය - කළමනාකරු (ආර්ථික සහ උපලේඛනගත කිරීම), ඒ.එම්.ඩබ්.ඩබ්.එස්.කේ. වටකැටිය මහතා - නියෝජ්‍ය කළමනාකරු (තාක්ෂණික සේවා - රසායනාගාර), ආර්.එම්.එම්.ඩබ්ලිව්. බණ්ඩාර මහතා - නියෝජ්‍ය කළමනාකරු (ගිනි සහ ආරක්ෂාව), ඩබ්.ඒ.ඩී.සී.ආර්. විජේසිංහ මහතා - (වැඩ බලන) කළමනාකරු (පිරිපහදු මෙහෙයුම්), ආර්.එම්.එල්.රණතුංග මහතා - (වැඩ බලන) කළමනාකරු (ඉංජිනේරු - ව්‍යාපෘති), එම්. රාජපක්ෂ මහතා - (වැඩ බලන) කළමනාකරු (ඉංජිනේරු - පරීක්ෂණ), ඒ.එම්.සී.ඩබ්. අබේකෝන් මහතා - සහකාර. කළමනාකරු (සපුගස්කන්ද පර්යන්තය - මෙහෙයුම්).

ආයතනික ව්‍යුහය


Chairman
Managing Director
DGM (M)
DGM (C & SC)
DGM (TS & CA)
DGM (F)
DGM (HR &A)
CLO
CIA
Mgr (Legal)
Mgr (Audit)
Mgr (Investigation)
Mgr (Marketing)
Mgr (Agro Chemical)
Mgr (Lub & Spcl Prdt)
Mgr (Commercial)
Mgr (Pro. & Stores)
Mgr (Shipping)
Mgr (Engi. & Premises)
Mgr (Avi. Operations)
Mgr (Operations)
Mgr (R & D)
Mgr (CP & BD)
Mgr (LNG)
Head of HSE
Mgr (IT)
Snr. Mgr (Finance)
Mgr (HR)
Mgr (HRD)
Mgr (Security)
Mgr (Secretariat)
Medical Officer



RM - Refinery Manager

DGM - Deputy General Manager

DRM - Deputy Refinery Manager

Snr. Mgr. - Senior Manager

CIA - Chief Internal Auditor

CLO - Chief Legal Officer

Mgr - Manager

Dy. Mgr. - Deputy Manager

M - Marketing

TS & CA - Technical Services & Corporate Affairs

C & SC - Commercial & Supply Chain

F - Finance

HR & A - Human Resources & Administration

E & I - Electrical & Instrument

M & P - Maintenance & Projects

M & O - Manufacturing & Operations

Lub & Spcl Prdt - Lubricant & Special Product

Pro. & Stores - Procurement & Stores

Engi. - Engineering

Avi. - Aviation

R & D - Research & Development

CP & BD - Corporate Planning & Business Development

LNG - Liquefied Natural Gas

IT - Information Technology

HSE - Health Safety Environment

HR - Human Resources

HRD - Human Resources Development

TS - Technical Services

Lab. - Laboratory

ST Ops. - Sapugaskanda Terminal Operations

E & S - Economic & Scheduling

Ops R & T - Operations Refinery Terminal

මෙහෙයුම් සන්දර්භය



3.1
(%)
ගෝලීය ද.දේ.නි. වර්ධනය

102.1
(දිනකට බැරල් මිලියන)
ගෝලීය ඉන්ධන ඉල්ලුම


-2.3
(%)
ද.දේ.නි. වර්ධනය

327.53
(රු..ඇ.ඩො.)
විනිමය අනුපාතය (සාමා.)


සමාලෝචනය - 2023

- ගෝලීය දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය සියයට 3.1 ලෙස වාර්තා විය.
- ශ්‍රී ලංකා ආර්ථිකය සියයට 2.3 කින් සංකෝචනය විය.
- ජාත්‍යන්තර ඉන්ධන මිල 16.0% කින් අඩු විය
- විනිමය අනුපාතිකය 10.79% කින් ඉහළ ගියේය.
- ජාතික ඉන්ධන බලපත්‍රය (QR පද්ධතිය) අත්හිටුවීම.
- 2023 දෙසැම්බර් මාසයේදී CCPI සියයට 4.0 දක්වා අඩු විය.

බොරතෙල් මිල චලනය




ගෝලීය වර්ධනය




මූලාශ්‍රය: WEO 2024 ජනවාරි - IMF

ගෝලීය ඉන්ධන ඉල්ලුම




මූලාශ්‍රය: OPEC මාසික තෙල් වෙළෙඳපොළ වාර්තාව - ජනවාරි

ගෝලීය ඉන්ධන සැපයුම




මූලාශ්‍රය: ඔපෙක් මාසික තෙල් වෙළෙඳපොළ වාර්තාව - ජනවාරි

ජාත්‍යන්තර ඉන්ධන මිල



විනිමය අනුපාතය



ගෝලීය සන්දර්භය

IMF විසින් ප්‍රකාශයට පත් කරන ලද World Economic Outlook (WEO) අනුව, සියයට 3.1ක් ලෙස පුරෝකථනය කර ඇති ගෝලීය වර්ධනය, 2022 දී සියයට 3.5 සිට පහත වැටී ඇත. 2023 වසර එක්සත් ජනපදයේ සහ සහ වෙනත් විශාල නැගී එන වෙළඳපොල සහ සංවර්ධනය වන ආර්ථිකයන් මෙන්ම චීනයෙන් ලද මූල්‍ය සහයෙන් අපේක්ෂිත ඔරොත්තු දීමේ හැකියාවට වඩා වැඩි ඔරොත්තු දීමේ හැකියාවක් 2023 දී පෙන්නුම් කර ඇත. කොවිඩ් 19 වසංගතයෙන්, රුසියාව විසින් යුක්‍රේනය ආක්‍රමණය කිරීමෙන් සහ ජීවන වියදම් අර්බුදයෙන් වූ බලපෑමෙන් වූ ලෝක ආර්ථික අර්බුදයෙන් යථා තත්වයට පත්වීම කැපී පෙනෙන ආකාරයෙන් ප්‍රත්‍යාස්ථ බවක් පෙන්වීය.2022 වර්ෂයේ උපරිමතම අගයට පත්වූ උද්ධමනය බලාපොරොත්තු වූ අගයට වඩා වැඩි වේගයකින් අඩු වූ අතර සහ එය මුල් අවස්ථාවේදි පුරෝකථනය කළ රැකියා නියුක්තියට සහ ආර්ථික කටයුතු මත වූ බලපෑමට වඩා අඩුවිය.

මෙම ප්‍රවණතාවයට හේතු වී ඇත්තේ, උද්ධමන අපේක්ෂාවන් ඵලදායි ලෙස ස්ථානගත කර ඇති වාසිදායක සැපයුම් පාර්ශව වර්ධනයන් සහ මහ බැංකු විසින් ක්‍රියාත්මක කරන ලද දැඩි පියවරයන් වේ. කෙසේ වෙතත්, උද්ධමනය මැඩපැවැත්වීම සඳහා ස්ථාපනය කරන ලද ඉහළ පොලී අනුපාත, ඉහළ ණය මට්ටම් සඳහා වන රාජ්‍ය මූල්‍ය ආධාරයේ අඩුවීමක් සමඟින්, 2024 දී වර්ධනය මත පහළට පීඩනයක් ඇති කිරීමට පුරෝකථනය කර ඇති බව සැලකිල්ලට ගැනීම වැදගත්ය.

2022 වර්ෂයේදී 2.6% වූ දියුණු ආර්ථිකයන්ගේ වර්ධනය 1.6% දක්වා පහත වැටී ඇත දියුණු ආර්ථිකයන් සියයට 1.6 ක වාර්ෂික වේගයකින් වර්ධනය වූ අතර එය 2022 දී සියයට 2.6 ක වාර්ෂික අනුපාතයකින් පහත වැටී ඇත. නැඟී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් 2022 දී වාර්තා වූ සියයට 4.1 ක වර්ධනයක් පවත්වා ගනිමින් වඩා හොඳින් වර්ධනය විය.


IMF විසින් පුරෝකථනය කර ඇති පරිදි, භාණ්ඩ මිල (තෙල්) 2022 දී 39.2% කින් වැඩි වූ අතර 2023 දී 16.0% කින් අඩු විය. තෙල් මිල 2024 දී 2.3% කින් සහ 2025 දී 4.8% කින් අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

OPEC ආයතනයට අනුව, 2022 වර්ෂයේදී 99.5%(mb/d) ලෙස වාර්තා වූ ගෝලීය තෙල් පරිභෝජනය 2023 වර්ෂයේදී 102.1%(mb/d) ලෙස වූ අතර එය වසරින් වසර වන ඉල්ලුම 2.46% ඉහළ යාමක් වන අතර එයට ඉල්ලුම් පුර්ව වසංගත තත්වයට ලඟාවීම සහ ආර්ථිකයේ දරා ගැනීමේ හැකියාව මඟින් පෙන්නුම් කරයි. ගෝලීය ආර්ථිකය ප්‍රකෘතිමත් වීමත් සමඟ ඉල්ලුමේ වැඩිවීමක් ඇති වුවත්, පවතින රුසියානු-යුක්‍රේන ගැටුම හේතුවෙන් සැපයුම් පාර්ශවීය අභියෝග මතු වූ අතර එය තෙල් මිල ඉහළ යාමට හේතු විය. (WTI) බොරතෙල් වල සාමාන්‍ය මිල 2022 දී බැරලයකට ඇමරිකානු ඩොලර් 94.79 සිට 2023 දී බැරලයකට ඇමරිකානු ඩොලර් 77.64 දක්වා 18.09% කින් පහත වැටුණි. සංස්ථාව විසින් භාවිතා කරන බොරතෙල් (Murban) සාමාන්‍ය මිල 2022 දී බැරලයක් සඳහා ඩොලර් 98.77 සිට 2023 දී බැරලයක් සඳහා ඩොලර් 82.88 ක් දක්වා 16.09% කින් අඩු විය.

IMF ආයතනයට අනුව 2023 දී ගෝලීය වර්ධනය සියයට 3.1 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, 2025 දී සියයට 3.2 දක්වා මධ්‍යස්ථ ලෙස ඉහළ යාමට පෙර 2024 දී සියයට 3.1 හි පවතිනු ඇතැයි පුරෝකථනය කර ඇත. කෙසේ වෙතත්, 2024 සහ 2025 හි ගෝලීය වර්ධනය සඳහා වන ප්‍රක්ෂේපනය තවමත් වාර්තාගත (2000-19) සාමාන්‍යය වන 3.8% ට වඩා අඩු වීම සීමාකාරී මූල්‍ය ප්‍රතිපත්ති සහ මූල්‍ය ආධාර ඉවත් කර ගැනීම, මෙන්ම ඊට සම්බන්ධ අඩු ඵලදායිතා වර්ධනය පිළිබිඹු කරයි. ලෝක වෙළඳපල වර්ධනය 2024 දී සියයට 3.3 ක් සහ 2025 දී සියයට 3.6 ක් ලෙස පුරෝකථනය කර ඇති අතර, එහි ඓතිහාසික සාමාන්‍ය වර්ධන අනුපාතය වන සියයට 4.9 ට වඩා අඩුය. ඉහළ යන වෙලඳ විකෘති කිරීම් සහ භූ-ආර්ථික බණ්ඩනය ගෝලීය වෙලඳාමේ මට්ටමට තවදුරටත් බලපෑමක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. වාර්ෂික සාමාන්‍ය තෙල් මිල 2024 දී සියයට 2.3 කින් පමණ පහත වැටෙනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර ඉන්ධන නොවන භාණ්ඩ මිල සියයට 0.9 කින් පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

තවද, ලෝක ව්‍යාප්ත උද්ධමනය 2023 දී සියයට 6.8 සිට 2024 දී සියයට 5.8 දක්වා සහ 2025 දී සියයට 4.4 දක්වා අඩු වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. දියුණු ආර්ථිකයන් සීඝ්‍ර අවධමනයක් බලාපොරොත්තු වන අතර 2024 වර්ෂයේදී නැගීඑන වෙළඳ පල හා සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්ට වඩා 2% ක ප්‍රතිශත කොටසකින් අඩු වී, 2.6% දක්වා වූ ප්‍රතිශතයක් කරා ලඟා වූ උද්ධමයක් අපේක්ෂා කරයි. උද්ධමනය පහත වැටීමේ නියාමකයන් රට අනුව වෙනස් වන නමුත් සාමාන්‍යයෙන් අඩු මූලික උද්ධමනය පිළිබිඹු කරන්නේ තවමත් දැඩි මුදල් ප්‍රතිපත්ති, ශ්‍රම වෙලඳපොලවල ආශ්‍රිත මෘදු වීමක් සහ සාපේක්ෂ බලශක්ති මිලෙහි පෙර සහ පවතින අඩුවීම් වල ප්‍රතිඵලයක් ලෙස ය. සියලුම ආසන්න කාලීන උද්ධමන අපේක්ෂාවන් ප්‍රධාන ආර්ථිකයන්හි පහත වැටී ඇති අතර දිගු කාලීන අපේක්ෂාවන් ස්ථාවර වී ඇත.

ද.දේ. නි. වර්ධනය




මූලාශ්‍රය: වාර්ෂික වාර්තාව 2023, ශ්‍රී ලංකා මහ බැංකුව


රටේ දළ දේශීය නිෂ්පාදිතය

වසර	ද.දේ.නි. (රු. ට්‍රි.)	ද.දේ.නි. (USD බි.)
2019	15.9	89.0
2020	15.6	84.4
2021	17.6	88.56
2022	24.1	76.8
2023	27.6	84.4

දේශීය මිල සංශෝධන



උද්ධමන අනුපාත



මූලාශ්‍රය: වාර්ෂික වාර්තාව 2023, ශ්‍රී ලංකා මහ බැංකුව

දේශීය සන්දර්භය

ශ්‍රී ලංකා මහ බැංකුවට අනුව, 2022 දී මුහුණ දුන් දරුණුතම ආර්ථික ව්‍යසනය සමඟ වාර්තා වූ සියයට 7.3 ක සංකෝචනයෙන් අනතුරුව යථා තත්ත්වයට පත්වෙමින් ශ්‍රී ලංකා දළ දේශීය නිෂ්පාදිතය වසරින් වසර සියයට 2.3 කින් සංකෝචනය වී ඇත. කර්මාන්ත අංශයේ සංකෝචනය සියයට 9.2 කින් සහ සේවා අංශය සියයට 0.2 කින් හැකිලීමට ආර්ථිකයේ සංකෝචනයද දායක වන තත්වයක් තුළ 2023 දී කෘෂිකර්ම අංශය සියයට 2.6 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

වේගවත් උද්ධමනය මැඩලීමේ ක්‍රියාමාර්ග, වැඩිදියුණු කළ බාහිර ඔරොත්තු දීමේ හැකියාව, වඩාත් ශක්තිමත් මූල්‍ය ශේෂයන් සහ සංරක්ෂණය කරන ලද මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය මගින් ප්‍රකෘතිය ශක්තිමත් භාවයට පත්විය. රජය සහ මහ බැංකුව විසින් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග මාලාවක් කඩිනමින් සහ සම්බන්ධීකරණයෙන් යුතුව ක්‍රියාත්මක කිරීම සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ අරමුදල් පහසුකම් වැඩපිළිවෙළ සමඟ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය සමස්ත සාර්ව ආර්ථික ස්ථායීතාවය ශක්තිමත් කළේය. ප්‍රතිෂ්ඨාපනය වූ ස්ථාවරත්වයේ ප්‍රතිලාභ ලැබීමෙන් පසු ආර්ථිකය වර්ධන මාවතකට සංක්‍රමණය වීම ආරම්භ විය. සමස්ත ඉල්ලුමේ වර්ධනය දේශීය ඉල්ලුම සහ ශුද්ධ බාහිර ඉල්ලුම යන දෙකම මගින් මෙහෙයවනු ලැබිය.

රටේ සමස්ත ආර්ථිකයේ ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 84.4 දක්වා වාර්තා වී ඇති අතර, ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය 2022 දී ඇමෙරිකානු ඩොලර් 3,464 සිට 2023 දී ඇමෙරිකානු ඩොලර් 3,830 දක්වා වැඩි දියුණු වී ඇති අතර, එය ජනගහනයේ මිලදී ගැනීමේ ශක්තිය වැඩි දියුණු වීම පෙන්නුම් කරයි. රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් රාශියක් හේතුවෙන්, 2022 සැප්තැම්බර් මාසයේදී සර්වකාලීන ඉහළම මට්ටමට ළඟා වූ උද්ධමනය වසරක් ඇතුළත තනි ඉලක්කම් මට්ටමට ආපසු ගොස් 2023 අවසානය වන විට බලාපොරොත්තු වූ එම ඉලක්කම් මට්ටම ආසන්නයේම පවත්වාගෙන යයි.

කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCPI) 2022 දෙසැම්බර් මාසයේදී සියයට 57.2 සිට 2023 දෙසැම්බර් මාසයේදී සියයට 4.0 දක්වා පහත වැටී ඇත. ජාතික පාරිභෝගික මිල දර්ශකය (NCPI) 2022 අවසන් වන විට සියයට 59.2 සිට 2023 දෙසැම්බර් මාසයේදී සියයට 4.2 දක්වා පහත වැටුණි.


2022 දෙසැම්බර් මාසයේ දී වාර්තා වූ විනිමය අනුපාතිකයට සාපේක්ෂව මාසික විනිමය අනුපාතිකය 11.53% කින් ඉහළ ගොස් ඇත. මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද වෙළෙඳපොළ පදනම් කරගත් විනිමය අනුපාත ප්‍රතිපත්තියක් යටතේ 2023 වසරේ දී ශ්‍රී ලංකා රුපියල නියුනු ලෙස ඉහළ ගියේය. විනිමය අනුපාත ලිහිල් කිරීම, විනිමය අනුපාත අර්බුදය සහ BOPදුෂ්කරතා හමුවේ 2022 දී එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව රුපියල නියුනු ලෙස අවප්‍රමාණය විය.
එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය ඉහළ යාම සංස්ථාව වෙත ධනාත්මක බලපෑමක් ඇති කළ අතර, එය සියලු බනිජ තෙල් නිෂ්පාදනවල මිල පහත දැමීමට බලපෑවේය. සංස්ථාව විසින් 2022 වසරේ වාර්තා කළ රු. බිලියන 529.47 විනිමය අනුපාත අලාභයට සාපේක්ෂව රුපියල් බිලියන 20.34 ක විනිමය ලාභයක් වාර්තා කරන ලදී.

ජාත්‍යන්තර ඉන්ධන මිලෙහි වෙනස්වීම් සහ අනෙකුත් ප්‍රධාන පිරිවැය සලකා බැලීම් අනුව දේශීය බනිජ තෙල් නිෂ්පාදන මිල තීරණය කිරීම සඳහා රජය විසින් 2022 දී නව මිල යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කරන ලද අතර එම මිල යාන්ත්‍රණය 2023 වසර සඳහා අඛණ්ඩව ක්‍රියාත්මක විය. ජාත්‍යන්තර ඉන්ධන මිල, විනිමය අනුපාතිකය සහ අනෙකුත් පිරිවැය සාධකවල අඩු වැඩි වීම් මත පදනම්ව මිල ගණන් මාසිකව සංශෝධනය කරන ලදී.

වෙළඳපොලේ US ඩොලර් තිබීම සහ මෙහෙයුම් හරහා මුදල් ප්‍රවාහය උත්පාදනය කිරීම නිසා සංස්ථාව හට එහි වත්මන් ඉන්ධන බිල්පත් නියමිත වේලාවට පියවීමට පහසුකම් සැලසුණි. තවද, 2022.12.31 දිනට පැවති පැරණි ණය රජයේ ශේෂ පත්‍රයට මාරු කිරීම නිසා සංස්ථාවහට මූල්‍ය පිරිවැය අවම කර ගැනීමට පහසුකම් සැලසීය.

ඇස්තමේන්තුගත ගෝලීය වර්ධන වේගය		
කාණ්ඩය	2024	2025
ලෝකය	3.1	3.2
උසස් ආර්ථිකයන්	1.5	1.8
EM සහ සංවර්ධනය වන ආර්ථිකයන්	4.1	4.2

අපේක්ෂිත GDP වර්ධනය



ඉදිරි මග

ජාත්‍යන්තර මුල්‍ය අරමුදල (IMF) 2024 දී 3.1% සහ 2025 දී සුළු වැඩිවීමක් සහිතව 3.2%ක ගෝලීය වර්ධනයක් පුරෝකථනය කර ඇත. කෙසේ වෙතත්, මෙම සංඛ්‍යා කම්පනයන් ඇති කළ පෙර වසංගත දිනවල පැවති ඒවාට වඩා අඩු අගයන් ගනී. 2000 සිට 2019 දක්වා වූ සාමාන්‍යය 3.8% ක් වූ පැරනි ප්‍රක්ෂේපණ සමඟ සංසන්දනය කරන විට ඒවා වෙනම ආකරයක වන බව පැහැදිලිය. උද්ධමනය මර්දනය කිරීමට මහ බැංකු විසින් සකස් කරන ලද ඉහළ පොලී අනුපාත, ඉහළ යන ණය තත්ව මධ්‍යයේ මූල්‍ය සහයෝගය හා සමඟ ගත් විට ආර්ථික ක්‍රියාකාරකම් මත සෙවණැලි හෙළීමක් ඇති කරන අතරම , ඵලදායිතාවයේ වර්ධනයද මන්දගාමී පසුබැසීමක් වාර්තා කරන බව සඳහන් නොකල යුතු තරම්ය. අඛණ්ඩ සැපයුම් දාමයේ බාධා සහ දැඩි මුදල් ප්‍රතිපත්තිවල බලපෑම නිසා බොහෝ අංශ හරහා බලාපොරොත්තු වූවාට වඩා වඩාත් වැඩි වේගයෙන් උද්ධමනය අඩු වෙමින් පවතින බව සතුටුදායක තත්වයකි.
සමෘද්ධිමත් ජාතික ආර්ථිකයක් බාධාවකින් තොර මෙහෙයුම් සඳහා මාර්ගය සකස් කරයි. එසේ වුවද, ක්ෂේත්‍රයට නව ඉන්ධන සැපයුම්කරුවන්ගේ පැමිණීම සංසථවෙහි වෙළඳපල කොටස සහ මූල්‍ය තත්වයට අභියෝග එල්ල කළ හැකිය. වත්මන් මිලකරණ උපාය මාර්ගය දිගටම භාවිතා කිරීම මගින් සංසථවෙහි ලාභ ආරක්ෂා කෙරෙනු ඇති අතර එහි දිගුකාලීන මූල්‍යමය ඔරොත්තු දීමේ හැකියාව සහ තිරසාරත්වය සහතිකකරනු ඇත.

දැඩි තරඟකාරී ඉන්ධන වෙළඳපල කළමනාකරණයට අවශ්‍ය සැලසුම් සකසා ඇත. සංස්ථාව විසින් රටේ ඉන්ධන ඉල්ලුම සපුරාලීම සඳහා අත්‍යවශ්‍ය උපාංග වලට සම්පත් යෙදවීම සහ ගබඩා කිරීමේ හැකියාව ඉහළ නැංවීම සිදු කරනු ලැබේ. ත්‍රිකුණාමලයේ ටැංකි සමූහයෙහි ටැංකිවල ආයෝජනය ජාතියට වටිනාකමක් එකතු කරමින් ඌන උපයෝජිත සම්පත් ප්‍රයෝජනයට ගැනීමේ කාර්යයෙහි ලා වැදගත් පියවරකි.

කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය



සමාලෝචනය - 2023

- පෙට්‍රල්, ඩීසල් සහ භූමිතෙල් සඳහා මිල නියම කිරීමේ යාන්ත්‍රණය අඛණ්ඩව පවත්වාගෙන යාම.
- ජාතියට අඛණ්ඩව ඉන්ධන සැපයීම.
- පරිභෝජන සීමාවන් ලිහිල් කිරීම (QR ක්‍රමය අත්හිටුවීම).
- TPTL හි බද්ධ ව්‍යාපාර සමාගමේ ආයෝජනය.
- කෘෂි රසායන ව්‍යාපාරය නැවත අත්පත් කර ගැනීම.

2024 වසර සඳහා අපේක්ෂාව

- ගබඩා කිරීමේ සහ බෙදාහැරීමේ කටයුතු වැඩිදියුණු කිරීම්.
- කල්බදු ලෙස ලබාගත් ත්‍රිකුණාමලයේ ටැංකි සමූහයෙහි ටැංකි 24 නවීකරණය කිරීම.
- පවතින අලෙවිසැල් වැඩිදියුණු කිරීම..
- ලාභදායී කෘෂි රසායන සහ ලිහිසි තෙල් නිෂ්පාදන හඳුන්වාදීම.

1,315
(රු. බි.)
ආදායම

4,184
(ලී. මිලියන)
විකුණුම්

ප්‍රවාහන		959.30 රු.බි.
බලශක්ති		181.38 රු.බි.
ගුවන් සේවා		121.52 රු.බි.
කර්මාන්ත		18.80 රු.බි.
දේශීය		32.21 රු.බි.
කෘෂි		1.61 රු.බි.

2023 වසර සංස්ථාව සඳහා එහි ක්‍රියාකාරකම් ධනාත්මක ලෙස ඉදිරියට ගෙන යන විවිධ ආර්ථික බලපෑම් මගින් හැඩගස්වා ඇති තීරණාත්මක කාලසීමාවක් බවට පත් වී ඇත. 2022 අභියෝගාත්මක ආර්ථික පසුබිම හමුවේ, විශ්වාසය සහ ස්ථාවරත්වය ඇති කරමින් ජාතියට ස්ථාවර ඉන්ධන සැපයුමක් කළමනාකාරණය කිරීමට සංස්ථාව සමත්විය.

ජාත්‍යන්තර ඉන්ධන මිල ගණන් අඛණ්ඩව පහත වැටීම හේතුවෙන් සැපයුම් දාමය සඳහා පැවති බාධාවන් ක්‍රමානුකූලව ප්‍රගතියක් ලබා ඇත.රුපියලේ අගය ඉහළ යාම සංස්ථාවට සැලකිය යුතු ප්‍රතිලාභ ගෙන දී ඇත.

ශ්‍රී ලංකාවේ ආර්ථික අවපාතය හේතුවෙන් 2022 දී මුහුණ දුන් සැලකිය යුතු අභියෝගවලට ප්‍රතිවිරුද්ධව, සංස්ථාව ස්ථාවර ලෙස දියුණුවේ ගමන් මගක් පෙන්නුම් කර ඇත. ජාත්‍යන්තර තෙල් වෙළඳපොලේ දක්නට ලැබෙන ධනාත්මක ප්‍රවණතා විශේෂයෙන් ශ්‍රී ලංකාවට ඉන්ධන ආනයනය සඳහා අවශ්‍ය එක්සත් ජනපද ඩොලර් සඳහා ඇති හිඟය නැතිවී යාම සංස්ථාවේ ක්‍රියාකාරිත්වය ඉහළ නැංවීමට උපකාරී වී ඇත.

සංස්ථාව විවිධ උපායමාර්ගික මුලපිරීම් ක්‍රියාත්මක කිරීම, විශේෂයෙන් පූර්ව ගබඩා ක්‍රමය මත ගෙවීමේ විකල්පය හරහා සැපයුම්කරුවන් සාර්ථකව ආකර්ෂණය කර ගෙන ඇත. බොරතෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ලබා ගැනීම සහතික කිරීම සඳහා මෙම ප්‍රවේශය ඵලදායී බව ඔප්පු වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස තම නිෂ්පාදන සැපයුම ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට සංස්ථාවට හැකි වී තිබේ. රජය විසින් අභියෝගාත්මක ආර්ථික තත්ත්වයන් හමුවේ පවා ඉන්ධන පිරවුම්හල්වල සහ ගුවන් තොටුපළවල ඛනිජ තෙල් නිෂ්පාදන ස්ථාවර සැපයුමක් පවත්වා ගනිමින් ජාතික ආරක්ෂාව ඵලදායී ලෙස තහවුරු කර ඇත.

මෙම අඩු වීම නිසා ජාතියට සැලකිය යුතු විදේශ මුදල් ඉතිරියක් සිදු වී ඇති අතර, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට(CPC) මෙම ප්‍රතිලාභ මහජනතාවට ලබා දීමට එමගින් ඉඩ සැලසී ඇත.

වත්මන් මිලකරණ යාන්ත්‍රණය පවත්වා ගැනීමට රජය ගත් තීරණය සහ රජයේ ශේෂ පත්‍රය ශක්තිමත් කිරීමේ වැඩසටහන හරහා CEB & SLA හි හිඟ මුදල් පියවීම සංස්ථාවේ ක්‍රියාකාරිත්වයට ධනාත්මක ලෙස බලපා ඇති අතර එය ද්‍රවශීලතා තත්ත්වයන් වැඩිදියුණු කිරීමට හේතු විය. තවද, ලාභදායීතාව සඳහා ධනාත්මක ආන්තිකයක් සහිතව පිරිපහදු මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යෑම සහ සියළුම අංශයන් විසින් සිය මූල්‍ය කාර්ය සාධනය වැඩිදියුණු කිරීම නිසා සමස්ත කාර්ය සාධනය වැඩිදියුණු විය. ආදායම රු. බිලියන 1,154.4 සිට රු. බිලියන 1,315 දක්වා වර්ධනය විය. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය වර්ෂය නිමා වූයේ දළ ලාභය රු. බිලියන 162.11 ක් සහ මෙහෙයුම් ලාභය රු. බිලියන 89.87 ක් ලෙස වාර්තා කරමිනි. මීට අමතරව, අනෙකුත් ආදායම්, විනිමය ලාභ, පොලී ආදායම් සහ පොලී වියදම් අඩු වීම 2023 වසර සඳහා රු. බිලියන 120.31 ක සුවිශේෂී ලාභයක් ලබා ගැනීමට හේතු විය.



ප්‍රවාහන

දිවයින පුරා පිහිටි පිරවුම්හල් 990කින් සමන්විත අපගේ පුළුල් ජාලයට සහ පාරිභෝගිකයින් වෙත සෘජුව විදුලි ජනනය සඳහා භාවිත කරන ඉන්ධන හැර පෙට්‍රල්, ඩීසල් සහ භූමිතෙල් බෙදා හැරීම කාර්යක්ෂමව සිදු කරනු ලැබ ඇත. කෙසේ වෙතත්, 2022 ට සාපේක්ෂව ආර්ථිකයේ සිදුවෙමින් පවතින ප්‍රකෘතිය සමග සමපාත වන විකුණුම් වල සුළු පහත වැටීමක් අත්විඳ ඇත.


සමාලෝචනය - 2023

මාසික පදනමින් ජාත්‍යන්තර ඉන්ධන මිල සහ අනෙකුත් පිරිවැය අංග වලට අනුකූලව ඉන්ධන මිල සංශෝධනය කිරීම සඳහා වන මිල යාන්ත්‍රණය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම
QR පද්ධතිය අත්හිටුවීම.
සීමාවකින් තොරව අපනයන මෙහෙයුම් සඳහා පහසුකම් සැලසීමට අපනයනකරුවන්ට USD කොන්දේසි මත ඩීසල් අලෙවි කිරීම දියත් කරන ලදී.
ආදායම රු. බිලියන 959 ක් දක්වා තියුණු ලෙස වැඩි විය.


බණිජ තෙල් නිෂ්පාදනවල විකුණුම් මිල සැලකිය යුතු ලෙස අඩු වී ඇති බව සඳහන් කළ යුතු අතර එසේ වුවද, මෙම මිල ගණන් තීරණය කරනු ලබන්නේ මිලකරණ යාන්ත්‍රණයක් හරහා බැවින්, 2022 මාර්තු මාසයේදී ලබා ගත් මට්ටම්වලට ආපසු නොපැමිණෙනු ඇත. වසර පුරා ජාත්‍යන්තර ඉන්ධන මිලෙහි සාමාන්‍ය අඩුවීමක් හේතුවෙන්, දේශීය විකුණුම් මිල පහළට දමා ඇති අතර ජාත්‍යන්තර ඉන්ධන මිල, විනිමය අනුපාත සහ අනෙකුත් පිරිවැය සාධක සමඟ සමපාත වන පරිදි මාසික පදනමින් සංශෝධනය කිරීම සිදු කෙරේ.

ඉන්ධන මිලෙහි සුළු වෙනස්කම් පවා සාමාන්‍ය ජනතාවට සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි බැවින් පෙට්‍රල් සහ ඩීසල් මිල ඉහළ සංවේදීතාවයක් පෙන්නුම් කරන අතර ඉන්ධන මිල ඉහළ යාම ජනගහනය, ඔවුන්ගේ ජීවන තත්ත්වය සහ ඒ ආශ්‍රිත ව්‍යදම්වල වෙනස්කම් ඇති කරයි.


නිෂ්පාදනය අනුව විකුණුම්



නිෂ්පාදන අනුව ආදායම



ජාත්‍යන්තර මිල ගණන්



සමස්ත ආදායම් දායකත්වය අනුව, මෙම අංශය වඩාත් වැදගත් වන අතර, 2023 දී රු. බිලියන 959.30 ක් ජනනය කළ අතර එය 2022 දී රු. බිලියන 902.77 සිට වැඩි වීමක් වන අතර එය පෙර වසරට සාපේක්ෂව 6% ක වර්ධන වේගයක් නියෝජනය කරයි. එම කාලසීමාව තුළ විකුණුම් පරිමාවේ 7% ක අඩුවීමක් තිබියදී මෙම ආදායම් වර්ධනය අත්කර ගැනීමට හැකි වූ අතර, වසර පුරාවට මිල ගණන් අඛණ්ඩව පවත්වාගෙන යාම ඊට හේතු විය.

2022 හා සසඳන විට, පෙට්‍රල් 92 සඳහා වූ ඉල්ලුම 1.88% ක සාමාන්‍ය වැඩිවීමක් පෙන්නුම් කළ අතර, පෙට්‍රල් 95 සඳහා වූ ඉල්ලුම 48% කින් සැලකිය යුතු අඩුවීමක් අත්විඳ ඇත.

තවදුරටත් ඩීසල් සඳහා වන ඉල්ලුම 11% පහත වැටුණු අතර, එසේම සුපර් ඩීසල් ද 47% කින් සැලකිය යුතු ඉල්ලුම් අඩු වීමක්ද පෙන්නුම් කරයි.වසර පුරා, සංස්ථාව ස්වකීය පවතින ජාලයට නව පිරවුම්හල් ඇතුළත් කරමින් උපාය මාර්ගිකව සිය ජාලය පුළුල් කර ඇත. කෙසේ වෙතත්, රජයේ රෙගුලාසිවලට අනුකූලව, 2023 දී නව තරඟකරුවෙකු වෙළඳපොළට ඇතුළු වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ඉන්ධන සැපයීම සඳහා සංස්ථාවේ පිරවුම්හල් මෙම නව ආයතනයට පැවරීමට සිදු විය. මෙම වෙළඳපල වෙනස්වීම් හේතුවෙන් සංස්ථාවෙහි විකුණුම්වල අඩුවීමක් ඇති විය.

සංස්ථා එහි අලෙවිකරුවන්ගේ QR පද්ධතියට අනුකූල වීම නිරන්තරයෙන් නිරීක්ෂණය කර ඇත. ඉන් අපගමනය වූ අවස්ථා නිරීක්ෂණය වූ විට අදාළ අලෙවි නියෝජිතයාගේ අලෙවිසැලට කෙරෙන සැපයුම් සති දෙකක කාලයක් සඳහා අත්හිටුවන ලදී. අලෙවිකරුවන් මුහුණ දෙන අභියෝග මධ්‍යයේ වුවද, ශක්තිමත් සේවාදායක සබඳතා තහවුරු කිරීමට සහ පාරිසරික වශයෙන් තිරසාර භාවිතයන් පෝෂණය කිරීමට සංස්ථාව විසින් හඳුනාගත් අඩුපාඩු කල්තියා විසඳා ඇත. පරිභෝජන සීමාවන් ක්‍රමයෙන් ලිහිල් කරන ලද අතර, අවසන් ප්‍රතිඵලය ලෙස QR පද්ධතිය සම්පූර්ණයෙන් ඉවත් කිරීම සහ 2023 අගෝස්තු මාසයේදී පරිභෝජන සීමාවන් ඉවත් කිරීම සිදු විය.

තවදුරටත් එක් එක් බෙදුම්කරුවන්ගේ තොග මට්ටම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා අලෙවි නියෝජිත තොග මට්ටම් අධීක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක කර ඇත. මෙම පද්ධතිය බෙදුම්කරුවන්ගේ නිෂ්පාදන ලබා ගැනීම් සහතික කරන අතර සීමිත තොග බෙදා හැරීමට උපකාරී වේ. ග්‍රාමීය ප්‍රදේශවල තොග හිඟ වීම් වැළැක්වීමට ද එය ඉවහල් වී ඇත.

අගෝස්තු මාසය දක්වා පැවති ඩීසල් සහ භූමිතෙල් අතර මිල වෙනස සැලකිල්ලට ගනිමින්, බස් රථ සහ ලොරි ඇතුළු විශාල ප්‍රවාහකයන් විසින් භූමිතෙල් මිශ්‍ර කිරීම නිරීක්ෂණය කිරීම සහ වැළැක්වීම සඳහා දැඩි පියවර ගන්නා ලදී. මෙම ප්‍රවාහකයන් විසින් අඩු ආදායම්ලාභී පවුල් සහ ධීවර ප්‍රජාව සඳහා ලබා දෙන භූමිතෙල් සහනාධාරය අවභාවිත කරන බව අනාවරණය විය.

සෘජු පාරිභෝගික විකුණුම්

ප්‍රවාහන අවශ්‍යතා සඳහා මෙන්ම කාර්මික යෙදුම් සඳහා සෘජු පාරිභෝගිකයන් ට සංස්ථාව ඩීසල් සහ පෙට්‍රල් සපයයි. මෙම සේවාව හමුදා සංවිධාන ඇතුළු රාජ්‍ය ආයතන වලට සහ පෞද්ගලික අංශයේ සමාගම් වලටද සපයනු ලැබේ.

ඇමරිකානු ඩොලර් පදනම් කොට ගෙන කෙරෙන විකුණුම්

අපනයන ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වය විධිමත් කිරීම සඳහා, සංස්ථාව සිය ඉන්ධන අලෙවි පද්ධතිය ගැලපෙන පරිදි එක්සත් ජනපද ඩොලර් පදනම් කොට ස්ථාපිත කර ඇත. මෙම කෘතහස්ත පියවර සංස්ථාව සහ අපනයන සමාගම් අතර වාසිසහගත හවුල්කාරිත්වයක් නිර්මාණය කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස විදේශ මුදල් එකතු වී ඇති අතර, එය සැපයුම්කරුවන් සඳහා වන ඉන්ධන බිල්පත් පියවීම සඳහා ප්‍රයෝජනවත් ලෙස භාවිත කෙරේ.

අපනයන සමාගම් තම මෙහෙයුම් පහසු කර ගැනීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන ලද එක්සත් ජනපද ඩොලර් මත පදනම්ව ඉන්ධන ලබා ගැනීම සම්බන්ධයෙන් සැලකිය යුතු උද්‍යෝගයක් පෙන්නුම් කර ඇත. සංස්ථාව විසින් මෙම කාණ්ඩය තුළ නව පාරිභෝගිකයින් කිහිප දෙනෙකු ඇතුළත් වීම හඳුනාගෙන පසුව ඔවුන්ගේ සැපයුම් අවශ්‍යතා සපුරාලන ලදී. තවද, එක්සත් ජනපද ඩොලරයට අනුව ඉන්ධන තොග වශයෙන් අලෙවි කිරීමට අමතරව, සංචාරකයින් සඳහා පහසුකම් සැලසීම සඳහා ද මෙම පහසුකම යොදා ගන්නා ලදී.

ප්‍රවාහන අංශය සඳහා වන උපාය මාර්ග

- පවතින පිරවුම්හල් ජාලය නවීකරණය කිරීම මඟින් හඳුනාගැනීමේ පහසුව සහ මෙහෙයුම් ධාරිතාවය වැඩිදියුණු කිරීම.
- උපාය මාර්ගික ස්ථානවල නව ඉන්ධන පිරවුම්හල් ස්ථාපනය කිරීම.
- පාරිභෝගික තෘප්තිමත් මට්ටම් සහ අවදානම් කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා අබණ්ඩ අලෙවි නියෝජිත පුහුණුව.
- ප්‍රමාණවත් තොග මට්ටම් සහතික කිරීම සඳහා අලෙවි නියෝජිත තොග මට්ටම් නිරීක්ෂණ පද්ධති වැඩිදියුණු කිරීම.
- සේවාලාභීන්ගේ තෘප්තිය වැඩි කිරීමට සහ පවත්වා ගැනීමට විවිධ අනුකූලතා පරීක්ෂාවන් ක්‍රියාත්මක කිරීම.



බලශක්ති




ජල විදුලිය හා සම්බන්ධ බාධාවන් සහ සීමිත ගල් අඟුරු භාවිතය හේතුවෙන්, තාප විදුලිය නිෂ්පාදනය සඳහා ඇති ඉල්ලුමේ සැලකිය යුතු වැඩි වීමක් දක්නට ලැබේ. ඊට ප්‍රතිචාර වශයෙන්, ලංකා විදුලිබල මණ්ඩලයට (CEB) සහ ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින්ට (IPPs) ස්ථාවර ඉන්ධන සැපයීමක් සහතික කිරීම සඳහා, සැලකිය යුතු උත්සාහයක් ගන්නා ලද අතර එමගින් අඛණ්ඩ බලශක්ති සැපයුම සඳහා පහසුකම් සැලසීම සිදු කෙරුණි.

සමාලෝචනය - 2023
ආදායම රු. බිලියන 181.38 දක්වා වැඩිවිය.
විශේෂයෙන් නැෆ්තා සඳහා ඉන්ධන ඉල්ලුම තියුනු ලෙස වැඩි වීම.
මිල ගණන් මාසිකව සංශෝධනය කෙරේ.

විදුලිය ජනනය කිරීම සඳහා ඉන්ධනවල ඉහළ යන ඉල්ලුම සැලකිල්ලට ගනිමින්, සංස්ථාව සාර්ථක ලෙස පෙර වසරට සාපේක්ෂව සැපයුමෙන් 35% ක වැඩිවීමක් සනිටුහන් කරමින්, විදුලිය උත්පාදනය සඳහා අඛණ්ඩව ඉන්ධන සම්පූර්ණයෙන්ම සැපයීමට සමත් විය. වසර පුරා, සංස්ථාව විසින් ඉන්ධන සැපයුම ආශ්‍රිත පිරිවැය සහ ප්‍රතිලාභ පිළිබිඹු කිරීම සඳහා ඉන්ධන මිල ගණන් සංශෝධනය මාසිකව ක්‍රියාත්මක කරන ලදි.


මෙම මිල ගැලපීම් වල ප්‍රතිඵලයක් ලෙස ඉල්ලුමේ සැලකිය යුතු වැඩිවීමක් සමඟ ඒකාබද්ධව කර්මාන්ත අංශයේ ආදායම 2022 සාපේක්ෂව 41% ක වර්ධනයක් අත්විඳ ඇත.

විකුණුම්




විදුලිබල උත්පාදන අංශය සංස්ථාව සඳහා දෙවන විශාලතම ආදායම් මාර්ගය වූ අතර 2022 දී රු.බිලියන 128.38 ට සාපේක්ෂව වත්මන් වසරේදී රු.බිලියන 181.38ක ආදායමක් ලබා දුනි. විදුලිය නිෂ්පාදනය සඳහා ඉන්ධන සැපයීම ජාතික ආර්ථිකයට ඉතා වැදගත් වන අතර, එය මේ සම්බන්ධයෙන් ගනු ලබන සෑම මූලපිරීමකටම වඩා වැඩි වැදගත්කමක් ගනී.

නිෂ්පාදන අනුව විකුණුම්



තවදුරත්, පිරිපහදුවෙහි දැනට ක්‍රියාත්මක වන මෙහෙයුම් බලශක්ති උත්පාදනයේ අවශ්‍යතා සපුරාලීම අවශ්‍ය ඉන්ධන ප්‍රමාණය සැපයීම සඳහා ඉවහල් වී ඇත.

නිෂ්පාදන අනුව විකුණුම්



2022 දී පිරිපහදුව වසා දැමීම් හේතුවෙන් නැෆ්තා අලෙවියේ අඩුවීමක් සිදු වුවද, අඛණ්ඩ පිරිපහදු මෙහෙයුම් හේතුවෙන් වසර පුරා සැලකිය යුතු නැෆ්තා ප්‍රමාණයක් සැපයීමට සංස්ථාව හට හැකි විය.


ලංකා විදුලිබල මණ්ඩලයේ (CEB) සහ ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින්ගේ (IPPs) මුදල් ප්‍රවාහ සම්බන්ධයෙන් වන ද්‍රවශීලතා ගැටළු ඉස්මතු වූ අතර, එය සංස්ථාවෙහි මූල්‍ය කළමනාකරණ හැකියාවන්ට අහිතකර ලෙස බලපෑ අතර අනවශ්‍ය මූල්‍ය වියදම් වලටද හේතු විය. ජාතික ආර්ථිකය තුළ බලශක්තියේ තීරණාත්මක භූමිකාව හඳුනා ගනිමින්, CEB සහ IPPs හි බෙරුම්කරණ ගැටළු මගින් එල්ල කරන ලද අභියෝග නොතකා, සංස්ථාව උපරිම ඉන්ධන සැපයුම පවත්වා ගැනීමට උත්සාහ කළේය. කෙසේ වෙතත්, දෙසැම්බර් මාසයේදී රජය CEB සහ IPPs වෙතින් හිඟ ශේෂයන් සංස්ථාව වෙත පියවීමෙන් රජය සතු ව්‍යාවසායන්හි ශේෂ පත්‍ර ශක්තිමත් කිරීමේ වැඩසටහනක් හරහා හිඟ ගෙවීම් තත්වයට විසඳුමක් සපයන ලදී.

සුදුසු ආරක්ෂණ ක්‍රම ක්‍රියාත්මකව පවතින බව සහතික කිරීම සඳහා, තොග සමාලෝචන කමිටුව බලශක්ති අංශයෙන් වන ඉන්ධන ඉල්ලුම සතිපතා තක්සේරු කරයි. ජාතියට අඛණ්ඩව බලශක්තිය සහ බලය සැපයීම සහතික කිරීමේ පරම පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා CEB සහ IPPs අතර සහයෝගී සබඳතාවයක් සක්‍රීයව පවත්වාගෙන යනු ලැබේ.

ගුවන් සේවා

සංස්ථාව විසින් කටුනායක, මත්තල සහ රත්මලාන ගුවන් තොටුපළ වලට ගුවන් යානා ඉන්ධන සැපයීම සිදු කරයි. ශ්‍රී ලංකා ගුවන් හමුදාව සහ පුහුණු ආයතන වැනි අනෙකුත් භාවිතා කරන්නන්ටද ඔවුන්ගේ අවශ්‍යතා මත ගුවන් යානා ඉන්ධන සපයනු ලැබේ. ජාත්‍යන්තර ප්‍රවාහනය සඳහා දේශීය හා විදේශීය ගුවන් යානා වලට ගුවන් ඉන්ධන සැපයීම අත්‍යවශ්‍ය බැවින් සංස්ථාව මෙම ව්‍යාපාරික ක්ෂේත්‍රය කෙරෙහි උපායමාර්ගික අවධාරණයක් යොමු කරයි.

ආදායම



සංචාරක කර්මාන්තයේ දියුණුවට උපකාරී වන ගුවන් ගමන් සඳහා අඛණ්ඩ ගුවන් ඉන්ධන සැපයීමට අපගේ උපායමාර්ගික අවධාරණය ලබා දී ඇත.

2022 දී රට තුළට ඉන්ධන ගෙන ඒම සඳහා අවශ්‍ය විදේශ මුදල් හිඟ වීම හේතුවෙන් ගුවන් යානා ඉන්ධන සැපයීම ද අඩාල වී ඇත. කෙසේ වෙතත්, විවිධ උපාය මාර්ග භාවිතා කිරීම මගින්, 2023 දී අඛණ්ඩ සැපයුම සහතික කිරීමට සංස්ථාව සමත් වූ අතර ගුවන් සේවා ව්‍යාපාරය සංචාරක කර්මාන්තයේ දියුණුවට සමාන්තරව අඛණ්ඩව වැඩිදියුණු විය.

සංස්ථාව විසින් අඛණ්ඩව ජෙට් ඒ1(Jet A1) සැපයුම සහතික කරන ලද අතර එය ජාත්‍යන්තර ප්‍රවාහනය අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකියාව ලබා දීම මගින් සංස්ථාව සහ දේශය යන ද්විත්වයටම විශාල වාසි ලබා දෙන අතර ඒ නිසා සංචාරක අංශය වර්ධනය වීම සිදුවේ.

සමාලෝචනය- 2023

සංස්ථාවෙහි මෙහෙයුම් විශිෂ්ටත්වය සංස්ථාවේ ගුවන් සේවා කෙරෙහි විශ්වාසය ගොඩනඟන බව පෙන්වමින් ඒකාබද්ධ පරීක්ෂණ කණ්ඩායම GIC විසින් 2023 සඳහා අඛණ්ඩව 'හොඳ' (සාමාන්‍යයට වඩා වැඩි) තත්ත්වයේ පවතින ආයතනයක් ලෙසට හඳුනාගනු ලැබ ඇත.

ආදායම රු. බිලියන 122 දක්වා වැඩි විය.

BIA පුළුල් කිරීමේ ව්‍යාපෘතිය 2023 අවසන් වන විට භෞතික ප්‍රගතියෙන් 87.8%ක් සහ මූල්‍ය ප්‍රගතියෙන් 78.9%ක් සම්පූර්ණ කර ඇත.

සංස්ථාව විසින් කලාපය තුළ තරඟ කිරීමට උපකාරී වන ශක්තිමත් මිලකරණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කරන ලදී.

ගුවන්සේවා මිලකරන සැලැස්ම මාසික ගාස්තු යාවත්කාලීන කිරීම් ඉල්ලා සිටින අතර, සංස්ථාව විසින් ජාත්‍යන්තර ඉන්ධන මිලෙහි වෙනස්වීමට සමගාමීව පැහැදිලි මිලකරණ ක්‍රමයක් සහ සියලු පාර්ශව කරුවන් සඳහා නිර්මාණය කර ඇත.

සංචාරක ව්‍යාපාරයේ ප්‍රගතිය හා ආර්ථික ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීමත් සම අඛණ්ඩ සැපයුමත් සමඟ 2022 වසරට සාපේක්ෂව ඉන්ධන සැපයුම 59.6% කින් වැඩි කිරීමට දායක විය. මෙය ආර්ථික පුණර්ජීවනය සහ සංචාරක පහසුකම් සඳහා අපගේ කැපවීම පෙන්නුම් කරයි.

ගුවන්සේවා අංශයේ ආදායම වසරින් වසර 47.8% ඉහළ ගොස් රු.බිලියන 121.5 ක විකුණුම් පරිමාවේ වලනය සහ විකුණුම් මිලෙහි වැඩිවීමත් සමඟ ය.

අනුකූලතා සපුරාලීම සඳහා සංස්ථාවෙහි කැපවීමේ අංගයක් හැටියට සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ තත්ත්ව සහතික කිරීමේ නිර්ණායක වලට අනුකූල බව තහවුරු කිරීම සඳහා ඒකාබද්ධ පරීක්ෂණ කණ්ඩායම (JIG) විසින් වාර්ෂික විගණන සිදු කරන ලදී. සංස්ථාවෙහි මෙහෙයුම් විශිෂ්ටත්වය සංස්ථාවේ ගුවන් සේවා කෙරෙහි විශ්වාසය ගොඩනඟා ඇති බවට සාක්ෂි දරමින් 2023 සඳහා අඛණ්ඩව 'හොඳ' (සාමාන්‍යයට වඩා වැඩි) තත්ත්වයේ පවතින ආයතනයක් ලෙසට සංස්ථාවේ හඳුනාගනු ලැබ ඇති බව සඳහන් කිරීම වටී.

ඉදිරි මග

ශ්‍රී ලංකාවේ සියලුම ගුවන් තොටුපලවල ජාත්‍යන්තර ගුණාත්මකභාවය සහ පිරිවිතර සපුරාලන ගුවන් සේවා සඳහා වන පෙට්‍රල් සැපයීමට සංස්ථාව කැපවී සිටී. මෙය සිදු කිරීම සඳහා, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ නවීකරණය කිරීම සඳහා ආයෝජන සිදු කරනු ලබන අතර, නවීන තාක්ෂණය භාවිතා කරමින් ඉන්ධන සැපයීම සිදු කෙරේ. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ සහ යාපනය ගුවන්තොටුපළේ ධාරිතාව වැඩි දියුණු කිරීම සහ ඉන්ධන අඛණ්ඩතාව සහතික කිරීමේ ව්‍යාපෘති දැන් ක්‍රියාත්මක වෙමින් පවතී.

ගුවන්තොටුපල සංවර්ධන ව්‍යාපෘතියට සමගාමීව, සංසථාව විසින් 2018 ජනවාරි මාසයේදී බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ නව හයිඩ්‍රන්ට් පද්ධතිය සහ ව්‍යාප්ති ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. කෝවිඩ්-19 වසංගතය හා ආර්ථික අවපාතය හේතුවෙන් ප්‍රමාද වුවද, 2023 අවසන් වන විට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතියෙන් 87.8% ක් සහ මූල්‍ය ප්‍රගතියෙන් 78.9% ක් සම්පූර්ණ කර ඇති අතර එහි ක්‍රියාකාරිත්වය 2024 දී ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.




කර්මාන්ත



කාර්මික භූමිතෙල්, කර්මාන්ත සඳහා වන ඉන්ධන තෙල්, ලිහිසි තෙල් සහ ද්‍රාව්‍ය (SBP) පුද්ගලික ගනුදෙනුකරුවන්ට විකිණීමෙන් ලැබෙන ආදායම මෙම තීරුවේ දක්වා ඇත. කර්මාන්තයෙන් ලැබෙන මුළු ආදායම පෙර වර්ෂයේ රු. බිලියන 21.1 ට සාපේක්ෂව 2023 දී රු. බිලියන 18.8 දක්වා අඩුවී පහත වැටීමක් පෙන්වයි. මෙම අඩුවීම විකුණුම් පරිමාව අඩුවීමට සහ විකුණුම් මිලෙහි පහළට ගැලපීම් වලට හේතු විය. මීට අමතරව, විදුලිය ඇනහිටීම් ඇතිවීම හේතුවෙන් 2022 දී කර්මාන්ත වලට සැලකිය යුතු ඉන්ධන ප්‍රමාණයක් ලබා ගැනීමට හේතු විය. කෙසේ වෙතත්, 2023 දී ස්ථාවර බල සැපයුමක් යථා තත්ත්වයට පත් කිරීමත් සමඟ කර්මාන්ත වලට ඉන්ධන සඳහා පැවති ඉල්ලුම ක්‍රමයෙන් අඩු වී ඇත.

නිෂ්පාදන අනුව ආදායම




2023 දී ඉන්ධන තෙල් වලින් ලද ආදායම පෙර වසරේ රු.බිලියන 18.2 සිට රු.බිලියන 15.7 කින් අඩු වූ අතර, එය කාර්මික ආදායමට දායක වන විශාලතම දායකයා බවට පත් වේ. 2023 වසර තුළ ඉන්ධන තෙල් සඳහා ඉල්ලුම 8.17% කින් අඩු විය.

ලිහිසි තෙල් යනු කර්මාන්ත අංශයේ අපගේ තරඟකාරී උපායමාර්ගික ව්‍යාපාරික ඒකකයකි. අපගේ සියලුම ලිහිසි තෙල් ISO 9001 /2000 සහතිකය සහිත මිශ්‍ර කිරීමේ කම්හලකදී මිශ්‍ර කරනු ලැබේ. සිපෙට්ටෝ (Ceypetco) සන්නාමයේ ලිහිසිතෙල් විවිධ ලිහිසි තෙල් වර්ග වලට අදාළ ජාත්‍යන්තර පිරිවිතරයන් වන ඇමරිකන් පෙට්ට්‍රෝලියම් (API),MTU Friedrichshafen SmbH සහ European Automobile Manufapturera Association (ACEA) වැනි අදාළ ජාත්‍යන්තර පිරිවිතරයන් වලට අනුකූල වන අතර, කාර්මික සහ මෝටර් රථ යෙදුම් යන දෙඅංශයෙන්ටම අදාළ වේ.

අපගේ කැපවූ වෘත්තිකයන් කණ්ඩායම, විශ්වසනීය සහ ඵලදායී අලෙවි නියෝජිත ජාලයක් සමඟ එක්ව, පාරිභෝගික අපේක්ෂාවන් අඛණ්ඩව අභිබවා යන පුළුල් විසඳුම් සහ සේවාවන් සපයයි. අපගේ ගනුදෙනුකරුවන්ගේ අපේක්ෂාවන් ඉක්මවා යාමට ඔවුන් කැපවී සිටිති

ආදායම



අපගේ සැපයුම්කරුවන් සමඟ සැපයුම් දාම අභියෝග විසඳා ගැනීමෙන් පසුව, අපගේ ආදායම කැපී පෙනෙන වර්ධනයක් අත්විඳ ඇති අතර එම වර්ධනය රු. බිලියන 0.76 සිට රු. බිලියන 1.56 කි.

මෙම සැලකිය යුතු දියුණුව පෙර වසරට සාපේක්ෂව විකුණුම් පරිමාවේ 45% ක වැඩිවීමක් නිසා ඇති වූවකි. සංස්ථාව ක්‍රමානුකූලව එහි වෙළඳපල තත්ත්වය නැවත ලබා ගනිමින් සිටී.

2023 දී ඉන්ධන සැපයුම අඛණ්ඩව සහතික කිරීම සහ පරිභෝජන සීමාවන් ඉවත් කිරීම කාර්මික භූමිතෙල් සඳහා ඇති ඉල්ලුම ක්‍රමයෙන් අඩුවීමට හේතු වී තිබේ. විශේෂයෙන්ම, කාර්මික භූමිතෙල් සඳහා වන ඉල්ලුම 2022 ට සාපේක්ෂව 67.6% කින් අඩු වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස කාර්මික භූමිතෙල් අලෙවියෙන් උපයන ආදායම පෙර වසරේ රු.බිලියන 2.0 සිට 2023 දී රු. බිලියන 0.7 ක් දක්වා අඩු වී ඇත.

සංස්ථාව විසින් SBP සඳහා ඉදිරිපත් කරන ලද සම්පූර්ණ ඉල්ලීම සාර්ථකව ඉටු කරන ලදී. කෙසේ වෙතත්, රට තුළ ඉන්ධන ලබා ගැනීමේ හැකියාව වැඩිවීමත් සමඟ, SBP සඳහා වන ඉල්ලුම 1.9% ක අඩුවීමක් අත්විඳ ඇති අතර එය පෙර වසරට සාපේක්ෂව 26.9% ක ආදායම් පහත වැටීමකට හේතු වී ඇත. මීට අමතරව, ජාත්‍යන්තර මිල ගණන්වල පහළ යාමත් සමඟ විකුණුම් මිල අඩුවීම, ආදායම පහත වැටීමට තවදුරටත් දායක වී තිබේ.



ගෘහස්ත අංශය



පිරිපහදුව අඛණ්ඩ මෙහෙයුම් පවත්වා ගැනීමට ඉඩ සලසමින් සැපයුම් දාම අභියෝග ක්‍රමානුකූලව වැඩිදියුණු වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, එය භූමිතෙල් සඳහා වන සම්පූර්ණ ඉල්ලුම සාර්ථකව සපුරා ඇති අතර, ද්‍රව පෙට්‍රෝලියම් වායු (LPG) සැපයුමේ සැලකිය යුතු වැඩි වීමක් ද අත්විඳිමින් සිටී. භූමිතෙල් ඉල්ලුම අඩු වුවද, මූල්‍ය වර්ෂය තුළ රු. බිලියන 32.2 ක ආදායමක් ලද අතර එය මෙම අංශයෙන් ලද ආදායමේ 71.2% ක වැඩි වීමකි.

රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව, භූමිතෙල් මිල 2023 පුරා මිල සැපයුම හා සම්බන්ධ පිරිවැයට ගැළපෙන පරිදි සකස් කර ඇති අතර මෙම තත්වය භූමිතෙල් අලෙවියෙන් ලැබෙන ආදායම වැඩි කිරීමට දායක වේ. මීට අමතරව, ජාත්‍යන්තර ඉන්ධන මිල සහ අනෙකුත් පිරිවැය සාධක සමඟ විකුණුම් මිල සමපාත කිරීම සඳහා භූමිතෙල් මිල මාසික පදනමින් සංශෝධනය කෙරේ.

ඩීසල් සහ භූමිතෙල් අතර පවතින මිල විෂමතාවය හේතුවෙන් බස් රථ සහ ට්‍රක් රථ ඇතුළු ඇතැම් විශාල ප්‍රවාහකයන් විසින් භූමිතෙල් සහනාධාරය සූරාකෑමට ලක් කරති. ඊට ප්‍රතිචාර වශයෙන්, අනපේක්ෂිත ප්‍රතිලාභීන්ට සහනාධාර ගල යෑම අවම කිරීම අරමුණු කරගනිමින්, ඇතැම් බර ප්‍රවාහකයන් විසින් භූමිතෙල් මිශ්‍ර කිරීම වැළැක්වීම සඳහා දැඩි ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර ඇත.


පිරිපහදුව අඛණ්ඩව ක්‍රියාත්මක වී ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ද්‍රව පෙට්‍රෝලියම් වායු (LPG) සැපයුමෙහි කැපී පෙනෙන 329% ක වැඩිවීමක් වාර්තා වී ඇති අතර, එම ප්‍රමාණය කිලෝග්‍රෑම් මිලියන 23.8 කි. එහි ප්‍රතිඵලයක් ලෙස වසර තුළ ද්‍රව පෙට්‍රෝලියම් වායු (LPG) අලෙවියෙන් උපයන ලද ආදායම රු. බිලියන 5.3 ක් ලෙස වාර්තා විය.

කෘෂි රසායන



සංස්ථාව දශක පහකට වැඩි කාලයක් කෘෂිරසායන කර්මාන්තයේ නියැලී සිටී. අප රාජ්‍ය ආයතනයක් ලෙස, වෙළඳපලේ මිල නියාමයෙකු ලෙස ක්‍රියාත්මක වෙමින් තරඟකාරී සූරාකෑමෙන් ගොවීන් ආරක්ෂා කරන අතර උසස් තත්ත්වයේ කෘෂි රසායන නිෂ්පාදන සාධාරණ මිලකට ලබා දීම සහතික කරයි.

ආදායම



කෘෂිරසායන ද්‍රව්‍ය ආනයනය සහ නිෂ්පාදනය සඳහා පහසුකම් සැලසෙන මෑතකාලීන ප්‍රතිපත්තිමය වෙනස්කම් හේතුවෙන් මෙම අංශය යළි පිබිදීමක් අත්විඳිමින් සිටී. 2022 වසරේ පනවා තිබූ කෘෂි රසායන ආනයන තහනම ඉවත් කිරීමට රජය ගත් තීරණය එම වසර අවසන් වන විට ව්‍යාපාරයේ පුනර්ජීවනයට දායක වී තිබේ.

එහි ප්‍රතිඵලයක් ලෙස කෘෂි රසායන අංශයෙන් උපයන ආදායම පවත්නා වර්ෂය තුළ රු. බිලියන 1.6 ක් වූ අතර එය 2022 දී වාර්තා වූ රු.. බිලියන 0.29 ට වඩා කැපී පෙනෙන වර්ධනයක් වන අතර ඉන් රු.. බිලියන 1.32 ක කැපී පෙනෙන වර්ධනයක් පිළිබිඹු කෙරේ.



නිෂ්පාදනයේ ගුණාත්මකභාවය සහතික කිරීම සහ සෞඛ්‍ය සම්පන්න සහ ආරක්ෂිත පරිසරයක් පවත්වා ගැනීම සඳහා ස්ථාපිත ක්‍රියා පටිපාටි පිළිපැදීමට සංස්ථාව කැපවී සිටී. කෘෂිරසායන ද්‍රව්‍ය හා සම්බන්ධ ආවේනික අවදානම් සැලකිල්ලට ගනිමින්, අපගේ මෙහෙයුම් ප්‍රශස්ත කිරීම සඳහා අපි විවිධ ක්‍රියාවලි සහ පාලන ක්‍රියාත්මක කර ඇත්තෙමු.මේ සඳහා, අපි ISO 9001:2015, ISO 14001:2015, සහ ISO 18001:2007 සඳහා ISO කාර්ය සාධන ඇගයීම් සිදු කර ඇත.



අපගේ නව නිපැයුමක් ලෙස, සංස්ථාව විසින් "ෆ්ලිපර්" නම් ජෛව කෘමිනාශකයක් හඳුන්වා දෙන ලද අතර එය අපගේ පරිසර හිතකාමී නිෂ්පාදන පරාසය පුළුල් කිරීමේ මූලාරම්භයන්ගේ එක් අවස්ථාවකි. 2021 දී එක්සත් රාජධානියේ හොඳම නවෝත්පාදනය සඳහා වන රැජින සම්මානය ෆ්ලිපර් ජෛව කෘමිනාශකයට හිමිවීම කැපී පෙනේ.

තිරසාර සංවිධානයක් ලෙස, අපි පාරිසරික භාරකාරත්වයට සහ කෘෂි රසායන ද්‍රව්‍යවල විභව අවදානම් සහ අනිසි භාවිතය අවම කිරීමට කැපවී සිටිමු. තව දුරටත්, අඩු ආදායම්ලාභී ගොවීන්ට තරඟකාරී මිල ගණන් යටතේ උසස් තත්ත්වයේ කෘෂි රසායන ලබා දීමෙන් තම බෝග අස්වැන්න ඉහළ නැංවීමට සහ ඔවුන්ගේ ආදායම් මට්ටම ඉහළ නැංවීමට සහාය වීම අපගේ අරමුණයි.

පසුගිය වසර තුළ, සංස්ථාව විසින් අපගේ කෘෂිරසායන ව්‍යාපාරය අඩුවෙන් පහසුකම් ලබන වෙළෙඳපොළ දක්වා තවදුරටත් ව්‍යාප්ත කිරීම සඳහා නව අලෙවි නියෝජිතයන් 70කට අධික සංඛ්‍යාවක් පත් කර ඇත.

ඉදිරි මග

මුතුරාජවෙල ප්‍රදේශයේ නවීනතම කෘෂි රසායන කර්මාන්ත ශාලාවක් පිහිටුවීම සඳහා සිත්ගන්නා සුළු පිවිසුමක් ගෙන තිබේ. මෙම අනාගත අපේක්ෂා සහිත ව්‍යාපෘතියට සියලු අත්‍යවශ්‍ය පහසුකම් සහ නවීන තාක්ෂණික දියුණුව අන්තර්ගත කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ආයෝජනයේ මූලික වශයෙන්ම පෙරළිකාර පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා මග පාදනු ලැබිය හැකි අති නවීන උපකරණ තැන්පත් කිරීම සඳහා නිර්මාණය කර ඇති නවීන තාක්ෂණික විද්‍යාගාරයක් ද ස්ථාපනය කෙරේ.

සපුගස්කන්ද බෙදාහැරීමේ පර්යන්තය

පෙට්‍රල් 92, ඔටෝ ඩීසල්, භූමිතෙල්, දැවිතෙල් සහ ජෙට් ඒ-1 වැනි ඉන්ධන සඳහා අපගේ මෙහෙයුම් වලදී කේන්ද්‍රස්ථානයක් වන සපුගස්කන්ද බෙදාහැරීමේ පර්යන්තය යොදා ගැනේ. සංස්ථාව වෙත හිමිකාරිත්වය ඇතිව අභිමානවත් ලෙස ක්‍රියාත්මක වන මෙම පහසුකම, පිරිපහදු කළ බනිජ තෙල් නිෂ්පාදන ආසන්නයේ ඇති පිරිපහදුවේ සිට විවිධ ගමනාන්ත වෙත කෙලින්ම බෙදා හැරීමෙහි ලා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

පෙර වසරේ පැවති රු. බිලියන 47.8ක් වටිනාමකින් යුතු ඉන්ධන ප්‍රමාණයේ සිට කැපී පෙනෙන ධාරිතාවක් වූ රු. බිලියන 139.3ක් වටිනා ඉන්ධන බෙදා හරින මෙම පර්යන්තය පසුගිය වසර තුළ බලාගාරයක් විය. ගුවන් යානා සඳහා ඉන්ධන සැපයීම තහවුරු කරමින් කටුනායක සහ මත්තල ගුවන් තොටුපළ වෙත ජෙට් A-1 ගුවන් යානා ඉන්ධන සැපයීම එමගින් ඉටු කරන ලද කැපී පෙනෙන දායකත්වයක් වේ.

සපුගස්කන්ද පර්යන්තය විසින් මූලික වශයෙන් අලෙවි නියෝජිතයින්ගේ ස්වකීයම වූ බවුසර් රථවල ඉන්ධන අවශ්‍යතා සපුරාලනු ලබන අතර, මෙම උපක්‍රමය මඟින් අයකිරීම් (Throughput) කපා හැරීම පමණක් නොව, කොලොන්නාව අවට මාර්ග තදබදය අවම කිරීමට ද උපකාරී වේ. මීට අමතරව, එය බලශක්ති භූ දර්ශනය තුළ එහි භූමිකාව තවදුරටත් ශක්තිමත් කරමින්, දැවිතෙල් සැපයීම සඳහාද උපකාරී වේ. පිරිපහදුව සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වන බැවින්, පර්යන්තයේ ප්‍රයෝජනයද අනුරූපී ලෙස ඉහල යාමක් දක්නට ලැබේ.



වසර පුරා, සංස්ථාව විසින් එහි බෙදාහැරීමේ පර්යන්තවල කාර්යක්ෂමතාව සහ ධාරිතාව ඉහළ නැංවීම අරමුණු කරගත් විවිධ ව්‍යාපෘති සඳහා ආයෝජනය කර ඇත. ඉන්ධන ටැංකි ප්‍රතිසංස්කරණය කිරීම සහ ටැංකිවල මැනීමේ පද්ධතියක් සම්පූර්ණ කිරීම වැනි වැඩිදියුණු කිරීම් ක්‍රියාත්මක කර ඇති අතර, එමගින් පර්යන්තය සංස්ථාව හි ඉන්ධන බෙදා හැරීමේ යාන්ත්‍රණයේ වැදගත් අංගයක් ලෙස පවතින බව සහතික කෙරෙයි.

පිරිපහදු මෙහෙයුම්

1969 වර්ෂයේදී ආරම්භ කිරීමේ සිටම සපුගස්කන්ද පිරිපහදුව අපේ ජාතියේ වටිනාකම සඳහා මුල් ගලක් ලෙස ක්‍රියා කරයි. 1970 වැනි අතීතයක සිට , එමගින් රටේ සමස්ත ඉල්ලුම සපුරාලන ලද අතර, අද වන විට, එය ඉහළ යන ඉල්ලුම මධ්‍යයේ සංස්ථාවෙහි විකුණුම් වලින් දළ වශයෙන් 35%-50% පමණ ඉටු කරමින් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

එය වටිනාකම් නිර්මාණය කරන්නේ කෙසේද?

- 100% ක්ම ශ්‍රී ලාංකික කාර්ය මණ්ඩලයක් සමඟ ක්‍රියාත්මක වීම.
- පුරවැසියන් 1000 කට පමණ සෘජු රැකියා අවස්ථා ලබා දීම.
- සමස්ත සංස්ථාව විකුණුම් පරිමාවෙන් 35%-50% ක් සපයයි.
- පිටතට ගලා යන විදේශ විනිමය
- ඉතිරි කරයි.
- වසර 53 ක අඛණ්ඩ මෙහෙයුම් සාර්ථකව නිම කරන ලදී.
- පිරිපහදු පුහුණු සඳහා විදේශීය රටවල ඉහළ පිළිගැනීමක්.

2022 වසර කැලඹිලි සහිත පරිච්ඡේදයක් වූ අතර, බොරතෙල් හිඟය හේතුවෙන් පිරිපහදුව වසා දැමීම් රාශියක්ම එම කාලය තුළ සනිටුහන් විය. එහෙත්, සංස්ථාව විසින් ක්‍රියාත්මක කරන ලද උපායමාර්ගික මුලපිරීම් සහ ක්‍රියාකාරී ක්‍රියාමාර්ග හේතුවෙන්, අපි 2023 පුරා පිරිපහදුව වෙත ස්ථාවර බොරතෙල් සැපයුමක් සාර්ථකව සහතික කළෙමු. එහි ප්‍රතිඵලයක් ලෙස, අත්‍යවශ්‍ය පුනර්ජනන උත්ප්‍රේරක සඳහා කෙටි වසා දැමීමක් පමණක් සමඟින් පිරිපහදුව මේ වසරේ සුමටව ක්‍රියාත්මක විය.



2023 වසර තුළ පිරිපහදුව බොරතෙල් මෙට්‍රික් ටොන් 1,677,033ක් සකස් කර ඇති අතර එය අඛණ්ඩ බොරතෙල් සැපයුම් සමඟ පෙර වසරට වඩා 217%ක වැඩිවීමකි.

උත්ප්‍රේරක පුනර්ජනනය සඳහා නියමිතව තිබූ වසා දැමීමක් හැර, පිරිපහදුව 2023 වසර පුරා අඛණ්ඩව සිය මෙහෙයුම් පවත්වාගෙන ගියේය.



බොර තෙල් වර්ගය	ප්‍රතිශතය (%)
මර්බන් බොර තෙල්	82.68
සයිබේරියන් ලයිට්	9.76
උරල් බොර තෙල්	1.99
එස්පෝ බොර තෙල්	5.57

මෙම කාල පරිච්ඡේදය තුළ, සංස්ථාව පිරිපහදුව මූලික වශයෙන් මර්බන් බොරතෙල් යොදා ගන්නා ලද අතර, සයිබීරියන් ලයිට්, වූරල් සහ ESPO බොරතෙල් සම්මිශ්‍රණයක් ඊට අමතරව භාවිතා කරන ලදී. පිරිපහදුව විසින් වසර සඳහා වන මුළු ඉල්ලුමෙන් 46.9% ක් සඳහා දායක වූ අතර එය 2022 දී 14.4% ක් වූ ප්‍රමාණයේ සිට සැලකිය යුතු වර්ධනයකි. මෙම නිෂ්පාදන මට්ටම පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය අඩු කිරීමට දායක විය.

පිරිපහදුව විසින් 2023 දී මෙට්‍රික් ටොන් 1,677,034 (MT) නිෂ්පාදන නිමැවුමක් ලබා ගත් අතර, එය 2022 දී වාර්තා වූ මෙට්‍රික් ටොන් 529,779 සිට සැලකිය යුතු වැඩි වීමක් නියෝජනය කරයි. සැපයුම් යථා තත්ත්වයට පත්වීම සහ අඛණ්ඩ ක්‍රියාකාරකම් නැවත ආරම්භ කිරීම 2023 සඳහා නිෂ්පාදන මට්ටම්වල කැපී පෙනෙන ඉහළ යාමකට හේතු වී තිබේ. මෙම කාල පරිච්ඡේදය තුළ, පිරිපහදුව විසින් විවිධ ඛනිජ තෙල් නිෂ්පාදන දහයක් සාර්ථකව නිෂ්පාදනය කරන ලද අතර ඔටෝ ඩීසල්, දැව් තෙල්, ජෙට් ඒ-1, පෙට්‍රල් 92 සහ භූමිතෙල් සමස්ත නිමැවුමට මූලික දායකත්ව සැපයීය. මෙම නිෂ්පාදන කොළොන්නාව නිමාව, සපුගස්කන්ද බෙදාහැරීමේ පර්යන්තය වෙත සහ ලංකා විදුලිබල මණ්ඩලය (CEB) සහ ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් ඇතුළු පාරිභෝගිකයින් වෙත සෘජුවම බෙදා හැර ඇත.

පිරිපහදුව ආරම්භ කරන ලද්දේ 1969 දී වුවද, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) ප්‍රශස්ත නඩත්තු පිළිවෙත් තුළින් එහි අඛණ්ඩ ක්‍රියාකාරිත්වය සහතික කර ඇත. තවද, පිරිපහදු මෙහෙයුම් උපරිම කිරීමට සහ නිෂ්පාදනය උපරිම කිරීමට පුද්ගලයින් පුහුණු කිරීම කෙරෙහි සැලකිය යුතු අවධානයක් යොමු කිරීමද සිදු කෙරේ.

අපගේ උපායමාර්ග

බනිජ තෙල් ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම ආයතනය ලෙස, සංස්ථාවෙහි කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන මූලපිරීම් ඇතුළත් උපාය මාර්ග රටේ ජාතික අභිලාෂයන් ඉටු කිරීම සඳහා අපගේ අරමුණු සමඟ සංකීර්ණ ලෙස පෙළගැසී ඇත. සංස්ථාව ක්‍රියාත්මක වන්නේ දේශීය සහ ගෝලීය ආර්ථික තත්ත්වයන් දෙකෙන්ම බලපෑමට ලක්වන ඉතා චංචල භූ දර්ශනයක් තුළ ය. මෙම අභියෝගාත්මක පරිසරය පිළිබඳ සවිස්තරාත්මක උපාය මාර්ගික ඉදිරි දර්ශනයක් අනුගමනය කරමින්, සංස්ථාව ස්වකීය සාර්ථකත්වයට අත්‍යවශ්‍ය අවස්ථාවන්ගෙන් ප්‍රයෝජන ගැනීමට සිය උපාය මාර්ග සකස් කර ඇත.

බලශක්ති ක්ෂේත්‍රය 2023 වසර පුරා ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත් විය. රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව, කර්මාන්තය තුළ නව ප්‍රවේශයන් මතු වීමට පටන් ගෙන තිබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, අපගේ පිරවුම්හල්වලින් කොටසක් මෙම නව තරඟකරුවන් වෙත සංචරණය කෙරෙමින් පවතින අතර, අනාගත තරඟකාරීත්වයට විසඳුම් සෙවීම සඳහා උපාය මාර්ග සකස් කරමින් පවතී. ජාතික ආර්ථික රාමුව තුළ බාධාවකින් තොරව ක්‍රියාත්මක වීම සහතික කරන අතරම ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් සපයන සාර්ථක ව්‍යාපෘතියක් සහ තිරසාර සංවිධානයක් පෝෂණය කිරීම සඳහා අපගේ ප්‍රතිපත්ති උපායමාර්ගිකව සැලසුම් කර ඇත.




ලාභදායී වර්ධනය

සංස්ථාව කැපවී සිටින්නේ අභියෝග හඳුනාගෙන ලාභදායීත්වය ඉහළ නැංවීමට සහ මූල්‍ය තිරසාරභාවය සහතික කිරීමට ඇති අවස්ථා ප්‍රයෝජනයට ගන්නා නව්‍ය උපාය මාර්ග සැකසීම සඳහාත් වේ. සන්නාම සමානාත්මතාවය ගොඩනැගීම, ලාභ උත්පාදනය සහ පාර්ශවකරුවන්ට වටිනාකමක් ලබා දීම අරමුණු කරගනිමින් පාරිභෝගික තෘප්තිය සහ එහි ව්‍යාපාරික හවුල්කරුවන්ගේ අවශ්‍යතා සඳහා සංවිධානය ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දෙයි. විවිධ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම තුළින් සහ රජයේ සහ නියාමන ආයතනවල සහාය ඇතිව, නිෂ්පාදනවල ස්ථාවර සැපයුමක් පවත්වා ගැනීමට සංස්ථාව සැලකිය යුතු උත්සාහයක් ගෙන ඇත. බොරතෙල් සහ පිරිපහදු කළ ඉන්ධන යන දෙකටම පෙර ගබඩා කිරීමේ ක්‍රමයක් අනුගමනය කිරීම බනිජ තෙල් නිෂ්පාදනවල අඛණ්ඩ සැපයුම යථා තත්ත්වයට පත් කිරීමට උපකාරී වී ඇත. තවද, රජය විසින් නව මිල ක්‍රමයක් ක්‍රියාත්මක කරමින් සිටීම අනාගත පාඩු අවම කර ගැනීමට දායක වී ඇත. වර්තමාන මිලකරණ යාන්ත්‍රණය සංස්ථාව ලාභදායීත්වය සුරක්ෂිත කරනවා පමණක් නොව සාමාන්‍ය ජනතාව ඇතුළු සියලුම පාර්ශ්වකරුවන්ට ප්‍රතිලාභ ලබා දෙන බැවින් සංස්ථාව විසින් විකුණුම් උපරිම කිරීමට සැලසුම් කර ඇති උපාය මාර්ග සකස් කර ඇත. මීට අමතරව, ගබඩා පහසුකම් සහ අනුබද්ධ සේවා සැපයීම කෙරෙහි අවධානය යොමු කරන TPTL සමඟ බද්ධ ව්‍යාපාරයක ආයෝජන හරහා සංස්ථාව ව්‍යාපාර විවිධාංගීකරණය සිදු කිරීමට අපේක්ෂා කරයි.



මෙහෙයුම් විශිෂ්ටත්වය

අපගේ ව්‍යාපාරික මෙහෙයුම් මුල් ගල වන අතර, මෙම විශිෂ්ටත්වය ඉහළ නැංවීම සඳහා අප විසින් සියලු ප්‍රාග්ධන වත්කම් හරහා සැලකිය යුතු සම්පත් වෙන් කිරීමක් සිදු කරනු ලබන අතර එමඟින් සංස්ථාවේ උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා තිරනාත්මක වන කාර්යක්ෂමතාව සහ ඵලදායී බව යන දෙකම වැඩි දියුණු කෙරෙයි. අපගේ කොටස්කරුවන් සඳහා වටිනාකම් උත්පාදනය කිරීමට තුඩු දෙන, අවසානයේ සමාජය සඳහා වැඩි වටිනාකමක් ඇති කරන වඩාත් පිරිවැය-කාර්යක්ෂම ආකාරයෙන් බනිජ තෙල් නිෂ්පාදන පිරිපහදු කිරීම සඳහා අපි පිරිපහදුව තුළ අඛණ්ඩ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම් ක්‍රියාත්මක කර ඇති අතර, ක්‍රියාවලි කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ පිරිවැය ප්‍රශස්ත කිරීම සඳහා නිර්මාණය කර ඇති වත්කම් සංවර්ධන මූලපිරීම් මාලාවක්ද අපි අනුගමනය කරමින් සිටින්නෙමු. ත්‍රිකුණාමලයේ ටැංකි 24 ක ආයෝජන සහ අපගේ අනුබද්ධිතTPTL වැඩිදියුණු කිරීම ඇතුළු උපායමාර්ගික මූලපිරීම් දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. මෙහෙයුම් ධාරිතාව වැඩි කිරීම, දෘශ්‍යතාව වැඩිදියුණු කිරීම සහ අපගේ පවතින පිරවුම්හල් ජාලයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා කැපී පෙනෙන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරේ. තවද, සැපයුම් දාම කළමනාකරණය සඳහා ප්‍රගතිශීලී ප්‍රවේශයක් අනුගමනය කරමින් පර්යේෂණ හා සංවර්ධන ඒකකයක් පිහිටුවීම සක්‍රීයව සිදුවෙමින් පවතී.



තාක්ෂණික දියුණුව

ඉක්මණින් වෙනස් වන පරිසරයක සැරිසැරීමට තාක්ෂණික දියුණුව අත්‍යවශ්‍ය වේ. සමස්ත දිවයින පුරා ඉන්ධන සැපයුම අධීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා නිර්මාණය කර ඇති ක්‍රමානුකූල පාලන යාන්ත්‍රණයක් හරහා ඉන්ධන බෙදා හැරීමේ උපාය මාර්ගය ස්වයංක්‍රීය කොට සහ ප්‍රමිතිගත කර ඇත.

අලෙවි නියෝජිත තොග මට්ටම් අධීක්ෂණ පද්ධතියක් පිහිටුවීම මගින් තීරණ ගැනීමේ ක්‍රියාවලීන් කැපී පෙනෙන ලෙස වැඩිදියුණු කර ඇති අතර, අඩු තොග ප්‍රදේශ හඳුනා ගැනීමට සහ ඉන්ධන සැපයුම් කඩිනමින් සංවිධානය කිරීමට පහසුකම් සපයයි. විශේෂයෙන්ම සම්පූර්ණ ස්වයංක්‍රීය පියවීම් ක්‍රියා පටිපාටි මගින් බෙදුම්කරුවන්ට තමන්ගේ ඉන්ධන ඉන්වොයිස් පත්‍ර කාර්යක්ෂමව පියවීම සඳහා අමතර බැංකුකරණ ආයතන සංස්ථාගත කිරීමත් සමඟ තොරතුරු තාක්ෂණය පසුගිය වසර පුරා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කර ඇත.

එපමණක් නොව, ඩිජිටල් යටිතල පහසුකම් සහ පුහුණුව සඳහා වන ආයෝජනවලට අමතරව, ව්‍යවසාය මූලාශ්‍ර සැලසුම් (ERP) පද්ධතියේ කාර්යක්ෂම භාවිතය තත්‍ය කාලීන දත්ත ලබා දී ඇති අතර, බෙදුම්කරුවන්ගේ තොග මට්ටමේ අධීක්ෂණ පද්ධති වැඩිදියුණු කිරීම ප්‍රමගින් ප්‍රමාණවත් තොග මට්ටම්වල පැවැත්ම සහතික කර ඇත.

තිරසාර බව



තිරසාර සංවිධානයක් කිරීමේ අපගේ නිර්මාණය කැපවීම තුළ, නායකත්වයේ සිට ක්‍රියාත්මක කිරීම දක්වා අපගේ මෙහෙයුම්වල සියලුම අංශ හරහා තිරසාර මූලධර්ම ඇතුළත් කර ඇත. සැපයුම් දාමයේ අභියෝගවලට මුහුණ දීමට සිදු වුවද, සංස්ථාව විසින් ධීවර ප්‍රජාවට සහ අඩු ආදායම් මට්ටම් ඇති පදිංචිකරුවන්ට භූමිතෙල් සහ ඉන්ධන සාර්ථකව ලබා දීමට සමත් වී ඇත. අපගේ කාබන් නිකුතුව අඩු කිරීමට, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමට සහ වඩාත් තිරසාර පරිභෝජන පරිවයන් ධෛර්යමත් කිරීමට අපගේ ප්‍රයත්නයන් තුළ අපි අධිෂ්ඨානශීලී වන්නෙමු. පාරිභෝගික තෘප්තිය වැඩි දියුණු කිරීම සහ නෛතික අවශ්‍යතා පිළිපැදීම සහතික කිරීම සඳහා, සංස්ථාව විසින් සවිස්තරාත්මක අනුකූලතා ඇගයීම් මාලාවක් සමඟින් බලශක්ති භාවිතය සහ ද්‍රව්‍ය සහ නිෂ්පාදන ප්‍රසම්පාදනය සඳහා ප්‍රශස්තකරණ උපාය මාර්ග අනුගමනය කර ඇත.

අප විසින් ඒකාබද්ධ කර ඇති දිවයින පුරා පුළුල් බෙදාහැරීමේ ජාලය හරහා වක්‍ර රැකියා අවස්ථා 15,000 කට අධික සංඛ්‍යාවක් සංස්ථාව විසින් උත්පාදනය කෙරෙයි.

මානව ප්‍රාග්ධනය සංවර්ධනය



කඩිනමින් විකාශනය වන මෙහෙයුම් භූ දර්ශනය තුළ අපගේ දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීමේ ප්‍රධාන අංගයක් ලෙස මානව ප්‍රාග්ධනය ක්‍රියා කරන අතර එය අපගේ ප්‍රමුඛතම උපායමාර්ගික වත්කම නියෝජනය කරයි. අපගේ පාර්ශවකරුවන්ට වටිනාකමක් ලබා දෙන අභිප්‍රේරිත, නියැලී සිටින සහ විශ්වාසවන්ත ශ්‍රම බලකායක් සංවර්ධනය කිරීම සඳහා රු. මිලියන 6.40 මුදලක් වැය කරමින් පුහුණු ලබා දීම සඳහා අපි නිරතුරුවම සම්පත් කැප කර ඇත්තෙමු. අපගේ කැපවීම අපගේම සේවක මණ්ඩලය වැඩි දියුණු කිරීමෙන් ඔබ්බට විහිදේ; පුහුණු වැඩසටහන් සහ අබණ්ඩ සන්නිවේදනය හරහා අපගේ ව්‍යාපාරික හවුල්කරුවන්ගේ මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීමටත් එමඟින් විශේෂඥතාව වර්ධනය කිරීම සහ පාරිභෝගික තෘප්තිය සහතික කිරීමටද අපි ප්‍රමුඛත්වය දෙන්නෙමු.

තවද, සංස්ථාව හි ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය වන මෙම මූලපිරීම් ඵලදායි කළමනාකරණය සහතික කරමින් සේවක පුහුණුව සහ සංවර්ධනය සඳහා සැලකිය යුතු ආයෝජනයක් සිදු කර ඇති අතර එය නිහඬව දක්වනු ලබන දැනුම වටා බැඳි අපගේ ආයතනික ආචාර ධර්ම සහ සංස්කෘතිය ශක්තිමත් කර ඇත.






සැපයුම් දාමය කළමනාකරණය

ආර්ථික සංවර්ධනය සඳහා බලශක්ති සුරක්ෂිතතාවයේ අත්‍යවශ්‍ය වැදගත්කම පිළිගනිමින් සැපයුම් දාම කළමනාකරණය කෙරෙහි අපගේ උපායමාර්ගික අවධානය යොමු කෙරේ. සංස්ථාව පිරිපහදු කළ සහ බොරතෙල් නිෂ්පාදන යන දෙකම ආනයනය කිරීම මත සම්පූර්ණයෙන්ම රඳා පවතින බැවින්, ඵලදායී සැපයුම් දාම කළමනාකරණය අපගේ මූලික උපායමාර්ගික අරමුණ වේ.

රටේ ආර්ථික වටිනාකම ඉහළ නැංවීම සහ ඉන්ධන සැපයුම් ටෙන්ඩර් සඳහා පුළුල් සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා අප විසින් බාහිර ගබඩා යටිතල පහසුකම් වැඩිදියුණු කර ඇත්තෙමු. මෙම වෙනස් කිරීම් සැලසුම් කර ඇත්තේ වඩාත් තරඟකාරී සහ විනිවිද පෙනෙන පරිසරයක් ඇති කිරීම සඳහා වන අතර, එය අවසානයේදී දේශීය වශයෙන් විදේශ විනිමය ඉතිරි කිරීම් වැඩි කිරීමට හේතු වේ.

සංස්ථාව විසින් මුහුණ දෙන ලද අභියෝග

අභියෝගය	බලපෑම	ක්‍රමෝපාය හා පවතින සබඳතාව
ඩොලර් ගනුදෙනු වල සීමාවන්	තම මූල්‍ය අභියෝගවලට මුහුණ දීම සඳහා අත්‍යවශ්‍ය වන ආනයන වගකීම් ඉටු කිරීම සඳහා විදේශ මුදල් ලබා ගැනීමේ දුෂ්කරතාවන්ට සංස්ථාව නිරන්තරයෙන් මුහුණ දෙයි. රුපියල් වලින් අරමුදල් නිබීම විනිමය අනුපාතික උච්චාවචනයන් හෝ වෙළඳපොලේ ඩොලර් හිඟය සමග සම්බන්ධ අවදානම් අවම නොකරයි. විනිමය අනුපාතිකයේ විචලනයන් සැලකිය යුතු ලෙස මිලකරණ උපාය මාර්ග කෙරෙහි බලපාන අතර, අවසානයේදී ලාභදායි වර්ධනයක් සඳහා සංවිධානයේ විභවයන් සමඟ සම්බන්ධ වේ.	
ගබඩා පහසුකම නොමැති වීම	බොරතෙල් සහ විවිධ වර්ගවල පිරිපහදු කළ නිෂ්පාදන යන ද්විත්වයම ගබඩා කිරීම සඳහා ඇති සීමිත ධාරිතාව හේතුවෙන් ආනයනික බොරතෙල් සහ පිරිපහදු කළ ඉන්ධන ගබඩා කිරීමට නොහැකි වී තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස, ගොඩබෑම සඳහා ප්‍රමාණවත් ඉඩ ප්‍රමාණයක් නොතිබීම හේතුවෙන් අවශ්‍ය නැව්ගත කිරීම් ආනයනය කිරීමේ සීමාවන් පවතී.	
අබලන් සහිත නල මාර්ග	ආනයනික ඛනිජ තෙල් නිෂ්පාදන කොළඹ වරායේ සිට පර්යන්ත දක්වා ප්‍රවාහනය සඳහා යොදවා ඇති නළ මාර්ග මේ වන විට සැලකිය යුතු ලෙස අබලන් තත්ත්වයක පවතී. මෙම තත්ත්වය නිසා ඉවත් කර ගැනීමේ ඉන්ධන කාලය දීර්ඝ වී ඇති අතර ඉන්ධන කාන්දු වීමේ අවදානමක් ද පවතී	
වෙළඳපොළ මිල පිළිගැනීම	ශ්‍රී ලංකාවට දේශීය ඛනිජ තෙල් සම්පත් නොපවතින අතර පවතින ගෝලීය වෙළෙඳපොළ මිල ගණන් යටතේ සියලුම ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීම අවශ්‍ය වන අතර, එමඟින් රටේ මිල ගණන් ගිවිස ගැනීමේ හැකියාව සීමා වේ. එහි ප්‍රතිඵලයක් ලෙස ජාත්‍යන්තර මිල ගණන්වල වෙනස්කම් විකුණුම් පිරිවැයට සෘජුවම බලපායි.	
නවක තරඟකරුවන්ගේ සම්ප්‍රාප්තිය	ඛනිජ තෙල් අංශයට නව බහුජාතික ආයතන ඇතුල්වීම සංස්ථාවෙහි මෙහෙයුම් කෙරෙහි සෘජු බලපෑමක් ඇති කරයි.	

අවස්ථාවන්

භූගෝලීය ගබඩා ධාරිතාව

ත්‍රිකුණාමලයේ ගබඩා ධාරිතාව ඉහළ නැංවීමට පහසුකම් සලසමින් සංස්ථාව විසින් ගබඩා ටැංකි 24ක් බද්දට ගැනීමට රජය සමඟ ගිවිසුමකට එළඹී ඇත. සංස්ථාව මෙම ටැංකි ප්‍රතිසංස්කරණය කිරීම ආරම්භ කර ඇත. මෙම පුළුල් කිරීමේ මූලාරම්භය සැලසුම් කර ඇත්තේ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ මූල්‍ය සහ තරහකාරී වාසි ලබා ගැනීම සඳහා වේ. මීට අමතරව, ත්‍රිකුණාමලය පහසුකමේ සිට නැව් තෙල් සැපයීම සහ දේශීය බෙදාහැරීමේ මෙහෙයුම් ආරම්භ කිරීමට සංස්ථාව සැලසුම් කරයි.

ව්‍යාපාර විවිධාංගීකරණය

සංස්ථාව විසින් ගබඩා කිරීම සහ ඒ ආශ්‍රිත සේවාවන් සැපයීමේ නිරතව සිටින බද්ධ ව්‍යාපාර (අනුබද්ධ) සමාගමක් වන TPTL හි ආයෝජනය කරන ලදී. නව නිෂ්පාදන සහ සේවා සඳහා ඇතුල් වීමේ ඉහළ හැකියාවක් පවතී.

ශක්තිමත් කර ඇති ශේෂ පත්‍ර

රජය සතු ව්‍යවසායන්හි මූල්‍ය ස්ථායීතාවය ඉහළ නැංවීමේ අරමුණින් ක්‍රියාත්මක කරන ලද මූලාරම්භයේ කොටසක් හැටියට රජය විසින් ඉන්දියානු ක්‍රෙඩිට් ලයින් ණය SLA සහ CEB වෙතින් ලැබිය යුතු මුදල් වලින් පියවා එම ගැටළුව විසඳා ඇත. මෙම පියවීම නිසා ඔවුන්ගේ ශේෂ පත්‍ර ආරක්ෂා කිරීමට දායක වී ඇත.

රාජ්‍ය මිලකරණ ප්‍රතිපත්තිය

රජය විසින් හඳුන්වා දී ඇති මිලකරණ යාන්ත්‍රණ මගින් පිරිවැය සහ ප්‍රතිලාභ යන දෙකම මහජනතාවට පැවරෙන අතර එමඟින් සංස්ථාව හි දිගුකාලීන ආර්ථික තිරසාරභාවය සහතික කෙරේ.

ව්‍යාපාර මාදිලිය

යෙදවුම්

මූල්‍ය ප්‍රාග්ධනය



හිමිකරුවන්ගේ අරමුදල්
ණය ගැනීම්
ප්‍රාග්ධන කළමනාකරණය

නිපැයුම් ප්‍රාග්ධනය



පිරවුම්හල් ජාලය
දේපල පිරියත හා උපකරණ

බුද්ධිමය ප්‍රාග්ධනය



තාක්ෂණික නිපුණතා
සන්නාම ක්‍රියාවලිය
ක්‍රියාවලි සංවර්ධනය

මානව ප්‍රාග්ධනය



අපගේ සේවකයන්
පළපුරුද්ද
හැකියා සහ ශක්‍යතා
පුහුණු සහ සංවර්ධන

සමාජයීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය



කොටස්කරුවන් කළමනාකරණය
සෞඛ්‍ය සහ ආරක්ෂණ ක්‍රියාමාර්ග
පාරදෘෂ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය

ස්වාභාවික ප්‍රාග්ධනය



බලශක්ති කළමනාකරණය
ජල කළමනාකරණය
අනෙකුත් ස්වාභාවික සම්පත්

ක්‍රියාකාරකම්

දැක්ම

ක්‍රමෝපායන්

ලාභ වර්ධනය

මෙහෙයුම් විශිෂ්ටත්වය

තාක්ෂණික දියුණුව

තිරසාර බව

මානව ප්‍රාග්ධනය සංවර්ධනය

සැපයුම් දාම කළමනාකරණය

ප්‍රාථමික ක්‍රියාකාරකම් සහ සහාය

අලෙවිකරණය
ආනයනය
පිරිපහදු කිරීම
බෙදා හැරීම

ව්‍යාපාර ක්‍රමෝපාය
තාක්ෂණික සහ මූල්‍ය
පිරිස් කළමනාකරණය
තොරතුරු තාක්ෂණ සහාය

සංස්ථායික පාලනය

අවදානම් කළමනාක

බාහිර පරිසරය

ප්‍රතිඵල



හිමිකරුවන්

සම්පත් නිර්මාණය
මූල්‍ය වර්ධනය



පාරිභෝගිකයන්

ගුණාත්මක නිෂ්පාදන
රට පුරා නිෂ්පාදන ලබා
ගැනීමට ඇති හැකියාව
සාධාරණ මිල



සේවකයන්

දක්ෂ සහ කාර්යක්ෂම
සේවා බල ඇණිය
ආරක්ෂාකාරී සහ සමාන
පරිසරය



නියාමකයන්

අනුකූලතාව
ආර්ථික සංවර්ධනය
සඳහා දායකත්වය



ප්‍රජාව

තිරසාර සම්බන්ධතා



සැපයුම්කරුවන්

තිරසාර අගය දාමය

නිමැයුම්

දළ ආදායම
රු.බි. **1,315**

විකුණුම් ධාරිතාව
ලී.මී. **4,184**

දළ ලාභය
රු.බි. **162,115**

ශුද්ධ ලාභය
රු. බි. **120**

කාර්ය මණ්ඩලය සඳහා පිරිවැය
රු.බි. **6.48**

රජය වෙත දායකත්වය රු.බි.
233

මුළු පිරවුම්හල්
990

පිරිපහදුවේ සෞඛ්‍ය සහ
ආරක්ෂාව පිළිබඳ අවම සිද්ධි

මෙහෙය

ව්‍යාපාරික මාර්ග

විදුලිබල උත්පාදනය

ගුවන් තෙල්

කර්මාන්ත

දේශීය

කෘෂි රසායනික

ලිහිසි තෙල්

සේවා

රණය

මූල්‍ය ප්‍රාග්ධනය



මූල්‍ය ප්‍රාග්ධනය

මිලකරණ යාන්ත්‍රණය දිගටම ක්‍රියාත්මක කිරීම, පිරිපහදුවෙහි අඛණ්ඩ ක්‍රියාකාරිත්වය, සියලු අංශ වැඩිදියුණු කිරීම, අනෙකුත් ආදායම්, පොලී ආදායම සහ විනිමය ලාභය සමඟ පහළ ගිය ජාත්‍යන්තර ඉන්ධන ක්‍රියාවලිය රු. බිලියන 120 ලාභයක් සංරක්ෂණයට දායක විය. මෙය සෘණ ප්‍රාග්ධන තත්වය වසර අවසානයේදී රුපියල් බිලියන 33.4 ක ප්‍රග්ධනය බවට පරිවර්තනය කිරීමට උපකාරී විය. SOE ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහනට අනුව රජය විසින් SLA සහ CEBවෙතින් ලැබිය යුතු මුදල් සඳහා සංස්ථාව වෙත රු. බිලියන 227 ක් පියවන ලද අතර එය සංස්ථාවෙහි වැඩිදියුණු කළ මූල්‍ය තත්ත්වය සඳහා දායක විය.

1,315
(රු. බි.)
ආදායම

162.1
(රු. බි.)
දළ ලාභය

120.3
(රු. බි.)
ශුද්ධ ලාභය

91.7
(රු. බි.)
ණය සහ ණය ගැනීම්


සමාලෝචනය - 2023

- විවිධ ක්‍රමෝපායන් සමඟින් CPC රු. බිලියන 120 ක ලාභයක් වාර්තා කළේය.
- 2022 වසරට සාපේක්ෂව ආදායම 13.89% කින් වැඩි විය.
- පොලී ආදායමෙන් සහ පාරිභෝගිකයන් ගේ ප්‍රමාද වූ පියවීම් මත අයකිරීම් වලින් ජනනය කර ඇති මූල්‍ය ආදායම රු. බිලියන 17.5 කි.
- රජය විසින් රු. SOE ශේෂ පත්‍රය ප්‍රතිව්‍යුහගත කිරීම හරහා SLA සහ CEBවෙතින් ලැබිය යුතු රුපියල් බිලියන 227ක් පියවන ලදී.
- නිමිකම් තත්ත්වය වසර අවසානයේ රුපියල් බිලියන 33.4 කි.

ආදායම

ආර්ථිකයේ ක්‍රමානුකූල ප්‍රකෘතිය, සංවිධානයට වසරේ හොඳම මූල්‍ය කාර්ය සාධනය සාක්ෂාත් කර ගැනීමට රුකුල් දෙමින් සංස්ථාවෙහි ක්‍රියාකාරිත්වයට ධනාත්මක ලෙස බලපා ඇත. සෑම අංශයක්ම පාහේ වැඩිදියුණු කිරීම් පෙන්නුම් කර ඇත. කෙසේ වෙතත්, අගෝස්තු මාසය දක්ව QR පද්ධතිය හරහා පරිභෝජනයට ඇති සීමාවන් සමඟ විකුණුම්වල මධ්‍යස්ථ වර්ධනයක් 2022 හා සසඳන විට සමස්ත විකුණුම් 3.31% කින් ඉහළ යාමට හේතු විය. දේශීය විකුණුම් ආදායමේ මූලික නියාමකය ලෙස පැවතුන අතර වසර පුරා පැවති ජාත්‍යන්තර ඉන්ධන මිල ගණන් වල සැලකිය යුතු පහත වැටීමක් ඇති වීම මාසිකව දේශීය විකුණුම් මිල සංශෝධනය කිරීමට රජය පොළඹවන ලදී.

ආදායම




රජය ඩීසල් සහ පෙට්‍රල් සඳහා මිල නියම කිරීමේ යාන්ත්‍රණය පවත්වා ගෙන ගිය අතර ජාත්‍යන්තර ඉන්ධන පිරිවැය වෙනත් වියදම් සහ බදු වලට අනුකූලව විකුණුම් මිල වෙනස් කිරීම සිදු කරන ලදී. නව තරඟකරුවෙකු පැමිණීම හේතුවෙන් ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාවේ අඩුවීමක් සිදුවුවද, යම් ප්‍රමාණයකට ආදායම ඉහළ නැංවීමට මිලකරණ යාන්ත්‍රණය මගින් පහසුකම් සලසා ඇත. ප්‍රවාහන අංශය මුළු ආදායමෙන් 73%ක් සඳහා දායක වූ අතර විදුලි ජනන අංශයෙන් ලද දායකත්වය 14%ක් විය. ගුවන් සේවා සහ අනෙකුත් කර්මාන්ත එකිනෙක සමස්ත ආදායමෙන් 13% නියෝජනය කළේය.

2023 දීද, ආදායම් වල දෙවන ආදායම් මූලාශ්‍රය වූ පෙට්‍රල් 92 ට පසුව ඔටෝ ඩීසල් ආදායම් උත්පාදනයේ ප්‍රමුඛතම ආදායම් මූලාශ්‍රය ලෙස දිගටම පැවතුණි. ගුවන් සේවා කර්මාන්තය රු. බිලියන 122 ක දායකත්වයක් ලබා දුන් අතර, මෙම ආදායමෙන් 90% කට වඩා වැඩි ප්‍රමාණයක් එක්සත් ජනපද ඩොලර් වලින් ජනනය වන අතර එමඟින් විදේශ මුදල් සඳහා වන අභියෝග අවම කිරීම සඳහා අමතර ආර්ථික ප්‍රතිලාභ ලබා දීමක්ද සිදුවේ.

සංස්ථාව විසින් අපනයනකරුවන් වෙත ඩීසල් සහ දැව් තෙල් එක්සත් ජනපද ඩොලර් මිලට විකිණීමේ භාවිතාවක් පවත්වා ගෙන ගොස් ඇති අතර, එම මුදලින් ම ආදායම් උපයා ඇත. මෙම ඇමෙරිකානු ඩොලර් වලින් ලැබෙන අලෙවි ආදායම ඉන්ධන ලබා ගැනීම සඳහා වෙන් කර ඇති අතර එමඟින් ඇමෙරිකානු ඩොලර් වලින් ආනයන ගෙවීම් කිරීමට පහසුකම් සැලසේ.


ආදායම් මිශ්‍රණය



දළ ලාභය

ජාත්‍යන්තර ඉන්ධන මිලෙහි උච්චාවචනයන් සහ විනිමය අනුපාතික ක්ෂයවීම් ඇතුළු අනෙකුත් පිරිවැය සාධකවලට ප්‍රතිචාර වශයෙන් දේශීය විකුණුම් මිල ගැලපීම ආදායම ඉහළ යාමට හේතු වී තිබේ. මූල්‍ය වර්ෂය තුළ සංස්ථාවෙහි දළ ලාභය රු. බිලියන 162ක් ලෙස වාර්තා වූ අතර එය 2022 දී රුපියල් බිලියන 39.8 ක කැපී පෙනෙන වර්ධනයකි. මෙම පිරිවැය සංරචකවල වෙනස්වීම්වලට අනුකූලව පෙට්‍රල්, ඩීසල් සහ භූමිතෙල් මිල මාසික පදනමින් සංශෝධනය කරන ලදී. මීට අමතරව, ආනයනය, නිෂ්පාදනය සහ බෙදා හැරීම සම්බන්ධයෙන් සංස්ථාව විසින් දරනු ලබන පිරිවැය පිළිබිඹු කිරීමට දැව් තෙල් මිල සකස් කර ඇත.

දළ ලාභය




සංස්ථාවේ ලාභදායිත්වයට දායක වීමෙන් සෑම අංශයකම පාහේ කාර්ය සාධනය හොඳින් සිදු වූ බව මෙහිලා සඳහන් කිරීම වටී. තවද, පිරිපහදුව අඛණ්ඩව ක්‍රියාත්මක වීම නිසා දළ ලාභය සඳහා ධනාත්මක පිරිපහදු ආන්තිකය ලබා දීමට හැකි විය.

වෙනත් ආදායම්

ගොඩනැගිලිවලින් ලැබෙන කුලී ආදායම, CODO පිරවුම්හල් ආශ්‍රිත ගාස්තු, කාර්ය මණ්ඩල ණයවලින් ලැබෙන පොලී, පිරවුම්හල් උපකරණ විකිණීමෙන් ලැබෙන ආදායම සහ වෙනත් විවිධ මූලාශ්‍ර ඇතුළත් ආයෝජන දේපළවලින් ලැබෙන ආදායම මෙම කාණ්ඩය තුළ වර්ගීකරණය කර ඇත.

වෙනත් ආදායම්



2023 දී අනෙකුත් ආදායම වර්ධනයක් පෙන්වූ අතර එය රු. බිලියන 1.18 සිට රු. බිලියන 10.7 දක්වා වූ සැලකිය යුතු වර්ධනයකි. මුළු එකතුව රු. බිලියන 9 ක් වූ මෙම ප්‍රාමාණික වර්ධනයට ඉන්ධන සපයන්නන් ගේ ප්‍රමාදයන් සහ ප්‍රමාණයට අඩු බෙදාහැරීම් සඳහා පනවන ලද දඩ මුදල් හේතු විය. මීට අමතරව, ආයෝජන දේපලවලින් ලැබෙන ආදායමට 2023 වසර සහ ඊට පෙර වසර සඳහා CODO පිරවුම්හල් වලින් අය කරන මාසික උපයෝගිතා ගාස්තු ඇතුළත් වන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස මෙම දේපලවලින් ලැබෙන ආදායම දෙගුණයක් බවට පත් විය. තවද, CPSTL විසින් 2023 දී රු. මිලියන 240 ක ලාභාංශ ප්‍රකාශයට පත් කරන ලද එය අනෙකුත් ආදායම් ඉහළ නැංවීමට ධනාත්මක ලෙස දායක විය.


විනිමය අනුපාත විචලනය

2023 දී ජාතික ආර්ථිකයේ ක්‍රමානුකූල ප්‍රකෘතිමත් වීම ප්‍රධාන මුදල් ඒකකවලට සාපේක්ෂව විනිමය අනුපාතිකය අගය වර්ධනය කිරීමකට හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, විනිමය අනුපාතිකය රු. 371.61 සිට එම වසරේම රු. 328.78 දක්වා ඉහළ යාමත් සමඟ, එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව රුපියල ශක්තිමත් විය. ශ්‍රී ලංකා රුපියලේ මෙම අගය ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස වසර සඳහා විනිමය ලාභයක් ඇති වූ අතර, ශුද්ධ විනිමය ලාභය රු. බිලියන 20.3 ක් විය. මෙම අගය රු. බිලියන 41.7 ක විනිමය ලාභයක් වූ අතර එය රු. බිලියන 21.4 ක පාඩුවකින් පියවා ඇත.

මූල්‍ය ආදායම

ස්ථාවර තැන්පතු, ඇමතුම් තැන්පතු, මුදල් වෙළෙඳපොළ ආයෝජන සහ ප්‍රමාද වූ පාරිභෝගික ණය පියවීම් හා සම්බන්ධ ගාස්තු හරහා ජනනය වන ආයෝජන ආදායමෙන් මූල්‍ය ආදායම සකස් වේ. සංස්ථාව උපක්‍රමශීලීව ආදායම උත්පාදනය කිරීම සඳහා පොලී සහිත මූල්‍ය උපකරණ වල අතිරික්ත දෛනික මුදල් ආයෝජනය කර එමඟින් නිෂ්ක්‍රීය අරමුදල් පැවතීම මග හරී.

මූල්‍ය ආදායම



කෙසේ වෙතත්, ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහනේ කොටසක් ලෙස මහා භාණ්ඩාගාරය විසින් SLA සහ CEB ට අදාළ හිඟ මුදල් පියවීම සහ තැන්පතු යෙදවීම හේතුවෙන් 2023 වර්ෂයේදී පොලී ආදායම බිලියන 37.5 සිට බිලියන 12.5 දක්වා වූ සැලකිය යුතු අඩුවීමක් අත්විඳින්නට සිදු විය.

මූල්‍ය වියදම්

ලංකා බැංකුව සහ මහජන බැංකුව හා සම්බන්ධUSD ණය සහ බිල්පත් වල වගකීම රජය භාරගත් අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ණය ශේෂය සැලකිය යුතු ලෙස අඩු විය. එසේ වුවද, ඉන්ධන ආනයනය සඳහා ලංකා බැංකුවෙන් රුපියල්වලින් ලබා ගත් කාරක ප්‍රාග්ධන ණය මුදල 2023 වසර පුරාවටම පවත්වාගෙන යන ලදී.

රජය විසින් සංස්ථාවෙහි USD ණය සහ බිල්පත් එහි ශේෂ පත්‍රයට ඇතුළත් කිරීමත් සමඟ පොලී වියදමේ සැලකිය යුතු පහත වැටීමක් අත්විඳිමින් රු. බිලියන 119.5 සිට රු. 2023 දී රු.බිලියන 7.4 ක් දක්වා අඩු විය. මීට අමතරව, පොලී අනුපාත වසර පුරා අඛණ්ඩව අඩු වූ අතර, පොලී පිරිවැය අඩු කිරීමට ධනාත්මක ලෙස දායක විය.

ආදායම් බදු වියදම්

සංස්ථාව විසින් පසුගිය වසර තුළ බදු අලාභ ඉදිරියට ගෙන ගොස් වසර සඳහා බදු අය කළ හැකි ලාභයට එරෙහිව හිමිකම් පෑම කළ බැවින්, වර්ෂය තුළ ආදායම් බදු ගෙවීමක් සිදු නොවුණි.

ඉදිරියට ගෙන ගිය බදු පාඩු තිබීම හේතුවෙන්, සංස්ථාව විසින් සිය මූල්‍ය ප්‍රකාශනවල වෙනස්වූ බදු හඳුනා ගැනීමක් සිදු නොකරයි.


කෙසේ වෙතත්, දේශීය ආදායම් පනතට අනුව වත්කම් උපලබ්ධි කර ගැනීමේදී ඉඩම්, බදු වලට යටත් වන බැවින්, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉඩම් නැවත තක්සේරු කිරීම සඳහා වෙනස්වූ බදු වගකීම් හඳුනාගෙන ඇත.

ලාභදායීත්වය

මිල නියම කිරීමේ යාන්ත්‍රණය තිරසාර ලෙස ක්‍රියාත්මක කිරීම, ජාත්‍යන්තර තෙල් මිල පහත වැටීම, පිරිපහදුවෙහි අඛණ්ඩ ක්‍රියාකාරිත්වය සහ විවිධ උපාය මාර්ගික මූලපිරීම් යන ඒවා විසින් සාමූහිකව 2023 මූල්‍ය වර්ෂය සඳහා මෙහෙයුම් ලාභවල සැලකිය යුතු ඉහළ යෑමකට දායක වී ඇත. මෙම වර්ධනය 2022 දී රු. බිලියන 6 ක පාඩුවක සිට වත්මන් වසරේ රු. බිලියන 89.8 ක ලාභයක් වාර්තා වීම තුළින් විද්‍යමාන වේ.

තවද, 2022 දී වාර්තා වූ රුපියල් බිලියන 617 ක ශුද්ධ පාඩුව 2023 දී රුපියල් බිලියන රු. 120.3 ක ලාභයක් බවට පරිවර්තනය වී ඇති අතර ඊට වෙනත් ආදායම්, පිරිපහදු ආන්තිකය, විනිමය ලාභ සහ පොලී වියදම් අඩු කිරීම මගින් දායකත්වය සපයනු ලැබ ඇත.

මෙහෙයුම්/ශුද්ධ ලාභය/(අලාභය)



ලාභය සඳහා හේතු
ජාත්‍යන්තර තෙල් මිල පහත වැටීම.
පිරිවැය සහ ප්‍රතිලාභ මහජනතාවට ලබාදීම සඳහා මාසිකව දේශීය සිල්ලර මිල සංශෝධනය කිරීම.
පිරිපහදුව අඛණ්ඩව ක්‍රියාත්මක වීම (කෙටිකාලීන වසා දැමීම් හැර).
ශ්‍රී ලංකා රුපියලේ අගය ඉහළ යාම මත රු. බිලියන 20.3ක විනිමය අනුපාත ලාභයක් අත්වීම
පොලී අනුපාතිකය අඩුවීම සමඟ ණය මුදලද අඩුවීම නිසා මූල්‍ය පිරිවැය තියුනු ලෙස අඩුවීම.
ජාතියට අඛණ්ඩ ඉන්ධන සැපයීම සහ QR පද්ධතිය හරහා පනවා ඇති සීමාවන් අත්හිටුවීම
ඵලදායී භාණ්ඩාගාර කළමනාකරණය.
පිරිවැය පාලන උපාය මාර්ග

වෙළඳ ණයගැති ලැබිය යුතු මුදල්

ජාතික ආර්ථිකය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සඳහා රාජ්‍ය ආයතනවලට සහ රාජ්‍ය ව්‍යාපාරවලට ඉන්ධන සැපයීම ණය පදනම මත සිදු කෙරේ. කෙසේ වෙතත්, බොහෝ රාජ්‍ය ව්‍යාපාරයන් ඉන්ධන මිලදී ගැනීම් සම්බන්ධයෙන් තම මූල්‍ය වගකීම් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොමැති අතර, ලැබිය යුතු වෙළඳ ණයගැති මුදල් සැලකිය යුතු ලෙස සමුච්චය වීමට මෙය හේතු වේ. ලංකා විදුලිබල මණ්ඩලය (CEB), ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් (IPPs), සහ ශ්‍රී ලංකන් එයාලයින්ස් (SLA) වෙතින් ගෙවිය යුතු හිඟ ශේෂයන් සැලකිල්ලට ගනිමින්, රජය විසින් SLA සහ CEB වෙතට ප්‍රාග්ධනය යෙදවීම මගින් මෙම හිඟ මුදල් පියවා ඇති අතර එමඟින් රාජ්‍ය ව්‍යාපාරවල මූල්‍ය ස්ථාවරත්වය ඉහළ නැංවීමට ක්‍රියා කොට ඇත. රජය විසින් රු. බිලියන 227ක් වූ මෙම ඉන්ධන ආශ්‍රිත ණය පියවීම සඳහා වෙන්කිරීම් කර ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස හිඟ වෙළඳ ලැබිය යුතු ශේෂය 2023 දෙසැම්බර් 31 වන විට රු. බිලියන 17.6 දක්වා අඩු වී ඇත.

පෙර වසරවල ස්ථාපිත භාවිතයන්ට අනුකූලව, සංස්ථාව විසින් ත්‍රිවිධ හමුදාව, ශ්‍රී ලංකා පොලිසිය සහ දුම්රිය දෙපාර්තමේන්තුව වෙනින් මෙම වසර සඳහා ලැබිය යුතු වෙළෙඳ ලැබීම් තුළින් රු. බිලියන 30.28 ක ප්‍රමාණයක් අයකර ගත් අතර එය 2022 වර්ෂය තුළදී රු. බිලියන 25.82කි. මෙම අයකර ගැනීම රජයට ගෙවිය යුතු සුරාබදු වලට එරෙහිව භාණ්ඩාගාරය විසින් සිදුකර ඇත.

තවද, සංස්ථාව විසින් ස්වකීය ණය ප්‍රතිපත්තිය පුද්ගලික බෙදුම්කරුවන් සහ ගණුදෙනු කරුවන් වෙත ලබා දෙනු ලබන ණය පහසුකම් සීමා කිරීම අරමුණු කරගෙන පවත්වාගෙන යන ලදී. බාධාවකින් තොරව ගනුදෙනු කිරීමට පහසුකම් සැලසීම සඳහා සංස්ථාව ඉලෙක්ට්‍රොනික බැංකු සේවා භාවිතය සක්‍රීයව ප්‍රවර්ධනය කළේය. ස්වයංක්‍රීය විද්‍යුත් බැංකු සේවා ක්‍රියාත්මක කිරීම මගින් ඇණවුම් කිරීම් සහ පියවීම් ක්‍රියාවලීන් සැලකිය යුතු ලෙස විධිමත් වී ඇත.

ණය සහ ණය ගැනීම්

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ පුළුල් කිරීමේ ව්‍යාපෘතියට සමගාමීව නව හයිඩ්‍රන්ට් පද්ධතියක් ඉදිකිරීම සඳහා මූල්‍ය සම්පාදනය කිරීමේ අරමුණින් ලබාගත් ණය සඳහා වන ශේෂය රු. බිලියන 5.94 ක් දක්වා වැඩි විය. මීට අමතරව, වසර අවසාන විනිමය අනුපාතිකය උපයෝගී කර ගනිමින් ණය මුදල නැවත තක්සේරු කිරීම හේතුවෙන් ණය අගය තවදුරටත් ඉහළ යාමට දායක වී ඇත. ව්‍යාපෘතියේ ප්‍රගතිය අනුව මුළු ණය මුදල ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2022 අවසානයේ මහා භාණ්ඩාගාරය විසින් සහතික කරන ලද සංස්ථාවෙහි විදේශ මුදල් ණය රජය විසින් භාර ගැනීමෙන් පසුව, ණය සහ බිල්පත් ප්‍රමාණයේ සැලකිය යුතු අඩුවීමක් සිදුවී ඇත. එසේ වුවද, ඉන්ධන ආනයනය සඳහා පහසුකම් සැලසීම සඳහා සංස්ථාව විසින් ලංකා බැංකුවෙන් රුපියල් වලින් කාරක ප්‍රාග්ධන ණයක් ලබාගෙන ඇත.

2022 පෙබරවාරි සිට මැයි දක්වා කාලය තුළ සංස්ථාව ඉන්ධන ප්‍රසම්පාදනය ඉන්දියානු ණය ආධාර යටතේ සිදුකරනු ලැබීය. මෙම ණය මුදල රජය විසින් ලංකා විදුලිබල මණ්ඩලය (CEB) සහ ශ්‍රී ලංකන් එයාලයින් (SLA) යන ආයතන වලට ගෙවිය යුතු මුදල්වලට එරෙහිව කපා හරින ලද අතර එමඟින් රාජ්‍ය ව්‍යවසායන්හි මූල්‍ය ස්ථාවරත්වයට ලභා වීමට බලාපොරොත්තු වේ.

ස්කන්ධ ප්‍රාග්ධනය

රජය බනිජ තෙල් නීතිගත සංස්ථාවේ සමස්ත ණය තොගය මධ්‍යම රජයට රැගෙන ඇති බැවින් එම මුදල් ස්කන්ධ ප්‍රාග්ධනය ලෙස සලකයි. රජය විසින් ප්‍රාග්ධනය ලබා දීම ණය පරිවර්තනයක් ආකාරයෙන් ලබා දුන්නද, සංස්ථාවෙහි ඍණ ස්කන්ධය ප්‍රමාණය පියවීමට එය ප්‍රමාණවත් නොවීය. 2022 දෙසැම්බර් 31 වනදා වන විට, ඍණ ස්කන්ධය ප්‍රාග්ධනය රු. බිලියන 85.7 ක් වූ අතර වැඩිදියුණු ප්‍රාග්ධන තත්ත්වය සමඟ, සංස්ථාව විසින් වසර තුළදී රුපියල් බිලියන 120 ලාභයක් අත් පත් කර ගන්නා ලද අතර අවසානයේ ප්‍රාග්ධන තත්ත්වය රුපියල් බිලියන 33.4 දක්වා වර්ධනය විය.

ස්කන්ධ ප්‍රාග්ධනය වර්ෂය	2023 (රු. මී.)	2022 (රු.මී.)
ආරම්භක ශේෂය	912,580.511	28,487.125
ප්‍රාග්ධන ගලාඒම්	-	884,093.386
අවසාන ශේෂය	**912,580.511**	**912,580.511**

මුදල් ප්‍රවාහ

වසර තුළ, සංස්ථාව විසින් එක්සත් ජනපද ඩොලර් මිලදී ගැනීම, ණය පියවීම සහ බිල්පත් ගෙවීම සඳහා එකතු කිරීම භාවිතා කරන ලදී. උපායමාර්ගික ක්‍රියාමාර්ග සහ ණය පියවීම සඳහා රජයේ මැදිහත්වීමත් සමඟ අවසානයේදී සංස්ථාවෙහි මුදල් ප්‍රවාහයන් යහපත් තත්වයට පත්විය.

අගය එකතු කිරීම

කාණ්ඩය	2023 (රු. මී.)	2022 (රු. මී.)
ශුද්ධ විකුණුම් ආදායම	1,263,603	1,148,801
වෙනත් ආදායම්	28,363	38,839
මිලදී ගන්නා ලද ද්‍රව්‍ය සහ සේවා	(921,866)	(1,546,819)
ක්ෂය වීම්	(2,632)	(2,645)
අගය එකතු කිරීම්	**367,468**	**(361,824)**
අදාල වනුයේ		
සේවකයන් වෙත ගෙවීම්		
වැටුප් සහ ප්‍රතිලාභ	6,483	6,595
ප්‍රාග්ධන ලැබීම් සඳහා		
ණය මත පොළිය	7,454	119,537
සංස්ථාව		
රඳවා ගන්නා ලද ලාභය	120,310	(615,022)
රජය		
බදු සහ තීරු බදු	233,220	127,066
අගය එකතු කිරීම	**367,468**	**(361,824)**

නිපැයුම් ප්‍රාග්ධනය



නිපැයුම් ප්‍රාග්ධනය

අපගේ නිෂ්පාදන ප්‍රාග්ධනය මූලික වශයෙන් පිරිපහදුව, බෙදාහැරීමේ පර්යන්තය, පුළුල් පිරවුම්හල් ජාලය සහ ගුවන් උපකරණ යන ඒවායින් සමන්විත වේ. සංස්ථාවේ අරමුණු හා අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම වත්කම්වල ප්‍රශස්ථ කළමනාකරණය සහ උපාය මාර්ගික පෙළගැස්ම අත්‍යවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් අංශය හි තිරසාර බව ප්‍රවර්ධනය කිරීම සඳහා අපගේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම කෙරෙහි අපි සැලකිය යුතු අවධාරනයක් තබා ඇත්තෙමු. මේ සඳහා සංස්ථාව විසින් නව ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම සඳහා රුපියල් බිලියන 3.02 ක් වෙන් කර ඇති අතර එමඟින් අපගේ පවතින වත්කම් සමූහය වැඩි වනු ඇත.

3.0
(රු. බි.)
ස්ථාවර වත්කම් මත ආයෝජනය

311.4
(රු. බි.)
මුළු වත්කම්

990
පිරවුම්හල් ගණන

67.8
(රු. බි.)
ස්ථාවර වත්කම්

සමාලෝචනය - 2023

- සංස්ථාව විසින් වසර තුළ ස්ථාවර වත්කම් මත රුපියල් මිලියන 3,017ක් ආයෝජනය කරන ලදී.
- ත්‍රිකුණාමලයේ ඉහළ ටැංකි සමූහයේ කල්බදු පදනම මත ලබාගත් ටැංකි 24ක් සංවර්ධනය කිරීම.
- 2023.12.31 දිනට දේපල, පිරියත සහ උපකරණවල ශුද්ධ ලේඛනගත වටිනාකම රු. මිලියන 45,684 කි.
- BIA පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සහ මූල්‍ය ප්‍රගතියෙන් 87.8% කට සහ 78.9% කට ළඟා වී ඇත.

අපගේ නිෂ්පාදිත ප්‍රාග්ධනයට දේපල, පිරියත සහ උපකරණ, ආයෝජන දේපල සහ අස්පෘශ්‍ය වත්කම් වන තොරතුරු තාක්ෂණ (IT) පද්ධති සහ මෘදුකාංග මෙන්ම සංස්ථාව සතු පිරවුම්හල් ජාලයක්ද අන්තර්ගත වේ. අපි අපගේ නිෂ්පාදිත ප්‍රාග්ධනය පෝෂණය කරන අතර එමඟින් අපි බොරතෙල් පිරිපහදු කර ඛනිජ තෙල් නිෂ්පාදන රට පුරා බෙදා හරිනු ලබන්නේ ඒවාට සාමාන්‍ය ජනතාවට සහ කර්මාන්තවලට පහසුවෙන් ප්‍රවේශ විය හැකි බව සහතික කිරීම සඳහා වේ.

සංස්ථාව යනු ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් ව්‍යාපාරයේ වෙළෙඳපොළ ප්‍රමුඛයා වන අතර කර්මාන්තයට අවශ්‍ය යටිතල පහසුකම් නිර්මාණය කිරීම සහ නඩත්තු කිරීම සඳහා ක්‍රියාත්මක වෙමින් පවතී. අපගේ පාර්ශවකරුවන් සඳහා වටිනාකමක් නිර්මාණය කිරීම, අපි අපගේ නිෂ්පාදන ප්‍රාග්ධනයේ ඵලදායීතාවය සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ මෙම සාධක දෙක මෙහෙයුම් විශිෂ්ටත්වය සමඟ එක් කිරීම සඳහා නැවත ආයෝජනය කරන්නෙමු. අගය නිර්මානය කිරීම සඳහා අපගේ නිෂ්පාදිත ප්‍රාග්ධනය ආයෝජනය කිරීම සහ රැකබලා ගැනීම කෙරෙහි අපි අපගේ උපායමාර්ගික අවධානය යොමු කරන්නෙමු.

දේපල, පිරියත සහ උපකරණ (PPE)

අපගේ දේපල, පිරියත සහ උපකරණ, පිරිපහදුව, ගුවන් තොටුපලවල ගුවන් තෙල් සැපයීම සඳහා වන වත්කම්, ඉන්ධන ගොඩබෑමේ බෝයා පහසුකම්, බෙදා හැරීමේ පර්යන්තය සහ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල යන ඒවායින් සමන්විත වේ. අප විසින් රු. මිලියන 3,017ක් ස්ථාවර වත්කම් වල ආයෝජනය කර ඇති අතර මේවාද අපගේ පවතින ස්ථාවර වත්කම් සමූහයට එකතු කර ඇත්තෙමු.





නව ආයෝජනයන් ප්‍රධාන වශයෙන් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ නව හයිඩ්‍රන්ට් පද්ධතිය සංවර්ධන සහ දිගු කිරීමේ ව්‍යාපෘතිය මඟින් නියෝජනය වේ. ආයෝජන දේපල ඇතුළු දේපල, පිරියත සහ උපකරණවල වටිනාකම රු. මිලියන 67,777 ක් වන අතර ශුද්ධ ලේඛනගත වටිනාකම රුපියල් මිලියන 45,684 ක් ලෙස පැවතුනි.



අපගේ ප්‍රමුඛතම උපායමාර්ගික වත්කම වන්නේ 1969 දී ආරම්භ කරන ලද සපුගස්කන්ද පිරිපහදුව වන අතර එය මුලින් නිර්මාණය කර ඇත්තේ එවකට පැවති ජාතියේ අවශ්‍යතා සපුරාලීම සඳහා වේ. දැනට මෙම පිරිපහදුව මුළු ඉල්ලුමෙන් 45% කට වඩා වැඩි ප්‍රමාණයක් සපයයි. 2023 දී, පිරිපහදුව ක්‍රියාත්මකව පැවති අතර, ඔක්තෝබර් මාසයේදී උත්ප්‍රේරක පුනර්ජනනයට පහසුකම් සැලසීම සඳහා සැලකිය යුතු නඩත්තු කිරීම් සඳහා කෙටි කාලයකට වසා දැමීමක් සිදු කරන ලදී.

ආර්ථිකයේ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය සඳහා බලශක්ති සුරක්ෂිතතාව ඉතා වැදගත් වන අතර, රටේ බලශක්ති සුරක්ෂිතතාව ඉහළ නැංවීම සඳහා පිරිපහදුව ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. නඩත්තු කිරීම සහ පිරිපහදුවේ හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා කුඩා හා සැලකිය යුතු මූලපිරීම් ගණනාවක් සිදු වෙමින් පවතී. සංස්ථාව ගුවන් සේවා මෙහෙයුම් අඛණ්ඩව, දවසේ පැය 24 පුරාම, සතියේ දින 7 පුරාම ක්‍රියාත්මක වන අතර, ගුවන් යානාවල සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සහ ඉන්ධන බෙදා හැරීම සඳහා පවතින යටිතල පහසුකම් ඉතා වැදගත් වේ. නවීන තාක්ෂණික දියුණුව සමඟ වේගයෙන් එක්ව ක්‍රියාත්මක වීම සඳහා ගුවන් යානා ඉන්ධන මෙහෙයුම් වෙනුවෙන් ආයෝජන සිදු කෙරෙමින් පවතී.

වර්තමානයේ පවතින ඉන්ධන හිඟයන් අභියෝග රාශියක් ඉදිරිපත් කරන බැවින් අපගේ මූලික අවධානය ගබඩා කිරීමේ ධාරිතාව පුළුල් කිරීම කෙරෙහි යොමු වී තිබේ. ගබඩා ධාරිතාව ඉහළ නැංවීම සඳහා ත්‍රිකුණාමලයේ ටැංකි 24ක් සංවර්ධනය කිරීම වෙනුවෙන් ආයෝජනය කිරීමට සැලසුම් කර ඇත.

ආයෝජන දේපල


ආයෝජන වත්කම්වලට තර්ස්ටන් පාරේ සහ මල් පාරේ දේපළ මෙන්ම සංස්ථාව සතු පිරවුම්හල් ද ඇතුළත් වේ. තර්ස්ටන් පාර සහ මල් පාර ගොඩනැගිලි විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයට සහ අගමැති කාර්යාලයට කල්බදු පදනම මත දී ඇත. වර්ෂය තුළ, කුලී/උපයෝගිතා ගාස්තු ආදායම ලෙස රු. මිලියන 1,153ක් ආයෝජන දේපල වලින් උපයා ඇත.

බෙදාහැරීමේ මාර්ග

දිවයින පුරා පිහිටි අපගේ පිරවුම්හල් ජාලය අපගේ අවසාන ගනුදෙනුකරුවන් සමඟ සබඳතා වර්ධනය කර ගැනීම සඳහා වැදගත් උපායමාර්ගික වත්කමක් ලෙස සේවය කරයි. මෙම පිරවුම්හල් සංස්ථාවට හිමි අලෙවි නියෝජිත (CODO) ලෙස ක්‍රියාත්මක හෝ අලෙවි නියෝජිතට හිමි අලෙවි නියෝජිත (DODO) ලෙස ක්‍රියාත්මක වශයෙන් වර්ගීකරණය කර ඇත. රජයේ ප්‍රතිපත්ති අනුව ඉන්ධන පිරවුම්හල් නව ඉන්ධන සැපයුම්කරුවන්ට ලබාදීම හේතුවෙන් සමස්ත ක්‍රියාකාරී අලෙවිසැල් සංඛ්‍යාව 990 දක්වා අඩුවී ඇත.

අපගේ පුළුල් භූගෝලීය ප්‍රවේශය මඟින් රටේ සෑම ප්‍රදේශයකම මහජනතාවට ඛනිජ තෙල් නිෂ්පාදන සැපයීමට හැකියාව ලබා දෙන අතර, අපගේ සමස්ත ආදායමට ඉන්ධන පිරවුම්හල් සැලකිය යුතු දායකත්වයක් සපයන බැවින් අපගේ අලෙවිසැල් ජාලයට අපි සැලකිය යුතු වැදගත්කමක් ලබා දෙන්නෙමු.

ඛනිජ තෙල් බෙදාහැරීමේ ජාලය



උතුරු පළාත

	දිස්ත්‍රික්කය	ටෙර්මි	ඩීසල්	ලීෂ්ඨ
1	යාපනය	21	35	56
2	කිලිනොච්චිය	4	3	7
3	මුලතිව්	1	9	10
4	වවුනියාව	1	12	13
5	මන්නාරම	3	9	12
	එකතුව	30	68	98

වයඹ පළාත

	දිස්ත්‍රික්කය	ටෙර්මි	ඩීසල්	ලීෂ්ඨ
6	පුත්තලම	7	53	60
7	කුරුණෑගල	14	73	87
	එකතුව	21	126	147

උතුරු මැද පළාත

	දිස්ත්‍රික්කය	ටෙර්මි	ඩීසල්	ලීෂ්ඨ
8	අනුරාධපුරය	12	30	42
9	පොළොන්නරුව	8	15	23
	එකතුව	20	45	65

බස්නාහිර පළාත

	දිස්ත්‍රික්කය	ටෙර්මි	ඩීසල්	ලීෂ්ඨ
10	ගම්පහ	17	99	116
11	කොළඹ	37	65	102
12	කළුතර	11	33	44
	එකතුව	65	197	262

දකුණු පළාත

	දිස්ත්‍රික්කය	ටෙර්මි	ඩීසල්	ලීෂ්ඨ
13	ගාල්ල	12	45	57
14	මාතර	6	29	35
15	හම්බන්තොට	7	27	34
	එකතුව	25	101	126

නැගෙනහිර පළාත

	දිස්ත්‍රික්කය	ටෙර්මි	ඩීසල්	ලීෂ්ඨ
23	ත්‍රිකුණාමලය	4	17	21
24	මඩකලපුව	4	31	35
25	අම්පාර	6	37	43
	එකතුව	14	85	99

සබරගමු පළාත

	දිස්ත්‍රික්කය	ටෙර්මි	ඩීසල්	ලීෂ්ඨ
21	කෑගල්ල	6	23	29
22	රත්නපුර	10	26	36
	එකතුව	16	49	65

මධ්‍යම පළාත

	දිස්ත්‍රික්කය	ටෙර්මි	ඩීසල්	ලීෂ්ඨ
18	මාතලේ	2	12	14
19	මහනුවර	17	35	52
20	නුවරඑළිය	11	4	15
	එකතුව	30	51	81

ඌව පළාත

	දිස්ත්‍රික්කය	ටෙර්මි	ඩීසල්	ලීෂ්ඨ
16	මොණරාගල	6	13	19
17	බදුල්ල	7	21	28
	එකතුව	13	34	47

ප්‍රාග්ධන ප්‍රගතිය සහ ඉදිරි ගමන

ප්‍රාග්ධන ආයෝජන සඳහා රජය විසින් පනවා ඇති සීමාවන් තිබියදී, මෙහෙයුම් විශිෂ්ටත්වය ඉහළ නැංවීම අරමුණු කරගත් ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා සංස්ථාව විසින් සැලකිය යුතු වියදම් දැරීමක් සිදු කර ඇත. තිරසාර දිගු කාලීන වර්ධනයක් සහතික කරන අතරම, අපගේ දැක්ම සහ අරමුණු හඹා යාමේදී මෙහෙයුම් විශිෂ්ටත්වය, කාර්යක්ෂමතාව සහ සඵලතාවය සාක්ෂාත් කර ගැනීමෙහි ලා සඳහා තීරණාත්මක වන නිෂ්පාදන ප්‍රාග්ධනය සඳහා ආයෝජනය කිරීමට අපි කැපවී සිටින්නෙමු.

ප්‍රධාන උපායමාර්ගික වාණිජ ආයතනයක් ලෙස, සංස්ථාව ජාතියේ බලශක්ති සුරක්ෂිතභාවය ආරක්ෂා කිරීමට නිරන්තරයෙන් උත්සාහ කරයි. දිගු කාලීන මහා පරිමාණ ප්‍රාග්ධන ව්‍යාපෘති සහ කෙටි කාලීන සිට මධ්‍ය කාලීන උපාය මාර්ගික මුලපිරීම් යන ද්විත්වයෙහිම අපගේ ආයෝජන පාර්ශවකරුවන් සඳහා වටිනාකම් උත්පාදනය කිරීමට හැකියාව ලබා දෙයි.

ප්‍රාග්ධන ආයෝජන සඳහා රජයේ සීමා කිරීම් පවතින අතර, අපගේ ව්‍යාපාර මෙහෙයුම්වල ප්‍රගතිය සහ අඛණ්ඩ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය වන කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ව්‍යාපෘති සඳහා අපි උපායශීලීව ප්‍රමුඛත්වය දී ඇත්තෙමු. මෙහෙයුම් විශිෂ්ටත්වය සහ කර්මාන්ත සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා ස්ථාපිත ක්‍රියා පටිපාටිවලට අනුකූලව මෙම මුලපිරීම් ක්‍රියාත්මක කිරීමට අපි ක්‍රියාකාරීව පියවර ගනිමින් සිටින්නෙමු.

සැලකියයුතු ව්‍යාපෘතිවල ප්‍රගතිය පහත දක්වේ.



- ගුවන් යානා ඉන්ධන යළි පිරවුම් පර්යන්තය සහ පවතින ඉන්ධන හයිඩ්‍රන්ට් පද්ධතිය සංවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම මෙන්ම කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ දෙවන අදියරේ සංවර්ධන ව්‍යාපෘතියට අනුකූලව නව Apron - ඊ හි ඉන්ධන හයිඩ්‍රන්ට් පද්ධතිය ස්ථාපනය කිරීම 2018 ජනවාරි මස ආරම්භ කරන ලද අතර එය ක්‍රියාත්මක වෙමින් පවතී. වසර අවසානයේදී ව්‍යාපෘතියේ 87.8% ක භෞතික ප්‍රගතියක් සහ 78.9% ක මූල්‍ය ප්‍රගතියක් ලබා ඇත. ව්‍යාපෘතිය අවසන් වූ පසු ගුවන්තොටුපලේ අනාගතයට අවශ්‍ය වන වැඩි වන ගුවන් ඉන්ධන ඉල්ලුමට බාධාවකින් තොරව ප්‍රතිචාර දැක්වීමට, නවීනතම උපකරණ සමඟින්, සංස්ථාව හට හැකි වේ.
- තෙල් සංස්ථාව ත්‍රිකුණාමලය ටැංකි සමූහයෙන් කල්බදු පදනම මත ලබාගත් ටැංකි 24 ප්‍රතිසංස්කරණය කිරීම දිගටම සිදු කරගෙන යයි.
- පිරිපහදුවේ බිටුමන් ටැංකියේ හැකිලීම් කටයුතු අවසන් කර ඇති අතර ජල පරීක්ෂාව සිදු වෙමින් පවතී.
- ජල පිරිපහදුවේ සිට පිරිපහදුව දක්වා වන ජල නල පද්ධතිය ප්‍රතිස්ථාපනය කිරීම අවසන් කරන ලදී.

ප්‍රාග්ධන ගනුදෙනු

සංස්ථාව සිය ආයෝජනවලින් වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ලද භාණ්ඩ සඳහා පොලී සහිත ණය මගින් ආවරණය කරයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මෙම ප්‍රවේශය මෙම ආයෝජන හා සම්බන්ධ සැලකිය යුතු මූල්‍ය පිරිවැයක් ඇති කරන අතර අවසානයේදී එය ව්‍යාපෘති වියදම් වැඩි කිරීමට දායක වන අතර සංස්ථාවෙහි ලාභදායිතාවයට අහිතකර ලෙස බලපායි.

.



බුද්ධිමය ප්‍රාග්ධනය



බුද්ධිමය ප්‍රාග්ධනය

බුද්ධිමය ප්‍රාග්ධනය යනු සංවිධානයේ සදාචාරය, සංස්කෘතිය, වටිනාකම්, දැනුම, පද්ධති, ක්‍රියාවලි, ක්‍රියා පටිපාටි, ඉගෙනීම සහ වෙළඳ නාම යුක්තිය හා සම්බන්ධිත අස්පෘශ්‍ය වත්කම් වේ. අපේ කණ්ඩායම දැනට සංස්ථාව සඳහා වැටුප් හා වේතන පද්ධතියක් නිර්මාණය කිරීමේ අභ්‍යන්තර සංවර්ධනයකට සම්බන්ධ වී සිටී.සංස්ථාව වෙතට කළමනාකරණ පරිචය පිළිබඳ සම්මානය පිරිනමනු ලැබීමෙන් අදහස් වන්නේ සංස්ථාව විසින් එහි පාර්ශවකරුවන් සඳහා අගය උත්පාදනය කිරීම සඳහා ස්වකීය බුද්ධිමය ප්‍රාග්ධනය සාර්ථකව භාවිතා කර ඇති බව වේ. මෙහෙයුම් පාලනය වැඩිදියුණු කිරීම සඳහා බොහෝ පද්ධති සහ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම් සිදු කෙරෙමින් පවතී.

830
වසර 20කට වැඩි සේවාවක්

6.40
(රු. මී.)
පුහුණු කිරීමේ පිරිවැය

36,290
මුළු සේවා පළපුරුද්ද

සමාලෝචනය - 2023

- 2024 හොඳම කළමනාකරණ පරිච සහිත සමාගම් සඳහා වන සම්මාන උළෙලේදී සංස්ථාව හට 'හොඳම කළමනාකරණ පිළිවෙත් පිළිබඳ පිළිගැනීමේ සහතිකය' පිරිනමන ලදී.
- දැනුම වැඩිදියුණු කිරීම සඳහා අභ්‍යන්තර පුහුණු වැඩපිළිවෙලක් පවත්වන ලදී.
- වැටුප් හා වේතන පද්ධතිය සංවර්ධනය.

අපගේ බුද්ධිමය ප්‍රාග්ධනය නිර්මාණය වන්නේ අපගේ ආචාර ධර්ම, සංස්කෘතිය, සාරධර්ම, ආයතනික දැනුම, පද්ධති, ක්‍රියාවලි, ක්‍රියා පටිපාටි, ඉගෙනීම සහ සන්නාම සමානාත්මතාවය සමඟ සම්බන්ධ වූ අස්පෘශ්‍ය වත්කම් සාමූහිකව එක් රැස් වීමෙනි. අපගේ දැක්ම සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වන නිහඬ දැනුම වැඩිදියුණු කිරීම සඳහා අපි අපගේ සම්පත් ක්‍රියාකාරීව යොදවන්නෙමු. අපගේ සදාචාරාත්මක මූලධර්ම සහ සාරධර්ම CPC හි සංස්කෘතිය තුළට ගැඹුරින් කාවැදී ඇති අතර ඒවා අපගේ පාර්ශවකරුවන් සඳහා වටිනාකම් උත්පාදනය කිරීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

අපගේ අත්දැකීම් සමඟ ඒකාබද්ධ, අපගේ නිහඬ දැනුම, සාධාරණ බෙදාහැරීමක් සහතික කරමින්, වසර මැදදී සීමිත ඉන්ධන තොග සමඟ ඉන්ධන බෙදා හැරීම කළමනාකරණය කිරීමේ පද්ධති හා ක්‍රියා පටිපාටි සංවර්ධනයට සැලකිය යුතු ලෙස දායක වී ඇත. ආර්ථික අස්ථාවරත්වය මගින් එල්ල වන අභියෝග අවම කිරීම වැළැක්වීම සඳහා විසඳුම් සෙවීම අරමුණු කරගත් නව පද්ධති ස්ථාපිත කිරීම සඳහා තොරතුරු තාක්ෂණ අංශය කෙරෙහි අපි දැඩි අවධානයක් යොමු කර ඇත්තෙමු.

අපගේ වෙළඳ නාමය

වසර 61කට වැඩි සාර්ථක ඉතිහාසයක් ඇති සිපෙට්කෝ සන්නාමය ජනතාවට ඇදහිය නොහැකි තරම් සමීපව පවතින්නේ ඛනිජ තෙල් නිෂ්පාදන වැදගත් කාර්යභාරයක් ඉටු කරන බැවිනි. ඛනිජ තෙල් නිෂ්පාදන සැපයුම පිළිබඳ පාරිභෝගික විශ්වාසය අප විසින් ගොඩනඟනු ලැබ ඇති අතර, සාධාරණ වෙළඳාම සඳහා සහ ඛනිජ තෙල් නිෂ්පාදන වල ගුණාත්මක බව සඳහා කැපවීම සහිත විශ්වාසදායක හවුල්කරුවෙකු බැවින් ජනතාව අපට දිගටම සහාය දක්වමින් සිටී.

සිපෙට්කෝ ලිහිසි තෙල් ISO 9001/2000 සහතික ලත් මිශ්‍ර කිරීමේ කර්මාන්ත ශාලාවක මිශ්‍ර කරනු ලබයි. සිපෙට්කෝ ලිහිසි තෙල් නිෂ්පාදන, ඇමරිකානු පෙට්‍රෝලියම් ආයතනය (API), MTU Friedrichshafen SmbH, සහ යුරෝපීය මෝටර් රථ නිෂ්පාදකයින්ගේ සංගමය (ACEA) සේවා විෂයපථ මෙන්ම අවශ්‍ය ජාත්‍යන්තර නිර්ණායක සපුරාලයි.

සිපෙට්කෝ කෘෂි රසායන දශක පහකට වැඩි කාලයක් කෘෂි රසායන වෙළෙඳපොළෙහි ආදර්ශමත් සේවාවක් සපයා ඇත. 2008 සිට, සිපෙට්කෝ කෘෂි රසායන, කෘෂි රසායන ව්‍යාපාරයෙහි ISO 9001:2015 (තත්ත්ව කළමනාකරණ පද්ධතිය) සහ ISO 14001:2015 (පරිසර කළමනාකරණ පද්ධතිය) වැනි ISO සහතික ලබා ඇත. සිපෙට්කෝ කෘෂි රසායන ගොවීන්ගේ වගා කටයුතු වලට උපකාර කිරීම, සඳහා වගාවේ පළිබෝධ, දිලීර සහ වල් පැලෑටි සම්පූර්ණයෙන්ම පාලනය කිරීම හෝ තුරන් කිරීම සඳහා පාත්ති සකස් කිරීමේ සිට බෝග අස්වනු නෙලීම දක්වා ගොවිපලවලට කාර්යක්ෂම විසඳුම් සැපයීමට කැපවී සිටී.

අපගේ වටිනාකම්

සංස්ථාව සතුව සංස්ථාවේ සංස්කෘතියට ගැඹුරින් කාවැදී ඇති තමන්ගේම ආචාර ධර්ම සහ පරමාදර්ශ ඇත. ඛනිජ තෙල් නිෂ්පාදනවල ගුණාත්මකභාවය තිරසාර පරිභෝජනය සහ පරිසර සංරක්ෂණය සඳහා වැදගත් අංගයක් වන අතර අපි ජනතාඉල්ලීම් සහ ගොවියාට ගැලපෙන ප්‍රමිතිගත ඛනිජ තෙල් නිෂ්පාදන පවත්වාගෙන යමින් සිටිමු.

ඛනිජ තෙල් නිෂ්පාදන නිසඟ සෞඛ්‍ය සහ ආරක්ෂිත ගැටලු මතු කරන අතර උසස් තත්ත්වයේ නිෂ්පාදන සැපයීම සඳහා අපි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කරන්නෙමු. අපගේ ගනුදෙනුකරුවන් තෘප්තිමත් කිරීමට සහ අපගේ පාර්ශවකරුවන්ට වටිනාකමක් ගෙන ඒම සඳහා, අපි විවිධාකාර තාක්ෂණික, මෙහෙයුම් සහ පාරිභෝගික හැසිරවීමේ සේවාවන් ලබා දෙන්නෙමු.

ක්‍රියාවලි වැඩිදියුණු කිරීම්

ස්වයංක්‍රීය ගෙවීම් ක්‍රමයට තවදුරටත් බැංකු ඇතුළත් කිරීම මගින් අපගේ මාර්ගගත ගෙවීම් පද්ධතිය පුළුල් වී ඇති අතර එමගින් සැලකිය යුතු ගනුදෙනු සීමවන්හි ආරක්ෂාව සහ නිරවද්‍යතාව යන ද්විත්වයම වැඩි දියුණු කෙරෙයි. මෙම සංවර්ධනය අලෙවිකරුවන්ට මෙන්ම ගනුදෙනුකරුවන්ට ද වැඩි පහසුවක් සපයයි.

එක් එක් වෙළෙන්දාගේ තොග මට්ටම් නිරීක්ෂණය කිරීම සහ ඉන්ධන බෙදා හැරීම පහසු කිරීම සඳහා සැලසුම් කර ඇති අලෙවි නියෝජිත තොග අධීක්ෂණ පද්ධතියක් ක්‍රියාවට නංවා ඇති අතර එමඟින් නිශ්චිත ප්‍රදේශවල හිඟය අවම කිරීමට ක්‍රියා කර ඇත. මීට අමතරව, මෙම පද්ධතිය විකුණුම් කළමනාකරණයට සහාය වන අතර සීමිත ලබා ගැනීමේ හැකියාව මත පදනම්ව ඉන්ධන වෙන් කිරීම සැලසුම් කිරීමට උපකාරී වේ.

දැනට, වැටුප් සහ වැටුප් කළමනාකරණය අපගේ අනුබද්ධ සමාගමට පවරා ඇති අතර, අපගේ අභ්‍යන්තර විශේෂඥතාව උපයෝගී කර ගනිමින් නව ක්‍රමයක් සකස් කරමින් පවතී. මෙම නව තාක්ෂණය මගින් වඩාත් නිවැරදි තත්‍ය කාලීන දත්ත ලබා දීමට සහ පිරිවැය ඉතිරිකිරීම් ජනනය කිරීමට හැකි වනු ඇත.



අඛණ්ඩ ඉගෙනීම සහ සංවර්ධනය

වත්මන් වෙනස්වන සුළු ආයතනික පරිසරය තුළ, ශක්තිමත් දැනුම් පදනමක් යනු අත්‍යවශ්‍ය උපායමාර්ගික වත්කමකි. දැනුම මත ක්‍රියාත්මක වන සංවිධානයක් ස්ථාපිත කිරීම තරඟකාරී වාසියක් ලබා දෙන අතර, සංස්ථාවෙහි අප වටිනාකම් නිර්මානය කිරීම සහ තිරසාර භාවය වැඩිදියුණු කිරීම සඳහා දැනට ක්‍රියාත්මක වන අපගේ පිරිස් සංවර්ධනය කිරීම සඳහා කැපවී සිටී. 2023 මුදල් වර්ෂයේදී අපි පුහුණු හා සංවර්ධන මූලපිරීම් සඳහා විවිධ බාධාවන් මධ්‍යයේ වුවද අපගේ ශ්‍රම බලකායේ කුසලතා සහ හැකියාවන් ඉහළ නැංවීමේ අරමුණින් රුපියල් මිලියන 6.40 ක් වෙන් කර ඇති අතර එය පෙර වසරේ දී වෙන් කළ රුපියල් මිලියන 4.75ට වඩා වැඩි වීමකි.

අපගේ 830 ක් වක සේවකයින් ඉහල වෘත්තිය නිපුණත්වයකින් යුතු වන අතර, එක් එක් අයෙකුට වසර 20 කට වැඩි අඛණ්ඩ සේවයක් පැවතීම මගින් , එම තත්වය තීරණාත්මක ක්ෂේත්‍රයන්හි සැලකිය යුතු ප්‍රවීණතාවයක් ඇති කරයි. අපගේ වත්මන් ශ්‍රම බලකායේ සමුච්චිත සේවා පළපුරුද්ද වසර 36,295 ඉක්මවයි. මෙහෙයුම් විශිෂ්ටත්වය සහ දිගු කාලීන තිරසාරභාවය සාක්ෂාත් කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වන නිහඬ දැනුම සංරක්ෂණය කිරීම සහතික කරන ඉගෙනුම් සහ සහාය සංස්කෘතියක් සංස්ථාව පෝෂණය කරයි. අත්දැකීම් සහ වෘත්තීය සංවර්ධනය තුළින් ලබාගත් අවබෝධය සහ තොරතුරු ඇතුළත් නිහඬ දැනුම, සංස්ථාවෙහි මෙහෙයුම් කාර්යක්ෂමතාවයට සහ අපගේ මෙහෙවර සහ අරමුණු ඉටුකර ගැනීමට සැලකිය යුතු දායකත්වයක් සපයයි. අපගේ පිරිපහදුව මගින් ජනනය කරනු ලබන අද්විතීය දැනුම ජාතික ආර්ථිකයට සැලකිය යුතු වටිනාකමක් එක් කරයි. සැලකිය යුතු කරුණක් නම්, පිරිපහදුව මීට වසර 53 කට පෙර 1960 දශකයේ තාක්ෂණය උපයෝගී කරගනිමින් ආරම්භ කරන ලද නමුත්, නිහඬ දැනුමක් ඇති අපගේ දක්ෂ සේවකයින් විසින් සිදු කරන ලද කඩිසර නඩත්තුව හේතුවෙන් එය කාර්යක්ෂමව අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

තවද, පිරිපහදුවේ පෙට්‍රෝලියම් රසායනාගාරය ශ්‍රී ලංකාවේ ඇති දියුණුම පහසුකම්වලින් එකක් ලෙස පිළිගැනෙන අතර, ඛනිජ තෙල් සහ ඛනිජ රසායනික පිරිවිතරයන් පිළිබඳ විස්තීර්ණ පරීක්ෂණයක් සිදුකිරීමට එහි පහසුකම් ඇත.
අපගේ දැනුම පදනම, නවීන තාක්ෂණික දියුණුවන් සමඟ ඒකාබද්ධව ජාතික ආර්ථිකයට අපගේ දායකත්වය වැඩි දියුණු කරයි.

සම්මාන සහ පිළිගැනීම

ශ්‍රී ලංකා වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනය විසින් සත්කාරකත්වය සපයන ලද 2024 හොඳම කළමනාකරණ භාවිතා සමාගම් සම්මාන උළෙලේදී CPC හට කුසලතා සම්මානය සහ හොඳම කළමනාකරණ පිළිවෙත් සඳහා පිළිගැනීමේ සහතිකය ලැබී ඇති බව සතුටින් ප්‍රකාශ කරන්නෙමු. 2024 හොඳම කළමනාකරණ භාවිතා සමාගම් සම්මාන යනු CPM ශ්‍රී ලංකා විසින් ආරම්භ කරන ලද්දක් වන අතර එය පසුගිය වසර පුරා විවිධ සංවිධාන වලින් ඵලදායී කළමනාකරණ භාවිතයන් බෙදා හැරීමට සැලසුම් කර ඇති අතර මෙම ක්ෂේත්‍රයේ විශිෂ්ඨත්වය විදහා දක්වන ඒවා ඇගයීමට ලක්කිරීම ද සිදු කරයි.

විශේෂයෙන්ම වර්තමාන අස්ථාවර ව්‍යාපාර සහ ආර්ථික භූ දර්ශනය සැලකිල්ලට ගනිමින්, එහි පාර්ශවකරුවන් සඳහා වටිනාකම් නිර්මාණය කෙරෙහි අවධානය යොමු කරන ඵලදායී කළමනාකරණ පිළිවෙත් ක්‍රියාත්මක කිරීමට සංස්ථාව දැඩි කැපවීමක් පෙන්නුම් කර ඇත. පවතින පරිසරයේ ඇති දුෂ්කරතා නොතකා මෙම කාර්ය සාධනය සාර්ථකත්වයක් පෙන්වා ඇත.

මානව ප්‍රාග්ධනය



මානව ප්‍රාග්ධනය

සාමාජිකයින් 2,083 දෙනෙකුගෙන් යුක්ත අපගේ හැකියාවන්ගෙන් සමන්විත කණ්ඩායම අප ආයතනයේ පදනම ලෙස ක්‍රියා කරයි. අපිට ඔවුන් හුදු සේවකයන් පමණක් නොව ඔවුන් අපගේ අගනා වත්කම් වන අතර අපව සාර්ථකත්වය කරා ගෙන මෙහෙයවනු ලබන්නේ ඔවුන් විසිනි. සංස්ථාවෙහි ඉලක්ක සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඔවුන්ගේ කැපවීම සහ කාර්යක්ෂමතාවය අත්‍යවශ්‍ය වේ. පුහුණුවීම් සහ සංවර්ධනය කටයුතු සඳහා ආයෝජනය කිරීම සඳහා අප ප්‍රමුඛස්ථානය ලබදෙන අතර අපගේ කණ්ඩායම සංවර්ධනය හා පෝෂණය කිරීමෙන්, අපට වඩාත් අභිලාෂකාමී අපේක්ෂාවන් සාක්ෂාත් කර ගත හැකි අතර එය ජයග්‍රහණ බවට පරිවර්තනය කළ හැකි බව අපි හඳුනා ගනිමු.

2,083
සේවකයන් ගණන

6,483
(රු. මි.)
කාර්ය මණ්ඩල පිරිවැය

45
සේවා තිළිණ

132
පුහුණු අවස්ථා

සමාලෝචනය 2023

- අභ්‍යන්තර සහ බාහිර පුහුණු මාලාවන්ලබා දෙන ලදී.
- වර්ෂය තුළ විශ්‍රාම ගත් / ඉල්ලා අස්වූ සේවකයින් සංඛ්‍යාව 150 කි.
- සේවකයින් සඳහා සේවා ඇගයීම් සම්මාන 45 ක් ලබා දෙන ලදී.
- වසර අවසානයේ දී බාහිර සිසුන් සඳහා පුහුණු අවස්ථා 132ක් ලබා දේ.

අපගේ ජයග්‍රහණ මූලික වශයෙන් අපගේ මානව ප්‍රාග්ධනය සමඟ සම්බන්ධ වී ඇති අතර, එය සංවිධානාත්මක උපාය මාර්ගයේ තීරනාත්මක අංගයක් සපුරාලමින් දැක්ම සහ මෙහෙවර ඉටු කිරීම කරා අපව මෙහෙයවයි. ඉහළ මට්ටමේ කුසලතා, අභිප්‍රේරණය සහ කැපවීමෙන් සංලක්ෂිත අපගේ ශ්‍රම බලකාය පිළිබඳව අපි මහත් සේ ආඩම්බර වන්නෙමු. ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් ක්ෂේත්‍රයේ වෙළඳපල ප්‍රමුඛයා වශයෙන් අපව පිළිගනු ලැබීමට ඔවුන්ගේ දායකත්වය මහෝපකාරී වේ. අපගේ මානව සම්පත් ප්‍රතිපත්තිය සේවකයින්ගේ යහපැවැත්මට ප්‍රමුඛත්වය දෙමින් ආකර්ශනීය දිරිගැන්වීම්, විස්තීර්ණ සෞඛ්‍ය සහ ආරක්ෂක පියවරයන් සහ වෘත්තීය දියුණුව තහවුරු කරන අවස්ථා ඇතුළත් ධනාත්මක සහ ප්‍රතිලාභදායක සේවා පරිසරයක් පෝෂණය කරයි. ස්වකීය අපේක්ෂාවන් තෘප්තිමත් කරන සහ සෑහීමට පත් ශ්‍රම බලකායක් සංවර්ධනය කිරීම සඳහා අපගේ කැපවීම අඛණ්ඩව සහ ස්ථිරව පවතී.

කාණ්ඩය	සේවකයන් ගණන
ස්ථිර කාර්ය මණ්ඩලය	2,083
කොන්ත්‍රාත් සේවකයන්	4
පුහුණුවන්නන්	132
මුළු මානව ප්‍රාග්ධනය	**2,219**

පාලනය

ප්‍රධාන පාලන ආයතනය ලෙස, සංස්ථාවේ උපාය මාර්ගික ඉලක්ක සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කරමින්, මානව සම්පත් ප්‍රතිපත්ති සංවර්ධනය කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය සහ මඟ පෙන්වීම යටතේ සංස්ථාවේ මානව ප්‍රාග්ධනය කළමනාකරණය කිරීමේ වගකීම මානව සම්පත් කාර්යාංශයට පැවරී ඇත. මානව සම්පත් ක්‍රමෝපායන් නිරන්තරයෙන් ඇගයීම් සහ ගැලපීම් මගින්, මානව සම්පත් ක්‍රියාකාරීත්වය ඉහළ ආයතනික අරමුණු සමඟ අඛණ්ඩව සමපාත වේ.

විවිධත්වය

සංස්ථාව විවිධත්වයට ප්‍රමුඛත්වය දෙන මානව සම්පත් ප්‍රතිපත්තියක් පවත්වා ගෙන යනු ලබන අතර අපගේ සේවකයින්ට ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ භාවය, වයස, ජාතිය, ආගම හෝ වෙනත් ලක්ෂණ නොසලකා කිසිදු ආකාරයක වෙනස් කොට සැලකීමක් පැහැදිලිවම අධෛර්යමත් කරයි. සම්පූර්ණයෙන්ම විවිධ වූ ශ්‍රම බලකායක් ඇති කිරීමේ අරමුණින්, සාමාන්‍ය ජනතාව සඳහා ප්‍රවේශ්‍යතාව වැඩිදියුණු කිරීමට සහ පාරිභෝගික සේවා වැඩිදියුණු කිරීමට හැකි වන සේ අපි විවිධ පළාත්වල අපගේ සේවකයින් උපායශීලීව ස්ථානගත කර ඇත්තෙමු. කාන්තාවන්ට ඔවුන්ගේ වෘත්තීය ප්‍රයත්නයන් තුළ සමෘද්ධිමත් වීමට සමාන අවස්ථා නිර්මාණය කරමින් අපගේ ආයතනය තුළ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීමට අපි කැපවී සිටිමු.


අපගේ කාන්තා සේවිකාවන් සඳහා ශක්තිමත් සේවා පරිසරයක් සහතික කිරීම සඳහා මානව සම්පත් ප්‍රතිපත්ති අඛණ්ඩව ඇගයීමට අපි කැපවී සිටිමු. ගත වූ වසර තුළ වෙනස් කොට සැලකීමේ සිදුවීම් වාර්තා වී නොමැති බව දැන්වීම අපගේ සතුටට කරුණකි. අපගේ ආයතනයේ සෑම තරාතිරමකම කාන්තාවන්ගේ සහභාගීත්වය සක්‍රීයව ප්‍රවර්ධනය කෙරෙන අපගේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයෙන් සහ ඉහළ තනතුරුවලින් 23% ක් කාන්තාවන් විසින් දැරීම පිළිබඳව අප ආඩම්බර වෙමු. වෘත්තීමයභාවය සහ ප්‍රගතිශීලීත්වය කෙරෙහි අවධානය යොමු කරමින්, අපි විවිධ සහ අන්තර්ගත ශ්‍රම බලකායක් පෝෂණය කිරීමට කැපවී සිටිමු.

පළාත අනුව සේවකයන්


M පිරිමි
F ගැහැණු
T එකතුව

M	F	T
13	4	17
24	6	30
31	14	45
1485	283	1768
82	11	93
23	1	24
40	18	58
24	7	31
14	3	17

ස්ත්‍රී පුරුෂ භාවය අනුව සේවකයින්



ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය



77% 23%

ප්‍රදාන සහ පිළිගැනීම්

අපගේ මෙහෙයුම්වල සාර්ථකත්වය සඳහා සේවකයින්ගේ තීරණාත්මක වැදගත්කම අපි හඳුනා ගෙන සිටින්නෙමු. ඔවුන්ගේ දායකත්වයන් අගයමින්, අපගේ සේවකයින්ට ඔවුන්ගේ භූමිකාවන්හි විශිෂ්ටත්වය දැක්වීමට පිළිගැනීමට සහ දිරිගැන්වීම සඳහා නිර්මාණය කර ඇති පුළුල් ත්‍යාග ප්‍රදාන ක්‍රමයක් අප විසින් ස්ථාපිත කරනු ලැබ ඇති අතර එමඟින් ඔවුන් තුළ ආයතනය කෙරෙහි පක්ෂපාතී භාවයක් ඇතිකිරීමට ඉඩ සලසා ඇත.

වත්මන් වෙළෙඳපොළ ප්‍රවණතාවන්ට අනුකූලව මූල්‍ය සහ මූල්‍ය නොවන ප්‍රතිලාභ දෙකම ඇතුළත් ශක්තිමත් ප්‍රදාන පැකේජයක් පිරිනැමීමට හැකි වීම අපට අභිමානයකි.. සාධාරණත්වය සහ විනිවිදභාවය සඳහා වූ කැපවීම මඟින්, 2,083ක් වන සියලුම ස්ථිර සේවකයන්ට ඔවුන්ගේ රැකියා වගකීම් පිළිබිඹු කරමින් තරඟකාරී සහ සාධාරණ වන්දි පැකේජයක් ලැබෙන බවට සහතික කෙරෙයි.

සංස්ථාවෙහි, සේවකයින් හඳුනා ගැනීම සහ ත්‍යාග පිරිනැමීම අගය කිරීමේ අංගයක් ලෙස පමණක් නොව මෙහෙයුම් සාර්ථකත්වයට සැලකිය යුතු ලෙස දායක වන තෘප්තිමත් සහ අභිප්‍රේරිත ශ්‍රම බලකායක් පෝෂණය කිරීමට කැපවීම සඳහා වන අපගේ ක්‍රියාදාමයට සාක්ෂියක් ලෙසද ක්‍රියා කරන බව අපි තරයේ විශ්වාස කරමු. තවද, සේවකයින් ඔවුන්ගේ රැකියා වර්ගීකරණය මත පදනම්ව විවිධ අතිරේක මූල්‍ය සහ මූල්‍ය නොවන ප්‍රතිලාභ සඳහාද සුදුසුකම් ලබති. මෙම ප්‍රතිලාභ අතරට ප්‍රසාද දීමනා, ඇතැම් ශ්‍රේණි සඳහා ගමන් වියදම් දීමනා, නිවාඩු නිකේතන සඳහා ප්‍රවේශය, සේවක ණය, වෛද්‍ය ආවරණය, සකසුරුවම් සමිතිය හරහා පාරිතෝෂික දීමනා, මාතෘ නිවාඩු සහ විශ්‍රාම ප්‍රතිලාභ ඇතුළත් වේ.

සංස්ථාව සඳහා ඔවුන්ගේ සුවිශේෂී දායකත්වය සහ නොසැලෙන කැපවීම අගයමින්, අපි අපගේ ආදර්ශමත් සේවකයින්ට සේවා සම්මාන පිරිනමන්නෙමු. අපගේ මානව සම්පත් ප්‍රතිපත්තියට අනුකූලව මෙම සම්මාන පිරිනමනු ලබන අතර කාර්ය මණ්ඩලය විසින් විදහා දක්වන ලද කැපවීම සහ කාර්යක්ෂමතාව සඳහා වන අපගේ ගැඹුරු ඇගයීම මින් පිළිබිඹු කෙරෙයි

මෙම වසරේ, සංස්ථාවේ අරමුණු සැලකිය යුතු ලෙස ඉදිරියට ගෙන ගිය විශිෂ්ඨ කාර්ය සාධනයක් සහිත පුද්ගලයින් සඳහා සංස්ථාව විසින් සාඩම්බරයෙන් යුතුව ඇගයීම් 45ක් පිරිනමන ලදී.

සේවා කාණ්ඩය	සේවා තිලිණ සංඛ්‍යාව
වසර 20 ක සේවාව	20
වසර 30 ක සේවාව	13
වසර 35 ක සේවාව	12
එකතුව	**45**

බඳවා ගැනීම්

සංස්ථාවෙහි අප, අපගේ මූලික වටිනාකම් සහ ප්‍රතිපත්තිවලට අනුකූල වන කුසලතාවන් සහිත පුද්ගලයින් ආකර්ෂණය කර ගැනීමට කැපවී සිටින අතර, බඳවා ගැනීමේ ක්‍රියාවලිය මෙම කැපවීම මූර්තිමත් කරන බව අපගේ විශ්වාසය වේ. කීර්තිමත් රාජ්‍ය සංස්ථාවක් ලෙස, බඳවා ගැනීමේ ක්‍රියාවලියේදී අපි ජාතික රෙගුලාසි මෙන්ම අපගේම විස්තීර්ණ මානව සම්පත් ප්‍රතිපත්තිවලට දැඩි ලෙස අනුගත වන්නෙමු. අපගේ ක්‍රමවේදයට විධිමත් සම්මුඛ පරීක්ෂණ සහ නිපුණතා තක්සේරු කිරීම් උපයෝගී කර ගනිමින් නිශ්චිත කාර්යභාරය සඳහා එක් එක් අපේක්ෂකයාගේ යෝග්‍යතාවය පිළිබඳ පරිපූර්ණ සහ විනිවිදභාවයෙන් යුත් ඇගයීමක් ඇතුළත් වේ. මෙම ප්‍රවේශය ස්ථාපිත සේවක අවශ්‍යතා සමඟ අනුකූල වීම සහතික කරන අතර ව්‍යක්තීය ප්‍රගතිය සහ වැඩි වගකීම් සඳහා ඇති හැකියාව පෙන්නුම් කරන ඉහළ සුදුසුකම් ලත් පුද්ගලයන් ආකර්ෂණය කර ගැනීමට හැකියාව ලැබේ.

සමාන අවස්ථා සේවා යෝජකයෙකු ලෙස වෙනස් කොට සැලකීමේ භාවිතයන් පවත්වා නොගැනීම සඳහා කැපවන අපගේ ස්ථාවරය ගැන අපි ආඩම්බර වන්නෙමු. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ඔවුන්ගේ අදාළ රැකියා කාණ්ඩ තුළ එකම අවස්ථා ව්‍යුහයන් සඳහා සමාන සුදුසුකම් ඇති, පිරිමි සහ කාන්තා අපේක්ෂකයින්ට සමානව සලකනු ලැබේ.

සියලුම ව්‍යවස්ථාපිත අවශ්‍යතා වලට අනුගත වීමට අපගේ කැපවීමක් ඇති බැවින්, අප විසින් සලකා බලනු ලබන්නේ කිසිදු ආකාරයක වෙනස්කම් කිරීමකින් තොරව වයස අවුරුදු 18 හෝ ඊට වැඩි අපේක්ෂකයින් පමණක් වේ.

රටේ ආර්ථික තත්ත්වයන් මත පැන නගින නව බඳවා ගැනීම් සඳහා රජය විසින් පනවා ඇති සීමා කිරීම් හේතුවෙන්, වත්මන් වර්ෂය තුළ අප විසින් කිසිදු නව සේවකයෙකු බඳවා ගැනීමක් සිදු නොකරන ලැබිය.

උසස්වීම්

අපගේ උසස්කිරීම් ප්‍රතිපත්ති ඉතා සූක්ෂම ලෙස සැලසුම් කර ඇත්තේ පාර්ශ්වීය සහ සිරස් ව්‍යක්තීය ප්‍රගමනයට පහසුකම් සැලසීම සඳහා වන අතර එමඟින් සියලුම සේවකයින් සඳහා වර්ධනය සහ සංවර්ධනය සඳහා ඇති අවස්ථා වැඩි දියුණු කරයි. මෙම ප්‍රතිපත්ති පදනම් වී ඇත්තේ උසස්වීම් ප්‍රධාන වශයෙන් කුසලතා සහ කාර්ය සාධන නිර්ණායක අනුව තීරණය වන බව දැඩි ලෙස සහතික කරන මාර්ගෝපදේශ පදනම් වූ විස්තීර්ණ රාමුවක් මත ය.

පුහුණුව සහ සංවර්ධනය

සංස්ථාවෙහි අපි, අඛණ්ඩ පුහුණු සහ සංවර්ධන මූලපිරීම් මාලාවක් හරහා අපගේ මානව ප්‍රාග්ධනයේ වර්ධනය පෝෂණය කිරීමට කැපවී සිටිමු. අපගේ වාර්ෂික පුහුණු සහ සංවර්ධන උපායමාර්ගය අපගේ ශ්‍රම බලකායේ සමස්ත කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය වැඩිදියුණු කිරීම සඳහා ඉතා සූක්ෂම ලෙස සකස් කර ඇත. අපගේ සේවකයින්ට ඔවුන්ගේ කාර්ය භාරයන් සාර්ථක වීමට අවශ්‍ය අත්‍යවශ්‍ය පුහුණුව ලැබෙන බව සහතික කිරීම සඳහා සංස්ථාව ක්‍රියාකාරී ස්ථාවරයක් අනුගමනය කර ඇත. අපගේ කාර්ය මණ්ඩලය ඔවුන්ගේ වගකීම් ඉටු කිරීමට අවශ්‍ය තාක්ෂණික සහ අන්තර් පුද්ගල කුසලතා වලින් සන්නද්ධ කිරීම අරමුණු කරගත් අභ්‍යන්තර හා බාහිර පුහුණු වැඩසටහන් රාශියක් ආරම්භ කර තිබේ.

පුහුණු කිරීම සහ සංවර්ධනය සඳහා කැපවීම ඉතා වැදගත් වන අතර, 2022 දී රු.මිලියන 4.75 ක් වූ මුදල 2023 දී රු. මිලියන 6.40 ක් දක්වා ඉහල යෑම සංස්ථාව විසින්, සේවකයින්ගේ කුසලතා සහ දැනුම වැඩි දියුණු කිරීම අරමුණු කර ගෙන ආයෝජනය කිරීමක් ලෙස පෙන්නුම් කෙරේ.
අපගේ පුහුණු මූලපිරීම් ඵලදායිතාව, පාලනය, වත්කම්වල ගුණාත්මකභාවය, සෞඛ්‍යය, ආරක්ෂාව සහ පාරිසරික අනුකූලතාවය වැනි තීරණාත්මක ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරන අතර, අඛණ්ඩ ඉගෙනුම් සංස්කෘතියක් පෝෂණය කිරීමට අපි කැපවී සිටිමු.

අපගේ සේවකයින්ට දේශීය හා ජාත්‍යන්තර වශයෙන් උසස් අධ්‍යාපන අවස්ථා සඳහා ප්‍රවේශය ලබා දීම මෙහෙයුම් විශිෂ්ටත්වය ළඟා කර ගැනීම සඳහා ඉතා වැදගත් බව අපි තරයේ විශ්වාස කරමු. එහි ප්‍රතිඵලයක් වශයෙන්, අපගේ කණ්ඩායමේ සාමාජිකයින්ට ඔවුන්ගේ දැනුම සහ නිපුණතා වැඩිදියුණු කරන ශාස්ත්‍රපති උපාධි, උපාධි සහ ඩිප්ලෝමා හැදෑරීමට සහාය වීම සඳහා මූල්‍ය ආධාර පිරිනැමීමට හැකි වීම ඉමහත් සතුටකි.

සෑම වසරකම, අපි එක් එක් පුද්ගලයාට ප්‍රතිඵල කඩිනමින් සන්නිවේදනය කරමින් වාර්ෂික කාර්ය සාධන ඇගයීම් සිදු කරන්නෙමු. වසර පුරා අත්පත් කරගත් ජයග්‍රහණ සැලකිල්ලට ගන්නා අතර, එක් එක් සේවකයාගේ අද්විතීය ශක්තීන් සහ දායකත්වයන් පිළිගනු ලබන බවට සහ අගය කරනු ලබන බවට අපි සහතික කරන්නෙමු.

සදාචාරාත්මක හැසිරීම සහ අනුකූලතාව

අඛණ්ඩතාව සහ විශ්වාසනීයභාවය අපගේ සියලු ක්‍රියාකාරකම්වලට මූලික වන මූලික මූලධර්ම බව අපි විශ්වාස කරමු. අපගේ ආයතනික සංස්කෘතියේ හරයට ඔවුන් ඒකාබද්ධ කරමින් අපගේ සේවකයින් තුළ මෙම වටිනාකම් ඇති කිරීමට අපි කැපවී සිටිමු.

අඛණ්ඩ පුහුණුව සහ අධ්‍යාපනික මූලපිරීම් තුළින්, ඵලදායී හා සදාචාරාත්මක හැසිරීම්වල වැදගත්කම පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීමට අපි උත්සාහ කරමු. අල්ලස සහ දූෂණය සම්බන්ධයෙන් අප විසිනි දැඩි ප්‍රතිපත්තියක් පවත්වා ගෙන යනු ලබන අතර, සියලුම ව්‍යාපාරික ගනුදෙනු සහ අන්තර්ක්‍රියා වලදී විශ්වාසීය, සාධාරණ සහ ස්ථාවර ප්‍රතිපත්තිමය හැසිරීම් වල නිරත වීම සියලුම සේවකයින් වෙතින් අපේක්ෂා කෙරේ.

ඉහළම හැසිරීම් ප්‍රමිතීන්ට අනුකූලව වගකීම් සහ සදාචාරාත්මක භාවිතයන් ආරක්ෂා කිරීමට සංස්ථාව කැපවී සිටී. තවද, සංස්ථාව සාඩම්බරයෙන් යුතුව සියලුම කම්කරු නීති සහ රෙගුලාසි වලට අනුකූල ව ක්‍රියා කරන අතර, ළමා ශ්‍රමය, බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීම සහ අනිවාර්ය ශ්‍රමය ඇතුළු නීති විරෝධී භාවිතයන් අපගේ සංවිධානය තුළ පැහැදිලිවම නොපවතින බව සහතික කෙරෙයි.

විශ්‍රාම ගැනීම්

අපගේ සංවිධානය තුළ දක්ෂතා රඳවා තබා ගැනීම ශක්තිමත් කණ්ඩායමක් පෝෂණය කිරීමේ තීරණාත්මක අංගයක් වන අතර, සියලුම රැකියා මට්ටම් හරහා ඉහළ රඳවා ගැනීමේ අනුපාත පවත්වා ගැනීමේ අපගේ අඛණ්ඩ සාර්ථකත්වය ගැන අපි ආඩම්බර වෙමු.
පසුගිය වසර තුළ, විශ්‍රාම ගැනීම්, මරණ සහ ඉල්ලා අස්වීම් හේතුවෙන් සේවකයින් 150 දෙනෙකු ආයතනයෙන් ඉවත්ව ගොස් ඇත.

විශ්‍රාම ගැනීම් / මරණ / ඉල්ලා අස්වීම්			
කාණ්ඩය	පිරිමි	ගැහුණු	එකතුව
වයස 18-30	3	-	3
වයස 31-40	9	2	11
වයස 41-50	12	2	14
වයස 51-60	104	18	122
එකතුව	**128**	**22**	**150**

සෞඛ්‍යය සහ ආරක්ෂාව

විශේෂයෙන්ම ඛනිජ තෙල් කර්මාන්තය ආශ්‍රිත ආවේනික සෞඛ්‍ය අවදානම් සහ ගිනිගැනීම් පැවතීම හේතුවෙන් අප ආයතනයේ ප්‍රධානතම සැලකිල්ලක් නිරතුරුවම අපගේ සේවකයින්ගේ සුබසාධනය වෙත යොමු වේ. ජාත්‍යන්තරව පිළිගත් සෞඛ්‍ය සහ ආරක්ෂිත ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කරමින් අපගේ ශ්‍රම බලකාය සඳහා ආරක්ෂාවට නැඹුරු පරිසරයක් ඇති කිරීමට අප විසින් සෑම උත්සාහයක්ම ගෙන තිබේ.

සෞඛ්‍ය හා ප්‍රවේසම් ගැටලුව	පිරිපහදුව	ප්‍රධාන කාර්යාලය
අනතුර හේතුවෙන් සේවය අහිමි වීම	2	-
ප්‍රථමාධාර අනතුරු	-	-
වාර්තා වූ සුළු ගිනි ගැනීම්	-	-



ආරක්ෂිත ප්‍රමිතීන් ආරක්ෂා කිරීමේදී පිරිපහදුවෙහි කාර්යභාරයේ වැදගත්කම ඉතා ප්‍රබල වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සාමාන්‍ය ආරක්ෂණ විගණන සහ පරීක්ෂණ ඇතුළත් සියලුම සේවකයින් සඳහා සවිස්තරාත්මක පද්ධති සහ ආරක්ෂණ පුහුණු වැඩසටහන් අප විසින් ස්ථාපිත කර ඇත. ආරක්ෂිත සහ සුරක්ෂිත සේවා ස්ථානයක් පිහිටුවීම සඳහා අපගේ කැපවීම, මෙහෙයුම්, ඉංජිනේරු සහ කළමනාකරණ කණ්ඩායම්වල සහභාගීත්වය සහිතව සෑම කාර්තුවකම ආරක්ෂක රැස්වීම් හරහා පෙන්නුම් කෙරේ.

.


සුභසාධනය

කැපවූ සහ අභිප්‍රේරිත ශ්‍රම බලකායක් පෝෂණය කිරීම, සේවක පක්ෂපාතිත්වය වැඩි දියුණු කිරීම සහ ඉහළ මට්ටමේ කුසලතා ආකර්ෂණය කර ගැනීමට සහ රඳවා ගැනීමට අපට හැකියාව ලබා දීම සඳහා අපගේ සේවකයින්ගේ සුභසාධනයට ප්‍රමුඛත්වය දීම ඉතා වැදගත් වේ. මෙම පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා, සෞඛ්‍ය සම්පන්න සහ කැපවූ කණ්ඩායමකට සහාය වීම සඳහා සැලසුම් කර ඇති විවිධ සුභසාධන වැඩසටහන් සහ මූලපිරීම් අප විසින් සපයනු ලබයි.



සංස්ථාවට අපගේ කාර්ය මණ්ඩලය විසින් සිදු කරන ලද සැලකිය යුතු දායකත්වය අගය කරමින්, ඔවුන්ගේ ජීවන තත්වය ඉහළ නැංවීම සඳහා සහනධායී පොලී අනුපාත පිරිනමන ණය වැඩසටහන් අප විසින් ස්ථාපිත කර තිබේ. මෙම වසරේ, සංස්ථාව විසින් අපගේ සේවකයින්ට ණය සහ අත්තිකාරම් පහසුකම් රාශියක් ලබා දී ඇත

2023 වර්ෂය තුළ සපයන ලද ණය පහසුකම්



අපගේ සේවකයින් සඳහා සෞඛ්‍ය සම්පන්න වැඩ-ජීවිත සමතුලිතතාවයක් පවත්වා ගැනීම කෙරෙහි අපගේ දැඩි අවධානයක් යොමු වෙයි. මෙම කැපවීමට තවදුරටත් සහාය වීම සඳහා, උසස් අධ්‍යාපනය හදාරන අය ඇතුළුව අධ්‍යයන විශිෂ්ටත්වය පෙන්නුම් කළ සේවකයින්ගේ දරුවන්ට ශිෂ්‍යත්ව ලබා දීමෙන් සංස්ථාවෙහි අප අපගේ මූලපිරීම් පුළුල් කරන්නෙමු.

සංස්ථාව වෛද්‍ය යෝජනා ක්‍රමය උපායශීලීව සැලසුම් කර ඇත්තේ සේවකයින් සහ ඔවුන්ගේ යැපෙන්නන් සඳහා පුළුල් ආවරණයක් ලබා දීම සඳහා වන අතර එමඟින් යහපැවැත්මේ සංස්කෘතියක් පෝෂණය කිරීම සහ සමබර ජීවන රටාවක් ප්‍රවර්ධනය කිරීම සිදු කෙරේ.

අප ආගමික පිළිවෙත්වල වැදගත්කම හඳුනාගෙන සිටින අතර සියලුම සේවකයින්ට ඔවුන්ගේ විශ්වාසයන්ට අනුකූල වන චාරිත්‍රවල නිරත වීමට බොහෝ අවස්ථාවන් ලබා දීමට කැපවී සිටිමු. තවද, උපද්‍රව වලින් තොර සේවා ස්ථානයක් පවත්වා ගැනීම සඳහා සෞඛ්‍ය සහ ආරක්ෂාව කෙරෙහි අවධානය යොමු කරමින්, නම් කරන ලද සේවක කාණ්ඩ සඳහා සුදුසු නිල ඇඳුම් අපි සපයන්නෙමු. අපගේ සේවකයින්ගේ සෞඛ්‍යය සහ යහපැවැත්ම සඳහා අපගේ කැපවීම කෙරෙහි විශ්වාසය තැබීම අත්‍යවශ්‍ය වේ.

සේවක සහභාගීත්වය

අපගේ මෙහෙයුම් සඳහා අපගේ සේවකයින්ගේ නියැලීම ඉහළ ඇගයීමක් ලැබෙන අතර ක්‍රියාකාරිව ප්‍රවර්ධනය කිරීමද සිදු කෙරේ. සේවය සහ ජීවිතය අතර සමතුලිතතාවයක් පවත්වා ගැනීමේ වැදගත්කම සංස්ථාව පිළිගන්නා අතර පුද්ගලික තෘප්තිය සහ පිළිගැනීම වර්ධනය කිරීම සඳහා ක්‍රීඩා සහ අනෙකුත් කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා සේවක සහභාගීත්වය අපි දිරිමත් කරන්නෙමු.







සියලුම පාර්ශ්වයන්ට අන්‍යෝන්‍ය වශයෙන් පිළිගත හැකි ආකාරයෙන් සේවක ගැටලු ක්‍රියාකාරිව විසඳීම සඳහා වෘත්තීය සමිති නියෝජිතයන් සමඟ කටයුතු කිරීමට සංස්ථාව ප්‍රමුඛත්වය දෙයි.

කාර්මික සබඳතා සහ අනුකූලතාව

කාර්මික සබඳතා පිළිබඳ ප්‍රශස්ත කළමනාකරණය ඕනෑම ආයතනයක සුමට ක්‍රියාකාරිත්වයට පහසුකම් සැලසීමේ තීරණාත්මක අංගයකි. මෙම වැදගත්කම අප විසින් පිළිගනු ලබන අතර අපගේ කාර්මික සබඳතා අපගේ මෙහෙයුම් උපාය මාර්ග සමඟ ඒකාබද්ධ කිරීමට අපි උත්සාහ කරන්නෙමු. වෙළඳපොලේ ප්‍රමුඛයෙකු ලෙස, මානව සම්පත්, වත්කම් සහ මූල්‍ය ප්‍රාග්ධනය ඵලදායී ලෙස භාවිතා කිරීම කෙරෙහි ඔවුන්ගේ සැලකිය යුතු බලපෑම හඳුනා ගනිමින්, ධනාත්මක කාර්මික සබඳතා පවත්වා ගැනීම සඳහා අපි ඉහළ වටිනාකමක් ලබා දෙමු.

අපගේ සංවාදය සඳහා විවෘත ප්‍රතිපත්තිය අපගේ සේවකයින් විසින් පිහිටුවා ඇති සියලුම වෘත්තීය සමිතිවල සහභාගීත්වය දිරිමත් කරන අතර සියලුම පාර්ශවකරුවන් සමඟ ධනාත්මක සබඳතා පවත්වා ගැනීම සඳහා නිර්මාණාත්මක සංවාදයක් ප්‍රවර්ධනය කරයි. මෙම ප්‍රයත්නයන් තුළින්, අපි අපගේ වටිනාකම් සමුදාය අඛණ්ඩව වැඩිදියුණු කර අපගේ මෙහෙයුම්වල අඛණ්ඩ සාර්ථකත්වය සුරක්ෂිත කර ගන්නෙමු.

සේවකයින්ට ඔවුන්ගේ පුද්ගලික කැමැත්ත අනුව වෘත්තීය සමිතියකට අනුබද්ධ වීමට ඇති අයිතිය ක්‍රියාත්මක කිරීමට ස්වාධීනත්වය ලබා දී ඇත. 2023 දෙසැම්බර් 31 දින වන විට ලියාපදිංචි වෘත්තීය සමිති නවයක් පැවති අතර, සුමට මෙහෙයුම් ක්‍රියාවලීන්ට පහසුකම් සැලසීම සඳහා සංස්ථාව මෙම එක් එක් වෘත්තීය සමිති සමඟ සුහද සබඳතා වර්ධනය කර ඇත.

සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය



අපගේ ව්‍යාපාරික හවුල්කරුවන් සහ ප්‍රජාව ආවරණය වන පරිදි පාර්ශවකරුවන් සමඟ අපගේ ශක්තිමත් සහ ඵලදායී සබඳතා අගය උත්පාදනය සඳහා අත්‍යවශ්‍ය වේ. ඵලදායී සැපයුම් කළමනාකරණය සහ පාරිභෝගික සේවාවන් සහතික කිරීම සඳහා අපගේ අලෙවිසැල් සමඟ අප සමීප සහයෝගීතාවක් පවත්වා ගෙන ඇත්තෙමු. සමීප පාරිභෝගික සබඳතා කළමනාකරණයට පහසුකම් සැලසීම සඳහා පුහුණුව ලබා දෙමින් අලෙවිසැල් වල මෙහෙයුම් වලදී සෞඛ්‍යය සහ ආරක්ෂාව පිළිබඳව මූලික අවධානය යොමු කර ඇත.

සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

233
(රු. බි.)
රජයට සිදු කළ දායකත්වය

1567
(000 මෙ.ටො)
බොරතෙල් ආනයනය

2,729
(ඇ.ඩො.මි)
ඉන්ධන ආනයන

709
(රු. මි.)
ඛනිජ තෙල් නොවන ප්‍රසම්පාදන

සමාලෝචනය 2023

- රජය සඳහා බදු සහ තීරුබදු දායකත්වය රු මිලියන 223,220 කි.
- වර්ෂය තුළ මුළු ඉන්ධන ආනයනය (ඇ.ඩො.)මිලියන 2,729 කි.
- බාහිර සිසුන් සඳහා පුහුණු අවස්ථා ගණනාවක් ලබා දෙන ලදී.
- සේවක සමිති හරහා ප්‍රජා සහභාගීත්ව ව්‍යාපෘති මෙහෙයවන ලදී.

සංස්ථාවේ සිදු කෙරෙමින් පවතින මෙහෙයුම් සහ වටිනාකම් උත්පාදනය සඳහා පාර්ශවකරුවන් සමඟ ඵලදායී ලෙස සම්බන්ධ වීම ඉතා වැදගත් වේ. මහා භාණ්ඩාගාරය, ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL), මූල්‍ය ආයතන, බොරතෙල් සහ පිරිපහදු කළ තෙල් සැපයුම්කරුවන්, නැව් සමාගම්, දේශීය විකුණුම්කරුවන් සහ බෙදුම්කරුවන් ඇතුළු ප්‍රධාන හවුල්කරුවන් සමඟ සංස්ථාව ක්‍රියාකාරීව සිය සහයෝගිතා සබඳතා වර්ධනය කරයි.


ඛනිජ තෙල් ආනයන

ශ්‍රී ලංකාව සතුව ඛනිජ තෙල් නිධි නොමැති බැවින්, ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය ජාතියේ සමස්ත ආනයනවල සැලකිය යුතු අංගයක් බවට පත් කරයි. ඉහළ ගුණත්වයකින් යුතු සැපයුම්කරුවන් ආකර්ශණය කර ගැනීමට විනිවිද භාවයට ප්‍රමුඛත්වය දෙන රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලීන් භාවිතා කරමින් බොරතෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන යන දෙකම ආනයනය කිරීමේ වගකීම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් දරනු ලැබේ.

වර්ගය	2023 (ඇ.ඩො. මි.)	2022 (ඇ.ඩො. මි.)
බොර තෙල්	1,068.14	483.79
පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන	1,661.12	2,805.95
එකතුව	**2,729.26**	**3,289.74**

පිරිපහදුව සමස්ත සංස්ථා අලෙවියෙන් දළ වශයෙන් 35% සිට 50% දක්වා ප්‍රමාණයකට දායක වන අතර ඉතිරි ඉල්ලුම පිරිපහදු කළ නිෂ්පාදන සෘජුව ආනයනය කිරීම මගින් සපුරාලනු ලබයි. ඉහත සඳහන් ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිවලට අනුකූලව , සංස්ථාව විසින් පිරිපහදු කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදන සහ බොරතෙල් ඩොලර් මිලියන 2,729.26 ක වටිනාකමකට ආනයනය කරන ලද අතර එය 2022 දී ආනයනය කරන ලද ඩොලර් මිලියන 3,289.74 සිට අඩුවූ ප්‍රමාණයකි.

පිරිවැය අනුව ආනයන





පිරවුම්හල් කාර්ය මණ්ඩල පුහුණුව පිරිපහදුවේ අඛණ්ඩ මෙහෙයුම් හේතුවෙන් 2022 ට සාපේක්ෂව බොරතෙල් ආනයනය 141% කින් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. ඊට සමගාමීව, පිරිපහදුවේ නිෂ්පාදන ධාරිතාවය හේතුවෙන් පිරිපහදු කළ නිෂ්පාදන ආනයනය 27% කින් සැලකියයුතු ලෙස අඩුවී ඇත.

පසුගිය වසරට සාපේක්ෂව මුළු ආනයන පරිමාව 5% ක වැඩිවීමක් වී ඇතත් 2023 වසර පුරාවට ජාත්‍යන්තර තෙල් මිල පහත වැටීම හේතුවෙන් ඒ ආශ්‍රිත ආනයන පිරිවැය 17% කින් අඩු වී ඇත.

තවද, තෙල් හැර අනෙකුත් සියලුම දේශීය හා විදේශීය ප්‍රසම්පාදන රජය විසින් ස්ථාපිත ප්‍රසම්පාදන රෙගුලාසිවලට අනුකූලව සිදු කෙරේ. මෙම මාර්ගෝපදේශ සැලසුම් කර ඇත්තේ විනිවිදභාවය වැඩි දියුණු කිරීම සහ උසස් තත්ත්වයේ භාණ්ඩ හා සේවා අත්පත් කර ගැනීම සහතික කිරීම සඳහා ය. මෙම ක්‍රියාවලිය පහසු කිරීම සඳහා, දිගුකාලීන භාවිතය සඳහා නිෂ්පාදන සහ සේවාවල අවශ්‍යතාවය, අදාළත්වය, ගුණාත්මකභාවය සහ මිල ගණන් තක්සේරු කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු සහ ප්‍රසම්පාදන කමිටු පිහිටුවා ඇත.


ඛනිජ තෙල් නොවන ප්‍රසම්පාදන	ප්‍රසම්පාදන ගණන	වටිනාකම (රු.මි)
පහල බලතල අනුව	1044	120.1
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු	83	588.9
එකතුව	**1127**	**709.0**

රජයට සිදුකල දායකත්වය


යටිතල පහසුකම් සංවර්ධනය සහ ආර්ථික කටයුතු සඳහා වෙන් කෙරෙන රජයේ බදු ආදායමට සැලකිය යුතු දායකත්වයක් සපයන ආයතනයක් ලෙස සංස්ථාව කටයුතු කරයි. පසුගිය වසරේ සංස්ථාව විසින් 2022 දී ලබා දුන් රුපියල් මිලියන 127,078 කට වඩා වැඩි මුදලක් වන රු. මිලියන 233,220 ක් ලබා දෙන ලද අතර, එම ප්‍රමාණය සංස්ථාවෙහි මුළු ආදායමෙන් 17.74% නියෝජනය කරයි. රජයේ ශේෂ පත්‍රයේ පිළිබිඹු වන ණය සහ බැඳීම් පියවීමේ අවශ්‍යතාවයට ප්‍රතිචාර වශයෙන් රජය ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා වන නිෂ්පාදන බද්ද ඉහළ නංවා ඇත.

රජය විසින් අය කරන ලද නිෂ්පාදන බද්ද ඉහළ නැංවීම හේතුවෙන් 2022 වසරට සාපේක්ෂව මුළු බදු සහ තීරු බදු දායකත්වය 83.53% කින් ඉහළ ගොස් ඇත. 2022 ඔක්තෝම්බර් මාසයේ සිට ක්‍රියාත්මක වූ සමාජ ආරක්ෂණ සහ දායකත්ව බද්ද නිසා, 2023 සම්පූර්ණ වර්ෂය සඳහා දායකත්ව බදු අගය SSCL නිසා වැඩි වීමට හේතු විය.

බදු දායකත්වය



බදු දායකත්වය




ව්‍යාපාර හවුල්කාරිත්වය

පිරවුම්හල් 990 කින් යුතු දීප ව්‍යාප්ත අලෙවි නියෝජිත ජාලය මගින් සාමාන්‍ය ජනතාවට නිෂ්පාදන ලබා ගැනීමට ඇති හැකියාව සහතික කරනු ලබයි.

සංස්ථාව ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් ක්ෂේත්‍රයේ වෙළෙඳපොළ ප්‍රමුඛයා වන බැවින්, රටේ බලශක්ති සුරක්ෂිතතාව පිළිබඳ වගකීම ඉටු කිරීම සඳහා අපගේ ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ සුහද ව්‍යාපාරික සබඳතා පවත්වා ගැනීම ප්‍රමුඛතාවයයි. අවශ්‍ය මට්ටමේ ගුණාත්මක ඛනිජ තෙල් නිෂ්පාදන සැපයීම සඳහා පිරවුම්හල් නඩත්තු කිරීම සඳහා දැඩි ක්‍රියාවලි සහ පාලන සකස් කර ඇත.

අලෙවිසැල් - පළාත් අනුව







මේ හැරුණු විට අපගේ කෘෂි රසායන සහ ලිහිසි තෙල් තොගකරුවන් සහ අලෙවි නියෝජිතයන් විසින්ද නිෂ්පාදන අණ්ඩව ලබාදීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

නිෂ්පාදන වගකීම

අපගේ භාණ්ඩ සමඟ නිරායාසයෙන්ම බැඳෙන ගිනිගැනීම් සහ ආරක්ෂාව හා බැදි ගැටළු නිසා, නිෂ්පාදන වගවීම සෑම විටම පාරිභෝගිකයාට ගුණාත්මක ප්‍රමිතිගත නිෂ්පාදනයක් සැපයීම අපගේ ප්‍රධාන සලකා බැලීම්වලින් එකකි. තත්ත්ව ක්‍රියාවලිය ආරම්භ වන්නේ මිලදී ගැනීමෙන් වන අතර, හැසිරවීම, බෙදා හැරීම සහ තත්ත්ව පරීක්ෂා කිරීමේ ක්‍රියාවලීන් සියල්ලම සමස්ත ක්‍රියාවලිය පුරාම නිරීක්ෂණය කරනු ලැබේ. ක්‍රියාවලි සහ භාවිතයන් අනුගමනය කරන බව සහතික කිරීම සඳහා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම සඳහා පාරිභෝගික අන්තර්සබඳතා ස්ථානයේ විශේෂ අධීක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක වේ. ගිනි තර්ජන සහ ගින්නෙන් ආරක්ෂා වීම සඳහා ආරක්ෂිත යාන්ත්‍රණ ඇති අතර සියලුම පිරවුම්හල් වල ගිනි නිවන උපකරණ සඳහා ප්‍රවේශය තිබේදැයි සහතික කිරීම සඳහා නිතිපතා පරීක්ෂා කිරීම් සිදු කරනු ලැබේ.

හඳුනාගත් අඩුපාඩු සපුරාලීමට සහ ඒවා නිවැරදි කිරීමටත් අනාගත ගැටළු වළක්වා ගැනීම අරමුණු කරගත් ක්‍රියායාවන් සිදු කිරීමටත් ක්‍රියාශීලී ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර ඇත. භූමිතෙල් මිශ්‍ර කිරීම හඳුනා ගැනීමට සහ පරිභෝජනය කරන නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහතික කිරීමට අමතර නියාමන පද්ධති ස්ථාපිත කර ඇත.

වැරදි භාවිතා හෝ අක්‍රමිකතා වාර්තා කිරීමට පහසුකම් සැලසීම සඳහා සෑම අලෙවිසැලකම විශේෂිත පැමිණිලි පොතක් තබා ඇති අතර, එලෙස වාර්තා වන පැමිණිලි සම්බන්ධයෙන් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග අනුගමනය කරමින් සේවා ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා සංස්ථාව විසින් පියවර ගනු ලැබේ.
සංස්ථාව රෙගුලාසි වලට දැඩි ලෙස අනුගත වන අතර ශ්‍රී ලංකාව තුළ තහනම් භාණ්ඩ විකිණීමේ නිරත නොවේ. සංස්ථාව ග්ලයිෆොසේට් මෙරටට ආනයනය කිරීම සහ බෙදා හැරීම සඳහා බලයලත් ආයතනයක් වන බැවින් අදාළ බලධාරීන් විසින් ලබා දී ඇති අනුමැතියට අනුකූලව බලයලත් කෘෂිකාර්මික ආයතන වෙත සපයා ඇත.



අධ්‍යාපනය සඳහා සහයෝගය

ශ්‍රී ලංකාවේ ඇති එකම පිරිපහදුව ලෙස, දේශීය සිසුන්ට ඔවුන්ගේ වෘත්තීය දියුණුව සඳහා පහසුකම් සැලසෙන කාර්මික ප්‍රවීණතාවයන් ලබා ගැනීමට අවශ්‍ය තරම් පුහුණු අවස්ථා අප විසින් ලබා දෙනු ලැබේ. විදේශයන්හි දක්ෂ බනිජ තෙල් ඉංජිනේරුවන් සඳහා සැලකිය යුතු ඉල්ලුමක් පවතින අතර එහි ප්‍රතිඵලයක් වශයෙන්, ජාතියට විදේශ විනිමය ආකර්ශණය කර ගැනීමට හැකි වන පරිදි හැකිතාක් පුහුණු අවස්ථා ලබා දීමට සංස්ථාව උත්සාහ කරයි. තවද, දැනුම වැඩි දියුණු කිරීම සඳහා තාක්ෂණික සිසුන් සඳහා කාර්මික වාරිකා සංවිධානය කිරීමද අප විසින් සිදු කරනු ලැබේ.

විශ්ව විද්‍යාල සහ අනෙකුත් අධ්‍යාපන ආයතනවලට බඳවා ගන්නා දේශීය සිසුන්ට මූල්‍ය, තොරතුරු තාක්ෂණය සහ මානව සම්පත් කළමනාකරණය ඇතුළු විවිධ ක්ෂේත්‍රවල කාර්මික පුහුණුව සඳහා අවස්ථා සලසා ඇත.

ප්‍රජා සහභාගිත්වය

ප්‍රජාව සමඟ සුහද සබඳතා පවත්වා ගැනීම අපගේ උපාය මාර්ගය වේ අපගේ පුළුල් බෙදාහැරීමේ ජාලය වක්‍ර රැකියා අවස්ථා 15,000කට වැඩි ප්‍රමාණයකට ප්‍රවේශය සපයයි.



මීට අමතරව, අප සතු කෘෂි රසායන සහ ලිහිසි තෙල් බෙදාහරින්නන් විසින්ද රැකියා අවස්ථා රාශියක් නිර්මාණය කෙරෙන අතර ඔවුහු එමගින් ආර්ථික සංවර්ධනයට දායක වෙති.

ලිහිසි තෙල් අලෙවිකරුවන්ට සහ තොග වෙළෙඳුන්ට ඔවුන් අවසාන පාරිභෝගිකයින් සඳහා මූලික සම්බන්ධතා ස්ථාන ලෙස සේවය කරන බැවින් එමඟින් වටිනාකමක් ජනනය වන සේ ඔවුන්ගේ පාරිභෝගික සේවා සහ සම්බන්ධතා කළමනාකරණ කුසලතා වැඩි දියුණු කිරීම අරමුණු කරගත් පුහුණු අවස්ථා ලබා දී ඇත.

තරඟකාරී මිල ගණන් යටතේ උසස් තත්ත්වයේ නිෂ්පාදන සැපයීමත් පහසුවෙන් ප්‍රවේශ හැකිවීමත්, ප්‍රජාව සමඟ සෘජු හා වක්‍ර ධනාත්මක ලෙස සබඳතා ප්‍රවර්ධනය කරයි.

සමාජ යහපැවැත්ම

සංස්ථාව සිය බෙදාහැරීමේ ජාලය හරහා සෘජු හා වක්‍ර රැකියා අවස්ථා 15,000 කට අධික සංඛ්‍යාවක් සපයන අතර එමඟින් ශ්‍රී ලංකාවේ ජනතාවගේ ආර්ථික තිරසාරභාවයට දායක වේ. බනිජ තෙල් නිෂ්පාදනවල මිල ගණන් සාමාන්‍ය ජනතාවගේ ජීවන වියදමට සහ සමස්ත ජීවන තත්ත්වයට සැලකිය යුතු ලෙස බලපාන බව සංස්ථාව පිළිගනී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, බනිජ තෙල් නිෂ්පාදන සඳහා කඩිනමින් ප්‍රවේශ වීම සහ දැරිය හැකි මිල ගණන් සහතික කිරීම මූලික ආර්ථික ප්‍රමුඛතාවයක් ලෙස පවතී.

කෘෂි රසායන අංශය වඩා අඩු ආදායමක් උපදවන නමුත්, සංස්ථාව, පාලන ආයතනයක් ලෙස කෘෂි රසායන වෙළඳපල තුළ දිගටම ක්‍රියාත්මක වේ. තරඟකාරී කෘෂි රසායන සමාගම් මගින් සිදු විය හැකි සූරාකෑම් වලින් ගොවීන් ආරක්ෂා කිරීම සහ තරඟකාරී මිල ගණන් යටතේ උසස් තත්ත්වයේ නිෂ්පාදන ලබා දීමෙන් ගොවීන් සඳහා ආර්ථික ප්‍රතිලාභ ඉහළ නැංවීම මෙම මූලපිරීමේ අරමුණයි.

ස්වාභාවික ප්‍රාග්ධනය



ස්වාභාවික ප්‍රාග්ධනය

අපි පරිසර සංරක්ෂණය සහ සහයෝගී පැවැත්ම සඳහා අපි ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දෙන අතර එමගින් මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කරන තිරසාර භාවිතයන් සඳහා කැපවන්නෙමු. අපගේ මූලික අරමුණු අතර කාබන් විමෝචනය අඩු කිරීම, ජලය සහ බලශක්තිය වගකීම් සහිතව පරිභෝජනය දිරිමත් කිරීම සහ ඵලදායී අපද්‍රව්‍ය කළමනාකරණය ක්‍රියාත්මක කිරීම යන ඒවා ඇතුළත් වේ. අපගේ මුල පිරීම් සහ ක්‍රියාකාරී සැලසුම් ස්ථාපිත පාරිසරික ප්‍රතිපත්ති මගින් ආභාෂය ලබන අතර එමඟින් අපගේ සංවිධානයේ දිගුකාලීන තිරසාරභාවය සහතික කෙරේ.

717
(000 මෙ.ටො.)
ජල පරිභෝජනය

94.28%
මෙහෙයුම් කාර්යක්ෂමතාව

83,677
(මෙ.ටො.)
ස්වයං පරිභෝජනය

0.6
%
සාමාන්‍ය හානිය

සමාලෝචනය 2023

- පිරිපහදුවේ විශාල සෞඛ්‍ය සහ ආරක්ෂිත සිදුවීම් නොමැත.
- CPC ජල පිරිපහදුව මගින් ජලය මෙට්‍රික් ටොන් 608,640 ක් පිරිසිදු කර ඇත.
- දැල්වීම් සඳහා වන CDU වායු ප්‍රමාණය 310 MT (2022-180 MT) වේ.
- පිරිපහදුවේ අපේක්ෂිත පාඩුව මෙ.ටොන් 9,708 කි.
- ජෛව විවිධත්ව පවතින අවස්ථා වාර්තා වී නොමැත.

අපගේ ක්‍රියාකාරකම්වල දිගු කාලීන තිරසාරභාවය වෙනුවෙන් අපි සැමවිටම කැපවී සිටිමු. නොවැළැක්විය හැකි ලෙස අපගේ ක්‍රියාකාරකම් සඳහා බොරතෙල් පිරිපහදු කිරීමේ ක්‍රියාවලිය පුරාම බලශක්තිය සහ ජලය භාවිතා කළද, අප විසින් ඇති කරනු ලබන කාබන් බලපෑම අවම කිරීමට සහ බලය තිරසාර ලෙස භාවිතා කිරීමට අපි සෑම උත්සාහයක්ම දරමු. තවද, අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය සඳහා දැඩි නීති, ක්‍රියාවලි සහ භාවිතයන් ක්‍රියාත්මක වේ.

ජල පරිභෝජනය

තෙල් පිරිපහදු ක්‍රියාවලිය සඳහා විශාල ජල ප්‍රමාණයක් අවශ්‍ය වන අතර, කැලණියේ සංස්ථාවේ ජල පවිත්‍රාගාරය මගින් සැලකිය යුතු ජල පරිමාවක් පිරිසිදු කර ඇත. මෙම පවිත්‍රාගාරයේ මෙහෙයුම් කාර්යක්ෂමතාව 44.17% (2022- 29.16%) ක් විය. ජල පවිත්‍රාගාරය ආසන්නයේ ගංගා ජලයෙහි අධික ලෙස ලුණු තිබීම හේතුවෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය 108,259 MTක් භාවිතා කිරීමට සිදු විය.

අප හැම විටම ජල සංරක්ෂණය සහ තිරසාර පරිභෝජන රටාව සඳහා කැපවී සිටින්නෙමු. පරිසරය කෙරෙහි අපගේ කැපවීම පෙන්නුම් කරමින් ජාත්‍යන්තරව පිළිගත හැකි ප්‍රමිතීන්ට අනුව අපද්‍රව්‍ය ජලය නිසි ලෙස පිරිසිදු කර සොබාදහමට මුදා හරිනු ලැබේ.

වර්ෂය	2023 (MT)	2022 (MT)
සංස්ථාවේ ජල පිරිපහදුව මගින්	608,640	274,914
ජලසම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය මගින්	108,259	284,960
එකතුව	**716,899**	**559,874**

බලශක්ති පරිභෝජනය

තෙල් පිරිපහදු ක්‍රියාවලියේදී බොරතෙල් පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන බවට පත් කිරීම සඳහා සැලකිය යුතු විදුලි හා බලශක්ති ප්‍රමාණයක් අවශ්‍ය වේ.

පිරිපහදුව මගින් ක්‍රියාකාරකම් සඳහා බලය නිපදවන අතර විදුලිබල මණ්ඩලය විසින් සපයනු ලබන විදුලිය මගින් ඉතිරිය සම්පූර්ණ කෙරේ. පිරිපහදුව සාමාන්‍යයෙන් 180.32 MWH සහ 316.78MWH අතර ප්‍රමාණයක් භාවිතා කරන අතර ඉහළ පැය වලදී 98.23MWH සහ 153.02MWH අතර ප්‍රමාණයක් භාවිතා කරයි. ලංවිම සැපයුම සඳහා වැඩිම ඉල්ලුම 1297 KVA සිට 1,687 KVA දක්වා පරාසයක පවතී.

ජනක යන්ත්‍ර

වසර පුරා ඉල්ලුමේ අවශ්‍යතා අනුව TG I සහ TG II ක්‍රියාත්මකව පැවතුණි. උපස්ථ ඉල්ලුම සැපයීම සඳහා වසර පුරා කඩින් කඩ DG I සහ DG II ක්‍රියාත්මක කරන ලදී.

ජෙනරේටරය	ක්‍රියාකාරී පැය ගණන
TG I	5,613
TG II	5,370
DG I	4,449.1
DG II	4,327.8

තිරසාරත්වය අපගේ ප්‍රධාන මූලධර්මය වන බැවින්, එලදායී බලශක්ති ඉතිරිකිරීමේ ශිල්පීය ක්‍රම සොයා ගැනීමට සහ ක්‍රියාත්මක කිරීමට පිරිපහදුව විසින් හානි සහ කාර්යක්ෂමතා සමීක්ෂණ සිදු කරනු ලැබේ.

සංස්ථාව විසින් සිය උපාය මාර්ග තුළට තිරසාර පරිභෝජනය ඇතුළත් කරන ලද අතර අනාගතය සඳහා මහ සැකසීමට සියලුම සංචාරක බංගලා සහ ප්‍රාදේශීය කාර්යාල සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන පහසුකම් සහිත බවට පත් කිරීමට සුදුසු ලෙස ආයෝජනය කරන ලදී.

ද්‍රව්‍ය කළමනාකරණය

ඉන්ධන සහ උපකරණ ඇතුළු ප්‍රාථමික වෙළඳ ද්‍රව්‍යවල භාවිතය නිරන්තරයෙන් අපගේ අධීක්ෂණයට ලක් වන අතර මෙම සම්පත් ප්‍රභවයන්ගේ කාර්යක්ෂමතාවය ප්‍රශස්ත කිරීමට උත්සාහ කරනු ලැබේ. ස්ථාපිත තාක්ෂණික ප්‍රමිතීන්ට අනුකූලවෙමින් පරිභෝජන කාර්යක්ෂමතාව ඉහළ නැංවීම අරමුණු කරගත් තාක්ෂණික ක්‍රියාවලීන් අපි සංවර්ධනය කර ක්‍රියාත්මක කරන්නෙමු. මීට අමතරව, තිරසාරත්වය කෙරෙහි අවධානය යොමු කරමින් කර්මාන්තයේ ඉදිරි දියුණුවට සමගාමීව අපි අපගේ රසායනාගාර පහසුකම් අඛණ්ඩව වැඩිදියුණු කරන්නෙමු.

වගකිවයුතු මූලාශ්‍ර

පාරිසරික වශයෙන් තිරසාර භාණ්ඩ හා සේවා ලබා ගැනීමට අපි උත්සාහ කරමු. වගකිව යුතු මූලාශ්‍ර ක්‍රියාවලියකට පහසුකම් සැලසීමට නම්, සැපයුම්කරුවන් විසින් අදාළ සියලුම නීති සහ රෙගුලාසිවලට අනුගත වීම අත්‍යවශ්‍ය වේ. මීට අමතරව, අපි පුළුල් පරාසයක ගණුදෙණුකරුවන් ඔවුන්ගේ භාණ්ඩ හා සේවා පිරිනැමීමට දිරිමත් කිරීම සඳහා නිර්මාණය කර ඇති විනිවිද පෙනෙන ප්‍රසම්පාදන පද්ධතියක් ක්‍රියාත්මක කර ඇත්තෙමු.

විභව සැපයුම්කරුවන් හඳුනා ගැනීම සඳහා සංස්ථාව විසින් විවිධ උපාය මාර්ග භාවිතා කරනු ලබන අතර, තිරසාරභාවය සඳහා කැප වූවන් සඳහා තෝරා ගැනීමේ ක්‍රියාවලිය මෙහෙයවනු ලැබුවේ ඔවුන් නෛතික සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම, පිරිවිතරයන්ට අනුකූල වීම සහ භාවිතා කරන ලද මූලාශ්‍ර ක්‍රමවේදයන් සලකා බැලීම මගිනි.

අන්තරායකාරී ද්‍රව්‍ය බැහැර කිරීම

අන්තරායකර කෘෂි රසායන ද්‍රව්‍ය කළමනාකරණය සහ බැහැර කිරීම දැඩි පරිසර හිතකාමී මූලලේඛයන්ට අනුකූලව අවශ්‍ය නියාමන අනුමත කිරීම් සහ අධීක්ෂණය යටතේ සිදු කරනු ලැබේ.



බලයලත් ආයතන විසින් අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියාවලිය සිදු කරනු ලබන්නේ මානව සෞඛ්‍යය සහ පරිසරය යන ද්විත්වයටම විය හැකි හානින්ගෙන් ආරක්ෂා වන ආකාරයට වේ.

පිරිපහදු කිරීමේ ක්‍රියාවලිය ස්වභාවයෙන්ම අන්තරායකර අපද්‍රව්‍ය ජනනය කරන අතර ඉන් වන පරිසර දූෂණය අවම කිරීම සඳහා ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව කළමනාකරණය කෙරේ. මෙම අනතුරුදායක අපද්‍රව්‍ය පසුව ඒවා දහනය කරන ස්ථානයකට ප්‍රවාහනය කෙරේ. භාවිතා කරන ලද ජලය පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව පිරිපහදු කර ඉවත්කරනු / මුදා හරිනු ලබන්නේ පාරිසරිකව වගකියනු ලබන ආකාරයකට වේ. වෙනත් ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය අපගේ ප්‍රතිකාර පහසුකම් හරහා ප්‍රතිචක්‍රීකරණය කිරීම ලැබේ හෝ පාරිසරික වශයෙන් පිළිගත හැකි ක්‍රමයකට බැහැර කිරීම සඳහා අනුමත පාර්ශ්ව වෙත යවනු ලැබේ.

නිරසාර සහ පාරිසරිකව මිත්‍රශීලී ආර්ථිකය

පරිභෝජනයේ පරිසර විද්‍යාත්මක බලපෑම අවම කිරීම සඳහා පාරිසරික වශයෙන් නිරසාර නිෂ්පාදන ලබා ගැනීමේ හැකියාව වැඩිදියුණු කිරීමට සංස්ථාව කැපවී සිටී. මෙම අරමුණට අනුකූලව, වඩාත් කාර්යක්ෂම ඉන්ධන විකල්පයන් සැපයීම සඳහා සංස්ථාව විසින් පරිසර හිතකාමී යුරෝ IV පෙට්‍රල් සහ ඩීසල් හඳුන්වා දී ඇත.

ජෛව විවිධත්වය

තෙල් කාන්දුවීම්, විමෝචන, අපද්‍රව්‍ය සහ ඒ හා සමාන ක්‍රියාකාරකම් නිසා ජෛව විවිධත්වයට ඇති විය හැකි අහිතකර බලපෑම් පිළිබඳව සැළකිලිමත් වී ක්‍රියා කිරීමට අපි කැපවී සිටිමු. මේ අරමුණ ඇතිව, ජෛව විවිධත්වයට විය හැකි අහිතකර බලපෑම් වැලැක්වීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීම සහතික කිරීම සඳහා අප විසින් දැඩි මෙහෙයුම් ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කර ඇත්තෙමු. ජෛව විවිධත්වයට බලපාන කිසිදු සිදුවීමක් වාර්තා වී නොමැති බව වාර්තා කිරීම අපට සතුටකි.


අනුකූල වීම

පාරිසරික භාරකාරත්වය සඳහා කැපවී සිටින හෘද සාක්ෂියට එකඟව සංස්ථාපිත ආයතනයක් ලෙස, පසුගිය වසර තුළ මෙහෙයුම් මට්ටමින් හෝ වාර්තාකරණ මට්ටමින් පාරිසරික නීති සහ රෙගුලාසිවලට අනුකූල නොවන අවස්ථා නොමැති බව වාර්තා කිරීමට හැකි වීම අපට සතුටකි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, හෙළිදරව් කරන ලද කරුණු හැරුණු විට, සංස්ථාව විසින් වසර පුරා සැලකිය යුතු දඩ හෝ මුදල් නොවන දඩුවම් ලබා නොමැත.

අපගේ මෙහෙයුම් සැලකිය යුතු පාරිසරික අවදානම් සමඟ සම්බන්ධ වී ඇති බව හඳුනා ගනිමින් සංස්ථාව පරිසර අධිකාරීන් සමඟ සක්‍රීයව සම්බන්ධ වී ක්‍රියා කරන්නෙමු. අපගේ ක්‍රියාකාරකම්වල අහිතකර බලපෑම් අවම කිරීම සඳහා අපි පුළුල් ක්‍රියාමාර්ග ගෙන ඇත්තෙමු. ජාත්‍යන්තර සංවිධාන සමඟ සහයෝගීව, විය හැකි පාරිසරික ප්‍රතිවිපාකවලට විසඳුම් සෙවීමට අප විසින් උනන්දුවෙන් කටයුතු කර ඇත. සංස්ථාව ජාත්‍යන්තර තෙල් දූෂණ වන්දි අරමුදලේ (IOPCF) සාමාජිකත්වය දරන අතර, එමගින් තෙල් ටැංකි කාන්දු වීම නිසා සිදුවන තෙල් දූෂණයෙන් සිදුවන හානිය සඳහා වන්දි ලබා දීම සිදු කරයි.

පාරිසරික වගකීම සඳහා වන අපගේ කැපවීම සමඟ සමපාත වෙමින්, අපගේ කෘෂි රසායනික ක්‍රියාවලීන් සහ නිෂ්පාදන සඳහා සංස්ථාව විසින් ISO සහතිකය සහ OHSAS 18001 සහතිකය ලබා ඇති බව ප්‍රකාශ කිරීමට අපි කැමැත්තෙමු.

පාර්ශවකරුවන් කළමනාකරණය



CPC පාර්ශවකරුවන්ගේ කළමනාකරණ ක්‍රියාවලිය ආරම්භ වන්නේ සහයෝගී ප්‍රයත්නයන් ඒකාබද්ධ කිරීමත් සමඟ වන අතර, අපගේ අරමුණු සමඟ සමපාත වන ඒකාබද්ධ උපාය මාර්ගයක් එමගින් ඇති කෙරෙයි. එක් එක් පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා සහ අභිලාෂයන් සංයෝගී වන බව සහතික කරමින් අපි සබඳතා ජාලය දක්ෂ ලෙස විමසන්නෙමු. ඵලදායි සන්නිවේදනය හරහා, සියලු අදහස් පිළිගෙන විවිධ පෙර දැකුම් සැලකිල්ලට ගන්නා බවට අපි සහතික වන්නෙමු.

මෙම ක්‍රියාවලියේදී හුදු ගනුදෙනුමය අන්තර්ක්‍රියාවන් ඉක්මවා යන අතර එය ඊට සම්බන්ධ සියලු පාර්ශ්වයන්ගේ අවශ්‍යතා පිළිබඳ සුපරීක්ෂාකාරී සමතුලිතතාවයක් අවශ්‍ය කරන සුමට භාවිතාවකි. අපගේ විශේෂඥභාවය සහ කැපවීම මගින් විභව ගැටුම්, වර්ධනය සහ සහයෝගීතාවය සඳහා වන මාර්ග බවට පරිවර්තනය කිරීමට අපට හැකිවේ. සම්බන්ධතාවයේ සහ අවබෝධයේ මූලධර්ම ප්‍රමුඛ වන මෙම වැදගත් ගමනට අප හා එක්වන ලෙස අපි ආරාධනා කරමු. අපි එක්ව, අපගේ වටිනාකම් නිර්මානයට කල්පවත්නා බලපෑමක් ඇති කරන ආදර්ශමත් පාර්ශවකරුවන්ගේ කළමනාකරණ රාමුවක් සකස් කරමු.

අපගේ ව්‍යාපාරික පරිසරය නියාමනය කිරීමෙහි ලා අප සුපරීක්ෂාකාරීව සිටින අතර කැපී පෙනෙන පාර්ශවකරුවන් හඳුනා ගන්නා අතරම වත්මන් පාර්ශවකරුවන්ගේ බල ගතිකත්වයේ සහ අවශ්‍යතාවල සිදුවන ඕනෑම වෙනසක් සාවධානව නිරීක්ෂණය කරන්නෙමු.

පාර්ශවකරුවන් වෙන් කර හඳුනා ගැනීම අපගේ උපායමාර්ගික ප්‍රවේශයේ තීරණාත්මක මෙවලමක් ලෙස ක්‍රියා කරයි. අපගේ ව්‍යාපාර ආකෘතියට අදාළව එක් එක් පාර්ශ්වකරු සතු බලය සහ උනන්දු මට්ටම තක්සේරු කිරීමට එය අපට හැකියාව ලබා දෙන අතර එමඟින් ඔවුන් කළ යුතු බලපෑමේ ප්‍රමාණය පිළිබඳව අපගේ තීරණ දැනුම් දීම සිදු කෙරෙයි. ඒ අනුව අපි ඔවුන්ගේ සහභාගිත්වයට මුල්තැන ලබා දෙන්නෙමු.

අපි පාර්ශවකරුවන් විසින් ඇති කරනු ලබන බලපෑමේ මට්ටම අනුව සලකා බැලීම් තක්සේරු කරන අතර පසුව මෙම පාර්ශවකරුවන් සමඟ ඉතා මිත්‍රශීලී සබඳතාවක් ඇති කර ගැනීමට උපාය මාර්ග සකස් කරන්නෙමු. සාරාංශයක් ලෙසගත් කළ, අපගේ මූලික අවධානය යොමු වන්නේ අපගේ පාර්ශ්වකරුවන් CPC ප්‍රජාව සමඟ ඒකාබද්ධ වී ඇති බව සහතික කෙරෙන සේ ඔවුන් සමඟ සම්බන්ධ වීම වේ.

පාර්ශවකරුවන්	අරමුණු	බැඳියා මට්ටම	බලයේ මට්ටම
හිමිකරුවන්	ආයෝජකයන්ගේ තොරතුරු සැපයීම සහ ආයෝජනයේ ප්‍රතිලාභ	●	●
පාරිභෝගිකයන්	උසස් නිෂ්පාදිත සඳහා ප්‍රවේශය ලබාදීම	●	●
නියාමකවරු	අනුකූලතාවය	●	●
සේවකයන්	බලගැන්වූ, සෞඛ්‍ය සම්පන්න සහ ආරක්ෂිත පරිසරයක් ගොඩනැගීම	●	●
ප්‍රජාව	තිරසර සම්බන්ධතාව	●	●
සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන්	වඩා හොඳ මූලාශ්‍ර සඳහා වෘත්තීය සබඳතා.	●	●

● ඉහළ ● මධ්‍යම ● පහළ





පාරිභෝගිකයන්

- බෙදුම්කරුවන්
- කෘෂි රසායන/ ලිහිසි තෙල් ගබඩාකරුවන්
- රජයේ ආයතන
- ආයතනික පාරිභෝගිකයන්
- විදේශීය පාරිභෝගිකයන්
- පුද්ගලික පාරිභෝගිකයන්



හිමිකරුවන්

- මහා භාණ්ඩාගාරය
- බලශක්ති අමාත්‍යාංශය



නියාමකවරු

- විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
- ශ්‍රී ලංකා රේගුව/ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
- කම්කරු අමාත්‍යාංශය
- ශ්‍රී ලංකා මහ බැංකුව
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය/ ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය
- මුදල් අමාත්‍යාංශය
- ශ්‍රී ලංකා මහ බැංකුව
- රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ කාරක සභාව
- වරාය අධිකාරිය
- ප්‍රදේශීය හා පළාත් පාලන ආයතන



සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන්

- ඉන්ධන සැපයුම්කරුවන්
- බැංකු
- දේශීය භාණ්ඩ/සේවා සැපයුම්කරුවන්
- ප්‍රවාහන අවශ්‍යතා සැපයුම්කරුවන්
- උපයෝගිතා සහ අනෙකුත් සේවා සපයන්නන්



ප්‍රජාව

- මහජනයා
- ප්‍රජා සංවිධාන
- මාධ්‍ය
- පරිසර සංවිධාන



සේවකයන්

කාණ්ඩය	සහභාගිත්ව යාන්ත්‍රණය	මතු වූ ගැටළු	අපගේ ප්‍රතිචාර
හිමිකරුවන් 	මාසික මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම. වාර්ෂික මූල්‍ය ප්‍රකාශන. වාර්ෂික වාර්තාව. ආයතනික වෙබ් අඩවිය.	කාලානුරූපී මූල්‍ය කාර්ය සාධනය සමාලෝචනය. මූල්‍ය වාර්තා හෙළිදරව් කිරීම්. අනාගත වර්ධනය සහ ඉදිරි දැක්ම.	නියමිත වේලාවට මූල්‍ය සහ මූල්‍ය නොවන තොරතුරු ඉදිරිපත් කිරීම. ආයතනික වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම.
පාරිභෝගිකයන් 	නිෂ්පාදන, ප්‍රවර්ධන ව්‍යාපාර පිරවුම්හල් හරහා සම්බන්ධ වීම. පාරිභෝගික තෘප්තිය පිළිබඳ සමීක්ෂණ. අලෙවිකරණ ක්‍රියාවලි හරහා සන්නිවේදනය. ප්‍රාදේශීය කාර්යාල මඟින් මාර්ගගත සහ ප්‍රාදේශීය වශයෙන් සම්බන්ධ වීම.	පහසුව සහ ප්‍රවේශය QR ක්‍රමයේ සලකාබැලීම් බොදාහැරීමේ ප්‍රමුඛතාව. නිෂ්පාදන ගුණාත්මය. දැරිය හැකි මිල. පාරිභෝගික ආරක්ෂණ සේවා .	පහසු ප්‍රවේශයක් ලබා දීම සඳහා දිවයින පුරා පැතිරුණු බෙදාහැරීමේ ජාලය අප විසින් ශක්තිමත් කර ඇත. පාරිභෝගික පැමිණිලිවලට සහභාගි වී වහාම ඒවා විසඳීමට පාරිභෝගික සත්කාර ඒකකය ශක්තිමත් කිරීම. වැඩි දියුණු කළ තොරතුරු පද්ධති.
නියාමකවරු 	වරින් වර සාකච්ඡා පැවැත්වීම. රජයට සහ නියාමකවරුන්ට වාර්තා කිරීම. සංස්ථාවේ කාර්යසාධනය සහ අනුකූලතා පිළිබඳ කාලානුරූපී වාර්තාකරණ පද්ධතිය. රාජ්‍ය මූල්‍ය/සාර්ව ආර්ථික තීරණ ගැනීමේ ක්‍රියාවලීන් සඳහා කාලෝචිත තොරතුරු රජයට ඉදිරිපත් කිරීම .	යහපාලනය. රෙගුලාසිවලට අනුකූල වීම. බදුවලට අනුකූල වීම. පාරිසරික ආරක්ෂාව.	අපි නියාමකවරු විසින් ඉල්ලා සිටින තොරතුරු ඉදිරිපත් කරන අතර කර්මාන්ත සංවර්ධනය දිරිමත් කිරීම සඳහා නියාමකවරු සමඟ විවෘත සංවාදයක් පවත්වන්නෙමු.
සේවකයන් 	කාර්යසාධනය ඇගයීම. සේවක සහභාගිත්ව ක්‍රියාකාරකම්. වෘත්තීය සමිති සමඟ රැස්වීම් . ක්‍රීඩා සහ අනෙකුත් අංග කාර්ය මණ්ඩල සුභසාධන පහසුකම්.	තරඟකාරී වේතන යෝජනා ක්‍රමය. රැකියා සුරක්ෂිතභාවය කුසලතා සහ දැනුම වර්ධනය. ආරක්ෂිත සේවා ස්ථානයක් . වෘත්තීය ප්‍රගතිය සහ අනුප්‍රාප්තිය.	අපි අඛණ්ඩ පුහුණු සහ සංවර්ධන අවස්ථා, කර්මාන්තයේ ප්‍රමිතීන්ට අනුකූලව ආකර්ෂණීය ප්‍රතිලාභ පද්ධතියක්, ආරක්ෂිත සේවා පරිසරක් සපයන අතර පූර්ණ වශයෙන් නියැලී සිටින ශ්‍රම බලකායක් සංවර්ධනය කරන්නෙමු.
ප්‍රජාව 	ප්‍රාදේශීය කාර්යාල සමඟ සම්බන්ධවීම. CSR හි ක්‍රියාකාරකම් සහ අනුග්‍රහය දැක්වීම්. මාධ්‍ය සහ අනෙකුත් සමාජ සිදුවීම්.	රැකියා අවස්ථා නිෂ්පාදනය සඳහා ප්‍රවේශය . ආර්ථික සහ සමාජීය බලපෑම . CSR ක්‍රියාකාරකම් අනුග්‍රාහකත්වය. QR ක්‍රමයේ සලකාබැලීම්	ප්‍රජාවන් සමඟ සුහද සබඳතාවක් ගොඩ නඟා ගැනීම. සවිබල ගැන්වීම සහ ජීවන තත්ත්වය ඉහළ නංවාලීම.
සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන් 	විනිවිදභාවයෙන් යුතු ලංසු ක්‍රියාවලිය. සැපයුම්කරු ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය. විධිමත් රැස්වීම්, ලිඛිත සන්නිවේදනය සහ සබඳතා කළමනාකරණය .	දිගුකාලීන හවුල්කාරිත්වය. නියමිත කාල සීමා තුළ පියවීම්. ප්‍රසම්පාදන. මාර්ගෝපදේශ පිළිපැදීම්. රෙගුලාසිවලට අනුකූල වීම.	දිගු කාලීන යහපත් සබඳතා දිරිමත් කිරීම. නියමිත කාල සීමා තුළ පියවීම්. නිෂ්පාදන සහ සේවාවන්හි තිරසරභාවය සහ තත්ව ප්‍රමිතීන් සහතික කිරීම.

තිරසාර වාර්තාව

ඛනිජ තෙල් අංශය තුළ සංස්ථාව හි තිරසාරභාවය පිළිබඳ මූලපිරීම්වල සුවිශේෂී ගමන් මග නවෝත්පාදන සහ ආයතනික වගකීම්වල සුසංයෝගී සම්මිශ්‍රණයක් නිරූපණය කරයි. සෑම ප්‍රගතියක් සමඟම, සංස්ථාව සිය මෙහෙයුම් පාරිසරික භාරකාරත්වය සමඟ සමෘද්ධිමත් සහ තිරසාර අනාගතයක් සඳහා සම්පාත කිරීමට උත්සාහ කරයි . නිෂ්පාදනය කරන සෑම ඉන්ධන ඒකකයක්ම ප්‍රගතියට පමණක් නොව වගකීම් සහිත පරිභෝජනය කරා ගමන් කිරීමට ද දායක වේ. කාබන් විමෝචනය අවම කිරීම සහ තිරසාර බලශක්ති භාවිතයන් ප්‍රවර්ධනය කිරීම සඳහා සංස්ථාව හි නිශ්චිත කැපවීම වඩා හරිතමය වූ අනාගතයක් සඳහා එහි කැපවීම අවධාරනය කරයි. නිරතුරුව වෙනස් වන භූ දර්ශනයක් තුළ, සංස්ථාව මෙම න්ෂේත්‍රයේ ප්‍රමුඛයෙකු ලෙස කැපී පෙනේ.

ජාතියට ඉන්ධන සැපයීමට අමතරව, ප්‍රජාව තුළ වක්‍ර රැකියා අවස්ථා 15,000 කට වැඩි ප්‍රමාණයක් ලබා දෙමින් රැකියා උත්පාදනය සඳහාද සංස්ථාව සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරයි. අපගේ පුළුල් බෙදුම්කරු ජාලය, ලිහිසි තෙල් සහ කෘෂි තොග බෙදාහරින්නන් හරහා, අපි ජාතික ආර්ථිකය සමෘද්ධිමත් කිරීමට පූර්ණ ලෙස දායක වීමට පුද්ගලයින් බල ගන්වන්නෙමු.

ශ්‍රී ලංකාව තුළ සුවිශේෂී භූමිතෙල් සැපයුම්කරු ලෙස, සංස්ථාව අඩු ආදායම්ලාභී පවුල්වලට සහ ධීවර ප්‍රජාවට අත්‍යවශ්‍ය සහයෝගයක් ලබා දෙයි. ආර්ථික සහන සහ පැවැත්ම සඳහා වන තීරණාත්මක අවශ්‍යතාවය හඳුනා ගනිමින් මෙම අත්‍යවශ්‍ය සම්පත අවශ්‍යතා ඇති අයට ලබා දීමට අපි කැපවී සිටිමු.

පිරිපහදු ක්‍රියාවලියේදී මුදා හරිනු ලැබිය හැකි කෘෂි රසායන හා ඛනිජ රසායනික ද්‍රව්‍ය හා සම්බන්ධ අන්තරායකර රසායනික ද්‍රව්‍ය පිළිබඳ ගැටළුවට විසඳුම් සෙවීමේ දැවැන්ත වගකීම සංස්ථාව විසින් භාරගෙන ඇත.

අපගේ තිරසාර ප්‍රතිපත්ති අපගේ මෙහෙයුම් සහ මූලලේඛණයන්ට පදනම ලෙස ක්‍රියා කරමින්, තිරසාර භාවය සඳහා වන අපගේ ස්ථීර කැපවීම පිළිබිඹු කරයි. හරිත අනාගතයක් පෝෂණය කිරීම සඳහා අපගේ කැපවීම අවධාරනය කරන ප්‍රමිතිගත භාවිතයන් ක්‍රියාවට නැංවීමට අපි සැලකිය යුතු උත්සාහයක් ගෙන ඇත්තෙමු.

අපගේ පිරිපහදු මෙහෙයුම් වලදී, අප විසින් සැලකිය යුතු ජල පරිමාවක් භාවිතා කරනු ලබන අතර, භාවිතා කරන ලද ජලය යළි සකස් කොට පරිසරයට මුදා හැරීම ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුකූල ව විදු වන බව සහතික කිරීමට හැකි වීම අපට ආඩම්බරයකි. පාරිසරික නීති හා රෙගුලාසිවලට අනුකූල නොවන අවස්ථා කිසි විටෙකත් අප විසින් අත්විඳිනු ලැබ නැති බව අවධාරණය කිරීම වැදගත්ය. සමස්තයක් වශයෙන්, සංස්ථාව තිරසාරභාවය සඳහා අපගේ කැපවීම අවධාරණය කිරීම සඳහා පාරිසරික, සමාජීය සහ පාලන (ESG) අංශවලට අපි ප්‍රමුඛත්වය ලබා දෙන්නෙමු.

තිරසාර සංවර්ධන ඉලක්ක

තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) වර්තමාන සහ අනාගත පරම්පරා වල පුද්ගලයන් සඳහා සහ අපේ ලොවට සාමය සහ සමෘද්ධිය ඇති කිරීම අරමුණු කරගත් ඒකාබද්ධ රාමුවක් නියෝජනය කරයි. වෙන් වෙන් ඉලක්ක 17 කින් සමන්විත, සහයෝගී ගෝලීය හවුල්කාරිත්වයක් හරහා SDGs සඳහා සියලු ජාතීන් විසින් කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. දේශගුණික විපර්යාස සහ අපගේ සාගර සහ වනාන්තර සංරක්ෂණය වැනි තීරණාත්මක ගැටළු වලට විසඳුම් ලබා දෙන අතරම දිළිඳුකම පිටුදැකීම, වැඩිදියුණු කළ සෞඛ්‍ය සහ අධ්‍යාපනය, අඩු වූ අසමානතාවය සහ ආර්ථික ප්‍රගතිය යන අන්‍යෝන්‍ය රඳා පැවැත්ම ඒවා මගින් හඳුනා ගනු ලැබේ.

වගකිවයුතු රාජ්‍ය ආයතනයක් ලෙස, සංස්ථාව කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන මූලපිරීම් අපගේ උපාය මාර්ගික සැලසුම්වලට ඇතුළත් කර ගනිමින් එමගින් SDGs ඉදිරියට ගෙන යාමට කැපවී සිටී. මෙම උපාය මාර්ග සැලසුම් කර ඇත්තේ වඩා පුළුල් සංවර්ධන න්‍යාය පත්‍ර සමඟ පෙළ ගැසීම සඳහා වන අතර SDGs සාක්ෂාත් කර ගැනීම සඳහා අපගේ කැපවීමට මෙම තත්වය අත්‍යවශ්‍ය වේ.





තරහකාරී අනුපාතයකින් යුක්තව ප්‍රතිලාභ ලබන පුද්ගලයන් 2,083 කින් යුතු විවිධ වූ ශ්‍රම බලකායක් සංස්ථාව සේවයේ යොදවා ගනී. ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා සේවක වියදම් සඳහා රුපියල් බිලියන 6.48ක් වෙන් කර ඇත. මීට අමතරව, සංස්ථාව පරාසයක විසිරි සුභසාධන කටයුතු පිරිනමන අතර ඊට සේවකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල ජීවන තත්ත්වය ඉහළ නැංවීම අරමුණු කරගත් ණය යෝජනා ක්‍රම සහ වෛද්‍ය පහසුකම් ඇතුළත් වේ. තවද, අපගේ බෙදාහැරීමේ ජාලය හරහා, අපි දිවයින පුරා වක්‍ර රැකියා අවස්ථා 15,000කට අධික සංඛ්‍යාවක් නිර්මාණය කර ඇති අතර, එමඟින් දරිද්‍රතාවය පිටුදැකීමේ සමාජ ප්‍රයත්නයන්ටද දායක වන්නෙමු.



බනිජ තෙල් නිෂ්පාදන වලට ආවේණික සෞඛ්‍යය සහ ආරක්ෂක අවදානම් හේතුවෙන්, සේවකයින්ට සහ පුළුල් ප්‍රජාවට ආරක්ෂිත සහ සෞඛ්‍ය සම්පන්න පරිසරයක් සහතික කිරීම සඳහා දැඩි ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර ඇත. පරිසර උවදුරු ඵලදායී ලෙස අවම කිරීම සඳහා පිරිපහදුව ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වේ.

තවද, සංස්ථාව සිය සේවකයින් සහ ඔවුන්ගේ පවුල් සඳහා පුළුල් වෛද්‍ය යෝජනා ක්‍රමයක් හරහා වෛද්‍ය ආවරණය, පාරිතෝෂික දීමනා, ප්‍රසූත නිවාඩු සහ වෙනත් ආධාරක මූලපිරීම් ඇතුළුව සිය ශ්‍රම බලකායේ සෞඛ්‍යය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් ප්‍රතිලාභ රැසක් පිරිනමයි.



සංස්ථාව සමාන අවස්ථා ලබා දෙන සේවායෝජකයෙකු වන අතර ස්ත්‍රී පුරුෂ භාවය මත වෙනස් කොට සැලකීමක් නොකරයි. සියලුම සේවකයින්, සියළුම ව්‍යවස්ථාපිත සහ නියාමන අවශ්‍යතාවලට අනුකූලව, එකම රැකියා කාණ්ඩ සඳහා පිරිමි සහ ගැහැණු යන දෙපිරිසටම සමාන ප්‍රතිලාභ පරිමාණයන් (1:1) සඳහා සුදුසුකම් ඇති බව සහතික කරමින් සේවකයන් වෙනස් කොට සැලකීමකින් තොරව සමාන ප්‍රතිපත්තියකට යටත් වේ.



ජාතියේ බලශක්ති සුරක්ෂිතභාවය සහතික කරන අතරම, පුද්ගලයන්ගේ ආර්ථික ක්‍රියාකාරකම් සහ ජීවනෝපායන් වැඩිදියුණු කිරීම සඳහා නිෂ්පාදන බහුතරයක් සහනදායී මිල ගණන් යටතේ ලබා දෙනු ලැබේ.

තත්ත්ව ප්‍රමිතීන්ට අනුකූල බනිජ තෙල් නිෂ්පාදන පාරිභෝගිකයින්ට ලැබෙන බව සහතික කිරීම සඳහා ස්ථාපිත ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක වේ.



ජාතියේ ආර්ථික වර්ධනයට සහාය වෙමින් සංස්ථාව විසින් විවිධ බදු සහ තීරු බදු ආකාරයට රු. බිලියන 233.22 ක සැලකිය යුතු දායකත්වයක් රජයට ලබා දී ඇත. මීට අමතරව, සංස්ථාව විසින් රටේ ඉන්ධන ඉල්ලුමෙන් 80% කට වැඩි ප්‍රමාණයක් සපුරාලීම කරමින් ඉන්ධන සැපයීම සහතික කර ඇති අතර එමඟින් අභියෝග හමුවේ වුවද ජාතියේ ආර්ථික සංවර්ධනය සඳහා බලශක්ති ලබා ගැනීමේ හැකියාව ශක්තිමත් කර ඇත. තවද, පිරිපහදුව අපගේ විකුණුම් වලින් 47% කට වඩා වැඩි ආර්ථික වටිනාකමක් ජනනය කර ඇති අතර එය ජාතික ආර්ථිකයට ධනාත්මක බලපෑමක් ඇති කරයි.



සියලු පුද්ගලයන් සඳහා දැරිය හැකි සහ සාධාරණ ප්‍රවේශයක් සහතික කිරීම කෙරෙහි අවධාරණය කරමින් ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම ප්‍රවර්ධනය කරන උසස් තත්වයේ විශ්වසනීය තිරසාර සහ ඔරොත්තු දිය හැකි යටිතල පහසුකම් ස්ථාපනය කිරීම අභිමතාර්ථය වේ.
සංස්ථාව සිය මෙහෙයුම් හැකියාවන් සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම අරමුණු කරගත් මධ්‍යම හා දිගු කාලීන උපාය මාර්ගික ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කිරීම සහ සැලසුම් කිරීමෙහි සක්‍රීයව නියැලී සිටී. මෙම මූලපිරීම් සඳහා සහාය වීම සඳහා වත්මන් මූල්‍ය වර්ෂය තුළ අප විසින් රු. බිලියන 3.0 ක ආයෝජනයක් ස්ථාවර වත්කම් සඳහා වෙන් කර ඇත.



විශේෂයෙන් පිරිපහදු සහ කෘෂි රසායන අංශවල රසායනික ද්‍රව්‍ය සහ සියලු අපද්‍රව්‍ය ඒවා පවතින මුළු කාලය පුරා පරිසරයට වගකියන ආකාරයෙන් කළමනාකරණය කිරීම අප විසින් තහවුරු කරනු ලැබේ. මෙය ස්ථාපිත ජාත්‍යන්තර රාමු වලට අනුකූලව සිදු කරනු ලබන අතර, වාතයට, ජලයට හෝ පසට හානිකර ද්‍රව්‍ය මුදා හැරීමක් සිදු නොවන බවට සහතික වන අතර එමඟින් මිනිස් සෞඛ්‍යයට සහ පරිසරයට ඇති අහිතකර බලපෑම් අවම කරයි.

අන්තරායකර අපද්‍රව්‍ය බැහැර කිරීම ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව, අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූලව සිදු කෙරේ. තිරසාර නිෂ්පාදන භාවිතයන් ප්‍රවර්ධනය කිරීම සඳහා මෙන්ම තිරසාර පරිභෝජන මූලපිරීම් සඳහා සහාය වීම සඳහා සම්පත් කාර්යක්ෂම හා ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා සංස්ථාව කැපවී සිටී. තවද, සංස්ථාව විසින් යුරෝ 4 ප්‍රමිතියෙන් යුත් ඩීසල් සහ පෙට්‍රල් ප්‍රවර්ධනය කර ඇති අතර ඒවා පරිසර හිතකාමී සහ කාර්යක්ෂම ඉන්ධන විකල්ප ලබා දීම සඳහා නිර්මාණය කර ඇති අතර එමඟින් තිරසාර ඉන්ධන පරිභෝජනයට දායක වීමද සිදු වේ.



දේශගුණය ආශ්‍රිත උවදුරු සහ ස්වභාවික විපත් වල බලපෑම් වලක්වා ගැනීම සහ අවම කිරීම සඳහා අප විසින් අපගේ ක්‍රියා පටිපාටි සහ භාවිතයන්ට උපාය මාර්ග ඒකාබද්ධ කර ඇත. අපගේ උපාය මාර්ග වලට රජය විසින් ස්ථාපිත කරන ලද දේශගුණික විපර්යාස මූලපිරීම් ද ඒකාබද්ධ කර ඇත. මීට අමතරව, ආරක්ෂාකාරී පියවරයන් ප්‍රවර්ධනය කිරීම සඳහා පිරිපහදු සේවකයින් සඳහා පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් අප විසින් ලබා දෙනු ලැබේ.



ඕනෑම විභව ඉන්ධන කාන්දුවීම් හඳුනා ගැනීම සහ ඉවත් කිරීම සඳහා වන දැඩි තත්ත්ව සහතික කිරීමේ මූලලේඛනයන් ක්‍රියාත්මක කිරීමට සංස්ථාව කටයුතු කර ඇත. තෙල් කාන්දු වීමේ අවදානම අවම කිරීම සඳහා ප්‍රවාහනය, ගබඩා කිරීම සහ බෙදා හැරීම ඇතුළු විවිධ අවස්ථා වලදී විස්තීරණ තත්ත්ව සහ නියාමන තක්සේරු කිරීම් සිදු කෙරේ. තවද, සංස්ථාව ජාත්‍යන්තර තෙල් දූෂණ වන්දි අරමුදලේ (IOPC) සාමාජිකයෙකු වන අතර එය ටැංකි කාන්දුවීම් හේතුවෙන් සිදුවන තෙල් දූෂණයෙන් සිදුවන හානි සඳහා වන්දි ලබා දෙයි. මෙම අනුබද්ධය ජල දූෂණය වැළැක්වීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග සඳහා පහසුකම් සපයයි.



ස්ථාපිත ප්‍රමිතීන්ට අනුකූලව කෘෂි රසායන නිෂ්පාදන තිරසාර ලෙස නිෂ්පාදනය සහ බෙදා හැරීම සඳහා අපි කැපවී සිටින්නෙමු. පෘථිවියේ ජීවයට ශූන්‍ය හානියක් සිදු කිරීම සහ පරිසර දූෂණයේ ශූන්‍ය මට්ටමක් පවත්වා ගැනීම අරමුණු කරගත් තොරතුරු සහ පුහුණුව අපි ලබා දෙන්නෙමු.

අවදානම් කළමනාකරණ වාර්තාව

මෙහෙයුම් සහ මූල්‍ය කාර්ය සාධනය යන ද්විත්වයටම බලපෑ හැකි විවිධ අවදානම් රැසකට බනිජ තෙල් කර්මාන්තයේ පවතින ආවේනික දුර්වලතා සැලකිල්ලට ගෙන, ජාතියේ සමස්ත කීර්ති නාමය මෙන්ම, ශක්තිමත් සමාජ හා ආර්ථික පරිසරයක් පවත්වා ගැනීම සඳහා ඵලදායී අවදානම් කළමනාකරණය අත්‍යවශ්‍ය වේ. බනිජ තෙල් ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම ආයතනය ලෙස, අපගේ ව්‍යාපාර මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා අවදානම් වල සියලු පැති ඇතුළත් විස්තීර්ණ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීමේ තීරණාත්මක වැදගත්කම අපගේ සංස්ථාව පිළිගනී.

අඛණ්ඩව ක්‍රියාත්මක වන අපගේ සංස්ථාව පිරිපහදුව සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ ඒවායේ ක්‍රියාකාරිත්වයට බලපෑම් කළ හැකි විවිධ අවදානම්වලට යටත් වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, අපගේ සංස්ථාව මෙම අවදානම් කඩිසරව හඳුනා ගැනීමට සහ ඒවා අවම කිරීම සඳහා උපාය මාර්ග සැකසීමට කැපවී සිටී.

අවදානම් කළමනාකරණයේ අරමුණ:


අවදානම් කළමනාකරණ පිළිවෙත් ක්‍රියාත්මක කිරීමේ මූලික අරමුණ වන්නේ බාහිර සාධක, වෙළඳපල උච්චාවචනයන් සහ අභ්‍යන්තර අඩුපාඩු වලින් පැන නගින විභවය දුර්වලතා වලින් සංස්ථාව ආරක්ෂා කිරීම වේ. අපගේ සේවකයින්ගේ, පාරිභෝගිකයින්ගේ සහ සාමාන්‍ය ජනතාවගේ යහපැවැත්ම ආරක්ෂා කරන අතරම සංස්ථාවේ තිරසාර පැවැත්ම සහතික කරමින් වර්ධනය සහ අවදානම අතර සියුම් සමතුලිතතාවයක් ඇති කිරීම ඉතා වැදගත් වේ. අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීමෙන්, ඇතිවිය හැකි ඕනෑම අහිතකර සිදුවීම් වලින් සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීම අපගේ අරමුණයි.

අපි උපක්‍රමශීලීව උපද්‍රව හඳුනා ගැනීම අධීක්ෂණය කරන අතර ඒවා ශූන්‍ය හෝ පිළිගත හැකි මට්ටමකට අඩු කිරීමට කටයුතු කරන්නෙමු.

අවදානම් කළමනාකරණ රාමුව

අපගේ අවදානම් කළමනාකරණ රාමුව සංස්ථාවට බලපාන ප්‍රධාන අවදානම් කල්තියා හඳුනා ගැනීම සඳහා ඉතා සූක්ෂම ලෙස නිර්මාණය කර ඇත. ජාතිය සඳහා විශ්වාසනීය බලශක්ති සැපයුමක් සහතික කිරීම සඳහා අපි මෙම අවදානම්වල ඇඟවුම් තක්සේරු කර ඒවා ඵලදායී ලෙස කළමනාකරණය කරන්නෙමු. මෙම රාමුවට පැහැදිලිව නිරූපණය කරන ලද භූමිකාවන් සහ වගකීම් සමඟින් විස්තීරණ අවදානම් ප්‍රතිපත්ති ඇතුළත් වේ.

මෙම ශක්තිමත් අවදානම් කළමනාකරණ රාමුව සාර්ථකව ක්‍රියාත්මක කිරීම අපගේ මෙහෙයුම් බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීමට පහසුකම් සපයයි. 1961 අංක 28 දරන ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථා පනත, 1971 අංක 38 දරන මුදල් පනත, මූල්‍ය රෙගුලාසි, යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශ, රාජ්‍ය ව්‍යවසායන් සඳහා හොඳම භාවිතයන් සහ වෙනත් අදාළ රෙගුලාසි ඇතුළු විවිධ නියාමන උපකරණ මත එය පදනම් වේ.



අවදානම් හඳුනා ගැනීම, නියාමනය, කළමනාකරණය, සහ හඳුනා ගැනීම සඳහා ශක්තිමත් වැඩරාමුවක් මෙම නියාමනයන් මගින් ස්ථාපිත කෙරේ.

සංස්ථාවෙහිඅවදානම් කළමනාකරණය ස්ථරයන් තුනකින් සමන්විත ආරක්ෂක වැඩරාමු පද්ධතියක් මගින් ශක්තිමත් කෙරේ. අපගේ ව්‍යාපාර සහ මෙහෙයුම් ඒකක වලින් පළමු පෙළ ආරක්ෂාව නියෝජනය වේ. දෙවන පෙළ ආරක්ෂාවට අපගේ නිශ්චිත අවදානම් සමඟ බැඳි අවදානම් කළමනාකරණය තහවුරු කරන අභ්‍යන්තර පාලන යාන්ත්‍රණ සහ පත්කළ අධිකාරීන් ගෙන් සමන්විත වේ. ස්ථාපිත ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි, සහ නියාමන අවශ්‍යතා වලට අනුකූල වීම අරමුණු කරගත් අභ්‍යන්තර විගණන, බාහිර විගණන සහ අමතර අනුකූලතා පිළියම් වලින් තෙවන පෙළ ආරක්ෂාව සමන්විත වේ.

පළමු පෙළ ආරක්ෂාව

පළමු පෙළ ආරක්ෂාව තුළ නිරාවරණය වන ලද ඕනෑම අවදානමක් හඳුනා ගෙන ඵලදායී ලෙස කළමනාකරණය කිරීම තහවුරු කරන අවදානම් හඳුනා ගැනීම, ඒවා කළමනාකරණය කිරීම සහ වාර්තාකරණය ව්‍යාපාරික සහ මෙහෙයුම් අංශ වගකීම දරයි.

දෙවන පෙළ ආරක්ෂාව

අදාළ පනත් සහ ක්‍රියාපටිපාටි අනුව නිර්මාණය කරන ලද පැහැදිලිව දක්වා ඇති ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ඇතුළත් විස්තීර්ණ අභ්‍යන්තර පාලන පද්ධතියක් සංස්ථාව විසින් ක්‍රියාත්මක කර ඇත. මෙම පද්ධතිය දෙවනි පෙළ ආරක්ෂාව හරහා සංස්ථාව හා බැඳි අවදානම් හඳුනා ගැනීමට, කළමනාකරණය කිරීමට මෙන්ම වැළැක්වීම සඳහා අවකාශ සලසයි.


තෙවන පෙළ ආරක්ෂාව

තෙවන පෙළ ආරක්ෂාව තුළ අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ ප්‍රධාන භූමිකාව අභ්‍යන්තර සහ බාහිර විගණන කාර්යයන් මඟින් සිදු කෙරෙයි. මූල්‍ය සහ මෙහෙයුම් පද්ධතිවල නිර්මාණය සහ ක්‍රියාත්මක කිරීමේ ඵලදායිතාවය මෙම කාර්යයන් මඟින් විමසා බැලේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරන ලද අවදානම් කළමනාකරණ කමිටුව, ප්‍රමාණාත්මක කළින් තීරණය කළ ඉලක්ක සහ අරමුණු හා සම්බන්ධ විගණන සොයා ගැනීම්, කළමනාකරණ ප්‍රතිචාර සහ කාර්ය සාධනය සඳහා වගකීම දරයි. මෙම අවදානම් පාලන රාමුව ක්‍රමානුකූලව ආදායම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම, අවම කිරීම සහ සන්නිවේදනය යන කාර්යයන් සහතික කරයි.

පරිපාලන ශෛලිය සහ අවදානම් පාලනය. සංස්ථාවේ සීමාවකින් තොර ක්‍රියාකාරිත්වය සඳහා කාර්යක්ෂම අවදානම් කළමනාකරණය අත්‍යවශ්‍ය වේ. කැපී පෙනෙන අවදානම් අඛණ්ඩව හඳුනා ගෙන ඒවාට පිළියම් සපයන ක්‍රියාකාරී ක්‍රමෝපායක් සඳහා වන අවශ්‍යතාව පවතින ලෝක සහ දේශීය ආර්ථික, දේශපාලන සහ සමාජ තත්වයක් මගින් ඉස්මතු කර පෙන්වනු ලබයි.

සභාපතිතුමාගේ නායකත්වය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවදානම් කළමනාකරණයේ මූලික වගකීම දරයි. මෙම වගකීම අවදානම් කළමනාකරණ කමිටුවේ ප්‍රයත්නයන් මගින් තව දුරටත් ශක්තිමත් වේ.



අවදානම් කළමනාකරණ කමිටුව ට පැවරී ඇති කාර්යය වන්නේ අවදානම් ප්‍රදේශ හඳුනා ගැනීම මෙන්ම විය හැකි අනතුරු සහ ඒවායේ බලපෑම අඩුකිරීමේ ක්‍රමෝපාය පිළියෙළ කිරීමත් වේ.
අධ්‍යක්ෂ මණ්ඩලයට සෘජුවම වාර්තා කරන අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අවදානම් කළමනාකරණ මණ්ඩලයේ උපකමිටුවක් පිහිටුවන ලදී.
මෙම කමිටුවට අධ්‍යක්ෂ වරුන් දෙදෙනෙක්ද, අවදානම් ප්‍රදේශ හඳුනා ගැනීමට සහාය වන සහ උචිත පාලන සහ අඩුකිරීමේ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කරන එක් එක් ක්‍රියාත්මක ප්‍රදේශ වලින් යුත් කළමනාකරුවන් සහ විධායකයන නිලධාරීන්ද ඇතුළත් වේ.

රාජකාරී හා වගකීම්

- ඔවුන් නිරාවරණය වන අවදානම් හඳුනා ගැනීම - සෑම මෙහෙයුම් හා වාර්තාකරණ කලාප වෙත ගොස් නිරාවරණය වීමට ඉඩ ප්‍රස්තාව ඇති සියලුම අවදානම් හඳුනා ගැනීමට අවශ්‍ය වේ.
- ඇගයීම - නිරාවරණය වන අවදානම් ඇගයීමට ලක් කිරීම හා එම අවදානම් සිදුවීමට ඇති සම්භාවිතාවය හා වාර ගණන ඇගයීම.
- අවදානම් අවම කිරීමේ උපාය මාර්ග සකස් කිරීම - අවදානම් අවම කර ගැනීමේ උපාය මාර්ග හඳුනා ගෙන සෑම අවදානම් කාණ්ඩයක් සඳහාම අවශ්‍ය උපාය මාර්ගයන් සකස් කිරීම.
- ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය - අවදානම් කළමනාකරණය/ අවදානම් අවම කිරීමේ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම හා ඒවා අධීක්ෂණය කිරීම.

අවදානම් කළමනාකරණ වැඩරාමුව


සංස්ථාව විවිධාකාර අවදානම් වලට ලක් වන අතර ඒ අතර ඛනිජ තෙල් නිෂ්පාදන හා බැදි සෞඛ්‍යය සහ සුරක්‍ෂිතකම සම්බන්ධ ඒවා විශේෂ වේ. ප්‍රතිඵලයක් ලෙස සංස්ථාව විසින් ආරක්ෂා පෙළ තුනේදීම කාර්යක්ෂම ලෙස ඒවායේ අවදානම් කළමනාකරණය කිරීමට සහ අඩු කිරීම සඳහා මෙම අවදානම් හඳුනා ගැනීමටත් ක්‍රමෝපාය වර්ධනය කිරීමටත් විස්තීර්ණ විශ්ලේෂණ ක්‍රියාමක කරයි. මෙම ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීම එක් එක් හඳුනා ගත් අවදානම් වල සම්භාවිතාව සහ ප්‍රබලත්වය මත රඳා පවතී. අවදානමක් නිසි පරිදි හඳුනා ගැනීම මත සංස්ථාව විසින් ක්‍රියාකිරීම හෝ වැළක්වීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරනු ලැබීම, වෙනත් ආයතනයකට එය බාර දීම නැතහොත් විභව ප්‍රතිඵල බාර ගෙන ඒ අනුව සම්පත් වෙන් කිරීම සිදු කරනු ලැබේ.

අවදානම් අභිරුචිය

අවදානම් අභිරුචිය අපගේ මෙහෙයුම් කටයුතු වලට වැදගත් යැයි සළකනු ලබන තීරණාත්මක අවදානම් කාණ්ඩ සඳහා වන ධාරණ බිමක් නිර්ණය කිරීම මගින් ව්‍යාපාර සහ අවදානම් ආශ්‍රිත ගැටළු කළමනාකරණ කිරීම සඳහා වැඩරාමුවක් ලෙස ක්‍රියා කරයි. මෙම ධාරණ බිම ඛනිජ තෙල් නිෂ්පාදන හැසිරවීම සහ ක්‍රියාත්මක කිරීම හා බැදි අවදානම් වල ස්වභාවයෙන්ම පවතින ගති ලක්ෂණ අනුව ස්ථාපනය කර ඇත. සංස්ථාව විසින් ස්වකීය මෙහෙයුම් වලට දැඩි ලෙස බලපෑ හැකි විවිධ අවදානම් හඳුනා ගනු ලැබේ.

අපගේ ක්‍රියාකාරකම් වලට මෙම අවදානම් වල අදාළ බව තක්සේරු කිරීමට සංස්ථාව විසින් ඒවා නම් කරන ලද අවදානම් අභිරුචිය සමඟ ගලපනු ලැබේ. මෙම අවදානම් ඒවායේ ප්‍රබලත්වය අනුව වර්ග කරනු ලබන අතර ඒවා සිදු වීම පාලනය කිරීමේ ක්‍රමෝපාය සැකසීමට බාහිර පාර්ශවයක් වෙත මාරු කර යැවීම හෝ උචිත පරිදි විභව ප්‍රතිඵල බාර ගනිමින් තක්සේරු කළ අවදානම් මට්ටමේ හදිසි අවශ්‍යතාව පදනම් කර ගනිමින් සුදුසු පරිදි සම්පත් වෙන් කිරීම හෝ සිදු කරනු ලැබේ.

පිරිපහදුවේ මෙහෙයුම් පිළිබඳව එමගින් පැන නගින බහුවිධ අවදානම් සාධක වලට නිරාවරණය වීම හේතුවෙන් විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ. අවුරුදු පනහකට පෙර ස්ථාපනය කර ඇති පිරිපහදුව විශේෂයෙන්ම විවිධ අවදානම් වලට ගොදුරු වන සුළු බැවින් අවදානම් කළමනාකරණය එහි මෙහෙයුම් වැඩ රාමුවේ අංගයක් බවට පත් කරයි.



අවදානම් අනුපාතය	අවදානම් මට්ටම	සම්බන්ධ විය හැකි මට්ටම
1 - 5	ඉතා අවම	කාර්ය මණ්ඩලය/පහළ කළමනාකරණ මට්ටම
6 - 11	අවම	ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම
12-19	මධ්‍යම	සංස්ථායික කළමනාකරණ මට්ටම
20 -24	ඉහළ	කළමනාකාර අධ්‍යක්ෂ
25	ඉතා ඉහළ	අධ්‍යක්ෂ මණ්ඩලය

මේ හා සමානවම ගුවන් තොටුපල පරිසර තුළ ක්‍රියාකාරීව පවතින ගුවන් සේවා කාර්යාංශය ආවේණික අවදානම් විශාල සංඛ්‍යාවකට නිරාවරණය වේ. මෙම මෙහෙයුම් අංග ද්විත්වය අවදානම් කළමනාකරණයට ප්‍රමුඛතාව ලබා දීමේ අවශ්‍යතාව සළකුණු කරමින් සංස්ථාව වෙතට සැළකිය යුතු අවදානම් ප්‍රමාණයක් ඇති කරයි. තවද, කෘෂිරසායන අංශය, ව්‍යාපාරික මෙහෙයුම් වල අඛණ්ඩතාව තහවුරු කිරීමට වැදගත් වන ඵලදායී අවදානම් කළමනාකරණ ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීමෙහි ලා විවිධ සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ අවදානම් වලට මුහුණ දෙයි.

සංස්ථාව නිරාවරණය වන අවදානම් තත්ව

ඛනිජ තෙල් අංශය සඳහා සෘජු සහ වක්‍ර ප්‍රතිඵල ඇති කරන එහි මෙහෙයුම් හා බැදි ප්‍රමාණාත්මක අවදානම් වල විස්තීර්ණ ඇගයීමක් සංස්ථාව විසින් සිදු කරනු ලැබේ. සංස්ථාව විසින් මුහුණ දෙන මූලික අවදානම් පිළිබඳ සංක්ෂිප්ත සාරාංශයක්, ක්‍රියාත්මක කරන ලද අදාළ අවදානම් කළමනාකරණ පිළියම් මෙන්ම මෙකී අවදානම් තව දුරටත් තුරන් කිරීමට නිර්මාණය කරන ලද ක්‍රමෝපායන්ද සහිතව පහත දක්වා ඇත.

ආර්ථික අවදානම	අවම කරන සාධක	ක්‍රමෝපාය
බනිජ තෙල් නිෂ්පාදන ආනයනය කරනු ලබන්නේ ඇමෙරිකානු ඩොලර් යොදා ගෙන වන අතර ආදායම් ලැබීම ශ්‍රී ලංකා රුපියල් වලින් සිදු වන බැවින් සංස්ථාවේ මෙහෙයුම් කෙරෙහි සැළකිය යුතු බලපෑමක් රට තුළ පවතින උද්ධමන අනුපාතයෙන් ඇති කෙරේ. බනිජ තෙල් නිෂ්පාදන මිළ උච්චාවචනය, ජාතික ආර්ථිකයේ ඉහළ වැදගත්කමක් දරන බැවින් ජාතික ආර්ථිකයට දැඩි බලපෑමක් ඇති කරයි. උද්ධමනය, පොළී අනුපාත, විදේශ විනිමය අනුපාත යන ඒවා නිෂ්පාදනවල පිරිවැය වැඩි වීමටත් එමගින් සමස්ත පිරිවැය වැඩි වීම නිසා ලාභය අඩුවීමටත් හේතු වෙයි. වාර්ෂිකව ලීටර බිලියන 4 ක් පමණ වන අලෙවි ධාරිතාවය පිළිබඳව සලකා බලන විට ආර්ථික දර්ශක වල සුළු වෙනස්කම් වලට වුවද ලාභදායිතාවය කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් ඇති කළ හැකිය.	♦ කාර්යක්ෂම පිරිවැය කළමනාකරණ මූලාශ්‍ර ක්‍රියාත්මක කිරීම. ♦ සියළු නිෂ්පාදන සඳහා පාරදෘෂ්‍ය මිල යාන්ත්‍රණයක් භාවිතයට ගැනීම. ♦ ලිහිසි තෙල් සහ තාර වැනි නිෂ්පාදන සඳහා තරඟකාරී මිල ගණන් ඉදිරිපත් කිරීම.	♦ පවතින සමාජ ආර්ථික තත්වයන් සමඟ සංස්ථාවේ ලාභදායිත්වය කාර්යක්ෂම ලෙස සමතුළිත කරන මිලකරණ ක්‍රමෝපායක් ක්‍රියාත්මක කිරීම.
භාණ්ඩ මිල අවදානම	**අවම කරන සාධක**	**ක්‍රමෝපාය**
බනිජ තෙල් සම්පත් ශ්‍රී ලංකාව සතුව නොපවතින බැවින්, ජාත්‍යන්තර වෙළඳපලෙන් බොරතෙල් සහ පිරිපහදු කළ නිෂ්පාදන ආනයනය කිරීමට සිදුව තිබේ.මෙම අංශයෙහි සාපේක්ෂව ඉතා කුඩා මිල දී ගන්නෙකු ලෙස සංස්ථාව ජාත්‍යන්තර සැපයුම්කරුවන් විසින් ස්ථාපනය කර ඇති වත්මන් පවතින මිල ගණන් වල බලපෑමට ලක්වෙයි. ප්‍රතිඵලයක් ලෙස සංස්ථාව අඛණ්ඩව, භාණ්ඩ මිල උච්චාවචනයන් හා බැඳි ආවේනික අවදානම් වලට නතු වෙමින් පවතී.සංස්ථාවේ විකිණුම් පිරිවැය, ලාභදායිතාවය, සහ මුදල් ප්‍රවාහයට ජාත්‍යන්තර තෙල් මිලේ අහිතකර වෙනස්වීම් වලින් ඍණාත්මක බලපෑමක් ඇති කරනු ලැබිය හැකිය.	♦ මිල අඩු වැඩි වීම් වල වාසිය ලබා ගැනීමට අඛණ්ඩ මිල නියාමනයක් ක්‍රියාත්මක කිරීම. ♦ තොග මිල දී ගැනීම සහ ගබඩා කිරීම සඳහා පිරිවැය ඵලදායී ක්‍රම යොදා ගැනීම.	♦ ලෝක වෙළඳපොලේ මිල පහත වැටීම් වන කාල වලදී තොග පවත්වා ගැනීමට ගබඩා ධාරිතාව වැඩි කිරීම. ♦ ආශ්‍රිත පිරිවැය සියල්ල ඇතුළත් සියළු නිෂ්පාදන සඳහා වන විනිවිද භාවයෙන් යුතු මිලකරණ යාන්ත්‍රනයන් ක්‍රියාත්මක කිරීම. ♦ තරඟකාරීත්වයට ඉඩ සැලසෙන පරිදි සැපයුම්කරුවන් සංඛ්‍යාව වැඩි කිරීම.
පොළී අනුපාත අවදානම	**අවම කරන සාධක**	**ක්‍රමෝපායන්**
සංස්ථාවේ සමුච්චිත පාඩු වල ප්‍රතිඵලයක් ලෙස ස්කන්ධ ප්‍රාග්ධන වල පහත වැටීමක් සිදුව ඇති අතර බනිජ තෙල් නිෂ්පාදන බාධාවකින් තොරව ලබා දීම සහතික කිරීමට සහ ජාතික බලශක්ති සුරක්ෂිතතාවය පවත්වාගෙන යාමට ක්‍රියාකාරී ප්‍රාග්ධන අරමුණු සඳහා ණය ලබා ගැනීමට සංස්ථාව පොළඹවනු ලබයි. සංස්ථාව විසින් ප්‍රශ්න ගත වර්ෂයේදී පවතින ණය නිසා ඇතිවූ රු. මිලියන 7,454ක මූල්‍ය පිරිවැයක් වාර්තා කරන ලදී. ලාභදායිත්වය කෙරේ අහිතකර බලපෑමක් ඇති කරන අතිරේක මූල්‍ය බරක් නිර්මාණය කරමින් සංස්ථාවේ මූල්‍ය කාර්ය සාධනයට පොළී අනුපාත වල විචල්‍යතා වලින් සැළකිය යුතු බලපෑමක් ඇති කරනු ලබයි.	♦ වඩා අඩු පොලී අනුපාත ලබා ගැනීමට මූල්‍ය ආයතන සමඟ සාකච්ඡා කිරීම් සිදු කෙරෙමින් පවතී. ♦ පොලී උපයන මාර්ගවල දෛනික අතිරික්ත මුදල් ශේෂ ආයෝජන සඳහා යොදා ගැනීම.	♦ ඇ.ඩො. මිළ දී ගැනීමේ ක්‍රමය සඳහා ඉලෙක්ට්‍රොනික වෙළඳාම් වේදිකාවක් දිගටම පවත්වා ගැනීම. ♦ බැංකු ණය ආපසු ගෙවීමට පහසු වන පරිදි රජය විසින් ලබා දෙනු ලබන සහන ගෙවීම් කඩිනමින් පියවීම. ♦ වඩා අඩු පිරිවැය සහ වඩා වැඩි කාල සීමා සඳහා වන මූල්‍යකරණ විකල්ප සොයා බැලීම.

ද්‍රවශීලතා අවදානම	අවම කරන සාධක	ක්‍රමෝපාය
සංස්ථාවේ කෙටි කාලීන ගිවිසුම් සහ වෙනත් වගකීම් නියමිත වේලාවට ගෙවීමට නොහැකි වීමෙන් සංස්ථාව ද්‍රවශීලතා අවදානමට මුහුණ පායි. නියමිත කාලයට පියවිය යුතු ණය නො ගෙවීමෙන් අතිරික්ත පොළි පිරිවැය දැරීමට සංස්ථාවට සිදුවේ. අනෙක් අතට, තම ණය ගෙවීම් හා සැපයුම්කරුවන්ට නියමිත වේලාවට ගෙවීමට අපොහොසත් වීම තුළින් සංස්ථාවේ කීර්ති නාමයට හානිවීම ද සිදු වේ.	♦ විවිධ කෙටි කාලීන සහ දීර්ඝ කාලීන අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම. ♦ ද්‍රවශීල තත්වය අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහ කල්පිරීමේ කාලසටහන අනුව කළමනාකරණය කිරීමග ♦ කාර්යක්ෂම එක් රැස් කර ගැනීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම.	♦ ණය කළමනාකරණ ප්‍රතිපත්තිය ප්‍රමිතගත කිරීම. ♦ දීර්ඝ කාලීන අරමුදල් ගැනීම සඳහා වන අවිස්ථා පිළිබඳව සොයා බැලීම. ♦ රජයෙන් ලැබිය යුතු සහනාධාර නිසි පරිදි ලබා ගැනීම සඳහා උත්සහ කිරීම. ♦ .
ආරක්ෂණ අවදානම	**අවම කරන සාධක**	**ක්‍රමෝපාය**
ඛනිජ තෙල් නිෂ්පාදනවල නිසග ගිනිගන්නා සුළු බව මගින් සෞඛ්‍ය හා ආරක්ෂාවට සැලකිය යුතු අවදානමක් ඇති කරයි. මෙම අවදානම් වලට පිළිතුරු වශයෙන් පිරිපහදුව, ජාත්‍යන්තරව ස්ථාපිත සෞඛ්‍යය සහ ආරක්ෂණ ප්‍රමිතීන් වලට අනුගතව කටයුතු කරයි. ආරක්ෂණ ක්‍රියාපටිපාටි පවත්වා ගැනීමට අඛණ්ඩ පරීක්ෂාවන් සහ පුහුණු පවත්වනු ලැබේ. එසේම, ගුවන්තොටුපල තුළ සිදු වන මෙහෙයුම් පැය 24 පුරා ක්‍රියාත්මකවීම නිසා ගුවන්සේවා ක්ෂේත්‍රයද මෙබඳුම ආරක්ෂණ අවදානමකට මුහුණ දේ. ආරක්ෂණ රෙගුලාසි සහ ප්‍රමිතීන් වලට අනුගත නොවීම, දඩ, දඬුවම් සහ මෙහෙයුම් සම්බාධක ස්වරූපයේ ඉහළ යන වියදම් වලට මුහුණ දීමට හේතුවන අතර ව්‍යාපාර මෙහෙයුම්, සංස්ථාවේ වත්කම් මානව ජීවිත වලටද දැඩි බලපෑමක් ඇති කරයි.	♦ සෞඛ්‍ය හා ආරක්ෂාව සඳහා වන දැඩි ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන් ක්‍රියාත්මක වේ. ♦ ගිනි ආරක්ෂාව, සෞඛ්‍ය ක්‍රියාපටිපාටි පිළිබඳව කාර්ය මණ්ඩලය නිරන්තරයෙන් පුහුණු කිරීම. ♦ ප්‍රමිතීන් හා ක්‍රියාපටිපාටීන් වලට අනුගත වීම තහවුරු කිරීමට අඛණ්ඩ නඩත්තුව පවත්වා ගැනේ. ♦ වත්කම් පවත්වාගෙන යාමට සෑම වසර තුනකට වරක් පිරිපහදුවේ ප්‍රධාන අළුත්වැඩියා කිරීම ක්‍රියාත්මක කිරීම.	♦ ව්‍යුහගත සහ ව්‍යුහගත නොවන ආකාරයට අභ්‍යන්තරයක් බාහිරවත් අඛණ්ඩ සේවක මණ්ඩල පුහුණු කිරීම් ක්‍රියාත්මක කිරීම. ♦ නවීනතම තාක්ෂණික ප්‍රවර්ධන ඇතුළත් කර ගැනීමට පිරිපහදුව අඛණ්ඩව වැඩි දියුණු කිරීම. ♦ මෙහෙයුම් සඳහා ISO, SL5 වැනි ගුණාත්මකභාවය හා ආරක්ෂාව සම්බන්ධ සහතික ලබා ගැනීමට උත්සුක වීම.
තොරතුරු තාක්ෂණ (IT) අවදානම	**අවම කරන සාධක**	**ක්‍රමෝපාය**
කඩිනම් සහ නිරවද්‍ය කළමනාකරණ ගැනීමෙහිලා විශ්වාසනීය තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීම තීරණාත්මක කාරණයකි. වෙළඳපලේ තරඟකාරී ස්ථානයක් පවත්වා ගැනීමට තත්කාලීන මාර්ගගත තොරතුරු සඳහා ප්‍රවේශය අත්‍යවශ්‍ය වේ.. මෙම අවශ්‍යතාව ස්වකීය වෙළඳපල කොටස වෙත ප්‍රවේශය සහ පවත්වා ගැනීම සඳහා තත්කාලීන තොරතුරු ලබා ගත හැකි වීම තීරණාත්මක වන දැඩි ලෙස තරඟකාරී ලිහිසි තෙල් සහ කෘෂි රසායන අංශ වලදී විශේෂයෙන් දැක ගත හැකිය.	♦ කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) හරහා ස්වකීය ගනුදෙනු නිවැරදිව වාර්තා කිරීමට සහ සටහන් කිරීමට SAP-ERP පද්ධතිය ආයතනය විසින් භාවිතා කරනු ලැබේ. ♦ පද්ධතිය භාවිතා කිරීමේ ප්‍රාගුණ්‍යය තහවුරු කිරීමට ස්වකීය පරිශීලකයන්ට තොරතුරු තාක්ෂණ පුහුණුව ලබා දීම ආයතනය විසින් අඛණ්ඩව සිදු කරනු ලැබේ. ♦ සංස්ථාව විසින් ස්වකීය කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව පවත්වා ගැනීමට තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වල ආයෝජනය කිරීම අඛණ්ඩව සිදු කරනු ලැබේ.	♦ ස්වකීය මෙහෙයුම් උපරිම මට්ටමට ගෙන ඒමට (Plant Model) ආකෘතිය වැනි ලක්ෂණ ක්‍රියාත්මක කිරීමද ඇතුළුව ERP පද්ධතියේ ඵලදායී භාවිතය වැඩි කිරීමට ආයතනය ඉලක්ක කරයි. ♦ දත්ත වල ඒකාග්‍රතාව සහ ආරක්ෂාව තහවුරු කිරීමට SAP ERP පද්ධතියේ යථා තත්වයන් පවත්වා ගැනීමට ආයතනය අදහස් කරයි. ♦ වැඩි දියුණු කළ කාර්යයන් සහ ප්‍රවර්ධනයන් ගෙන් ප්‍රතිලාභ ගැනීමට පද්ධතිය වඩාත්ම නවීන මොඩලය දක්වා අඛණ්ඩව යාවත්කාලීන කිරීමට ආයතනය කටයුතු කරයි.

මානව සම්පත් අවදානම	අවම කරන සාධක	ක්‍රමෝපාය
නියුක්ත සේවකයින් සංස්ථාවේ ක්‍රමෝපායික වත්කමක් නියෝජනය කරන අතර ආයතනයේ සම්පත් ඵලදායී ලෙස මෙහෙයවීමට සහ ආරක්ෂා කිරීමට ඔවුන් සමඟ ධනාත්මක සබඳතාවක් වර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ. සංස්ථාවෙහි අප අගය එකතු කිරීමෙහි ලා ඔවුන්ගේ දායකත්වය හඳුනා ගැනීම මගින් සහ ආකර්ශනීය සහ තරඟකාරී සහන පැකේජ ලබා දීම මගින් දක්ෂ සේවකයන් ආකර්ශනය කරගැනීමටත් රඳවා තබාගැනීමටත් කැප වන අතර එමගින් නීතිමය ආරවුල් අඩු කර ගැනීමටත් කටයුතු කරන්නෙමු. ප්‍රමාණවත් නොවන ශ්‍රම බලකායක් හෝ එක් ගැටළුකාරී සේවකයෙකු මගින් වුවද නිෂ්පාදනවල ගුණාත්මකභාවය, කාර්යක්ෂම නොවන පාරිභෝගික සේවාවක් හා ඊට හානිදායී වන ගැටළු වලට හේතු විය හැකි අතර අවසානයේදී සංස්ථාවෙහි පිරිවැය සහ ලාභදායීත්වයට ඍණාත්මක ප්‍රතිවිපාක ඇති කළ හැක. මීට අමතරව, සේවකයන් සමඟ ආරවුල් පැවතීමෙන් සේවක කළමකාරණය සහ නීති කෘත්‍යය හේතුවෙන් සංස්ථාවහට අතිරේක පිරිවැයක් දැරීමටද සිදු විය හැක.	♦ සේවක නිපුණතා තක්සේරු කිරීම කෙරෙහි අවධානය යොමු කරන බඳවා ගැනීමේ පටිපාටියක් ක්‍රියාත්මක කිරීම. ♦ සේවකයන් වඩා හොඳින් හඳුනා ගැනීමට සහ දිරිමත් කිරීමට ත්‍යාග ක්‍රමවේදය වැඩි දියුණු කිරීම. ♦ සේවකයන්ගේ කුසලතා සහ දැනුම ප්‍රවර්ධනයට පුහුණු හා සංවර්ධන වැඩසටහන් ලබා දීම.	♦ කාර්ය සාධනය පදනම් කර ගත් දිරිගැන්වීමේ ක්‍රමයක් ප්‍රවර්ධනය මගින් සේවකයින් තවදුරටත් අභිප්‍රේරණය කොට ඉහළ කාර්ය සාධනයක් පෙන්වන්නන්ට ත්‍යාග ලබා දීම. ♦ වෘත්තීය වර්ධනය සහ සංවර්ධනය ධෛර්යමත් කිරීමට අමතර වෘත්තීය සංවර්ධන අවස්ථා නිර්මාණය කිරීම. ♦ තාක්ෂණික දියුණුව සහ නවෝත්පාදන සඳහා අවශ්‍ය කුසලතා සහිත සේවකයින් ශක්තිමත් කිරීමට පුහුණු සහ සංවර්ධන මූලාරම්භ සැපයීම.

විනිමය අනුපාත අවදානම	අවම කරන සාධක	ක්‍රමෝපාය
අළෙවි ආදායමෙන් 90% ට වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකා රුපියල් වලින් ලැබෙන නමුත්, ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය හා බැඳි පිරිවැය සහ NIOC යළි ගෙවීම් බොහොමයක් මූලික වශයෙන් පියවනු ලබන්නේ ඇ.ඩොලර් මඟිනි. ඊට අනුරූපව, සංස්ථාව විනිමය අනුපාත උච්චාවචනයන්ට සැලකිය යුතු තරමින් නතු වන සුළු වේ. විශේෂයෙන් සැපයුම්කරුවන් කෙරෙහි ඇති ගෙවියයුතු බැදියාව වගකීම් හේතුවෙන් විනිමය අනුපාතිකයේ රු. 1/-ක වැනි සුළු ගැලපීමකට පවා, සංස්ථාවෙහි මූල්‍ය කාර්ය සාධනය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකිය. සංස්ථාවෙහි ලාභදායීත්වය, මූල්‍ය තත්ත්වය සහ මුදල් ප්‍රවාහය කෙරෙහි වන බලපෑම එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම මත විනිමය අනුපාතිකයේ නිසා සිදු වන අලාභයේ බලපෑම මගින් තවදුරටත් තීව්‍ර කරනු ඇත. 2023 මුදල් වර්ෂය සඳහා විනිමය අනුපාත විචලනය රු. බිලියන 20.3 ක් විය.	♦ සියලුම බැංකු විසින් පිරිනමනු ලබන විනිමය අනුපාත අඛණ්ඩව අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සහ සක්‍රීයව එක්සත් ජනපද ඩොලර් මිලදී ගන්නා අතරම වෙළඳපල හැසිරීම් නිරීක්ෂණයද සිදු කිරීම. ♦ සාධාරණ විනිමය අනුපාතයකට එක්සත් ජනපද ඩොලර් මිලදී ගැනීම සඳහා බැංකු සමඟ සාකච්ඡා කිරීම. ♦ බැංකු විසින් එක්සත් ජනපද ඇමරිකානු ඩොලර්හි විකුණුම් අනුපාත මෙන්ම අදාළ ආන්තිකය තීරණය කිරීමට රජයේ මැදිහත්වීම.	♦ බැංකු පද්ධතිය හරහා ඇ.ඩොලර් මිලදී ගැනීම් සඳහා පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.

ණය අවදානම	අවම කරන සාධක	ක්‍රමෝපාය
ගනුදෙනුකරුවන්ට නියමිත දිනට ඔවුන්ගේ හිඟ ඉන්වොයිස් පියවීමට නොහැකි වූ විට ණය අවදානම් මතු වන අතර එමඟින් සංස්ථාව විභව මූල්‍ය අවදානම්වලට නිරාවරණය වේ. සංස්ථාව මූලික වශයෙන් ඛනිජ තෙල් නිෂ්පාදන විකිණීම සඳහා සිය ගනුදෙනු කරුවන්ට ණයට ලබා දීම සිදු කරන අතර පුද්ගලික ආයතන වලට ණයට ලබා දීම සඳහා අතිරේක කොන්දේසි ඉටු කළ යුතුවේ. ඊට ප්‍රතිවිරුද්ධව, රාජ්‍ය ආයතන වෙත ණයට ලබා දීම සිදු කරනු ලබන්නේ කිසිදු ඇපකරයකින් තොරවය. ගනුදෙනුකරුවකු සංස්ථාව වෙත ගෙවීම් පැහැර හැරීමක් හෝ ප්‍රමාදයක් ඇතිවන සේ තම ගිවිසුම්ගත බැඳීම ඉටුකිරීමට අපෝහොසත් වුවහොත්, මෙම තත්ත්වය මුදල් ප්‍රවාහ අභියෝගවලට තුඩු දිය හැකි අතර ලාභදායිතාවයට අහිතකර බලපෑමක් ඇති කරයි. මේ අනුව, මෙම අංශවල කාර්ය සාධනය සංස්ථාවේ ණය තත්ත්වය කෙරෙහි සැලකිය යුතු ලෙස බලපාන අතර, අවසානයේ එය සංස්ථාවේ ලාභදායීත්වයට සහ සමස්ත මූල්‍ය තත්ත්වයටද බලපායි.	♦ රාජ්‍ය ආයතනවලින් ලැබිය යුතු මුදල්, ගෙවිය යුතු බදුවලින් කොටසකට හිලව් කිරීම. ♦ හිඟ ශේෂයන් අයකර ගැනීමට රජයේ මැදිහත්වීම් ලබා ගැනීම. ♦ හිඟ ශේෂයන් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගැනීම. ♦ වඩාත් ව්‍යුහගත ණය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම.	♦ ආරක්ෂක පියවරයන් සහ ගිවිසුම්ගත එකඟතා මත පදනම්ව රජයේ ආයතන වෙත ණයට විකිණීම ක්‍රියාත්මක කිරීම. ♦ ණය ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම සහ විධිමත් කිරීම. ♦ රජය විසින් ගෙවිය යුතු හිඟ මුදල් ශේෂයන් ලබා ගැනීමට මහා භාණ්ඩාගාරය සම්බන්ධ කර ගැනීම.

ආයතනික යහපාලනය

ආයතනික පාලනය

යහපත් සංස්ථායික පාලනය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තිරසාර සංවර්ධනයට දායක වන්නේ එහි කාර්‍ය සාධනය ඉහළ නැංවීමෙන් හා එහි උපාය මාර්ගික ඉලක්ක හා අරමුණු වෙත ළඟා වීමෙනි. අපගේ සංස්ථායික පාලනය අධ්‍යක්ෂ මණ්ඩලය, කළමනාකාරීත්වය, පාර්ශ්වකරුවන් හා අනෙකුත් හිමිකරුවන් අතර සබඳතා පිළිබඳව සැලකිලිමත් වේ.

ආයතනික සාර්ථකත්වය හා තිරසාර සංවර්ධනය සහතික කරනු ලබන අරමුණු, විනිවිදභාවය, වගවීම ප්‍රවර්ධනය කිරීම හා පවත්වා ගෙන යාම අපගේ පාලන මූලධර්මවල ප්‍රධාන අරමුණ වේ.

අභ්‍යන්තර කටයුතු වලට අදාල ලේඛන

- → 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත.
- → අධ්‍යක්ෂ මණ්ඩලයේ හා අනු කමිටුවල කාර්යයන්
- → අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්ති හා ප්‍රතිපත්ති මාර්ගෝපදේශ.
- → මූල්‍ය අධිකාරිය පවරා දීම.
- → චර්යාධර්ම සංග්‍රහය.

බාහිර මෙවලම්

- → 1971 අංක 28 දරන මුදල් පනත.
- → යහපාලනය සඳහා වන පොදු ව්‍යවසාය මාර්ගෝපදේශ.
- → මහා භාණ්ඩාගාර/රාජ්‍ය වක්‍රලේඛ.
- → ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ යහපත් පරිචයන් අන්තර්ගත සංග්‍රහය.
- → ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ කවුන්සිලය විසින් ප්‍රකාශයට පත් කරන ලද ඒකාබද්ධ වර්තාකරණ රාමුව.
- → ජාත්‍යන්තර වාර්තාකරණ ආයතනය විසින් නිකුත් කරන ලද තිරසාර වාර්තාකරණය සඳහා ජාත්‍යන්තර වාර්තාකරණ ආයතන ප්‍රමිති.

අපගේ ආයතනික යහපාලන රාමුව මෙහෙයවනු ලබන්නේ අභ්‍යන්තර හා බාහිර මෙවලම්වල අන්තර්ගත මූලධර්ම හා අවශ්‍යතා මගිනි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන්ගේ වගකීම් මුදා හරිනු ලබන ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සඳහා සකස් කරන ලද ක්‍රමවේදය පාලනය කිරීමට සකස් කර තිබෙන අපගේ යොමුව මෙම සංස්ථායික පාලන වාර්තාව මඟින් ඉදිරිපත් කර ඇත.

අධ්‍යක්ෂක මණ්ඩලය

ක්‍රමෝපායික, මූල්‍ය හා සංස්ථාවේ කීර්තිනාමය සම්බන්ධ ගැටලු සඳහා සංස්ථාව වෙනුවෙන් තීරණ ගනු ලබන ප්‍රධාන ආයතනික බලවේගය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයයි.

ආචාරධර්මයන් ප්‍රතිගම්‍ය වන යහ පාලනයක් සහිත සංස්කෘතියක් හා එහි වටිනාකමක් මෙන්ම වගවීම හා විනිවිදභාවය අඛණ්ඩව පරීක්ෂා කරන හා වැඩි දියුණු කරනු ලබන වැඩරාමුව ශක්තිමත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වේ. 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතින් අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියාත්මක වීමට අවශ්‍ය නිර්ණායක ඉදිරිපත් කරන අතර යහපත් ආයතනික පාලනයක් සහතික කරනු ලබයි. තවද, අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්ය භාරය හා වගකීම් මෙන්ම එහි සංයුතිය හා ධුර කාලය පිළිබව ද එමගින් ඉදිරිපත් කර ඇත.

තනි තනි වශයෙන් මෙන්ම සාමූහික වශයෙන් විශේෂඥ දැනුමින් හා ව්‍යාපාරික ඥානයෙන් සංස්ථාවේ දැක්ම හා මෙහෙවර වෙත ළඟා වීමට පුළුල් ක්ෂේත්‍රවලින් මනාව සන්නද්ධ වූ අධ්‍යක්ෂ මණ්ඩලයක් අප සංස්ථාව සතු වේ. සංස්ථාවේ වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් කර ඇති පරිදි වන අතර අධ්‍යක්ෂවරුන්ගේ සාරාංශගත කරන ලද විශේෂඥතා ඔවුන්ගේ සුදුසුකම් හා අත්දැකීම් මෙම වාර්තාවේ පිටු අංක 19 සිට පිටු අංක 23 දක්වා ඇතුළත් කර ඇත.

අධ්‍යක්ෂ හා ධුරයේ ස්වභාවය	පත්වීම් දිනය
ඩී.ජේ.ඒ.එස්. ද එස් රාජකරුණා මහතා (සභාපති)	24.09.2024
ආචාර්ය මයුර නෙත්තිකුමාරගේ (කළමනාකාර අධ්‍යක්ෂ)	24.09.2024
ආර්.එම්.එස්. පී.එස්. බණ්ඩාර මහතා (අධ්‍යක්ෂ/ භාණ්ඩාගාර නියෝජිත)	03.10.2024
එම්.එම්. ක්‍රිස්ටි ඩොස් මහතා (අධ්‍යක්ෂ)	24.09.2024
ඒ.ජේ.එල්. විමලරත්න මහතා (අධ්‍යක්ෂ)	24.09.2024
මහේන්ද්‍ර ගරුසිංහ මහතා (අධ්‍යක්ෂ)	24.09.2024

2023.12.31 වන දිනට සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වේ.

සාලිය වික්‍රමසූරිය මහතා (සභාපති)
කර්නල් (විශ්‍රාමික) එස්.ආර්.පී. රත්නායක මහතා (කළමනාකාර අධ්‍යක්ෂ)
ආර්.එම්.ඩී.කේ රත්නායක මිය
ජේ. මනෝජ් ගමගේ මහතා
ගිහාන් රශාන්ත මහතා
කේ.කේ.එස්.ඒ. පෙරේරා මහතා

මණ්ඩල රැස්වීම්

සාමාන්‍ය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසිකව පවත්වනු ලැබේ. විශේෂත්ව මත කැඳවනු ලබන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අවශ්‍ය විට, අවශ්‍ය පරිදි කැඳවනු ලැබේ. ආයතනික හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරවරු ආරාධනා මත රැස්වීම්වලට සහභාගි වෙති. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් විධිමත් ලෙස න්‍යාය පත්‍රයක් මත පදනම්ව පවත්වනු ලැබේ. අදාළ විස්තීරණ පසුබිම් තොරතුරු රැස්වීම්වලට පෙර ආයතනික කළමනාකාරීත්වය විසින් අධ්‍යක්ෂවරුන්ට සපයනු ලැබේ. සමාලෝචිත වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 13ක් පවත්වන ලදී.

සංස්ථාගත කළමනාකාරීත්වය විසින් අවශ්‍ය සෑම තොරතුරක්ම සපයනු ලබන අතර, අවශ්‍ය විට දී බාහිර විශේෂඥයන්ගේ/ වෘත්තිකයන්ගේ සිට සියලුම අධ්‍යක්ෂ මණ්ඩල අධ්‍යක්ෂවරුන් හෝ උප කමිටු රැස්වීම් සඳහා අවශ්‍ය තොරතුරු සපයනු ලබන්නේ ඵලදායී තීරණ ගැනීමේ අවශ්‍යතාවය මත වේ. සංස්ථාගත කළමනාකාරීත්වය නිවැරදි තොරතුරු ලබා දීම සඳහා වගකිව යුතු අතර අධ්‍යක්ෂ මණ්ඩල අධ්‍යක්ෂවරුන් විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉල්ලා සිටින තොරතුරු නිසි වේලාවට සැපයීමට කටයුතු කළ යුතු වන්නේ තනි තනි වශයෙන් හෝ සාමූහික වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සතු වගකීම් ඵලදායී ලෙස හා කාර්යක්ෂමව සම්පූර්ණ කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට අවකාශය සලසා දිය යුතු බැවිනි.

අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය

විධායක නොවන ස්වාධීනව කටයුතු කරනු ලබන සාමාජිකයන්ගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රධාන වශයෙන් සමන්විත වේ. විධායක නොවන අධ්‍යක්ෂවරු කළමනාකරණ ක්‍රියාවලියේ දී ස්වාධීනව කටයුතු කරන අතර ඔවුන්ගේ ස්වාධීන විනිශ්චයන්හී තීරණවලට ප්‍රමාණාත්මක වශයෙන් බලපෑම් ඇති කරවිය හැකි ව්‍යාපාරවලින් හෝ වෙනත් සබඳතාවයන්ගෙන් තොරව කටයුතු කරනු ලබයි. පිටු අංක 144 ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 29 යටතේ අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාවන් සඳහන් කර ඇත.

මණ්ඩලයේ කාර්යභාරය සහ වගකීම්

සංස්ථාවේ සාර්ථකත්වය හා තිරසාර බව පිළිබඳ සමස්ත වගකීම හා වගවීම එහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත. පාර්ශවකරුවන්ගේ රුචිකත්වයන් ආරක්ෂා කර ගනිමින් සංස්ථාවේ උපාය මාර්ගික දිශාවන් වෙත හා සමස්ත කාර්ය සාධනය වෙත සංස්ථාව රැගෙන යාමට මූලික වශයෙන් ක්‍රියාත්මක වීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන කාර්ය භාරයයි. ඉහත සඳහන් කරන ලද කාර්ය භාරයන් හා වගකීම්වලට අමතරව පහත සඳහන් කර තිබෙන කාර්ය භාරයන් හා වගකීම් ද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්පූර්ණ කළ යුතු වේ.

අධ්‍යක්ෂ	අධ්‍යක්ෂ තනතුරේ ස්වභාවය	පත්වීම් දිනය/ නැවත පත්වීමේ දිනය	සේවයෙන් ඉවත් වූ දිනය	රැස්වීම් සඳහා පැමිණීම
එම්. උවායිස් මොහමඩ් මහතා	සභාපති	06.06.2022	27.09.2023	10/10
එල්.ඊ. සුසන්ත සිල්වා මහතා	කළමනාකාර අධ්‍යක්ෂ	23.07.2022	13.02.2023	1/1
ආර්.එම්.ඩී.කේ. රත්නායක මහත්මිය	අධ්‍යක්ෂ	13.01.2020		13/13
ඩබ්.ඩබ්. ඩී. සුමිත් විජේසිංහ මහතා	අධ්‍යක්ෂ	06.06.2022	22.03.2023	3/3
ආචාර්ය ප්‍රභාත් සමරසිංහ	අධ්‍යක්ෂ	09.04.2021	22.03.2023	3/3
ජේ. මනෝජ් ගමගේ මහතා	අධ්‍යක්ෂ	12.12.2022		13/13
අද්මිරාල් ආර් සී විජේගුණරත්න මහතා	කළමනාකාර අධ්‍යක්ෂ	14.02.2023	26.07.2023	5/6
නිලංක ජයවර්ධන මහතා	අධ්‍යක්ෂ	23.03.2023	25.09.2023	4/6
ඩබ්ලිව්.එම්. ගිහාන් රෂාන්ත මහතා	අධ්‍යක්ෂ	23.03.2023		9/9
රුක්මාල් රත්නවීර මහතා	අධ්‍යක්ෂ	23.03.2023		5/9
සී.ජයසූරිය මහතා	නිරීක්ෂක	12.04.2023	15.10.2023	4/5
කර්නල් (විශ්‍රාමික) එස්.ආර්.පී. රත්නායක	කළමනාකාර අධ්‍යක්ෂ	27.07.2023		4/4
සාලිය වික්‍රමසුරි මහතා	සභාපති	05.10.2023		3/3
කේ.කේ.එස්.ඒ. පෙරේරා මහතා	නිරීක්ෂක	16.10.2023		2/3

මණ්ඩලයේ කාර්යභාරය සහ වගකීම්

- **සංස්ථාවේ උපාය මාර්ගික සැලැස්ම තුළින් උපාය මාර්ගික දිශාවන් නිර්මාණය කිරීම.**
- **ප්‍රධාන කාර්ය සාධන දර්ශක නිවැරදිව ක්‍රියාත්මක කරන බවට සහතික වීම.**
- **මෙහෙයුම් කාර්ය සාධනය හා මූල්‍ය ප්‍රතිඵල අභිප්‍රේක්ෂණයවන පරිදි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ උපාය මාර්ගයන් සාක්ෂාත් කර ගැනීම සඳහා වගවීම.**
- **ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ආයතනික පාලන රාමුවේ භාරකරු ලෙස කටයුතු කිරීම.**
- **අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනය හා අනුකූලතාවය සඳහා පද්ධති ස්ථාපනය කිරීම.**
- **මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදයන්, පාලන පද්ධතිය, අවදානම් කළමනාකරණය හා මෙහෙයුම් පාලනය පිළිබඳ විශ්වාසය සහතික කිරීම.**
- **ව්‍යාපාරික වපසරය තුළ නව්‍යකරණයන් සඳහා ආයතනිකමය සහයෝගය ලබා දීම.**
- **ව්‍යවස්ථායික හා නියාමන අවශ්‍යතාවන් සමඟ අනුගත වීම.**
- **මූලික ක්‍රියාවලීන් හා ක්‍රියා පටිපාටීන් නිසියාකාරව ලේඛනගත කරමින් කාලානුරූපිව යාවත්කාලීන කිරීමට සහතික වීම.**
- **අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු කමිටු පත් කිරීම හා ඒවායේ නිසි ක්‍රියාකාරීත්වය සහතික කිරීම.**

පවරන ලද කාර්ය භාරය හෝ වගකීම ඉටු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් විසින් තම බලතල හෝ රාජකාරි අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු කමිටුවක් වෙත හෝ ඕනෑම අධ්‍යක්ෂවරයෙකු වෙත හෝ සේවකයෙකු වෙත පැවරීම සිදු කළ හැකිය. ප්‍රතිපත්ති සම්පාදනය කිරීමෙන් හා ක්‍රියාත්මක කිරීමෙන් සංස්ථාවේ අභ්‍යන්තර පාලනය තුළ ඵලදායී පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට එහි අධ්‍යක්ෂ මණ්ඩලය සියලුම උත්සාහයන් දරයි. එමෙන්ම මෙහෙයුම්කරණ හා වාර්තාකරණ පරිසරයක් තුළ දී ඒවායේ ඵලදායී ක්‍රියාකාරිත්වය ද සහතික කරනු ලබයි. සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීමට ඉඩ ප්‍රස්ථාව සලසා දෙමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් විසින් අභ්‍යන්තර හා බාහිර විගණකවරුන්, සංස්ථාවේ සියලුම සාමාජිකයන් හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව කණ්ඩායම සමඟ සෘජුව ම සන්නිවේදනය කරනු ලබයි. එමඟින් ඵලදායී හා කාර්යක්ෂම සම්පත් වෙන් කිරීම් සිදු කිරීමට හැකිවනු ඇත.

වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, වාර්ෂික අයවැය, ආයතනික සැලැස්ම, වාර්ෂික වාර්තාව, ක්‍රියාකාරී සැලැස්ම හා මූල්‍ය කාර්ය සාධනය ක්‍රමිකව සමාලෝචනය කිරීමට අනුමැතිය ලබා දීම සඳහා ද අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම් දැරිය යුතු වේ. එමෙන්ම, ප්‍රධාන පත්වීම්, කාර්ය මණ්ඩල උසස් වීම්, ප්‍රධාන ප්‍රාග්ධන ආයෝජන, ණය ගැනීම් හා පාරිභෝගිකයන්ට ණය පහසුකම් සලසා දීම සඳහා ද අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දෙනු ඇත.

සභාපතිවරයාගේ භූමිකාව

සංසංස්ථාවේ තිරසාර සංවර්ධනය සඳහා දායක වීම හා සියලුම අධ්‍යක්ෂවරුන් ඵලදායී හා කාර්යක්ෂම වශයෙන් තම වගකීම් ඉටු කිරීමට තනි තනි වශයෙන් හා සාමූහික වශයෙන් තීරණ ගැනීමේ ක්‍රියාවලි සඳහා ඵලදායී ලෙස තම දායකත්වය ලබා දෙන බවට සහතික වීම සඳහා නායකත්වය ලබා දීම සංස්ථාවේ සභාපතිවරයාගේ භූමිකාවයි.

කළමනාකාර අධ්‍යක්ෂ භූමිකාව

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දෙන තීරණ කළමනාකාර අධ්‍යක්ෂවරයා ක්‍රියාත්මක කරයි. සංස්ථාවේ කළමනාකරණය භාරව සිටින්නේ කළමනාකාර අධ්‍යක්ෂවරයායි. ඔහු අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකාරිත්වය අතර සබඳතා ඇති කිරීමට කටයුතු කරයි. සංස්ථාව ඵලදායී ලෙස හා කාර්යක්ෂම අයුරින් ක්‍රියාත්මක වන බව තහවුරු කිරීම සඳහා සංස්ථාවේ සියලුම මෙහෙයුම් අභිප්‍රේක්ෂණය කිරීම කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ භූමිකාවයි.

කළමනාකාර අධ්‍යක්ෂ භූමිකාව

- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්මිත අරමුණු හා මූලික කාර්ය සාධන දර්ශක වෙත ළඟා වීමට සහාය ලබා දිය හැකි ක්‍රමාණුකූල උපායශ්‍රිලී මෙහෙයුම් සැලසුම් සංවර්ධනය කිරීම.
- උපාය මාර්ගික දිශාවන් ක්‍රියාත්මක කිරීම සඳහා යහපත් අභ්‍යන්තර පරිසරයක් තහවුරු කිරීම.
- ආපදා පරීක්ෂා කිරීම හා කළමනාකරණය අඛණ්ඩව මෙහෙය වීම.
- සංස්ථාව තුළ ඉගෙනුම් හා නව්‍යකරණ පරිසරයක් ඇති කිරීම.
- ව්‍යාපාර ක්‍රියාකාරිත්වයේ හා ප්‍රතිකාර්මික ක්‍රියාවන්වල වෙනස්වීම් සන්නිවේදනය කිරීම.
- ඵලදායී ලෙස තොරතුරු ගලා යෑම සඳහා සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකාරිත්වය අතර සන්නිවේදන සබඳතා ගොඩ නැංවීම.
- සංස්ථාවේ මෙහෙවර හා අරමුණු කරා ළඟා වීම මෙන්ම අදාළ සියලුම ව්‍යවස්ථාපිත හා අනෙකුත් රෙගුලාසි සමඟ අනුකූල වීමට සුදුසු ප්‍රතිපත්ති සංවර්ධනය කරන බවට සහතික වීම.

සභාපතිවරයාගේ භූමිකාවන්

- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මෙහෙය වීම හා අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියා පටිපාටීන් නිසියාකාරව ක්‍රියාත්මක වන බව සහතික කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ක්‍රමානුකූලව පවත්වන බවට සහතික වීම.
- ඵලදායී තීරණ ගැනීම සඳහා ප්‍රමාණාත්මක තොරතුරු අධ්‍යක්ෂවරුන් වෙත ඉදිරිපත් කිරීම.
- නිසි වාර්තා පවත්වාගෙන යාම.
- සාමාජිකයන් සතු විවිධ අදහස් ඉදිරිපත් කිරීමට පහසුකම් සැලසීම හා දිරිමත් කිරීම.
- සාකච්ඡා සඳහා සියලුම අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වය සහතික කිරීම.
- අදාළ සියලු නීති හා රෙගුලාසි වෙත අනුගත වීම සහතික කිරීම.

අධ්‍යක්ෂකගේ වේතනය

මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛවලට අනුකූලව සභාපතිගේ, කළමනාකාර අධ්‍යක්ෂගේ හා අධ්‍යක්ෂවරුන්ගේ වැටුප්/ වේතන තීරණය කිරීම හා ගෙවීම් කිරීම සිදු කරනු ලැබේ. පිටු අංක 144හි සඳහන් කර තිබෙන මූල්‍ය ප්‍රකාශනවල සටහන 29 යටතේ කළමනාකාරිත්වය සඳහා ගෙවන ලද වැටුප් හා වේතන ඉදිරිපත් කර ඇත.

අනු කමිටු

අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරු විසින් අනු කමිටු පත් කර තිබෙන්නේ විශේෂ කාර්යභාරයක දී අධ්‍යක්ෂ මණ්ඩලයට ඔවුන්ගේ වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා තම දායකත්වය ලබා දීමේ අරමුණෙනි. අධ්‍යක්ෂ මණ්ඩලය සතු වගකීම් කිහිපයක් ඉටු කිරීමේ අරමුණින් විගණන හා කළමනාකරණ කමිටුව මෙන්ම අවදානම් කළමනාකරණ කමිටුව පත් කර ඇත.

අනු කමිටුව	ආවරණය වන කාර්යයන්
විගණන සහ කළමනාකරණ කමිටුව	මූල්‍ය පද්ධතිය සහ වාර්තාකරණය අභ්‍යන්තර විගණනය සහ බාහිර විගණනය අභ්‍යන්තර පාලන
අවදානම් කළමනාකරණ කමිටුව	අවදානම් හඳුනාගැනීම අවදානම් කළමනාකරණය උපාය මාර්ග සංවර්ධනය

රටේ ඉන්ධන අවශ්‍යතාවය සහතික කිරීම සඳහා එයට අදාළ අනෙකුත් පාර්ශවයන් සමඟ සම්බන්ධීකරණය කිරීම සඳහා තොග සමාලෝචන කමිටුව පත් කර ඇත. මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද නිර්ණායකවලට අනුකූලව අදාළ අධිකාර තත්වයන් සහිතව ප්‍රසම්පාදන කමිටු ස්ථාපනය කර තිබෙනුයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය විනිවිදභාවයකින් සිදු කිරීමේ අරමුණිනි.

විගණන සහ කළමනාකරණ කමිටුව

අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වගවීමකින් යුක්තව විගණන හා කළමනාකරණ කමිටුව කළමනාකාරිත්වයෙන් ස්වායත්ත වූ භූමිකාවක කාර්යභාරය ඉටු කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි විගණන හා කළමනාකරණ කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් සමන්විත වේ. මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 88 හා 89 තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ සංයුතිය, පවත්වන ලද රැස්වීම් ප්‍රමාණය, එහි කාර්ය භාරය හා රැස්වීම් සඳහා සහභාගිත්වය විස්තරාත්මකව සඳහන් කර ඇත.

අවදානම් කළමනාකරණ කමිටුව

අවදානම් කළමනාකරණ කමිටුව කළමනාකාරිත්වයෙන් ස්වායත්තව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වගවීමෙන් තම කාර්ය භාරය ඉටු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි අවදානම් කළමනාකරණ කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරු දෙදෙනෙකුගෙන් සමන්විත වේ. සංස්ථාව මේ වන විට නිරාවරණය වී ඇති අවදානම් හා ඉදිරි අනාගතයේ දී නිරාවරණය විය හැකි අවදානම් කළමනාකරණය කිරීම සඳහා මෙම කමිටුව ස්ථාපනය කරන ලද්දේ වර්ෂයේ අග භාගයේදී ය.

තොග සමාලෝචන කමිටුව

වත්මන් තොග තත්වය විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව ඉදිරි මාස තුන සඳහා තෙල් තොග අවශ්‍යතාවය තක්සේරු කිරීම තොග සමාලෝචන කමිටුව විසින් සිදු කරනු ලබයි. මෙම කමිටුව ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම(CPSTL), ලංකා ඉන්දියන් ඔයිල් සමාගම(LANKA IOC), සිනොපෙක්(Sinopec) හා ලංකා විදුලි බල මණ්ඩලයේ (CEB)නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන් යුතුව සතිපතා රැස් වේ. ආනයනය කිරීමට හා නැව් ගත කිරීමට අවශ්‍ය ප්‍රමාණයන් සැලසුම් කරනු ලබන්නේ රට තුළ පුරෝකථනය කර ඇති ඉල්ලුම, පිරිපහදු නිෂ්පාදන හැකියාවන් හා ගබඩා කිරීමේ ධාරිතාව පිළිබඳ අවධානය යොමු කිරීමෙන් අනතුරුවය. මෙම කමිටුව මඟින් ජාතියට අඛණ්ඩව ඉන්ධන සැපයීම සහතික කරනු ලබයි.

ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණික ඇගයීම් කමිටුව

රජයේ ආයතන සඳහා නිෂ්පාදන, භාණ්ඩ, සේවා හා වැඩ මිලදී ගැනීමට ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශවලට අනුව, වාර්ෂිකව හෝ භාණ්ඩ, සේවා හා වැඩ ප්‍රසම්පාදනය කිරීමට අවශ්‍ය වූ විට මෙම ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටු පිහිටුවනු ලැබේ.

විනිවිදභාවය තහවුරු කිරීමට, ප්‍රමාදයන් අවම කිරීමට හා සංස්ථාව වෙත මූල්‍යමය වශයෙන් වඩාත් වාසිදායක හා ගුණාත්මක වශයෙන් උසස් සේවා හා සැපයුම් ළඟා කර ගැනීමේ අරමුණින් ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය විසින් නිකුත් කර තිබෙන මාර්ගෝපදේශවලට අනුකූලව ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටු ක්‍රියාත්මක වේ. මිලදී ගැනීම්වල තාක්ෂණික අංශ කෙරෙහි අවධානය තාක්ෂණික කමිටුව විසින් යොමු කරන අතර මිලදී ගැනීම්වල අනෙකුත් අංශයන් පිළිබඳව ප්‍රසම්පාදන කමිටුව විසින් අවධානය යොමු කරනු ලබයි. මිලදී ගැනීමේ වටිනාකම මත ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුව, කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව හා ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව ක්‍රියාත්මක වේ.

පාලන සමාගම සමඟ පවත්වනු ලබන සබඳතා

සංස්ථාවේ සියලුම පාර්ශ්වයන් සමඟ පවත්වාගෙන යනු ලබන මිත්‍රශීලී හා අර්ථවත් සබඳතාවය මත සංස්ථාවේ අඛණ්ඩත්වය පවතින අතර සංස්ථාව හා එහි පාර්ශවකරුවන් අතර අන්‍යෝන්‍ය අවබෝධය වර්ධනය කිරීමේ වටිනාකම සංස්ථාව විසින් හඳුනා ගෙන තිබේ. අධ්‍යක්ෂවරුන්ගේ මතය අනුව සංස්ථාවේ තීරණ ගැනීම හා මෙහෙය වීම ශ්‍රී ලංකා රජයට හිමි අධිකාරියකි. සංස්ථාවේ මෙහෙයුම් කටයුතු කළමනාකරණය කිරීම සඳහා බලශක්ති අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය හා ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සංස්ථාව සමීප සබඳතාවක් පවත්වාගෙන යනු ලබයි. සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂ රජය සමඟ ගනුදෙනු කරනු ලබන ප්‍රධාන නිලධාරීන් වේ. එවැනි සන්නිවේදන වාචිකව හා ලිඛිතව සිදු කරනු ලබයි.

අභ්‍යන්තර පාලන

අභ්‍යන්තර පාලන මෙහෙයුම් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට හා දීඝ්‍ර කාලීන ශක්‍යතාවයන් පවත්වාගෙන යාම සඳහා සංස්ථාව වෙත අභ්‍යන්තර පාලන පද්ධතියක් අවශ්‍ය වේ. සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීම හා වාර්තාකරණය නිවැරදිව පවත්වාගෙන යාම තහවුරු කිරීම මෙන්ම උපාය මාර්ගික තීරණ ගැනීම පහසු කිරීම සඳහා නිවැරදි තොරතුරු නිසි වේලාවට ඉදිරිපත් කිරීම මෙම පද්ධතියේ අරමුණ වේ.

ව්‍යාපාරයේ දැනට ක්‍රියාත්මක වන හා තිරසාර ක්‍රියාකාරිත්වය උදෙසා අවශ්‍ය වන මූල්‍ය මෙහෙයුම් හා අනුකූලතා පාලන මෙන්ම ආපදා කළමනාකරණය ද අභ්‍යන්තර පාලන පද්ධතිය මඟින් ආවරණය කරනු ලැබේ. සංස්ථාව තුළ පවතින අවදානම් සහිත තත්වයන් එමඟින් ඵලදායී ලෙස හඳුනා ගන්නා අතර එම අවදානම් අවම කිරීමට සුදුසු මිණුම් ක්‍රියාත්මක කිරීම තුළින් එම අවදානම් තත්වයන් පාලන මට්ටම්වල දී කළමනාකරණය කරනු ලබන බවට සහතික වේ. සංස්ථාවේ දැක්ම හා මෙහෙවර ඵලදායී ලෙස සාක්ෂාත් කර ගැනීමට අභ්‍යන්තර පාලන පද්ධතිය ඉඩ සලසා දෙනු ඇත. එමෙන්ම, එමඟින් මූල්‍ය ප්‍රකාශයන් නිවැරදි බවටත් සාවද්‍ය විශ්ලේෂණවලින් තොර බවටත් සාධාරණ මට්ටමින් සහතික වේ.

අභ්‍යන්තර විගණනය

විගණන හා කළමනාකරණ කමිටුවේ සමාලෝචනයට ලක් වීමෙන් අනතුරුව එහි අනුමතය ලබා ගන්නා අභ්‍යන්තර විගණනය, විගණන සැලසුම් සකස් කරනු ලබයි. අභ්‍යන්තර පාලන ඇගයීමට, අවදානම් තත්වයන් තක්සේරු කිරීමට හා අවදානම් හඳුනා ගැනීමට මෙම සැලසුම් නිර්මාණය වේ. එමෙන්ම, ගනුදෙනුවල සම්පූර්ණත්වය තහවුරු කිරීම ද එම සැලසුම්වල අරමුණු වේ. විශේෂ කාරණා පිළිබඳව කළමනාකාරිත්වයට නීරීක්ෂණ හා නිර්දේශ ලබා දීමේ අරමුණින් අභ්‍යන්තර විගණන කාර්යයන්ට විශේෂ විගණන පවරනු ලැබේ.

අභ්‍යන්තර විගණනයට පවරනු ලබන වගකීම් නිවැරදිව ඉටු කිරීමට අවකාශය සලසා දෙමින් යහ පාලන ක්‍රියාකාරිත්වයකට මග පෙන්වමින් අභ්‍යන්තර විගණන ක්‍රියාකාරිත්වය පාලනය කරනු ලබන්නේ වෘත්තීය මට්ටමින් සුදුසුකම් ලද සේවක මඩුල්ලක් විසිනි.

අභ්‍යන්තර විගණනයේ කාර්යභාරය සහ වගකීම්

♦ අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත් බව සමාලෝචනය කිරීම සහ නිවැරදි කිරීම හා දුර්වලතා නිවැරදි කර ගැනීම සඳහා සන්නිවේදනය කිරීම.
♦ විගණකාධිපති වාර්තාව, එහි නිවැරදි කිරීම් හා වාර්තාවේ සොයා ගැනීම්වල වර්තමාන තත්වය සාකච්ඡා කිරීම.
♦ අනුමත විගණන සැලැස්මට අනුව විගණන ක්‍රියාත්මක කිරීම.
♦ කළමනාකාරීත්වය හෝ විගණන හා කළමනාකරණ කමිටුව විසින් යොමු කරන ලද විශේෂ විමර්ශන විගණනයන් ක්‍රියාත්මක කිරීම.
♦ ක්‍රියාවලියේ සංවර්ධනය හඳුනා ගැනීමට හා එහි කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට කළමනාකරණ විගණන පවත්වා ගෙන යාම.

ආයතනික කළමනාකරණය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කලින් කලට අනුමත කරන ලද උපාය මාර්ගික මග පෙන්වීම්, සකස් කරන ලද ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි මත සංස්ථාවේ නිත්‍ය කටයුතු කළමනාකරණය කිරීමට සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂ කටයුතු කරති. ඔවුන් මෙහෙයුම් අභිප්‍රේක්ෂණය කරන අතර විචල්‍යයන් අධීක්ෂණය කරමින් උපාය මාර්ගයන්ගේ දිශානතියන් නැවත සකස් කිරීම සඳහා නිවැරදි පියවර ගනු ලබයි.

පහසු පාලන ක්‍රමවේදයක අරමුණ උදෙසා සංස්ථාවේ මෙහෙයුම් හා ප්‍රධාන පරිපාලනය කාණ්ඩ දෙකකට බෙදා ඇත. එම කාණ්ඩ දෙක පිරිපහදු මෙහෙයුම් හා ප්‍රාදේශීය කාර්යාල ඇතුළුව ප්‍රධාන කාර්යාල මෙහෙයුම් වේ.

පිරිපහදු කළමනාකරු විසින් මෙහෙයුම් ක්‍රියාත්මක කරනු ලබන අතර විදුලිය හා උපකරණ, නිෂ්පාදන හා මෙහෙයුම්, නඩත්තු හා ව්‍යාපෘති සහ තාක්ෂණික සේවා වැනි විවිධ මූලික තාක්ෂණික ක්ෂේත්‍රවල නියෝජ්‍ය පිරිපහදු කළමනාකරුවන්ගේ සහාය හිමි වේ.

ප්‍රධාන කාර්යාලයේ කාර්ය කාර්යංශ කිහිපයකට කාණ්ඩ කර ඇත. එක් එක් කාර්යංශයන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරවරයෙකු හෝ සංස්ථාවේ දෛනික ක්‍රියාකාරකම්වල දී සභාපතිට හා කළමනාකාර අධ්‍යක්ෂට සහාය වන කළමනාකරුවෙකු විසින් මෙහෙයවනු ලබයි. පිරිපහදුව හා ප්‍රධාන කාර්යාලය යන අංශ දෙකෙහිම ආයතනික කළමනාකරුවන් ඔවුන්ගේ ක්‍රියාකාරී ක්ෂේත්‍ර තුළ දක්ෂයින් හා විශේෂඥයින් වන අතර අදාළ ව්‍යාත්තීය සුදුසුකම් හා අධ්‍යාපන සුදුසුකම්වලින් පොහොසත් වේ. මෙම වාර්තාවේ පිටු අංක 26 සිට 28 දක්වා සංස්ථායික කළමනාකාරීත්වයේ සාරාංශගත සුදුසුකම් ඉදිරිපත් කර ඇත.

බැඳියාව

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සියලුම අදාළ නීති හා රෙගුලාසිවලට අනුගත වන බව සහතික කිරීමට අභ්‍යන්තර පාලන පද්ධති හා ක්‍රියාකාරීත්වය මෙන්ම ක්‍රියා පටිපාටීන් නිවැරදිව ක්‍රියාත්මක කරන බවට සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වනු ඇත. අදාළ නීති හා රෙගුලාසි සමඟ අනුගත වන බවට තහවුරු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තනි තනි වශයෙන් හෝ සාමූහික වශයෙන් තම වගකීම් මනාව ඉටු කරනු ලබයි. අධ්‍යක්ෂවරුන්ගෙන් වාර්ෂිකව ප්‍රකාශයන් සටහන් කර ගනු ලබන්නේ තීරණ ගැනීමේ ක්‍රියාවලියේ ඵලදායීත්වයට හානි පමුණුවන එක් එක් පුද්ගලයාගේ රුචිකත්වයන් පිළිබඳව පවතින ගැටුම් මග හරවා ගැනීම සඳහා ය.

සියලුම අධ්‍යක්ෂවරුන් හා සේවකයන් අවංකව හා සාදාචාරාත්මක ලෙස කටයුතු කරනු ලබයි. එමඟින් ඔවුන්ගේ තනතුරු භාවිත කරමින් රහසිගත තොරතුරු නිරාවරණය කිරීමෙන් ඔවුන් වැළකී සිටින බව තහවුරු වේ.

අනුකූල වීම

තම සියලු මෙහෙයුම් හා ගනුදෙනුවල විනිවිදභාවය පවත්වාගෙන යාමට ඛනිජ තෙල් නීතිගත සංස්ථාව කැප වී සිටී. සංස්ථාවේ සාර්ථකත්වයට හා තිරසාරත්වයට අදාළ සියලුම නීති සම්පාදනය, රෙගුලාසි, ප්‍රමිති, යහපත් පරිචය හා කේතයන්ට අනුකූල වීම අත්‍යවශ්‍ය වේ.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ යහපත් පරිචයන් සංග්‍රහයේ ප්‍රකාශයට පත් කරන ලද මාර්ගෝපදේශ හා මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද යහ පාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ නිර්ණායක අනුව සංස්ථාවේ ආයතනික පාලනය ව්‍යුහගත කර ඇත. ශක්තිමත් ආයතනික යහපාලන ක්‍රියාවලි සහතික කරමින් මෙම අවශ්‍යතා සමඟින් අනුගත වීමට අධ්‍යක්ෂ මණ්ඩලය කැප වී සිටී. 1971 අංක 38 දරන මුදල් පනතට හා 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතට අනුව සංස්ථාවේ දෛනික මෙහෙයුම්වලට අභ්‍යන්තර පාලන පද්ධතිය ඒකාබද්ධ වී ඇත. විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟින් වාර්ෂිකව ප්‍රකාශනයට පත් කරන අතර පාර්ලිමේන්තු අනුමැතියට ලක් වේ.

විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

විගණන හා කළමනාකරණ කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු කමිටුවකි. සුදුසුකම් හා පළපුරුද්ද සහිත විධායක නොවන අධ්‍යක්ෂවරුන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන හා කළමනාකරණ කමිටුවට පත් කරනු ලබන අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කමිටුව වාර්තා කරනු ලබයි. කමිටුවේ සොයා ගැනීම් හා නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම විගණන හා කළමනාකරණ කමිටුවේ ප්‍රධාන වගකීම වන අතර එමඟින් මූල්‍ය වාර්තාවල හා විගණන ක්‍රියාපටිපාටිවල නිරවද්‍යතාවය මෙන්ම යහපත් අභ්‍යන්තර පාලන හා අවදානම් කළමනාකරණ පද්ධති යහපත්ව පවත්වා ගෙන යාම ද තහවුරු කරනු ඇත. කමිටුව සතු වගකීම් පහත සඳහන් කර ඇති පරිදි වේ.

- මූල්‍ය වාර්තාකරණ පද්ධතියේ හෙලිදරව් කිරීම්වල ප්‍රමාණවත් බව හා වාර්තාකරණය ප්‍රමිතීන්ට අනුකූලව සිදුවන බව සහතික කිරීම සඳහා මූල්‍ය වාර්තාකරණ පද්ධතිය අධීක්ෂණය කිරීම.
- ආයතනික ක්‍රියාකාරකම්වල අනුකූලතාවය අධීක්ෂණය කිරීම.
- මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාවය තහවුරු කිරීම හා එහි අන්තර්ගත වී තිබෙන සැලකිය යුතු වාර්තාගත විනිශ්චයන් අධීක්ෂණය කිරීම.
- අභ්‍යන්තර විගණන කාර්යයේ ක්‍රියාකාරකම් හා සඵලතාවය පරීක්ෂා කිරීම.
- අභ්‍යන්තර පාලන හා අවදානම් කළමනාකරණ පද්ධතිවල ඵලදායීතාවය පරීක්ෂා කිරීම.
- සංස්ථාව නිරාවරණය වී තිබෙන අවදානම් හා එම අවදානම් අවම කිරීමට ගෙන තිබෙන පියවර හා එම පියවරවල ඵලදායීතාවය අධ්‍යයනය කිරීම.
- වාර්ෂික විගණන සැලැස්ම සාකච්ඡා කිරීම හා අනුමත කිරීම.
- විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණන වාර්තාව සාකච්ඡා කිරීම.

කමිටුවේ සංයුතිය

විගණන හා කළමනාකරණ කමිටුව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. සමාලෝචිත වර්ෂය තුළ දී සංස්ථාව කමිටු රැස්වීම් හතරක් (04) පවත්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි කමිටු සාමාජිකයන් ලෙස විධායක නොවන අධ්‍යක්ෂවරුන් පත් කර ඇත.

ආර්.එම්.ඩී.කේ.රත්නායක මහත්මිය (සභාපති), ආචාර්ය ප්‍රභාත් සමරසිංහ (සාමාජික) හා සුමිත් විජේසිංහ මහතා (සාමාජික) යන මහත්ම මහත්මීන් 100 වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම සඳහා කමිටු සාමාජිකයන් වශයෙන් පත් කරන ලදී. 101, 102 සහ 103 යන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ කමිටු සාමාජිකත්වය දරන ලද්දේ ආර්.එම්.ඩී.කේ.රත්නායක මහත්මිය (සභාපති) හා මනෝජ් ගමගේ මහතා (සාමාජික) සහ ගිහාන් රශාන්ත මහතා (සාමාජික) යන මහත්ම මහත්මීන්ය. මූල්‍ය, මෙහෙයුම් සහ පාලනය පිළිබඳ ඔවුන් සතු පුද්ගල මෙන්ම සාමූහික ප්‍රවීණත්වය හා අත්දැකීම් ඔවුන්ගේ යුතුකම් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා ප්‍රයෝජනවත් විය.

රාජ්‍ය වානිජ ව්‍යවසායන්හී විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම සම්බන්ධව නිකුත් කර තිබෙන භාණ්ඩාගාර චක්‍රලේඛයේ ඉදිරිපත් කර ඇති වගකීම්, අධිකාරීන් හා විශේෂිත රාජකාරීන් ආවරණය වන පරිදි කමිටුවේ විගණන ප්‍රඥප්තිය සකස් කර ඇත.

රැස්වීම්

සමාලෝචිත වර්ෂය තුළ දී, ඉහත සඳහන් කළ පරිදි ඔවුන් වෙත පවරා තිබෙන වගකීම් ඉටු කිරීම පිළිබඳව සමාලෝචනය කිරීමට විගණන කමිටු රැස්වීම් හතරක් (04ක්) පවත්වා ඇත.

දිනය	සහභාගී වූ සාමාජිකයන්	සහභාගීත්වය
14.03.23	ආර්.එම්.ඩී.කේ.රත්නායක මහත්මිය, ආචාර්ය ප්‍රභාත් සමරසිංහ හා සුමිත් විජේසිංහ මහතා	3/3
27.06.23	ආර්.එම්.ඩී.කේ. රත්නායක මහත්මිය මනෝජ් ගමගේ මහතා, ගිහාන් රශාන්ත මහතා	3/3
27.09.23	ආර්.එම්.ඩී.කේ. රත්නායක මහත්මිය මනෝජ් ගමගේ මහතා, ගිහාන් රශාන්ත මහතා	3/3
19.12.23	ආර්.එම්.ඩී.කේ. රත්නායක මහත්මිය මනෝජ් ගමගේ මහතා, ගිහාන් රශාන්ත මහතා	3/3

කමිටුව විසින් ඉටු කරන ලද කාර්යයන්

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අනුගමනය කරන ලද මූල්‍ය වාර්තාකරණ පද්ධතිය කමිටුව විසින් සමාලෝචනය කරන ලදී.

මෙම කමිටුව සතු තවත් එක් වගකීමක් වන්නේ, අනාවරණය කිරීම් හා අනෙකුත් නියාමන අවශ්‍යතා ඇතුළුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට එස්.එල්.එෆ්.ආර්.එස්/ එල්.කේ.ඒ.එස්. වැනි මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් ගළපමින් ඒවා ඊට අනුකූලව සකස් කර තිබෙන බවට සහතික වීමයි. සංස්ථාවේ අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණවත්බව, කාලය හා ඉදිරිපත් කිරීම ද කමිටුව විසින් අධීක්ෂණය කරනු ලැබේ.

ඉහත සඳහන් කරන ලද ක්‍රියාකාරකම්වලට අමතරව, පහත සඳහන් කාර්ය ද කමිටුව විසින් සම්පූර්ණ කරන ලද්දේ සිය වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීමේ අරමුණෙනි.

- 2022 දෙසැම්බර් 31 න් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තා හා වර්තමාන තත්වය සාකච්ඡා කරන ලදී.
- 2023 වර්ෂයේ දී ඉදිරිපත් කරන ලද විගණන වාර්තාවල සාරාංශය අධීක්ෂණය කරන ලදී.
- සංස්ථාවේ අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය හා 2024 අභ්‍යන්තර විගණන සැලැස්ම සමාලෝචනය කර අනුමත කරන ලදී.
- ප්‍රධාන කාර්ය සාධන දර්ශකයන් අධීක්ෂණය කරන ලදී.
- අවදානම් විශ්ලේෂණය හා එම අවදානම් අවම කර ගැනීමේ පියවර සාකච්ඡා කරන ලදී.
- වර්ෂය තුළ දී ඇති වූ වෙනත් මෙහෙයුම් හා අනුකූලතා ගැටලු සමාලෝචනය කරන ලදී.

අභ්‍යන්තර විගණන කාර්යය

අභ්‍යන්තර විගණන කාර්ය භාරය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට සාධාරණ වූ සහතික වීමක් පෙන්නුම් කිරීම සඳහා අභ්‍යන්තර පාලනවල ඵලදායීතාවය තක්සේරු කිරීම, අවදානම් පැහැකඩයන් හඳුනා ගැනීම හා ගනුදෙනුවල නිරවද්‍යතාවය හා සම්පූර්ණත්වය තහවුරු කිරීම අභ්‍යන්තර විගණනය විසින් සිදු කළ යුතු කාර්ය භාරය වේ.

වර්ෂය ආරම්භයේ දී අභ්‍යන්තර විගණනය විසින් සකස් කරන ලද විගණන සැලැස්ම, විගණන හා කළමනාකාර කමිටුව විසින් අනුමත කරනු ලබයි. එමෙන්ම සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා එහි අභ්‍යන්තර පාලන පද්ධතිය ක්‍රියාත්මක වන බව සහතික කිරීමට විගණන වාර්තාවල සාරාංශය කමිටුව විසින් අධීක්ෂණය කරනු ලබයි.

ඉහත සඳහන් කරන ලද කාර්යයන් හැරුණු විට, අතපසුවීම් පිළිබඳ අධීක්ෂණ හා යෝජනා ලබා දීම සඳහා කළමනාකාරීත්වය විසින් මෙහෙයවනු ලබන විශේෂ විමර්ශන ක්‍රියාත්මක කිරීම ද අභ්‍යන්තර විගණනයේ කාර්යයකි. විගණන නිර්දේශයන් ක්‍රියාත්මක වන බවට සහතික වීම සඳහා නිත්‍ය සමාලෝචනයන් සැලසුම් කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය තුළ දී අභ්‍යන්තර විගණනය විසින් සිදු කරන ලද කාර්යයන්වල සාරාංශය පහත සඳහන් පරිදි වේ.

- නිවැරදි කිරීම් අරමුණු කර ගනිමින් අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත් බව සහ සන්නිවේදන දුර්වලතා සමාලෝචනය කරන ලදී.
- සභාපතිවරයාට ලැබුණු පැමිණිලි පිළිබඳ විශේෂ විගණන.
- විගණකාධිපති වාර්තාව හා එහි සොයා ගැනීම්වල වර්තමාන තත්වය සාකච්ඡා කරන ලදී.
- අනුමත විගණන සැලැස්මට අනුව විගණන 99 ක් සිදු කරන ලදී.
- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී අභ්‍යන්තර විගණන වාර්තාවන් සාකච්ඡා කරන ලදී.
- ක්‍රියාවලි වැඩි දියුණු කිරීම් හඳුනා ගැනීමට හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට කළමනාකරණ විගණනයන් සිදු කරන ලදි.

නිගමනය

සංස්ථාවේ කටයුතු එහි නියමිත ප්‍රතිපත්තීන් හා ක්‍රියා පටිපාටීන්වලට අනුකූලව කළමනාකරණය කරන බව හා සංස්ථාවේ වත්කම් නිසි ලෙස ගිණුම්ගත කර ප්‍රමාණවත් ලෙසින් සංස්ථාවේ අභ්‍යන්තර පාලන පද්ධතිය සඳහා සාධාරණ සහතිකයක් ලබා දෙන බව විගණන හා කළමනාකරණ කමිටුවේ විශ්වාසය යි.



ආර්. එම්. එස්. පී. එස්. බණ්ඩාර
සභාපති
විගණන සහ කළමනාකරණ කමිටුව

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 32 (3) වගන්තියට අනුකූලව 2023 දෙසැම්බර් 31 දිනට අවසන් වූ වර්ෂය සඳහා සංස්ථාවේ හා එහි සමූහයේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන මෙන්ම සභාපතිතුමාගේ පණිවුඩය, කළමනාකාර අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය, කළමනාකරණ සාකච්ඡාව හා සමාලෝචනය, අගය එකතු කිරීම, ආයතනික යහ පාලනය, විගණන කමිටු වාර්තාව, විගණකාධිපති වාර්තාව හා අනෙකුත් තොරතුරු ඇතුළත් 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය අභිමානයෙන් ඉදිරිපත් කරයි.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව යනු 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත යටතේ ස්ථාපිත වූ රාජ්‍ය ව්‍යාපාරික ආයතනයකි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංස්ථාව කළමනාකරණය කරනු ලැබේ. සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය අංක 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09 ලිපිනයෙහි පිහිටා ඇත.

මෙම වාර්තාවේ අන්තර්ගත වී තිබෙන විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට අනුකූලව (එස්.එල්.එෆ්.ආර්.එස්/එල්.කේ.ඒ.එස්), 1971 අංක 38 දරන මූල්‍ය පනතේ විධිවිධාන හා 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත හා ඒ සඳහා පසුව සිදු කරන ලද සංශෝධන ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ණ අනුදැනීම යටතේ සකස් කර ඉදිරිපත් කරන ලදී.

ප්‍රධාන ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකාව තුළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය, පිරිපහදු කිරීම හා අලෙවි කිරීම සංස්ථාවේ මූලික ක්‍රියාකාරකම් වේ. ඇතැම් ඛනිජ තෙල් නිෂ්පාදන සංස්ථාව විසින් අපනයනය ද කරයි.

අනුබද්ධ සමාගම්

නම	ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL)	ත්‍රිකුණාමල ඛනිජ තෙල් පර්යන්ත පුද්ගලික සමාගම (TPTL)
කොටස	2/3	51%
ප්‍රධාන ක්‍රියාකාරකම්	ඉන්ධන ගබඩා කිරීමේ පහසුකම් හා බෙදා හැරීමේ පහසුකම්, සැපයුම් හා තොරතුරු තාක්ෂණ සේවා ලබා දීම.	ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදනවලට පමණක් සීමා නොවන ව්‍යාපාර ක්‍රියාත්මක කිරීම, සංවර්ධනය කිරීම, භාවිත කිරීම හා ගබඩා පහසුකම් කළමනාකරණය කිරීම, ගබඩා කර ඇති ඛනිජ තෙල් හා ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන ආනයනය, ගබඩා කිරීම, විකිණීම හා අපනයනය කිරීම, අදාළ නීති හා රෙගුලාසිවලින් අවසර ලත් වෙනත් ව්‍යාපාර පවත්වා ගෙන යාම.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හා එම සමූහයේ මූල්‍ය ප්‍රකාශන

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ එහි සමූහයේ මූල්‍ය ප්‍රකාශන 2024 පෙබරවාරි 26 දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

සංස්ථාව විසින් සියලුම ගනුදෙනුවල නිසි ගිණුම් පොත් පවත්වාගෙන යන බවට හා වර්ෂය සඳහා පවතින තත්වය, ලාභ අලාභ පිළිබඳ සත්‍ය මෙන්ම සාධාරණ දැක්මක් ලබා දෙන මූල්‍ය ප්‍රකාශන සකස් කරන බවට සහතික වීමේ වගකීම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරේ.

ඒ අනුව, ඔවුන්ගේ නිරන්තර රැස්වීම් හා විගණන කමිටුව තුළින් මූල්‍ය වාර්තාකරණය සඳහා කළමනාකාරිත්වයේ වගකීම් හඳුනා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කරයි. විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව පිටු අංක 88 සිට 89 දක්වා ඉදිරිපත් කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී හා විස්තීරණ අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපනය කර ඇත. මූල්‍ය, මෙහෙයුම්, අනුකූලතා හා අවදානම් කළමනාකරණය ආවරණය වන පරිදි අභ්‍යන්තර පාලන සමාලෝචනයක් සිදු කර ඇත. ඒවායේ කාර්යක්ෂමතාවය හා ව්‍යාපාර කටයුතු විධිමත්ව පවත්වා ගෙන යාමට මෙන්ම වත්කම් ආරක්ෂා කිරීම සඳහා සාර්ථක ලෙස ක්‍රියා කිරීම පිළිබඳව සාධාරණ සහතික වීමක් ලබා ගැනීමට සමත් වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංස්ථාවේ ආයතනික/ ව්‍යාපාරික සැලැසුම් සමාලෝචනය කර ඇති අතර ඉදිරි කාලය සඳහා ව්‍යාපාර පවත්වා ගෙන යාමට ප්‍රමාණවත් සම්පත් සංස්ථාව සතු බවට සෑහීමකට පත් වෙමින් එහි අඛණ්ඩ පැවැත්ම අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම අඛණ්ඩව සිදු කරනු ඇත.

ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාලෝචිත වර්ෂය තුළදී, 'මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම' පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 මගින් නියම කර ඇති පරිදි, පසුගිය මූල්‍ය වර්ෂයේ සම්මත කරගත් ප්‍රතිපත්තිවලට අනුකූලව, සම්මත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල කිසිදු වෙනසක් සිදු නොවූ අතර ඉහත ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කිරීමේ බලපෑම සහ ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර ඇත.

විගණන වාර්තාව

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණක වාර්තාව පිටු අංක 95 සිට 108 දක්වා දක්වා ඇත.

කාර්ය සාධනය පිළිබඳ සමාලෝචනය

2023 මූල්‍ය වර්ෂය තුළ සංස්ථා කාර්ය සාධනය සහ කටයුතු පිළිබඳ සමාලෝචනයක් සභාපතිවරයාගේ සමාලෝචනය යටතේ පිටු අංක 14 සිට 15 දක්වා පිටු වලද, MD ගේ සමාලෝචනය පිටු අංක 17 සිට 18 දක්වා පිටු වල ද, සංස්ථාවේ කාර්ය සාධනය පිටු අංක 33 සිට 42 දක්වා පිටු වලද ඇතුළත් කර ඇත.

අධ්‍යක්ෂවරු

2023.12.31 දිනට නිලතල දරමින් සිටි අධ්‍යක්ෂවරුන්ගේ නම් පහත සඳහන් කර ඇත.

සාලිය වික්‍රමසූරිය මහතා (සභාපති)
කර්නල් (විශ්‍රාමික) එස්.ආර්.පී. රත්නායක මහතා (කළමනාකාර අධ්‍යක්ෂ)
ආර්.එම්.ඩී.කේ රත්නායක මිය
ජේ. මනෝජ් ගමගේ මහතා
ගිහාන් රශාන්ත මහතා
කේ.කේ.එස්.ඒ. පෙරේරා මහතා

වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලයේ නම්

ඩී.ජේ.ඒ.එස්. ද එස් රාජකරුණා මහතා (සභාපති)
ආචාර්ය මයුර නෙත්තිකුමාරගේ (කළමනාකාර අධ්‍යක්ෂ)
ආර්.එම්.එස්. පී.එස්. බණ්ඩාර මහතා (අධ්‍යක්ෂ/භාණ්ඩාගාර නියෝජිත)
එම්.එම්. ක්‍රිස්ටි ඩොස් මහතා (අධ්‍යක්ෂ)
ඒ.ජේ.එල්. විමලරත්න මහතා (අධ්‍යක්ෂ)
මහේන්ද්‍ර ගරුසිංහ මහතා (අධ්‍යක්ෂ)

රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් හා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලින් සමන්විත අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම් පිළිබඳ විස්තර පිටු අංක 83 සිට 87 දක්වා තිබෙන ආයතනික යහපාලනය පිළිබඳ වාර්තාවේ ඉදිරිපත් කර ඇත.

අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම වාර්ෂික වාර්තාවේ පිටු අංක 84 න් ඉදිරිපත් කර ඇත.

අධ්‍යක්ෂවරුන්ගේ වේතන

වර්ෂය තුළ දී අධ්‍යක්ෂවරුන්ගේ වේතන පහතින් සඳහන් කර ඇත.

	2023 (රු. මිලියන)	2022 (රු. මිලියන)
අධ්‍යක්ෂවරුන්ගේ වේතන	9.702	9.643

කොන්ත්‍රාත්තු පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ බැඳියා

සංස්ථාව සමඟ අධ්‍යක්ෂවරුන්ගේ සෘජු හා වක්‍ර සබඳතාවයන් මූල්‍ය ප්‍රකාශනයේ සටහන 29හි ඉදිරිපත් කර ඇත.

අභ්‍යන්තර පාලන පද්ධතිය

සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඵලදායී හා විස්තීරණ පාලන පද්ධතියක් ස්ථාපනය කර ඇත. අභ්‍යන්තර ක්‍රියා පටිපාටි, අවදානම් විශ්ලේෂණය, අනුකූලතා හා අනෙකුත් පාලන සමාලෝචන ඇගයීමට හා සත්‍යාපනය කිරීමට සුදුසුකම් ලත් වරලත් ගණකාධිකාරීවරයකුගේ ප්‍රධානත්වයෙන් අභ්‍යන්තර කාර්යංශයක් ක්‍රියාත්මක වේ. එහි නිරීක්ෂණයන් විගණන හා කළමනාකරණ කමිටුව වෙත වරින් වර වාර්තා කරනු ලැබේ. එම කාර්යයට අමතරව, මෙමඟින් කළමනාකාරීත්වය වෙත නිරීක්ෂණ ඉදිරිපත් කරන අතර එම නිරීක්ෂණ නිවැරදි කිරීම සඳහා නිර්දේශ ක්‍රියාත්මක කිරීමට හැකියාවක් ලැබෙනු ඇත.

අවදානම් කළමනාකරණය

සංස්ථාව විසින් ඵලදායී අවදානම් කළමනාකරණ රාමුවක් මෙන්ම සංස්ථාව විසින් නිරාවරණය කර ඇති අවදානම් අවම කිරීම සඳහා ප්‍රායෝගික සහ නිවැරදි ක්‍රියාමාර්ග හඳුනා ගැනීම, විශ්ලේෂණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවදානම් කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කර ඇත. සවිස්තරාත්මක උපදෙස්, අවදානම් ඇඟවීම් සහ අවදානම් බලපෑම් පාලනය කිරීමට හෝ අඩු කිරීමට පියවර විස්තර කරන අවදානම් කළමනාකරණ වාර්තාව 77 සිට 82 දක්වා පිටුවල දක්වා ඇත.

මූල්‍ය කාර්ය සාධනය

2023 වර්ෂයේදී, සංස්ථාවේ සියළුම මෙහෙයුම් අංශ හරහා සැලකිය යුතු වැඩිදියුණු වීම් පෙන්නුම් කළ අතර, එහි ඍණාත්මක කොටස් ස්කන්ධය ධනාත්මක අගයකට සාර්ථකව පරිවර්තනය කර ගන්නා ලදී. පිරිපහදුවෙහි තිරසාර ක්‍රියාකාරිත්වය ධනාත්මක ආන්තික උත්පාදනයට දායක වූ අතර එමඟින් ලාභදායිත්වය ඉහළ නැංවුනි. මීට අමතරව, සාමාන්‍ය පෙට්‍රෝලියම් නිෂ්පාදන සඳහා පවතින මිලකරණ යාන්ත්‍රණය සංස්ථාවේ මූල්‍ය කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

තවද, සංස්ථාවෙහි ණය සහ බිල්පත් රජය විසින් බාර ගැනීම සංස්ථාවට සිය මූල්‍ය බර අඩු කිරීමට හේතු වූ අතර, එය වසර සඳහා වූ මූල්‍ය පිරිවැය අඩු කිරීමකට හේතු විය.

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය කාර්ය සාධනයේ සාරාංශය පහත දැක්වේ.

	2023 (රු. මිලියන)	2022 (රු. මිලියන)
ශුද්ධ ආදායම	1,263,603	1,148,801
දළ ලාභය/ (පාඩුව)	162,115	39,849
මෙහෙයුම් ලාභය/ (අලාභය)	89,871	(6,210)
ශුද්ධ ලාභය/ (අලාභය)	120,310	(617,589)
වෙනත් විස්තීරණ ආදායම	(107)	(156)
මුළු විස්තීරණ ආදායම	120,203	(617,746)

දළ ආදායම

	2023 (රු. මිලියන)	2022 (රු. මිලියන)
ප්‍රවාහන	959,301	902,779
බලශක්තිය	181,386	128,383
ගුවන් සේවා	121,519	82,207
කර්මාන්ත	18,799	21,167
ගෘහස්ථ	32,212	18,806
කෘෂිකාර්මික	1,612	290
නැව් තෙල් සැපයුම් හා අපනයනය	-	817
එකතුව	**1,314,829**	**1,154,449**

කර්මාන්ත හැර සියලු අංශ වල ආදායම් වර්ධනයක් දක්නට ලැබුනි. පරිභෝජන සීමාවන් ඉවත් කිරීම සහ ඉන්ධන අඛණ්ඩව සැපයීම මෙම ආදායම වැඩිවීමට දායක වී ඇත. 2022 වසරට සාපේක්ෂව 13.89% ක වර්ධනයක් වාර්තා වී ඇති බව මෙහි ලා සටහන් කළ යුතු වේ.

අංශ කාර්ය සාධනය

- වසරේ මුල් භාගයේ පරිභෝජන සීමාවන් හේතුවෙන් 7% ක ප්‍රමාණාත්මක අඩු වීමක් සිදුවුව ද, ප්‍රවාහන අංශයේ ආදායම 6% ක වැඩිවීමක් අත්විඳින අතර, මූලික වශයෙන් විකුණුම් මිලෙහි උච්චාවචනයන් සංස්ථාවේ සමස්ත ආදායමට ඉහළම දායකත්වයක් ලබා දී ඇත.
- බලශක්ති උත්පාදන අංශයේ විකුණුම් 35% කින් ඉහළ ගොස්, එහි ප්‍රතිඵලයක් ලෙස මෙම භාණ්ඩ සැපයීමේ පිරිවැය සමඟ ගැලපෙන පරිදි ඩීසල්, උදුන් තෙල් සහ නැප්තා සඳහා බලශක්ති නිෂ්පාදනය සඳහා යොදා ගන්නා මිල ගැලපීම් මගින් මෙහෙයවනු ලැබ ආදායම 41% කින් ඉහළ ගොස් ඇත.
- ස්ථාවර ඉන්ධන සැපයුමක් සහතික කිරීම සඳහා කැපවීමත් සමඟ, ගුවන් තෙල් ඉන්ධන අලෙවිය 54% කින් ඉහළ ගොස් ඇති අතර, ආදායම ඊට සමගාමීව 48% කින් වැඩි විය.
- විකුණුම් පරිමාවේ පහත වැටීම, විකුණුම් මිලෙහි පහත වැටීම් ගැලපීම් සමඟ, කාර්මික අංශයෙන් ලද ආදායම 11% කින් අඩුවීම සිදු විය.
- වසර තුළ සංස්ථාව විසින් එහි ඉහළම කෘෂි රසායන අලෙවිය ලබා ගත් අතර එය රු. මිලියන 1,612 ක් විය.

ලාභ

උත්ප්‍රේරක පුනර්ජනනය සඳහා කරන ලද කෙටි වසා දැමීම් හැර පිරිපහදුව 2023 වසර පුරා අඛණ්ඩව සිය මෙහෙයුම් පවත්වාගෙන ගියේය. මෙම පියවර ක්‍රියාත්මක කර ඇත්තේ ලාභදායිත්වය සඳහා ඉතා වැදගත් වන ආන්තික උත්පාදනය ඉහළ නැංවීම සඳහා ය. මීට අමතරව, සාමාන්‍ය ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා පවතින මිලකරණ යාන්ත්‍රණයන් ලාභදායීතාවයට සැලකිය යුතු ලෙස බලපෑවේය.

අනෙකුත් ආදායම් උත්පාදනය, විදේශ විනිමය ලාභ, මූල්‍ය ආදායම සහ පොලී වියදම් අඩුවීම මගින් රු. බිලියන 120 ක ආදායමකට ධනාත්මක ලෙස දායක විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මෙම ජයග්‍රහණය සංස්ථාවෙහි ඍණාත්මක කොටස් ස්කන්ධය ධනාත්මක කොටස් ස්කන්ධයක් කරා පරිවර්තනය කර ඇත.

බදු අය කිරීම

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට සහ එහි සංශෝධනයන්ට අනුව ආදායම් බදු වියදම් ගෙවා ඇත. ඉදිරියට ගෙන ආ සමුච්චිත බදු අලාභයක් ඇති බැවින්, වසර සඳහා කිසියම් ආදායම් බදු වගකීමක් උද්ගත වී නොමැත. සවිස්තරාත්මක බදු වගකීම් මූල්‍ය ප්‍රකාශන වල සටහන අංක 07. 124 පිටුවේ දක්වා ඇත

විශේෂ ගාස්තුව

2014 වර්ෂය තුළ දී, මහා භාණ්ඩාගාරය රු. බිලියන 10ක විශේෂ ගෙවීමක් සිදු කරන ලෙසට සංස්ථාවට උපදෙස් ලබා දෙන ලදී. එමෙන්ම 2014 වර්ෂය සඳහා රු. මිලියන 250ක් ගෙවීම් ලෙස සටහන් කිරීමට දන්වන ලදී. එමෙන්ම 2015 වර්ෂය සඳහා රු. මිලියන 750ක් ද, 2016 සිට 2024 දක්වා කාලය සඳහා වාර්ෂිකව රු.මිලියන 1000ක් ද ආදායම් ප්‍රකාශන වෙත ගලපන ලෙස දන්වා සිටින ලදී. ඒ අනුව, 2023 වර්ෂය සඳහා රු.මිලියන 1000 ක් ක්‍රමක්ෂය කරන ලදී.

දේපල, පිරියත සහ උපකරණ

සංස්ථාවේ හා සමූහයේ දේපල, පිරියත හා උපකරණ මෙන්ම ආයෝජන දේපල පිළිබඳ විස්තර පිටු අංක 125 මූල්‍ය ප්‍රකාශනවල සටහන 08 තුළින් ඉදිරිපත් කර ඇත. . වසර තුළ සංස්ථාව විසින් ස්ථාවර වත්කම් මත රු. බිලියන 3.0 ක් ආයෝජනය කර ඇත.

ආයෝජන

සංස්ථාව විසින් ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි සංකීර්ණයේ ඇති තෙල් ටැංකි සඳහා ආයෝජනයෙන් ව්‍යාපාර කටයුතු සිදු කිරීම සඳහා ලංකා ඉන්දියානුතෙල් සමාගම (Lanka IOC) සමඟ බද්ධ ව්‍යාපාර සමාගමක් වන ත්‍රිකුණාමල ඛනිජ තෙල් පර්යන්ත පුද්ගලික සමාගම වෙත වර්ෂය තුළදී රු. මිලියන 51ක් ආයෝජනය කරන ලදී.

දායක ප්‍රාග්ධනය

2023 දෙසැම්බර් 31 දිනට මුළු දායක ප්‍රාග්ධනය රු. මිලියන 912,580.511 ක් විය. (2022 -රු. 912,580.511).

ප්‍රාග්ධන සංචිත

සංස්ථාවේ ප්‍රාග්ධන සංචිත 2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 4,992.686 ක් විය. (2022 - රු. මිලියන 4,992.686).

මානව සම්පත්

සංස්ථාවේ උපාය මාර්ගික වත්කම්වල ප්‍රධාන අංගයක් වශයෙන් මානව සම්පත හැඳින්විය හැකිය. සංස්ථාවේ ව්‍යාපාර දැක්ම හා මෙහෙවර වෙත ළඟාවීම සඳහා සංස්ථාවට අගයක් එකතු කිරීමට එහි සේවකයන් විසින් මනා රුකුලක් ලබා දේ. සංස්ථාවේ මානව සම්පත වැඩි දියුණු කිරීම සඳහා අවුරුද්ද මුළුල්ලෙහිම විවිධ පියවරයන් ක්‍රියාත්මක කරන ලදී. එමෙන්ම සංස්ථායික දිගු කාලීන මෙහෙයුම් සඳහා එමඟින් ලබා දෙන දායකත්වය ප්‍රශස්තකරණය කිරීම සඳහා ද එම පියවරයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී. දිගු කාලීන මානව ප්‍රාග්ධනයක් ස්ථාපනය කිරීම සඳහා සංස්ථාවේ මානව සම්පත් උපාය මාර්ගයන් පුහුණු කිරීම, සංවර්ධනය කිරීම මෙන්ම වෘත්තීය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම ද සිදු කරනු ලබයි. පිටු අංක 60 සිට 64 දක්වා මානව ප්‍රාග්ධනය පිළිබඳ විස්තරාත්මක අගය එකතු කිරීම යටතේ දක්වා ඇත.

කැපී පෙනෙන නීති කෘත්‍යයන්

අධ්‍යක්ෂවරුන්ගේ මතය අනුව, මූල්‍ය ප්‍රකාශනවල 26වන සටහන යටතේ ඉදිරිපත් කර ඇති තවමත් අවසන් වී නොමැති නඩු විභාග සංස්ථාවේ මූල්‍ය ස්ථායීත්වයට හෝ එහි අනාගත මෙහෙයුම් කටයුතුවලට කිසිදු ප්‍රමාණාත්මක බලපෑමක් ඇති නොකරනු ඇත.

නීති සහ රෙගුලාසි වලට අනුකූල වීම

අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ දැනුම හා විශ්වාසය මත, අදාළ නීති හා රෙගුලාසිවලට පටහැනි කිසිදු ක්‍රියාකාරකමක් සංස්ථාව විසින් සිදු කර නොමැත.

පරිසරික ආරක්ෂණය

අදාළ පාරිසරික නීති සහ රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට සංස්ථාව සියලු උත්සාහයන් ගෙන ඇත.

පරිත්‍යාග

සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළ දී සංස්ථායික සමාජීය වගකීම් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 0.2 වියදම් කරන ලදී. සංස්ථාවේ දුර්වල මූල්‍ය තත්වය හා සංස්ථාව සතු වියදම් අවම කිරීමට රජය විසින් පනවන ලද රෙගුලාසි හා අනුගත වෙමින් එම මුදල් දරන ලදී.

ව්‍යවදස්ථාපිත ගෙවීම්

තම දැනුම හා විශ්වාසය අනුව සියලුම අදාළ නීතිමය හා ව්‍යවස්ථාපිත අධිකාරීන් වෙත සිදු කළ යුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් පවතින සීමා සහිත මූල්‍ය හැකියාවන් යටතේ වුව ද කාලීනව (කෙටිකාලීන රේගු ගෙවීම් හැර) ගෙවා ඇති බව අධ්‍යක්ෂවරුන්ගේ විශ්වාසයයි.

රජය වෙත දායකත්වය

ශ්‍රී ලංකා රේගුවට සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට තීරුබදු, බදු සහ අනෙකුත් ව්‍යවස්ථාපිත තීරුබදු සහ අයකිරීම් වශයෙන් සංස්ථාව විසින් වර්ෂය තුළ රුපියල් මිලියන 233,220 (2022 දී රු. මිලියන 127,078) රජයට ගෙවා ඇත.

වාර්තා කළ දිනට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම්/ හෙළිදරව් කිරීම සඳහා 142 පිටුවේ මූල්‍ය ප්‍රකාශන වල 27 වන සටහනෙ හි අනාවරණය කර ඇති ඒවා හැර, මූල්‍ය තත්ත්වය ප්‍රකාශය වාර්තා කළ දිනයෙන් පසු ප්‍රමාණාත්මක සිදුවීම් කිසිවක් වාර්තා වී නොමැත.

අඛණ්ඩ පැවැත්ම

සංස්ථාවේ ඍණාත්මක කොටස් ප්‍රාග්ධන තත්ත්වය තිබියදීත්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආයතනික සැලැස්ම සකස් කර ඇත්තේ සංස්ථාවේ ඉදිරි දැක්ම, මෙහෙයුම් වැඩිදියුණු කිරීම සහ අනාගතයේදී එහි මෙහෙයුම්වල මූල්‍ය හා වාණිජ ශක්‍යතාව සහතික කිරීම වැඩිදියුණු කිරීමේ දැඩි ආශාව සහිතව වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කර ඇත්තේ අඛණ්ඩ පැවැත්ම පදනම් කර ගෙනය.

විගණකවරුන් පත් කිරීම

සංස්ථාවේ විගණකවරයා ලෙස විගනකාධිපතිවරයා කටයුතු කරන අතර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවේ 154වන වගන්තිය යටතේ සඳහන් කර ඇති විධිවිධාන ප්‍රකාරව විගණකවරයා පත් කරනු ලැබේ. 1961 අංක 28 දරන ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත හා ජාතික විගණන පනත අනුව විගණනය සඳහා විගණකවරයාගේ චේතනය තීරණය කරනු ලබයි.

විගණකවරුන්ගේ චේතන හා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කොන්ත්‍රාත් සම්බන්ධ රුචිකත්වය


සංස්ථාවේ 2023 දෙසැම්බර් 31 දිනට අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල රු.මිලියන 7.0 (2022- රු.මිලියන 6.6) ක් විගණන ගාස්තු වශයෙන් ඉදිරිපත් කර ඇත.

අධ්‍යක්ෂවරුන්ගේ දැනුම අනුව, සංස්ථාව හෝ එහි අනුබද්ධිත ආයතන සමඟ විගණකවරුන් කිසිදු සබඳතාවක් නොපවත්වන අතර ගිවිසුම්ගත වීමකට රුචිකත්වයක් නොදක්වයි.

වාර්තාවේ අන්තර්ගතය පිළිගැනීම

1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් සංස්ථා පනතේ 32(3) වගන්තියට අනුව 2023 වර්ෂය සඳහා වන සංස්ථාවේ වාර්ෂික වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සකස් කර ඉදිරිපත් කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මෙම වාර්ෂික වාර්තාවේ අත්සන් තබා ඇත්තේ;





සභාපති
20.11.2024

කළමනාකාර අධ්‍යක්ෂ

විගණකාධිපති වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන

	පිටු අංකය
විගණකාධිපති වාර්තාව	95
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය	109
මූල්‍ය තත්ව ප්‍රකාශය	110
ස්කන්ධය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය	111
මූල්‍ය ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	112
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	113

ජාතික විගණන කාර්යාලය

මගේ අංකය: ENR/A/CPC/1/23/01 ඔබගේ අංකය: දිනය: 2024 ඔක්තෝබර් 09

සභාපතිතුමා
ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව

ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ එහි පරිපාලිත සමාගම්වල 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන හා වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කළ මතය

ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ (“සංස්ථාව”) සහ එහි පරිපාලිතයෙහි 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, සහ මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන් සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධාන ප්‍රකාරව මාගේ විධිවිධානය යටතේ විගණනය සිදු කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව නුදුරු අනාගතයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2023 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ සහ එහි පරිපාලිතයේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය, මුදල් ප්‍රවාහයන්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වය පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ.) අන්තර් සමාගම් ශේෂ

(i.) CPSTL වෙත ගෙවිය යුතු මුදල

සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL) වෙත ගෙවිය යුතු මුදල රු. මිලියන 6,128 කි. කෙසේ වෙතත්, CPSTL හි මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ඊට අනුරූපව ලැබිය යුතු ශේෂය රු. මිලියන 7,357 ක් සහ වෙනස රු. මිලියන 1,229 ක් ලෙස නිරීක්ෂණය විය. සංස්ථාව මතභේදයට ලක්වූ කරුණු හඳුනාගෙන ඇති අතර මෙම වෙනස්කම්වලට එකඟ වීමට සාකච්ඡා කර ඇත. ඒ අනුව සංස්ථාව රු. මිලියන 313 ක වෙනසකට අන්‍යොන්‍ය වශයෙන් එකඟ වී ඇත. කෙසේ වෙතත්, ගිණුම්වල කිසිදු ගැලපීමක් මේ සඳහා සිදු කර නොතිබුණි.

(ii.) CPSTL වෙතින් ලැබිය යුතු මුදල

සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL) වෙතින් ලැබිය යුතු මුදල රු. මිලියන 228 කි. කෙසේ වෙතත්, CPSTL හි මූල්‍ය ප්‍රකාශනවලට අනුව එම ප්‍රමාණය රු. මිලියන 301 කි. ඒ අනුව 2023 දෙසැම්බර් 31 දිනට මෙම ශේෂ දෙක අතර ශුද්ධ වෙනස ලෙස රුපියල් මිලියන 73 ක් නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, CPSTL විසින් වාර්තා කරන ලද ඉහත වෙනසට තුඩු දුන් දළ ගනුදෙනු රු. මිලියන 379 ක් ලෙස වාර්තා වූ අතර අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වීමක් සිදු නොවී 2023 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ මූල්‍ය වාර්තාවල සටහන් කර නොතිබුණි.

(ආ.) මූල්‍ය ප්‍රකාශන වල අංක 26 දරන සටහනට අනුව 1509 සහ 1512 බදු කාල සීමාවන් සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) විසින් ජාතිය ගොඩනැගීමේ බද්ද සඳහා රුපියල් මිලියන 154.08 (1509 සඳහා රුපියල් මිලියන 77.04 සහ 1512 සඳහා රුපියල් මිලියන 77.04) පිළිබඳව තක්සේරු කිරීම් දෙකක් (02) නිකුත් කර ඇත. තවද, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉහත කී NBT තක්සේරු වලට දඩයක් නොමැතිව රු. මිලියන 102.72 ක් ගෙවීමට අනුමත කරන ලදී. ඒ අනුව, NBT සඳහා ගෙවිය යුතු ප්‍රතිපාදන රු. මිලියන 102.72 වගකීමක් ලෙස නිවැරදිව සටහන් කර ඇති නමුදු, NBT මූලික තක්සේරුව වන රු. මිලියන 154.08ක් මූල්‍ය ප්‍රකාශනවල අවිනිශ්චිත වගකීමක් ලෙස අනාවරණය කර තිබුණි.

(ඇ.) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල - SLFRS 10 වල B86(C) ඡේදයට අනුව අන්තර් සමූහ වත්කම් සහ වගකීම්, ප්‍රාග්ධනය, ආදායම්, වියදම් සහ සමූහයේ ආයතන අතර ගනුදෙනුවලට අදාළ මුදල් ප්‍රවාහයන් සම්පූර්ණයෙන් ඉවත් කළ යුතුය. කෙසේ වෙතත්, මෙම වාර්තාවේ 1.2.1 (a) හි වාර්තා කර ඇති පරිදි, සියලු අන්තර් සමාගම් ශේෂයන් හඳුනා ගැනීමට, සමථයකට පත් කිරීමට සහ ඉවත් කිරීමට සමාගම අසමත් වී ඇත.

1.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS)

(අ) වටිනාකම රුපියල් මිලියන 4,538 ක් වන භාණ්ඩ 26,820 කින් සමන්විත සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් LKAS 16 ට අනුව ඒවායේ සුන්බුන් වටිනාකම සහ ඒවායේ ඵලදායී ආයු කාලය සමාලෝචනය නොකර සංස්ථාව විසින් භාවිතා කර ඇත.

(ආ) LKAS 16 හි 36 වන ඡේදයට අනුව, දේපල, පිරියත සහ උපකරණ අයිතමයක් නැවත තක්සේරු කරන්නේ නම්, එම වත්කම අයත් වන දේපල, පිරියත සහ උපකරණවල සමස්ත පන්තියම නැවත තක්සේරු කළ යුතුය. කෙසේ වෙතත්, සංස්ථාවට අයත් ඉඩම් කැබලි 211 න්, ඉඩම් කැබලි 22 ක් වාර්තා කර තිබුණේ ඒවා නැවත තක්සේරු නොකර රු. මිලියන 87ක් වූ පිරිවැයකටයි. තවද, ඉඩම් නැවත ඇගයීමට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සටහන අංක 1.4.6 හි ඉඩම් නැවත තක්සේරු කිරීමේ වාර ගණන සඳහන් කර නොමැත.

1.2.3 පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳ විගණන මතය

පරිපාලිත සමාගමක් වන ත්‍රිකුණාමලය බනිජ තෙල් පර්යන්ත (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ නත්වාගණනය නොකළ මතයක් මා විසින් නිකුත් කරන ලදී. ලංකා බනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණන මතය මා විසින් නත්වාගණනය කරන ලදී. සංස්ථාවේ සහ සමූහයේ අනුරූප ශේෂ/ ගනුදෙනු සමග එකඟ නොවීමට හේතු වන වැදගත් කරුණු පහත දැක්වේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා CPSTL හි මූල්‍ය ප්‍රකාශනවලට අනුව ලංකා ඉන්දියන් ඔයිල් සමාගමෙන් (LIOC) ලැබිය යුතු මුදල රු. මිලියන 693 කි. කෙසේ වෙතත් LIOC විසින් තහවුරු කරන ලද ශේෂය රු. මිලියන 289 ක් වූ අතර රුපියල් මිලියන 404 ක වෙනසක් නිරීක්ෂණය විය. ඒ අනුව වෙනස්කම් හඳුනා ගැනීමට අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වීමක් පිළියෙල කර තිබුනද තොග ප්‍රවාහන ගාස්තු රු. මිලියන 301ක් LIOC සමඟ අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වී නොතිබුණි.

(ආ) සම්පූර්ණයෙන්ම ක්ෂය කළ දේපල පිරියත සහ උපකරණ අයිතම 25,297 කින් සමන්විත වටිනාකම රුපියල් මිලියන 8,388 ක් වූ වත්කම් LKAS 16 හි 51 ඡේදයට අනුව ඒවායේ සුන්බුන් වටිනාකම සහ ඵලදායී ආයු කාලය සමාලෝචනය නොකර CPSTL විසින් භාවිතා කරමින් තිබෙන අතර එම වත්කම් ගිණුම්කරණ ප්‍රමිත 79 (b) ඡේදයට අනුකූලව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොමැත. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම්වල සාධාරණ වටිනාකම පිළිබිඹු නොවන බව නිරීක්ෂණය වේ.

(ඇ) LKAS 16 හි 07 වන ඡේදයට අනුව, CPSTL විසින් රුපියල් මිලියන 13ක් වූ CPSTL හි බවුසර් 133කින් යුතු සමූහය සඳහා 2023 මාර්තු 31 දින සම්පූර්ණ කරන ලද ජී.පී.එස්.(G.P.S) ස්ථාන හඳුනා ගැනීමේ පද්ධතිය ප්‍රාග්ධනීකරණය කර නොතිබුණි. ඒ වෙනුවට, එම වත්කම් සමාලෝචිත වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල කෙරී ගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර ඉදිරිපත් කර තිබුණි.

(ඈ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ශේෂය තහවුරු කිරීමේ ලිපියට අනුව, ආදායම් බදු වගකීම, වැට් සහ උපයනවිට ගෙවීම් බදු වගකීම CPSTL සඳහා පිළිවෙලින් රුපියල් මිලියන 364 ක් රුපියල් මිලියන 322 ක් සහ රු. මිලියන 13 ක් විය. තවද, එම තක්සේරුවලට එරෙහිව CPSTL විසින් අභියාචනයන් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, සමාගම විසින් එම වැඩි වටිනාකම් සහිත බදු තක්සේරු කිරීම් සමාලෝචිත වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන වල සටහන්වල අවිනිශ්චිත වගකීම් ලෙස අනාවරණය කර නොතිබුණි.

1.2.4 නොසැසඳුණු වෙනස්කම්

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේ සංස්ථාවේ වාර්තා අනුව ශ්‍රී ලංකා රේගුවට (SLC) ගෙවිය යුතු මුළු මුදල රු. මිලියන 46,979 ක් වූ අතර ශ්‍රී ලංකා රේගුව තහවුරු කරන පරිදි එය රු. මිලියන 37,601 කි. එබැවින්, එම ශේෂ දෙක අතර රු. මිලියන 9,378 ක නොසැසුදුණු වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල අංක 12 දරණ සටහනට අනුව, ලැබිය යුතු මුළු වෙළඳ ශේෂය රු. මිලියන 17,617.51 කින් රාජ්‍ය අංශයේ ආයතනවලින් රුපියල් මිලියන 11,235ක් ලැබීමට නියමිත වූයේ රාජ්‍ය අංශයේ ආයතන වලිනි. කෙසේ වෙතත්, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ලැබියයුතු ශේෂයන් සහ රාජ්‍ය අංශයේ ආයතන පහකින් (05) සංස්ථාවට ගෙවිය යුතු අනුකූල ශේෂයන් අතර රුපියල් මිලියන 7,043.60ක නොගැලපීමක් නිරීක්ෂණය විය

(ඇ) වෙළඳාම සහ අනෙකුත් ගෙවිය යුතු වගකීම් කාල විශ්ලේෂණයට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේදී රුපියල් මිලියන 2,507 ක් වසර 05 කට වැඩි කාලයක් තිස්සේ නොපියවූ ශේෂ ලෙස තිබූ අතර, ණයහිමියන් 133 දෙනෙකුට අදාළ රුපියල් මිලියන 17,369 ක ගෙවිය යුතු ශේෂයන් සමාලෝචිත වර්ෂය අවසානයේදී වසර 01 සිට 05 දක්වා කාලයක් තිස්සේ පියවා නොතිබුණි. කෙසේ වෙතත් දැනට ලැබී ඇති තොරතුරු අනුව එම ශේෂ පියවීමට සංස්ථාව කඩිනම් පියවර ගෙන නොතිබුණි. එබැවින් එම ශේෂවල නිරවද්‍යතාවය සහ පැවැත්ම විගණනයේදී සැක සහිත විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් අනුව, මාගේ විගණනය සිදු කරන ලදී. මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකාධිපතිවරයාගේ වගකීම යන කොටසේ මගේ වගකීම් තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්වාගණනය කරන ලද මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ යෝග්‍ය බව මාගේ විශ්වාසයයි.

කරුණු අවධාරණය කිරීම

මගේ මතය තත්වාගණනයට ලක් නොකොට, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට එරෙහිව කොළඹ සිවිල් අභියාචනා මහාධිකරණයේ විභාග වෙමින් පවතින නඩු පහක් සම්බන්ධයෙන් වන සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන වල අංක 26 දරන සටහනට අවධානය යොමු කරමින් CPC වෙත දැනුම් දීමකින් තොරව අවසන් විභාගය සහ තීරණයක් ලබා දීමට තිබියදී පහත සඳහන් අතුරු නියෝග නිකුත් කරනු ලැබ ඇත.

(අ) ඛනිජ තෙල් නිෂ්පාදනවල සිල්ලර මිලෙන් 3% ට අඩු මුදලක් කොමිස් ලෙස ඛනිජ තෙල් බෙදුම්කරුවන්ට ගෙවීමෙන් සංස්ථාව වැළැක්වීම,

(ආ) දැනටමත් කොමිස් ලෙස ගෙවා ඇති යම් මුදලක් ආපසු අයකර ගැනීම වැළැක්වීම සහ

